
කොවිඩ් ව්‍යාප්තිය




★


# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ බක් අව එකොළොස්වක ලත් කිවි දින | කාණ්ඩය 112 | පත්‍රය 120 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මැයි 07 සිකුරාදා





දේශයේ කාලය මනින
දේශබන්ධු
අද පත්‍රය සමඟ


# වරාය නගර කොමිසමේ උසාවි තීන්දුව 18 දා මැතිසබයට

නුවන් කොඩිකාර සහ භක්ති මෙන්ඩිස්

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත පිළිබඳ ඉදිරිපත් වූ පෙත්සම් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාට ඊයේ (6) ලැබී ඇති අතර, එම තීරණය එළැඹෙන 18 වැනිදා කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. පිට 6



## ජනපතිගේ කැබිනට් පත්‍රිකාවෙන් රණවිරුවන්ට හිමි සහන අප්‍රේල් 27 සිටම

පිට 6

# ඉන්දියාවේ සිට කිසිවකුට මෙරටට ඒම තහනම්

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

ඉන්දියාවේ සිට පැමිණෙන කිසිදු සංචාරකයකුට මෙරටට ගොඩ බැසීමට අවසර නොදීමටත්, දින නියමයක් නොමැතිව මේ තීරණය ක්‍රියාත්මක කිරීමටත් සෞඛ්‍ය අංශවලින් ලද උපදෙස් අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි පියවර ගත් බව සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති උපුල් ධර්මදාස මහතා 'දිනමිණ'ට ඊයේ (6) පැවසීය. පිට 6

## රුවන්පුර අධිවේගයේ ඉදි කිරීම් අද ඇරඹේ

මෙරට හත්වැනි අධිවේගය

පිට 6

## කොවිඩ්

පිට 6

### එක් ප්‍රෝටීන වෙනසකින් වයිරසයේ හැසිරීම වෙනස් වෙනවා

බෝ වීමේ වේගය සහ බරපතළකම වැඩියි

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය

### වයිරසය පාලනයට ආයුර්වේද රෝහල් පද්ධතියත් එක් වෙයි

ඇඳන් 5,000ක්

### ප්‍රතිකාර කරන්න නව රෝහල් සහ ආයතන 32ක්

### නිරෝධායන රීති කැඩූ තරුණයෝ යාපනයේ යකා නටති





## ස්පුට්නික් එන්නත් කිරීම් ඇරඹේ

රුසියාවේ නිෂ්පාදිත ස්පුට්නික් V එන්නත මෙරට ජනතාවට නික්ෂේපණය කිරීමේ කටයුතු ඊයේ (6) ආරම්භ කෙරිණි. මාදින්නාගොඩ ශ්‍රී සුරම්‍යාරාම විහාරස්ථානයේදී ප්‍රදේශවාසීන්ට එන්නත් කළ අයුරු.
*ඡායාරූපය - රුක්මල් ගමගේ*

## බත්තුළුඔය විදුහලේ උසස් පෙළ ප්‍රථමයා විදුලි සැර වැදී මරුට

පුත්තලම දිසා සමූහ

ආරච්චිකට්ටුව, බත්තුළුඔය මහා විද්‍යාලයේ මෙවර උසස් පෙළ විභාගයේ පිරිමි අංශයේ වැඩිම ප්‍රතිඵල ලැබූ සිසුවා විදුලි සැර වැදීමකින් මියගොස් ඇත. පිට 6

## අනුරපුර බැංකුවක් අසල වෙඩි හුවමාරුවක්

පිට 6

## අවුරුදු සමයේ උද්භිද උද්‍යාන බලන්න ලක්ෂ 1 1/2ක් ගිහින්

ධනුෂ්ක ගොඩකුඹුර

කොරෝනා අවදානම සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශ අනතුරු අඟවා තිබියදීත් ලක්ෂ එකහමාරක පිරිසක් අවුරුදු සමයේ උද්භිද උද්‍යාන නැරඹීමට ගොස් තිබේ. පිට 6


Cargills rewards
30% දක්වා වට්ටම්
තෝරාගත් භාණ්ඩ වර්ග 50 ක් සඳහා



කොන්දේසි:
* දීමනා කලය තුළ එක් භාණ්ඩයකින් මිලදී ගත හැකි උපරිම ප්‍රමාණය ඒකක 3යි.
* දීමනාව වලංගු වන්නේ 2021 මැයි 20 දක්වා පමණයි.
* තොග අවසන් වනතුරු පමණයි.

Cargills SINCE 1844
Cargills food city
ගෙදර යන ගමන්


## නීතිපති කැනඩා මහ කොමසාරිස් ධුරය එපා කියයි

පිට 6

## හිම්කරුවන් නැති ෆේස්බුක් ගිණුම් ලක්ෂ 20ක් අත්හිටුවනවා



රුවන්ත නිතුල්ගස්පිටිය

මෙරට සමස්ත ෆේස්බුක් ගිණුම් ප්‍රමාණයෙන් නිසි හිමිකරුවන් නොමැති බවට තහවුරු වී ඇති සියයට 27ක් වූ ගිණුම් ප්‍රමාණයක් (ගිණුම් ලක්ෂ 20ක් පමණ) අත්හිටුවීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ඉදිරියේදී ගැනීමට නියමිත බව ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පැවසීය. පිට 6

## ෆේස්බුක් සාදයක් වටලා ලක්ෂ 11/2ක මත්පැන් සමඟ අයෙක් අත්අඩංගුවට

නිරෝධායන රීති උල්ලංඝනය කරමින් සමාජ මාධ්‍ය ඔස්සේ සංවිධාන කර තිබූ මත්පැන් සාදයක් වටලා රුපියල් එක්ලක්ෂ පනස්දාහක වටිනාකමින් යුතු මත්පැන් තොගයක් සමඟ සැකකරුවකු සුරාබදු විශේෂ මෙහෙයුම් කාර්යාංශයේ (දීපව්‍යාප්ත) නිලධාරීන් විසින් අහංගම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන තිබේ. පිට 6



## ධම්මික පැණියේ රස බැලූ ආණ්ඩුව දැන් බෙල්ලටම හිර වෙලා



ගිරෝමි අබයසිංහ

ලෝකයේ අනෙකුත් රටවල් කොරෝනා මර්දනය සඳහා පර්යේෂණ කරද්දී මෙරට ආණ්ඩුව ධම්මික පැණිය ජනතාවට පෙවීමේ විපාක දැන් රට පුරා දකින්නට ඇතැයි එක්සත් ජාතික පක්ෂ නායක සහ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ඊයේ (6) පැවසීය. පිට 6

## යහපාලන ආණ්ඩුව සහල් මෝල්වලට ණය දෙන්න ඇරඹූ වැඩසටහනත් අසාර්ථකයි

ලක්ෂ 10,000න් වැය කර ඇත්තේ ලක්ෂ 4,348යි පිට 6


මිණිපුරට ඉදිකරන
රුවන්පුර අධිවේගය
අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ
"රට හදන සෞභාග්‍යයේ දැක්ම සංකල්පයට අනුව"
රුවන්පුර අධිවේගී මාර්ගයේ පළමු අදියර වන කහතුඩුව සිට ඉංගිරිය දක්වා
වූ කොටස ඉදිකිරීමේ සමාරම්භක මොහොත
මහාමාර්ග අමාත්‍යංශයේ ලේකම්
ආර්.ඩබ්.ආර් පේමසිරි මහතාගේ
ආරාධනයෙන්
ගරු මහාමාර්ග අමාත්‍ය
ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාගේ
සහ
ගරු ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය
නිමල් ලන්සා මැතිතුමාගේ
සහභාගිත්වයෙන්
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ
සුරතින්
2021 මැයි මස 07 වන දින
පෙ.ව 10.00ට කෝරළඉම දී සිදුකෙරේ.
■ පළමු අදියර කහතුඩුව සිට ඉංගිරිය දක්වා - දුර කි.මී 24.3 යි.
■ මංතීරු 04 ක් යටතේ ඉදිකෙරේ.
■ ඉදිකිරීම් පිරිවැය රුපියල් බිලියන 54.70
■ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු මාගා ඉංජිනේරු ආයතනය.
■ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 03 යි කහතුඩුව, හොරණ, ඉංගිරිය
මාර්ග සංවර්ධන අධිකාරිය
Road Development Authority
MINISTRY OF HIGHWAYS
State Ministry of Rural Roads & Other Infrastructure
MAGA

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 මැයි 07 සිකුරාදා

# ජනරංජන කලාපීය නායකයා

ආසියානු සංවර්ධන බැංකුවේ ඊළඟ වාර්ෂික සැසිය ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට ද බැංකුවේ අධිපතිවරුන්ගේ නායකත්වය අගමැති මහින්ද රාජපක්ෂ මහතා වෙත පැවරීමට ද බැංකු අධිකාරීන් තීරණය කර තිබේ. ඒ අනුව ආසියානු සංවර්ධන බැංකුවේ පනස් පස් වන සැසි වාරය ලබන වසරේ මැයි 02- 05 අතර කාලය තුළ කොළඹදී පැවැත්වෙන්නේ අගමැතිවරයාගේ නායකත්වය යටතේය. මෙය ශ්‍රී ලංකාව ලැබූ සුවිශේෂී අවස්ථාවක් වන්නා සේම මහින්ද රාජපක්ෂ මහතා වෙත පිදෙන ගෞරවනීය තත්ත්වයක් ද වන්නේය. කොවිඩ් වසංගතය තුළ අපේ ආර්ථිකය යළි නඟා සිටුවීමට ලැබුණු අවකාශයක් ලෙස ද එය හැඳින්විය හැකිය. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් කියන්නා සේ සුදුස්සාටම සුදුසු තැන ලැබිය යුතුය.

ආසියානු සංවර්ධන බැංකුව පිහිටුවනු ලබන්නේ 1966 දීය. එහි මූලික අරමුණ ආසියා පැසිෆික් කලාපයේ රටවල සමාජ ආර්ථික වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමය. සංවර්ධන ණය සැපයීම, තාක්ෂණික සහයෝගය දීම, ප්‍රදානයන් සිදු කිරීම හා ආයෝජන අවස්ථා පුළුල් කිරීම ඉහත වැඩසටහන්වලට අයත්ය. බැංකුවේ ප්‍රධාන කාර්යාලය පිලිපීනයේ මැනිලා නුවර පිහිටුවා ඇත. ආසියා පැසිෆික් කලාපීය රටවල් පමණක් නොව අමෙරිකාව හා යුරෝපීය රටවල් ගණනාවක් ද මෙහි සාමාජිකත්වය දරති. ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනය, ජලසම්පාදනය, බලශක්ති වර්ධනය හා සෞඛ්‍ය කටයුතු සඳහා ද ආසියානු සංවර්ධන බැංකුවේ සෘජු දායකත්වය ලැබී ඇත.

ලෝකයේ කිසිදු රාජ්‍යයකට හුදෙකලාව නැඟී සිටීමේ හැකියාවක් නැත. ස්වයංපෝෂිත ආර්ථිකය යන සංකල්පය පවා අද සංවාදයට අයත් නැත. එය යල් පීනූ අදහසක් ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබේ. දියුණු වීමට නම් ගෝලීය ආර්ථිකය සමඟ බද්ධ විය යුතුය. දුප්පත් රටවල් ආයෝජන අවස්ථා පුළුල් කළ යුතුය. ගෝලීය ආර්ථිකය සඳහා උපදේශන හා වෙනත් සේවා සපයන ආයතන පවතින අතර, කලාපීය වශයෙන් ද එම උපදේශන හා සේවා සපයන ආයතන පවතී. ශ්‍රී ලංකාව කලාපීය වශයෙන් වඩාත් සමීප වන්නේ ආසියානු සංවර්ධන බැංකුව වෙතය. අපගේ ප්‍රධාන මූල්‍ය උපදේශකයා හා සේවා සපයන්නා ලෙස ද ආසියානු සංවර්ධන බැංකුව ඔසවා තැබිය හැකිය.

ආසියානු සංවර්ධන බැංකුවේ නව තේමාව වන්නේ "ආසියාවේ නව උදාවක් සඳහා නැඟී සිටිමු" යන්නය. මේ තේමාව යටතේ විෂය ක්ෂේත්‍ර ගණනාවක් සංවාදයට ගෙන ඇත. කොවිඩ් වසංගතය හමුවේ ආසියාවේ ආර්ථිකය, දේශගුණික විපර්යාස අවම කරගැනීමට ක්‍රියා කිරීම, ව්‍යාපාර හා කර්මාන්ත පවත්වා ගැනීමට සුදුසු ණය පොලී හඳුන්වාදීම, එකිනෙක රටවල සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා සාමූහිකව කටයුතු කිරීම ඒ අතර පවතී. ආසියාවේ රටවල් කිහිපයක් කොවිඩ් වසංගත තත්ත්වය තුළ බලවත් අසීරුවකට පත් වී ඇත. ඒ අතර, අසල්වැසි ඉන්දියාව අසීරුතාවේ පළමු තැන ගෙන ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ අවධානය ඉන්දියාවට යොමු වී ඇත. සාමූහික ක්‍රියාවලියක් ඔස්සේ ඉන්දියාවට උපකාර කළ යුතුව තිබේ.

ආසියානු සංවර්ධන බැංකුවේ ඉදිරි වසරේ කාර්යභාරය සම්බන්ධයෙන් බරපතළ වගකීමක් මහින්ද රාජපක්ෂ මහතා වෙත පැවරී ඇත. එහි ප්‍රධාන කොටස් දෙකක් තිබේ. පළමුව කොවිඩ් මර්දනය කරමින් ආසියා - පැසිෆික් කලාපයේ ආර්ථික වර්ධනයට අවශ්‍ය උපායමාර්ග සකසා ගත යුතුව තිබේ. දෙවනුව ඊළඟ වසරේ ප්‍රධාන සමුළුව පැවැත්වීම සම්බන්ධයෙන් වගකීම භාරගත යුතුව තිබේ. ශ්‍රී ලංකාව ගත හොත් ගෙවී ගිය වසරේ ආර්ථිකය බරපතළ කඩා වැටීමකට ලක් වී ඇත. මහ බැංකු වාර්තා ඒ බව සනාථ කර ඇත. ආසියාවේ සෑම රටකම පාහේ ආර්ථිකයන් පසුබෑමකට ලක් වී ඇත. ඒ කොවිඩ් වසංගතය නිසාය. ඒ අනුව ආර්ථික සංවර්ධනයේ පළමු පියවර විය යුත්තේ කොවිඩ් මර්දනය කොට ජන ජීවිතය සාමාන්‍ය අතට ගැනීමය.

අපේ කලාපයේ සාර්ථකම කොවිඩ් මර්දනය ඇත්තේ ශ්‍රී ලංකාවේ යැයි කිව හොත් එය අතිශයෝක්තියක් වන්නේ නැත. ලෝකයේ බොහෝ රටවල් තවම එන්නත්කරණය ආරම්භ කර නැත. ශ්‍රී ලංකාව ලක්ෂ දහයකට ආසන්න පිරිසකට එන්නත දී ඇති අතර, මේ වසර අවසන් වීමට පෙර ලක්ෂ එකසිය තිස්පහකට එන්නත දෙන බවට පොරොන්දුවක් දී ඇත. එන්නත් වර්ග තුනක් රටට ගෙන්වා ගෙන ඇත. ප්‍රාදේශීය මධ්‍යස්ථාන ඔස්සේ සාමාන්‍ය පුරවැසියන්ට එන්නත දීම රජයේ ඉලක්කය වී ඇති අතර, කොවිඩ් තෙවන රැල්ල පාලනය කිරීම සඳහා කඩිනම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද රජය පියවර ගෙන තිබේ. අපේ කොවිඩ් මර්දන වැඩසටහන් කලාපයේ අනෙක් රටවලට ආදර්ශයක් සේ පවතී.

මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වය සේම කොවිඩ් මර්දන ව්‍යාපාරයේ අත්දැකීම් ද ආසියානු සංවර්ධන බැංකුවේ අනාගත සැලසුම් සඳහා බෙහෙවින් වැදගත් වනු ඇත. ශ්‍රී ලංකාවේ තිස් අවුරුදු යුද්ධය නිමා කිරීමට දේශපාලන නායකත්වය දුන්නේ මහින්ද මහතාය. යුද්ධයත් ත්‍රස්තවාදයත් අවසන් කළ දේශපාලන නායකයකු ලෙස මහින්ද මහතාට ජගත් කීර්තියක් තිබේ. ඒ හැරෙන්නට ඔහු පොදු ජනයාගේ නායකයෙකි. ඔහු තරම් ජන ප්‍රසාදයට ලක් වූ වෙනත් නායකයකු ශ්‍රී ලංකාවේ දක්නට නැත. එබැවින් ජනරංජන යන නාමය ඔහුට යෙදී තිබේ. 2009 දී බොහෝ දෙනකුගේ මතය වූයේ මහින්ද මහතා නෙල්සන් මැන්ඩෙලාට සමාන බවය. ඔහුට නොබෙල් සාම ත්‍යාගය ලැබිය යුතු යැයි තවත් පිරිසක් කියා සිටියහ.

ලෝකයේ දරුවන් වෙනුවෙන් පෙනී සිටින හොඳම දේශපාලකයා හැටියට ද මහින්ද මහතා සම්මානයට ලක් වී ඇත. දරුවන් යනු රටක අනාගතයයි. දරුවන්ට ආදරය කරන නායකයා අනාගතය සුබවාදී කරන නායකයෙකි. ආසියානු සංවර්ධන බැංකුවේ ඉදිරි වැඩසටහන් මහින්ද මහතාගේ ද සහභාගිත්වය මත ඉදිරිගාමී වන බවට කිසිදු සැකයක් නැත.

දිල්රූගෙ සීවිදි

| | |
|---|---|
| කුස දරු ගැබක් දරමින් සුබ සිහින | දුටු |
| මවකගෙ ජීවිතෙත් මරුවට වුණා | කොටු |
| මේ වයිරසය එන විට විහිදමින් | තටු |
| සැඟවී සිටිය හොත් මිස විය නොහැක | තුටු |

# රට විසාලාවක් නොකළ

# රාජ්‍ය යන්ත්‍රණය

කොවිඩ් - 19 වයිරසය මේ වන විට රටටම ව්‍යසනයක්ව පැවැතියත් එය මර්දනය කොට රටේ ආර්ථිකය ද යහපත් තත්ත්වයට පත් කර ගනිමින් ජන ජීවිතය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය කටයුතු රැසක් ආණ්ඩුව ක්‍රියාත්මක කරමින් පවතියි. ලෝකයේ දියුණු රටවල පවා ආර්ථිකය බිඳ වැටී තිබියදී ශ්‍රී ලංකාවට එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ නොදීමට වගබලා ගැනීම වත්මන් පාලනය උත්සාහ ගනිමින් සිටී.



කොවිඩ් වයිරසයේ ව්‍යාප්තිය හේතුවෙන් රටම වසා දැමුවහොත්, ඉතා ඉක්මනින් ජන ජීවිතය කඩා වැටීම සිදු වන බව සත්‍යයකි. එවැනි තත්ත්වයක් උදා වුව හොත් එදා වේල සොයාගෙන ජීවිතය ගැට ගසා ගන්නා පුද්ගලයන්ට අත්වන ඉරණම දරුණු විය හැකිය. කොවිඩ් රෝගීන් වැඩිපුර වාර්තා වන ප්‍රදේශයවල සංචරණ සීමා යොදා මේ වන විට වයිරසය ව්‍යාප්තිය පාලනය කොට තිබේ. වත්මන් රජය ගෙන ඇති හොඳම විසඳුම එය බව අප කාටත් පිළිගන්නට සිදු වනු ඇත. ජනතාවගේ ජීවිත ආරක්ෂා කර, රටේ ආර්ථිකය ද ආරක්ෂා කර ගනිමින් රජය ගෙන යන සුවිශේෂ වැඩපිළිවෙළ ඇතැමුන්ගේ පැසසුමටත්, විවේචනයටත් ලක්ව තිබේ. ඒ කෙසේ වෙතත්, මේ වසර අවසන් වන විට මෙරට ජනගහනයෙන් සියයට 63 ක් පූර්ණ එන්නත්කරණයට ලක් කිරීම රජයේ අරමුණය.

## අවිනිශ්චිත වසංගතය

1918න් පසු වසර සියයක කාලයක් ගත වී ඇති තැන, ලොව පුරා ගෝලීය වසංගතයක් පැතිරෙමින් තිබේ. මේ වසංගතයේ අප තවමත් සිටිනුයේ මුල ද මැද ද අග ද කියන කාරණාව පැහැදිලි නොවේ. ඇතැම් විට අප තවමත් මේ වසංගතයේ මුල් කොටසේ සිටිය හැකිය. ඇතැම් විට මැද සිටිනවා විය හැකිය. ඇතැම් විට අග සිටිනවා විය හැකිය. මේ වසංගත තත්ත්වය හමුවේ සෞඛ්‍ය අංශ වංසගත නිලධාරීන්, වෛද්‍යවරුන්, හෙද නිලධාරීන්, සෙසු සෞඛ්‍ය සේවකයින්, ආරක්ෂක අංශවල සාමාජිකයින් අපමණ වෙහෙසක් දරමින් වසංගතය මර්දනයට පියවර ගනිමින් සිටී.

පසුගිය අප්‍රේල් මස 08 වැනිදා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අණුක ජීව විද්‍යා අංශය මඟින් බොරලැස්ගමුව ප්‍රදේශයේ වැඩබිමක සේවකයන් පස්දෙනකු නව කොරෝනා වසංගතයට ගොදුරුව සිටින බවට හඳුනා ගැනීම සිදු විය. ඔවුන්ගේ සාම්පලවල මීට පෙර වයිරසයේ නොදුටු වෙනසක් හඳුනා ගැනීමට හැකි විය. එය වෛද්‍ය විද්‍යානුකූලව හඳුන්වනුයේ එස්ජීන් ඩ්‍රොප් යනුවෙනි. මේ එස්ජීන් ඩ්‍රොප් එක අවස්ථා තුනකදී නිරීක්ෂණය කළ හැකිය. එංගලන්තයේ කෙන් ප්‍රදේශයෙන් ආරම්භ වූ ප්‍රභේදය, නයිජීරියානු ප්‍රභේදය සහ තවත් ප්‍රභේදයක් ලෙසිනි.

## නව ප්‍රභේද

මේ නව ප්‍රභේදය හඳුනාගත් වහාම මෙරට බුද්ධි අංශ යොදා අදාළ වැඩබිමේ ආශ්‍රිතයන් 800ක් හඳුනාගෙන තිබුණි. සාමාන්‍යයෙන් පළමු සහ දෙවැනි වළල්ලේ ආශ්‍රිතයන් පමණක් මීට පෙර හඳුනා ගැනීම සිදු කළ ද නව ප්‍රභේදය නිසා තුන්වැනි පෙළ ආශ්‍රිතයන්ගේ ආශ්‍රිතයන් පවා හඳුනා ගැනීම සිදු කෙරිණි. එම ආශ්‍රිතයන් 800 දෙනාගේ සාම්පල ගෙන ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත යොමු කෙරිණි. එකී 800න් කිසිවෙකුටත් වයිරසය ආසාදනය වී නොතිබිණි. එම නිසා අදාළ දත්ත මත පදනම්ව රජය කළ හැකි සියලු දේ සිදු කරන්නට විය. එස්ජීන් ඩ්‍රොප් එක දුටු සැණින් නව ප්‍රභේදයක් බවට එක්වරම හඳුන්වා දිය නොහැක. නව ප්‍රභේදයක් බවට හඳුනා ගැනීම සඳහා තවදුරටත් ජීන් සීක්වල් ක්‍රියාවලිය කළ යුතුය. ඒ ක්‍රියාවලියේ ප්‍රතිඵල අප්‍රේල් 28 වැනිදා රජයට ලැබිණ. දින 20ක් ඒ සඳහා ගත විය. ඒ කාලය තුළ තවත් ස්ථාන කිහිපයක මේ වයිරසය පැතිර ගොස් තිබිණ. එය රජයේ හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ ආරක්ෂක අංශවල හෝ වැරැද්දක් නොවේ. වූහාන් නගරයේ මේ වයිරසය මීට වසරකට ප්‍රථම පැතිරිණි. ලොව පුරා වූහාන් ප්‍රභේදය පැතිරිණ.

අද වන විට බ්‍රිතාන්‍ය ප්‍රභේදය ලොව පුරා පැතිරෙන ප්‍රමුඛ වයිරස් ප්‍රභේදය බවට පත්ව තිබේ. වයිරසයේ පැවැත්ම සඳහා එය කාලානුරූපීව වෙනස් වේ. වූහාන් ප්‍රභේදයෙන් ආරම්භ වී මේ වන විට බ්‍රිතාන්‍ය ප්‍රභේදයක් දක්වා වයිරසය අනුවර්තනය වී තිබේ. බ්‍රිතාන්‍යයේ ප්‍රභේදයේ තවත් විකෘතියක් මේ වන විට ඉන්දියාවෙන් වාර්තා වේ. එය මෙරටට පැමිණීම වැළැක්වීම සඳහා රජයෙන් ගත යුතු සියලු පියවර ගැනීම සිදු කරයි. ඒ අනුව ඉන්දියාවේ සිට නීති විරෝධී බෝට්ටුවලින් මෙරටට පැමිණෙන පුද්ගලයන් මුහුදු සීමාවේදී නැවත හරවා යැවීමට නාවික හමුදාව පියවර ගෙන තිබේ. ඒ අනුව පසුගියදා නීති විරෝධී ලෙස පුද්ගලයන් 88 ක් රැගත් බෝට්ටු 11ක් මෙරටට ඇතුළු වීමට දැරූ උත්සාහය වළක්වා නැවත හරවා යැවීමට නාවික හමුදාව කටයුතු කර තිබේ.

වසංගතය පාලනය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය කරුණු 10කින් සමන්විත දස වැදෑරුම් වැඩපිළිවෙළක් එළි දක්වා තිබේ. කොවිඩ් පාලනයට ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව රජය කටයුතු කරයි. කොවිඩ් පාලනයට අවශ්‍ය සියලු දේ මිල දී ගැනීමට නම් රටේ ආර්ථිකය ශක්තිමත් විය යුතුය. උදාහරණයක් ලෙස මේ වන විට දිනකට පී.සී.ආර්. පරීක්ෂණ 25,000ක් සිදු කරයි. අදාළ පරීක්ෂණ සඳහා දිනකට රුපියල් ලක්ෂ හාරසියයක් පමණ වැය කිරීමට සිදු වේ. පී.සී.ආර්. පරීක්ෂණ සිදු කිරීම, දැඩි සත්කාර ඒකක ඇඳන් ස්ථාපිත කිරීම, එන්නත් ගෙන්වීම යනාදී සියලු කාරණා සඳහා රටේ ආර්ථිකය යහපත්ව පැවැතීම අත්‍යවශ්‍ය කරුණකි. එම නිසා වගකිව යුතු රජයක් ලෙස කොවිඩ් පාලනයට යොමුවී සිටිනුයේ දුගී දුප්පත් ජනතාවගේ ආර්ථිකය ද ආරක්ෂා වන පරිදිය. කොවිඩ් පාලනය වෙනුවෙන් රජය ගන්නා සෑම තීරණයකදීම රටේ ආර්ථිකය පවත්වාගෙන යාම, අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් මාර්ග පවත්වාගෙන යාම යනාදී කරුණු කෙරෙහි දැඩිව අවධානය යොමු කර තිබේ. මෙම වසංගතයෙන් ආරක්ෂා වීම සඳහා එකම විකල්පය එන්නත්කරණය බවට රජය හඳුනාගෙන තිබේ.




කොවිඩ් වයිරසය මර්දනය සඳහා ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනිකා එන්නත් 925,240ක ජනතාවකට ලබාදී තිබේ. රුසියාවේ නිෂ්පාදිත ස්පුට්නික් එන්නත ගෙන්වීම ද රජය ආරම්භ කර තිබේ. මේ වසර අවසාන වන විට රුසියානු ස්පුට්නික් එන්නත් මාත්‍රා මිලියන 13ක් මෙරටට ගෙන්වා ගැනීමට රජය ගිවිසුම් අත්සන් කර ඇත. මේ වන විට ඉන් මාත්‍රා 15,000ක් මෙරටට ගෙනැවිත් ජනතාවට ලබාදීම ආරම්භ කර තිබේ.

## එන්නත්කරණය

ෆයිසර් එන්නතේ මාත්‍රා මිලියන පහක් මෙරටට ඇණවුම් කර තිබේ. ලෝකයේ රටවල් 50ක් එක් එන්නත් මාත්‍රාවක්වත් ලබා ගත නොහැකිව සිටියදී ලංකාවට මෙම එන්නත් ලබා ගැනීමට හැකි වූයේ රජයේ සාර්ථකත්වය නිසාය. ආර්ථිකයෙන් දියුණු රටක් වන ඉන්දියාවේ මෙන් ජනතාව මහ මඟ මැරෙන්නට නොදී ජනතාවට අවශ්‍ය පහසුකම් සැලසීමට නිරන්තරයෙන් රජය පියවර ගෙන තිබේ. මෙරට එන්නත්කරණ ක්‍රියාවලිය ලෝකයේ දියුණු රටක එන්නත්කරණ ක්‍රියාවලිය හා සමාන වේ. එන්නත් ජනතාවට ලබාදීම බණ්ඩනයකින් තොරව සිදු කිරීම රජයේ අපේක්ෂාව වී තිබේ.

කොවිඩ් රෝගීන් වෙනුවෙන් ඇඳන් 13,800ක් වෙන් කිරීමට රජය පියවර ගෙන ඇත. ඉදිරි සති දෙක තුළ තවත් ඇඳන් 10,000ක් වෙන් කිරීම රජයේ සැලසුම වේ. දැඩි සත්කාර ඒකක ඇඳන් 104ක් ද කොවිඩ් රෝගීන් වෙනුවෙන් ස්ථාපිත කර ඇත. අවශ්‍යතාව අනුව එම ඇඳන් වැඩි කිරීමට රජය පියවර ගනියි. ස්වසන අපහසුතා පවතින කොවිඩ් රෝගීන්ට වෙන්ටිලේටර් යන්ත්‍ර ලබාදීමට ද සෞඛ්‍ය අංශ පියවර ගෙන තිබේ. කොවිඩ් රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා සීමාවාසික වෛද්‍යවරුන් ද පුරුදු පුහුණු කර අවශ්‍ය සෞඛ්‍ය අංශ සේවාව රෝගීන්ට ලබාදී ඇත. ඒ අනුව රජය බහුවිධ සැලැස්මක් අනුව කොවිඩ් පාලනයට පියවර ගෙන තිබේ.

## ඔක්සිජන් ධාරිතාව

කොවිඩ් රෝගීන්ට අවශ්‍ය ඔක්සිජන් රට තුළ නොමැති බවට විවිධ ප්‍රචාරයන් පළ වුවද ඒවායේ සත්‍යතාවක් නොමැත. රෝගීන්ට අවශ්‍ය ඔක්සිජන් රට සතුව තිබේ. ඔක්සිජන් ටොන් 80ක් දක්වා වැඩි කිරීමේ ධාරිතාව රජය සතුය. ඒවා භාවිතා කිරීමට අවශ්‍ය ජම්බො සිලින්ඩර් 7000ක් මේ වන විටත් ඇණවුම් කිරීමට රජය පියවර ගෙන තිබේ. රෝගීන්ට අවශ්‍ය ඔක්සිජන් රට තුළ තිබෙන නිසා රෝගීන් අනවශ්‍ය බියක් මේ සම්බන්ධයෙන් ඇති කර නොගත යුතුය.

පාරම්පරික මුතුන්මිත්තන් අනුගමනය කළ ජීවන ක්‍රියාවලිය නැවත අනුගමනය කළ යුතුය යන පණිවුඩය ස්වභාව ධර්මයෙන් ලබාදී තිබේ. ආයුර්වේද රෝහල් 118ක් රට සතුව පවතියි. එහි ඇඳන් 5072ක් ඇත. කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර සඳහා අවශ්‍ය වුවහොත් එම ඇඳන් භාවිතයට ගත හැකි ය. පාරම්පරික හා ආයුර්වේද වෛද්‍යවරුන් 1022ක් රට තුළ සේවය කරයි. සමස්ත ආයුර්වේද වෛද්‍යවරුන් 2296ක් සේවයේ නියුතුය. කොවිඩ් මර්දනය සඳහා සුවධරණී ඔසු පානය ආයුර්වේදයෙන් හඳුන්වාදීම පසුගිය දිනයන්හි සිදුකෙරිණ. කොවිඩ් පොකුරු මර්දනයට මේ පානය භාවිතා කිරීම සිදු කෙරිණ. ඊට අමතරව ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් අනුමත ඖෂධ වර්ග භාවිතයට ගැනීම ද සිදු කෙරිණ. විද්‍යාත්මක පරීක්ෂණයන්ට ලක් කරමින් මෙම ඖෂධ වර්ග රෝගීන්ට හඳුන්වාදීමට රජය පියවර ගෙන තිබේ. පාරම්පරික ආයුර්වේද ක්‍රමයේ සහ බටහිරට වෛද්‍ය ක්‍රමයේ සංකලනයක් ලෙස රෝගීන්ට අලුතින් ඖෂධ ලබාදීමට ද රජය සැලසුම් කර තිබේ.

**සන්ධ්‍යා කරුණාරත්න**



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇති වසර 2025 වන විට ඩොලර් බිලියන 5ක මෘදුකාංග අපනයන ඉලක්කය සැපිරීමට තොරතුරු තාක්ෂණ ශ්‍රම බළකාය සවිබල ගැන්වීම සම්බන්ධයෙන් ජාවා තාක්ෂණික උසස් අධ්‍යාපන ආයතනයේ සභාපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ සාමාජික සහ සමුපකාර අමාත්‍යාංශයේ ස්වේච්ඡා උපදේශක ආචාර්ය ඉෂාන්ත සිරිබද්ධන මහතා සමඟ කළ සාකච්ඡාවකි මේ.

# කොවිඩ් නිසා සංචාරක ව්‍යාපාරය මෙන්ම විදෙස් රැකියා නියුක්තියත් බිඳ වැටිලා

ආචාර්ය **ඉෂාන්ත සිරිබද්ධන**
ජාවා තාක්ෂණික උසස් අධ්‍යාපන ආයතනයේ සභාපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ සාමාජික සහ සමුපකාර අමාත්‍යාංශයේ ස්වේච්ඡා උපදේශක

**● තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය රටේ ආර්ථික වර්ධනය සඳහා දායක වීමට ඇති හැකියාව පිළිබඳ ඔබේ අදහස කුමක් ද?**

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සෘජු ලෙස දායකත්වය සපයා දුන් සංචාරක ක්ෂේත්‍රය, විදෙස්ගත රැකියා නියුක්තිය යන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක මේ වන විට කොවිඩ් 19 වසංගතයත් සමඟ දැවැන්ත කඩා වැටීමකට ලක් වෙලා. නමුත් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය මුළු ලෝකය පුරාම දැවැන්ත ප්‍රවර්ධනයක් පෙන්නුම් කරන්න පටන් ගෙන. මේ තත්ත්වයෙන් හැකි පමණ ප්‍රයෝජන ගෙන රටේ ආර්ථිකය නඟාසිටුවීමට කටයුතු කිරීම රජයේත් පෞද්ගලික අංශයේත් වගකීමක්.

තොරතුරු තාක්ෂණය හරහා ලෝකය ජයගත් පෞද්ගලික ආයතන සැලකිල්ලට ගත් විට ආරම්භක ප්‍රාග්ධනය ඉතාම කුඩා අගයක තියෙන්නේ. සමහර විට ලැප්ටොප් පරිගණකයකට මූලිකව යොදන ලද ආයෝජනය පමණයි. නමුත් එම තනි ආයෝජකයා සතු දැනුම හා කුසලතාවය අතිශයින් වැදගත්. එනිසා අද තරුණ පරපුරට තොරතුරු තාක්ෂණ දැනුම පමණක් සපයා දීම ප්‍රමාණවත් වන්නේ නැහැ. හැකියාව ලබා දෙන්නත් රජයට විශාල වගකීමක් තිබෙනවා. මගේ අදහසේ හැටියට තොරතුරු තාක්ෂණය ලෙස හඳුන්වා දුන්නාට තොරතුරු තාක්ෂණයේ මූලික සංකල්ප ඇතුළත් උපාධි පාඨමාලා හරහා පමණක් දැනුම ලබාදීම ප්‍රමාණවත් නැහැ. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ තිබෙන විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අවම වශයෙන් උපාධියක් දක්වා විශේෂීකරණය වූ දැනුම තරුණ පරපුරට ලබාදීම වැදගත්.

## වෘත්තීමය කුසලතා වර්ධනය සඳහා ලබා දී ඇත්තේ අඩු අවධානයක්.

තොරතුරු තාක්ෂණය හරහා වේගවත් ගමනක් යෑමට නම් මෘදුකාංග ඉංජිනේරු උපාධි පාඨමාලා හරහා වෘත්තිකයින් පුහුණු කිරීම අතිශයින් වැදගත්. මෙහිදී මා අදහස් කරන කරුණු නිවැරදිව කළමනාකරණය කර ගැනීමෙන් වසර 5 ක් තුළ රුපියල් බිලියන 5ක අවම විදේශ විනිමය මට්ටමක් වුව ද ළඟා කර ගැනීමට හැකියාව තිබෙනවා.

**● සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව මෘදුකාංග අපනයන ඉලක්ක සපුරාගත හැකි ද?**

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව මෘදුකාංග අපනයනය හරහා 2025 වන විට රටට ලබා ගැනීමට බලාපොරොත්තු වන විදේශ විනිමය ඩොලර් බිලියන 3 ක්. මේ සඳහා පුහුණු කිරීමට බලාපොරොත්තු වන මෘදුකාංග ඉංජිනේරුවන් සංඛ්‍යාව ලක්ෂ 3 ක්. මෘදුකාංග අපනයනය සඳහා ශ්‍රම බළකාය සූදානම් කරන විට මෘදුකාංග ඉංජිනේරුවන් ප්‍රමාණය 40%ක් නම් ඔවුනට සහය වන තොරතුරු තාක්ෂණ සහයක ශිල්පීන් ප්‍රමාණය 60%ක්.

මෘදුකාංග ඉංජිනේරුවන් හා සහායක තාක්ෂණ ශිල්පි ශ්‍රම බළකාය සඳහා පුහුණු කර ගැනීම පිණිස සැලසුම් සකස් කිරීම කිරීම වේගවත්ව සිදු කළ යුතුයි. ඊට ප්‍රධානම හේතුව වන්නේ පරිපූර්ණ හැකියාව සහිත මෘදුකාංග ඉංජිනේරුවකු පුහුණු කිරීම සඳහා අවම වශයෙන් වසර තුනක කාලයක් ද සහායක තාක්ෂණවේදියකු බිහිකිරීමට වසරක කාලයක් ද ගත වීමයි.

2014 වන විට තොරතුරු තාක්ෂණ (ICT) ශ්‍රම බළකාය 82,854ක වර්ධනයක් පෙන්වනවා. 2018 සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ මුළු තොරතුරු තාක්ෂණ (ICT) ශ්‍රම බළකාය 124,873 ක්. මුළු ශ්‍රම බළකාය තුළ මෘදුකාංග ඉංජිනේරුවන්ගේ ප්‍රතිශතය 38.76% වීම විශේෂත්වයක්. විදේශ විනිමය ඉපයීම සඳහා සෘජුව දායක විය හැකි මෘදුකාංග ඉංජිනේරුවන් ගණන 2018 වන විට 48,400 ක්. එම මෘදුකාංග ඉංජිනේරුවන් සංඛ්‍යාව බිහි වන්නේ වසර 30ක පමණ කාලයක් තුළයි. මෙය වසරකට මෘදුකාංග ඉංජිනේරුවන් 1600 ක සාමාන්‍යයක්. ICT උපාධි පාඨමාලා හරහා රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් බිහිවුණු උපාධිධාරීන් සංඛ්‍යාව හා විදේශ රටවලින් උපාධි ලැබූ සංඛ්‍යාවත් සැලකූ විට මෙම ගණනය කිරීම නිවැරදිව බව තහවුරු වෙලා තිබෙනවා.

මේ වන විට ශ්‍රී ලංකාවේ බොහොමයක් විශ්වවිද්‍යාලයන්හි තොරතුරු තාක්ෂණය සඳහා සකස් වී ඇති තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලා අධ්‍යාපනික සුදුසුකම් අරමුණු කොටගෙන නිර්මාණය වූවක්. වෘත්තීමය කුසලතා වර්ධනය සඳහා ලබා දී ඇත්තේ අඩු අවධානයක් බව පැහැදිලියි. ඉහළ තාක්ෂණික කුසලතා වර්ධනය සඳහා අවශ්‍ය මෘදුකාංග ඉන්ජිනේරු උපාධි පාඨමාලා ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඇත්තේ කැලණිය විශ්වවිද්‍යාලය හා විවෘත විශ්වවිද්‍යාලයේ පමණයි. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන හා විශ්වවිද්‍යාල සියල්ල එක්ව වසරකට බිහි කරනුයේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උපාධිධාරීන් 5000 කට අඩු ප්‍රමාණයක්.

**● ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන ලබාදෙන තොරතුරු තාක්‍ෂණ උපාධි පාඨමාලාවලින් තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් බිහි කිරීමට හැකියාවක් තියෙනව ද?**

මෙතෙක් කාලයක් එහෙම තමයි සිදු වුණේ. නමුත් 2025 වන විට ඩොලර් බිලියන 3ක අපනයන ඉලක්කයක් කරා ගෙනයන්න මෙතෙක් කල් වෘත්තිකයින් බිහි කළ ක්‍රමයට හැකියාවක් නැති බව කියන්නට ඕනෑ. මේ වන විට රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන වන රජයේ විශ්වවිද්‍යාල, APIIT, ICBT, IIT, SLIIT, NSBM, NIBM හා Java Institute යන ආයතන මෘදුකාංග ඉංජිනේරු උපාධි පාඨමාලා හා තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලා රාශියක් හඳුන්වා දී තිබෙනවා. එම පාඨමාලාවන්හි විෂයමාලා සකස් කර ඇති ආකාරය නිරීක්ෂණය කළ විට පෙනී යන්නේ බොහෝ උපාධි පාඨමාලා පශ්චාත් උපාධි සුදුසුකම් අරමුණු කොට සකස් කර ඇති බවයි. උපාධිය නිම වූ වහාම තොරතුරු තාක්ෂණ ශිල්පියකු ලෙස රැකියාවකට අවශ්‍ය කුසලතා වර්ධනයට අඩු අවධානයක් යොමු කොට ඇති බවත්. දිනෙන් දින අලුත් වන තාක්ෂණයට ගැළපෙන පරිදී විෂය කරුණු උපාධි විෂයමාලා සඳහා ඇතුළත් කිරීම අතිශයින් අපහසු කාර්යයක්. එනිසා මේ උපාධි පාඨමාලා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ආකෘතියකට සකස් කර දැනුම හා කුසලතා ස්වයං වර්ධනයක් සිදු වන ආකාරයට විශ්වවිද්‍යාල සිසුන් පුහුණු කළ යුතුයි. ඒ සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය අනිවාර්යයෙන්ම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සිසුනට ලබා දිය යුතුයි. මෘදුකාංග ඉංජිනේරු විෂයමාලා අපේ රටට ගැළපෙන ආකාරයට අපේ රටේම නිර්මාණය කර ගැනීම වැදගත්.

## රටේ ආර්ථිකය නඟාසිටුවීමට කටයුතු කිරීම රජයේත් පෞද්ගලික අංශයේත් වගකීමක්



## තරුණ පරපුරට තොරතුරු තාක්ෂණ දැනුම පමණක් ප්‍රමාණවත් නැහැ

**● ශ්‍රී ලංකාවේ රජයේ හා පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන මඟින් ලබා දෙන තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලා හරහා සෞභාග්‍යයේ දැක්ම අරමුණ සාක්ෂාත් කර ගැනීමට ප්‍රමාණවත් ද?**

2018 වන විට ශ්‍රී ලංකාව මෘදුකාංග අපනයනයෙන් රුපියල් බිලියනයක ආදායම ඉක්මවනවා. 2018 වන විට ශ්‍රී ලංකාවේ මුළු තොරතුරු ශ්‍රම බළකාය 124,873 ක්. එවිට බිලියන 3ක මෘදුකාංග අපනයනයක් කිරීමට නම් මෙම ශ්‍රම බළකාය තුන් ගුණයකින් ඉහළ නැංවීමට සිදුවෙනවා. එනිසා ශ්‍රම බළකාය 374,619 දක්වා ඉහළ දැමීමට සිදුවනවා. එනම් ඉදිරි වසර තුන සඳහා වසරකට තොරතුරු තාක්ෂණ ශිල්පීන් 93,654 බිහි කිරීමට සිදු වෙනවා. 2002 වසරේ සිටම වසරකට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ශ්‍රම බළකාය වර්ධනය වී තිබෙන්නේ වසරකට 7500කට ආසන්න අගයකින්. එනිසා වසරකට තොරතුරු තාක්ෂණ ශිල්පීන් 93,654 බිහි කිරීමට රාජ්‍ය අනුග්‍රහය ඇතිව ප්‍රබල ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සිදුවෙනවා. බිලියන 3 ක මෘදුකාංග අපනයන ඉලක්කයක් සපුරා ගැනීමට නම් අවශ්‍ය වන මෘදුකාංග ඉංජිනේරුවන් ප්‍රමාණය 145,263ක්. එනම් වසරකට මෘදුකාංග ඉංජිනේරුවන් අවම වශයෙන් 36,315 ක් බිහි කිරීමට සිදුවෙනවා. ඒ කියන්නේ දැනට රජයේ මුළු විශ්වවිද්‍යාල පද්ධතියටම ඇතුළත් කර ගන්නා සිසුන් ගණනට සමාන ප්‍රමාණයක්. දැනට ශ්‍රී ලංකාව තුළ වසරකට මෘදුකාංග ඉංජිනේරුවන් ලෙසම උපාධි ලබන පිරිස 1000කටත් වඩා අඩුයි.

**● 2025 වන විට මෘදුකාංග අපනයන ඉල්ලක්කය වන ඩොලර් බිලියන 3 සපුරා ගැනීමට නම් ඔබ විසින් ගෙනෙනු ලබන යෝජනා මොනවා ද?**

අතිශයින් දුෂ්කරම කාර්යය මෘදුකාංග ඉංජිනේරුවන් බිහි කරන එකයි. මෘදුකාංග ඉංජිනේරුවන් බිහිකිරීම සාර්ථක කර ගැනීමට හැකි වුවහොත් අනෙකුත් තොරතුරු තාක්ෂණ ශිල්පීන් අවශ්‍ය පරිදි ස්වාභාවිකව බිහි වෙන එක ගැන සැකයක් නැහැ. එනිසා වසරකට අවශ්‍ය මෘදුකාංග ඉංජිනේරුවන් බිහි කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ඇතිව දැවැන්ත වැඩපිළිවෙළක් දියත් කිරීමට සිදු වෙනවා. මෙය රාජ්‍ය යාන්ත්‍රණයට පමණක් තනිවම කරන්න හැකියාවක් නැහැ. පෞද්ගලික අංශයත් හවුල් කර ගන්න වෙනවා.

වසර පහකට පසු ගෙවීමට හැකි වන පරිදි දැනට ක්‍රියාත්මක වන පොලී රහිත ශිෂ්‍ය ණය ක්‍රමය තවදුරටත් වේගවත්ව පුළුල් කරන්න වෙනවා.

ශ්‍රී ලංකාවේ දැනට NVQ in ICT කියන පාඨමාලාව 6 වන මට්ටමට පමණයි තිබෙන්නේ. මේ මට්ටම වෙනත් රටවල මෙන් 7 , 8 හා 9 මට්ටම්වලටම දියුණු කරන්න වෙනවා.

මෘදුකාංග ඉංජිනේරුවන් බිහි කරන්න NVQ 5,6,7 පාඨමාලා ඉක්මනින්ම ආරම්භ කරන්න වෙනවා. වෙනත් රටවල අපොස සාමාන්‍ය පෙළෙන් පසුව කෙටි කාලීන මූලික අධ්‍යාපනයකින් පසුව උපාධි පාඨමාලා ආරම්භ කරන්න පුළුවන්. අද ICT කියන්නේ හුගක් අමාරු විෂයක් නොවෙයි. එනිසා අපොස සාමාන්‍ය පෙළෙන් පසුව NVQ 5 පාඨමාලාව කරන්න අවසර දෙන්න අත්‍යාවශ්‍යයි. NVQ 5 in ICT පාඨමාලාව සඳහා දැනට පවතින ශිෂ්‍ය ණය ක්‍රමය හඳුන්වලා දීලා පෞද්ගලික අංශය සහභාගි කර ගන්නට ඕනෑ.

වෘත්තීය පුහුණු අධිකාරියට හා නයිටා ආයතනයට වැඩි වැටුප් සහිතව ගුරුවරුන් බඳවා ගන්න අවශ්‍යයි. දැනට පවතින වැටුප් තලවලට හොඳ තොරතුරු තාක්ෂණ ගුරු වෘත්තිකයින් බඳවා ගැනීමට කිසිම හැකියාවක් නැහැ.

පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් විශ්වවිද්‍යාලයක් හැටියට පිළිගැනීමට වර්ග අඩි 50,000 ක ගොඩනැඟිලි සීමාවක් පනවලා තියෙනවා. නමුත් පෞද්ගලික විශ්වවිද්‍යාලයක් ආරම්භක අවස්ථාවේදී එතරම් විශාල ගොඩනැඟිලි ප්‍රමාණයකට ආයෝජනය කිරීම ආයෝජකයාට ප්‍රතිලාභයක් නැහැ. ඇත්තටම අද විශ්වවිද්‍යාල පවත්වන්න භූමියක අවශ්‍යතාවයක් නැති තරමටම ලෝකය දියුණු වෙලා. වර්චුවල් විශ්වවිද්‍යාල ආරම්භ වෙලා තියෙනවා. මෙවැනි විභවයක් තිබෙන පෞද්ගලික අධ්‍යාපන ආයතන හඳුනාගෙන එම ආයතනවල තත්ත්ව නියාමනය කිරීමට ක්‍රමවේදයක් සකස් කරලා උපාධි ලබාදිය හැකි මට්ටමට වේගයෙන් පරිවර්තනය කිරීමට සිදු වෙනවා.

## SLQF සුදුසුකම උසස් අධ්‍යාපන අමාත්‍යංශය විසින් නිර්මාණය කොට අවසන්

අද අමෙරිකාවේ ඕනෑම මොහොතක උසස් අධ්‍යාපන ආයතනයක් "විශ්වවිද්‍යාලය" කියන නම ඇතිව ලියාපදිංචි කරන්න පුළුවන්. ලංකාවේ විශ්වවිද්‍යාලය කියන නම ලබා දෙන්නේ නැහැ. මේ තත්ත්වය ගෝලීය වශයෙන් විශාල අවාසියක්. විශ්වවිද්‍යාලය යන නම ලැබුණ නිසාම එම ආයතනයට පිළිගැනීමක් එන්නේ නැහැ. ඒ සඳහා විශාල අන්තර්ජාතික ප්‍රමිතිකරණයකට අනුගත වෙන්න සිදු වෙනවා.

එහෙත් විශ්වවිද්‍යාල කියන නාමය සහිතව ලියාපදිංචිය ලැබුණොත් පෞද්ගලික ආයෝජකයාට එම ආයතනය අන්තර්ජාතික මට්ටමට දියුණු කරන්න විශාල අවස්ථාවක් ලැබෙනවා. මේ දේ කරන්න පුළුවන් වුණොත් විශාල වශයෙන් විදේශ විනිමය ප්‍රේෂණය නතර කරන්න හැකියාව ලැබෙනවා.

SLQF සුදුසුකම මේ වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය නිර්මාණය කොට අවසන්. මේ හරහා පෞද්ගලික අංශයට විශ්වවිද්‍යාල තත්ත්වය සහිතව කටයුතු කිරීමට හැකියාව ලැබෙනවා. එහෙත් එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ස්වභාවයක් පෙනෙන්නට තියෙනවා. එනිසා මේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුයි.

**සුභාෂිණී සේනානායක**




# ඇතුවත් බැරි නැතුවත් බැරි සීනි

ඇතුවත් බැරි නැතුවත් බැරි දේ බොහෝය. සීනි ඉන් එකක්ය. කොතැනත් පාහේ එය එසේමය. සමාජයේ කුඩාම ඒකකය කියන්නේ පවුලටය. එහි මුළුතැන්ගෙයි සීනි බෝතලයක් නැති ගෙයක් නැති තරම්ය.

එපමණක් නොවේය. ඉන් එහාටත් එසේමය. කෙළින්ම සීනි අපූරු විදියට නොවුණත් ඒවායෙන් සෑදූ ආහාර පාන පමණක් එමටය. මගතොටේදී කොතෙකුත් ඒ වග දැකිය හැකිය.

කඩපිලේදී, බස් රියේදී, දුම්රියේදී පමණක් නොව රැකියා ස්ථානවලදී ද දිනපතා මෙරට එක් එක් තැනැත්තා ගිල දමන සීනි ප්‍රමාණය සුළු පටු නොවේ ය. එහෙත් ඒ සීනි භාවිතයේ සීමාමායිම් පිළිබඳ හරි හැටි නොදන්නාකම නිසා ය.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ අවධාරණය කිරීමට අනුව සෑම තැනැත්තෙක්ම දිනකට භාවිතා කරන සීනි ප්‍රමාණය හැඳි 6කට සීමා කළ යුතු වන්නේය. බොහෝ රටවල් එය ඉහළින් පිළිගත්ත ද ඇතැම් රටවල් එතරම් එය නොසලකන්නේ නොදැනුවත්කම නිසා ය.

එහෙත් එහි විපාක හරිහැටි දන්නේ නම් දෝතට ගන්නා ආහාර පාන හැම එකකම සීනි අන්තර්ගතය පිළිබඳ දෙතුන් වරක් සලකා බලනවා සිකුරුය.

මෙරට හුග දෙනෙක් කලින් සඳහන් කළ පරිදි දිනකට පරිභෝජනය කළ යුතු සීනි ප්‍රමාණය මෙන් දෙතුන් ගුණයකට වඩා ගිල දමනවාය. ඒ සෞඛ්‍ය අංශ වෙතින් කලක සිටම දැල්වෙන රතු එළියක්ය.

කොතරම් දැනුවත් කළ ද තවමත් සැලකිය යුතු පිරිසක් ඒ පුරුද්දේ ඇලී ගැලී සිටින වග රහසක් නොවේය. එක අතකට එහි පුදුම වන්නට දෙයක් නැත. ඒ ලෝකයේ භයානකම ඇබ්බැහිකාරක මත්ද්‍රව්‍යයක් විදියට සැලකෙන කොකේන් මෙන් සීනි රසට දිව ඉක්මනින්ම හුරු වන නිසාය.

විශේෂයෙන් කුඩා දරුවන් ඒ කෙරෙහි වහා ආකර්ෂණය වෙනවාය. ඉදින්, ආදරයටය කියා වැඩිහිටියන් දරුවන්ට ගෙන ගොස් දෙන්නේම පැණි රසය. පැණි රස අතුරෙන් අංක එකට පත් වී සිටින්නේ හරි හරියට සීනි කළවම් කළ කඩචෝරු ජාතිය.

සීනිය කීවාට ඒ කඩපිලෙන් ගෙදර ගෙනෙනා සුදු හෝ දුඹුරු සීනි ද නොවේය. බොහෝ ආනයනික පැණි රසවල අන්තර්ගතව ඇත්තේ ඊටත් වඩා බෙහෙවින් අහිතකර පැණි රසය. එය දෙස් විදෙස් පර්යේෂණ මඟින් හෙළිදරව් කරගෙන තිබෙන්නකි.

ලැක්ටෝස් සීනි එවැන්නකි. ද්‍රාවණයක් වශයෙන් ද පැණි රස උතුරන අයුරින් කෘත්‍රිමව ඉතා අඩු පිරිවැයකින් නිපදවා ගත හැකි වන එක් පැණි රසයකි. ඒ සැබැවින්ම ලෝකයෙන් සීනිවලට එසේත් නැතිනම් පැණි රසට පවතින ඉහළ ඉල්ලුම හමුවේ උපරිම ලාභ අපේක්ෂා කරන කර්මාන්තකරුවන් රැසක්ම යොමු වී සිටින්නේ ඒ ලාභ විකල්පය දෙසටය. එයින් දිනකට ටොන් ගණන් පැණි රස විච්චූර්ණ කෑම බීම නිපදවිය හැකිය.

එහෙත් ඒ වගක් ඒවායේ ආකර්ෂණීය අසුරණවලින් හඳුනාගත නොහැකිය. නිතර දෙවේලේ ජනමාධ්‍ය ඇතුළු සියලුම ප්‍රචාරණ මාධ්‍ය හරහා ඊට පුළුල් ප්‍රචාරයක් දීමටත් ඒ ඒ නිෂ්පාදකයෝ නොපැකිළෙති.

ඔයින් මෙයින් දැන් දැන් අපේ රටේ හුග දෙනකුට ද වැඩ වැරදී ඇතුවාය. ඒ අධික සීනි භාවිතය නිසා වැලඳෙන දියවැඩියාව ආදී බෝ නොවන රෝගවලට ගොදුරු වීමෙනි.

මෙරට සිදු වන මරණවලින් බොහොමයක් සිදු වන්නේ ඒවායේ බලපෑමෙනි. අකාලයේ ජීවිතයෙන් සමුගන්නට සිදුවීම වැරදි ආහාර පුරුදු නිසා සිදුවේ නම් උගත් බුද්ධිමත් සත්ත්ව කොට්ඨාසයක් වශයෙන් මිනිසා ඒ පිළිබඳ නැවත නැවත සිතා බැලිය යුතුව ඇත.

වයස්ගත වන විට ලෙඩ රෝග ඇති වන බව කියමින් මේ ඇත්ත යටපත් කළ නොහැකිය. ඒ දැන් ළමා පරපුර අතුරෙන්ද සැලකිය යුතු මට්ටමකින් දියවැඩියා අවදානම් කාණ්ඩ හඳුනා ගැනෙන හෙයිනි. අනෙක, අද බොහෝ කුඩා දරුවන් කෙරෙන් හඳුනාගත හැකිව තිබෙන දන්ත වෛද්‍ය ගැටලුය. අකාලයේ දත් දිරායෑම, දත් නරක්වීම වැනි බොහෝ ප්‍රශ්නවලට සීනි මූලික සාධකයකි. ඉවක් බවක් නැතිව දවස තිස්සේ කෘත්‍රිමව නිපද වූ සීනි එසේත් නැතිනම් පැණි රස යෙදූ ආහාරපාන ඊට හේතුවකි.

මෙරට කඩපිලට නො එසේ නම් සුපිරි වෙළෙඳසැලට කරපොවා බැලුව ද එහි බරපතළකම හොඳින් පෙනේය. ඒ කවුරු කවුරුත් වැඩිපුර ඇඟෑලුම්කම් පාන්නේ සුදු සීනි මිටියට වන හෙයිනි. එහෙත් සීනි සුදු පාටට හැරවීමේ ක්‍රියාවලියේදී ඊට පිළිකාකාරක ද එක්වන වග තවම හුගදෙනෙක් නොදන්නා ගානය.

එසේම, ඊට වඩා දුඹුරු සීනි පරිභෝජනය සෞඛ්‍යාරක්ෂිත බව ද එතරම් සමාජගත වී නැති සැටියකි. ඒ දෙකෙහි මිල පරතරය ද සලකා වඩා ලාභදායී ඉතා කුඩාවට කුඩු කළ සීනි දෙසටය තවමත් වැඩි දෙනෙක් ඇදී යන්නේ. එහෙත් නුදුරේදීම මෙරට තුළ රටට වුවමනා තරම් දුඹුරු සීනි නිෂ්පාදනය කළ හැකි බව ලංකා සීනි සමාගම පවසයි. එය රටට සුභාරංචියක් වනු ඇත. එතනින්වත් මෙරට සීනි කෑම පිළිබඳ කතාව වෙනත් අතකට හැරවිය හැකි නම් ඉන් මතු පරපුරට සෙතක්ම අත්වනු ඇත.

**නුවන් මහේෂ් ජයවික්‍රම**

# ප්‍රතිකාර කරන්න නව රෝහල් සහ ආයතන 32ක්

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 ආසාදිතයන්ට ප්‍රතිකාර කිරීම සඳහා විශේෂිත රෝහල්, ඒකක සහ ආයතන අලුතින් 32ක් ස්ථාපිත කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කරයි.

ශ්‍රී ලංකා කොවිඩ් හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය මගින් මේ විශේෂිත රෝහල්, ඒකක සහ ආයතන කඩිනමින් ස්ථාපිත කරන බව එම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ වෛද්‍ය ජයසුන්දර බණ්ඩාර මහතා පැවසුවේය.

කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ විශේෂිත රෝහල්, ඒකක සහ ආයතන දැනට 20ක් පවතින අතර අලුතින් 32ක් ස්ථාපිත කිරීමත් සමඟ එම සංඛ්‍යාව 52ක් දක්වා ඉහළ යන බවද ඒ මහතා ප්‍රකාශ කළේය. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා කොවිඩ් හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වේ.

# නීතිපති කැනඩා මහ කොමසාරිස් ධුරය එපා කියයි

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

කැනඩාවේ මහ කොමසාරිස්වරයා ලෙස ලද පත්වීම භාර නොගැනීමට නීතිපති දප්පුල ද ලිවේරා මහතා තීරණය කර ඇති බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනී රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙණෙවිය දිනමිණට ඊයේ (6) ප්‍රකාශ කළාය. තමන් කැනඩාවේ මහ කොමසාරිස්වරයා ලෙස පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ස්තුතිවන්ත වන නමුත් එම තනතුර භාර නොගෙන ශ්‍රී ලංකාවට තමන්ගේ සේවාව දීමට බලාපොරොත්තු වන බව නීතිපතිවරයා ජනාධිපතිවරයාට දැනුම් දුන් බවත් ජයරත්න මෙණෙවිය පැවසුවාය.

# ජනපතිගේ කැබිනට් පත්‍රිකාවෙන් රණවිරුවන්ට හිමි සහන අප්‍රේල් 27 සිටම

**නුවන් කොඩිකාර**

ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය විවාහක ත්‍රිවිධ හමුදා සහ පොලිස් සාමාජිකයන්ගේ වැන්දඹුවන් හට මිය ගිය සාමාජිකයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනට හිමිගන්වන වැටුප් හා දීමනාවල එකතුව නොවෙනස්ව වැන්දඹුවන් ජීවත්ව සිටින තෙක් ගෙවීම ඇතුළු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ යෝජනා 7කින් සමන්විත අමාත්‍ය මණ්ඩල සන්දේශ දෙකටම ඇමැති මණ්ඩලයේ අනුමැතිය හිමිව තිබේ. ඒ අනුව අප්‍රේල් මස 27 වැනිදා සිටම එම සහන ගෙවීමට පියවර ගන්නැයි ජනාධිපතිවරයා ආරක්ෂක අමාත්‍යාංශයට උපදෙස් දී ඇත.

ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් මියගිය විවාහක, අවිවාහක ත්‍රිවිධ හමුදා, පොලිස් සාමාජිකයන්ගේ මව්පියන් වෙත සාමාජිකයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ දින සිට මව්පියන් ජීවත්ව සිටින තෙක් රුපියල් 25,000ක මාසික දීමනාවක් හිමිගැන්වීම, ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් ආබාධිතව සේවයෙන් ඉවත් වූ ත්‍රිවිධ හමුදා, පොලිස් සාමාජිකයන් වෙත මේ වන විටත් ජීවිතාන්තය දක්වා ගෙවන වැටුප් හා දීමනා ඔවුන් මියගිය විට ඔවුන්ගේ යැපෙන්නන් වෙත ගෙවීම, ත්‍රස්ත ක්‍රියා නොවන වෙනත් මෙහෙයුම් රාජකාරිවල යෙදී සිටියදීත් ආබාධිත ත්‍රිවිධ හමුදා, පොලිස් සාමාජිකයන් වෙත සහ මිය ගිය සාමාජිකයන්ගේ යැපෙන්නන් වෙත අදාළ සිදු වීම් පිළිබඳ කමිටුවක් මගින් පරීක්ෂා කර බලා එම අය සහ යැපෙන්නන් වෙත ද වයස 55 සම්පූර්ණ වූ දිනට හිමි වූ වැටුප් හා දීමනා නොවෙනස්ව හිමි ගැන්වීම, පැවති යුද්මය වාතාවරණයේ ප්‍රතිඵලයක් ලෙස වූ පශ්චාත් යුද ක්‍රියාකාරකම් (පුපුරන ද්‍රව්‍ය ඉවත් කිරීම වැනි) කාර්යයක නිරත වීමේදී ආබාධිත වූ, මිය ගිය ත්‍රිවිධ හමුදා, පොලිස් සාමාජිකයන් වෙත අදාළ සිදුවීම පිළිබඳ කමිටුවක් මගින් පරීක්ෂා කර බලා එම අය හා යැපෙන්නන් වෙත ජීවිතාන්තය දක්වා වයස 55 සම්පූර්ණ වූ දිනට හිමි වූ වැටුප් හා දීමනා නොවෙනස්ව හිමි ගැන්වීම, ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් ආබාධිතව සේවයෙන් ඉවත් වූ ත්‍රිවිධ හමුදා, පොලිස් සාමාජිකයන් වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට පෙර මියගිය හොත් ඔවුන් අවුරුදු 55 තෙක් ජීවත්ව සිටින්නේ යැයි සලකමින් ඒ දක්වා වැටුප් හා දීමනා ඔවුන්ගේ යැපෙන්නන් වෙත හිමි ගැන්වීම හා ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් ආබාධිතව එම ආබාධිත බවින් ඇති වූ මානසික ව්‍යාකූලතාවක් නිසා සිය දිවි නසා ගත් සාමාජිකයකුට (වයස 55 තෙක්) අයත් වැටුප් හා දීමනා ඔවුන්ගේ යැපෙන්නන් වෙත හිමි ගැන්වීම යන යෝජනා ක්‍රියාත්මක කිරීමට අනුමැතිය හිමිව තිබේ.

# අනුරපුර බැංකුවක් අසල වෙඩි හුවමාරුවක්

## ATM සේප්පුව ගෙනියන්න ඇවිත්

## ආරක්ෂක නිලධාරියකුට තුවාල

**අනුරාධපුර මධ්‍යම විශේෂ සහ හිදෝගම සමූහ**

රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා මුදල් ප්‍රවාහනය කරන පෞද්ගලික සමාගමක ආරක්ෂක අංශ නිලධාරීන්ට මිරිස් කුඩු ප්‍රහාරයක් එල්ල කර රුපියල් ලක්ෂ 120ක ටෙලර් යන්ත්‍ර සේප්පුවක් කොල්ලකෑමට උත්සාහ කළ නාඳුනන කොල්ලකරුවන් දෙදෙනකු සමඟ ඇති වූ වෙඩි හුවමාරුවකින් ඊයේ (6) උදෑසන ආරක්ෂක අංශ නිලධාරියකු තුවාල ලබා අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කළ බව අනුරාධපුර මූලස්ථාන පොලිසියේ අපරාධ විමර්ශන අංශය පවසයි.

අනුරාධපුර නව නගරයේ සිව්වැනි පටුමගේ පිහිටි සම්පත් බැංකු ශාඛාවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයට මුදල් තැම්පත් කිරීමට පැමිණි පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් හා කොල්ලකරුවන් අතර වෙඩි හුවමාරුවක් වී තිබේ. වෙඩි හුවමාරුවෙන් ආරක්ෂක නිලධාරියකු තුවාල ලබා තිබෙන අතර, ආරක්ෂක නිලධාරීන්ගේ දක්ෂතාව නිසා කොල්ලකරුවන් යතුරු පැදියේ නැගී පලා ගොස් තිබේ. ආරක්ෂක නිලධාරීන්ගේ ප්‍රහාරයෙන් කොල්ලකරුවකුත් තුවාල ලබා ඇති බවට සැක මතුව තිබෙන බව පරීක්ෂණ කරන පොලිසිය පවසයි.

ඊයේ (6) උදෑසන 6.30ට පමණ සිද්ධිය සිදුව තිබෙන අතර, ආරක්ෂක අංශ නිලධාරීන් අර්ධ ස්වයංක්‍රීය ගිනි අවි සමඟ අදාළ බැංකුවේ ඉදිරිපිට වෑන් රථය නවතා යන්ත්‍රයේ කුටියට මුදල් තැම්පත් කිරීමට සූදානම් වෙද්දී කොල්ලකරුවෙක් එහි පැමිණ ආරක්ෂක නිලධාරියා අත වූ කුඩා සේප්පුව පැහැර ගැනීමට පොරබදා තිබේ. පසුව ඔවුන්ගේ මුහුණට මිරිස් කුඩු ප්‍රහාරයක් එල්ල කර ඇති අතර, වහාම ක්‍රියාත්මක වූ ආරක්ෂක අංශ නිලධාරියකු විසින් ඔහු අත වූ රිපීටර් වර්ගයේ අවියෙන් යතුරු පැදියෙන් පලා යෑමට උත්සාහ කළ කොල්ලකරුවන් දෙසට වෙඩි තබා තිබේ.

ඒ අවස්ථාවේ කොල්ලකරුත් ඔහු අත වූ පිස්තෝලයකින් ආරක්ෂක අංශ නිලධාරීන් දෙසට වෙඩි තබා පලා ගොස් තිබෙන අතර, කොල්ලයට පැමිණි සැකකරුවන් මුහුණු අවරණය වන පරිදි ආරක්ෂිත හිස් වැසුම් පළඳාගෙන සිට ඇති බව පොලිසිය පවසයි. සැකකරුවන් පැමිණ නැවත පලා යන අයුරු පරීක්ෂණ කරන පොලිසිය අනුරාධපුර නව නගරයේ ඇති ආරක්ෂිත කැමරා කිහිපයකින්ම නිරීක්ෂණය කර තිබෙන අතර, ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා පුළුල් විමර්ශනයක් අරඹා තිබේ.

පලාගිය කොල්ලකරුවකුට එල්ල කළ වෙඩි ප්‍රහාරයෙන් තුවාල වන්නට ඇති බවට පෞද්ගලික ආරක්ෂක අංශ නිලධාරීන් තහවුරු කරයි. සිද්ධිය සම්බන්ධයෙන් අනුරාධපුර ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මහේස්ත්‍රාත්වරයා එහි පැමිණ ස්ථානීය පරීක්ෂණයක් කර සැකකරුවන් අත්අඩංගුවට ගන්නා ලෙස පොලිසියට නියෝග කළේය.

උතුරු මැද පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ අනුරාධපුර කොට්ඨාස භාර පොලිස් අධිකාරි කීර්ති ලංකා ගීගනගේ යන මහත්වරුන්ගේ උපදෙස් මත අනුරාධපුර මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඊ. එම්. සංජීව මහානාම මහතාගේ මෙහෙයවීමෙන් අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ජී. විදානගමගේ ඇතුළු අපරාධ ස්ථානාගාරයේ නිලධාරීහු පරීක්ෂණ කරති.

# යහපාලන ආණ්ඩුව සහල් මෝල්වලට ණය දෙන්න ඇරඹූ වැඩසටහනත් අසාර්ථකයි

## ලක්ෂ 10,000න් වැය කර ඇත්තේ ලක්ෂ 4,348යි

**ධනුෂ්ක ගොඩකුඹුර**

සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් හට ණය සහන සැලසීමට යහපාලන රජය 2019 වසරේ පෙබරවාරි මාසයේදී රුපියල් ලක්ෂ 10,000ක් වැය කරමින් ක්‍රියාවට නැංවූ වැඩසටහනෙන් 2019 නොවැම්බර් මස 1 වැනි දින වන විටත් වැය කර ඇත්තේ රුපියල් ලක්ෂ 4,348ක් පමණක් බව විගණන වාර්තාවක් මගින් හෙළි කර තිබේ.

දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති වෙත නිකුත් කරන ලද එම රුපියල් ලක්ෂ 4,348න් වැඩිම මුදල වන රුපියල් ලක්ෂ 2,060ක මුදල පොලොන්නරුව දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිතිය වෙත නිකුත් කර ඇති බවත් විගණකාධිපතිවරයා අප්‍රේල් 27 වැනි දින නිකුත් කරන ලද කාර්ය සාධන විගණන වාර්තාවේ සඳහන් වේ.

සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නියෝජනය කරන සමිතියේ සභාපතිවරයාද වන පොලොන්නරුව දිස්ත්‍රික් සමුපකාර සමිතියේ සභාපතිවරයා ඔහුගේ අභිමතය පරිදි එක් එක් මෝල් හිමියාට වී මිලදී ගැනීමට ණය මුදල භාවිත කර ඇති බවත් එහි සඳහන් වේ.

සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් නගා සිටුවීම මගින් සහල්වල සිල්ලර මිල ස්ථාවර කිරීමත් වී ගොවීන් හට සාධාරණ මිලක් දීමත් අපේක්ෂා කර ගනිමින් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා 2019 වසරේ ජනවාරි මස 11 වැනි දින ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවකට අනුව මේ වැඩසටහන ආරම්භ කොට ඇත. අනුරාධපුරය, පොලොන්නරුව, අම්පාර, කුරුණෑගල, පුත්තලම, මහනුවර, හම්බන්තොට සහ මඩකලපුව යන තෝරා ගත් දිස්ත්‍රික්ක අටක ක්‍රියාවට නංවා තිබූ අතර, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් 228 දෙනකු මේ යටතේ ප්‍රතිලාභ ලැබීමට නියමිතව තිබිණි.

# වයිරසය පාලනයට ආයුර්වේද රෝහල් පද්ධතියත් එක් වෙයි

## ඇඳන් 5,000ක්

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් රෝගය පාලනය සඳහා ඇඳන් 5,000කින් සමන්විත ආයුර්වේද රෝහල් පද්ධතිය යොදා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කරයි.

කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන යන මේ මධ්‍යස්ථානයන්හිදී රෝගියාගේ කැමැත්ත අනුව ආයුර්වේද හෝ බටහිර ප්‍රතිකාර ක්‍රම ගත හැකිය.

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය සහ දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති අධිනීතිඥ සිසිර ජයකොඩි මහතා අතර පැවති විශේෂ සාකච්ඡාවකදී ඊයේ (6) මේ තීරණය ගෙන තිබේ.

මේ කටයුතු කඩිනම් කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශ දෙකෙහි ලේකම්වරියන් දෙදෙනා ඇතුළු පස්දෙනකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටුව මගින් සතියක කාලයක් තුළදී අදාළ කටයුතු සංවිධාන කිරීමට යෝජිතය.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූලික අධීක්ෂණය යටතේ ආයුර්වේද රෝහල් අතරමැදි සත්කාර සේවා මධ්‍යස්ථාන ලෙස මේවා භාවිත කෙරේ.

කොවිඩ් රෝගය පාලනය සඳහා ආයුර්වේදය සහ බටහිර වෛද්‍ය සේවා එක්ව කටයුතු කිරීමේ අවශ්‍යතාවද මෙහිදී සාකච්ඡාවට ලක් කෙරිණ.

රෝගීන්ට අගතියක් නොවන පරිදි තීන්දු තීරණ ගැනීමේ වැදගත්කම ඇමැතිවරිය විසින් මෙහිදී පෙන්වා දුන් අතර, දෙපාර්ශ්වය එක්ව කටයුතු කිරීමේ ක්‍රමවේදය සකස් කර ගැනීමට මෙහිදී උපදෙස් දීම කෙරිණ.

කොවිඩ් රෝගීන් හැසිරවීම පිළිබඳ මූලික පුහුණුවක් ආයුර්වේද වෛද්‍ය කාර්ය මණ්ඩලයට දීමටත්, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වෛද්‍ය නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ ආයුර්වේද අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන පවත්වා ගැනීමටත් එකඟ විය.

මේ කටයුතු ක්‍රමවත් කිරීම සඳහා විශේෂ උපදෙස් මාලාවක් නිකුත් කිරීමට සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත රාජ්‍ය ඇමැතිවරිය උපදෙස් දුන් අතර, සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ආයුර්වේද රෝහල් දීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසද ඇමැතිවරිය මෙහිදී ඉල්ලීමක් කළාය.

හෙද කාර්ය මණ්ඩලයක්ද සිටින ආයුර්වේද රෝහල් පද්ධතිය තුළ වෛද්‍යවරුන් 2,000ක පමණ පිරිසක් සිටින බවත් ඔවුන්ගේ සේවය කොවිඩ් මර්දනය සඳහා යොදා ගැනීමටද මෙහිදී තීරණය විය.

මේ සාකච්ඡාවට ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සුනේත්‍රා ගුණවර්ධන, දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් කුමාරි වීරසේකර, ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සමන් රත්නායක, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන, නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) විශේෂඥ වෛද්‍ය ලාල් පනාපිටිය, නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සේනක පිලපිටිය, ආයුර්වේද වෛද්‍ය සංගමයේ සභාපති වෛද්‍ය එස්. කේ. පී. තරංග යන මහත්ම මහත්මීහු සහභාගි වූහ.

# නිරෝධායන රීති කැඩූ තරුණයෝ යාපනයේ යකා නටති

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනය නගරයේ මුව ආවරණ නොමැතිව පැමිණි තරුණයන් පිරිසක් අත්අඩංගුවට ගැනීමට යෑමේදී පොලිසිය සමඟ ඔවුන් විශාල ආරවුලක් ඇති කර ගැනීම නිසා පොලිස් නිලධාරීන් ඔවුන්ව ඔසවා ගෙන ගොස් අත්අඩංගුවට ගෙන තිබේ.

යාපනය නගරයට කිසිදු අවශ්‍යතාවක් නොමැතිව මේ තරුණයන් පිරිස පැමිණ ඇත්තේ විනෝදයටය.

පොලිසිය මුව ආවරණ නොමැතිව පැමිණි මේ තරුණයන්ගෙන් ප්‍රශ්න කොට ඔවුන් වරදකරුවන් නිසා අත්අඩංගුවට ගැනීමට යෑමේදී යළිත් පොලිසිය සමඟ බහින්බස් වෙමින් බිම වැතිරී විරෝධය පළ කරන්නට පටන් ගෙන තිබේ.

පසුව පොලිස් නිලධාරීන් ඔවුන්ව ඔසවා ගෙන ගොස් වාහනවල පටවා පොලිසියට රැගෙන ගොස් තිබේ.

යාපනය පොලිසිය විසින් මේ තරුණයන් සමඟ යාපනයේ කොරෝනා නීතිරීති උල්ලංඝනය කළ තවත් 42ක් අත්අඩංගුවට ගෙන ඔවුන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේ.

# රුවන්පුර අධිවේගයේ ඉදි කිරීම් අද ඇරඹේ

**ක්‍රිසන්ති විතාරණ**

ශ්‍රී ලංකාවේ ඉදි කෙරෙන හත්වැනි අධිවේගී මාර්ගය වන රුවන්පුර අධිවේගී මාර්ගයේ පළමු අදියර වන කහතුඩුවේ සිට ඉංගිරිය දක්වා කොටසේ වැඩ කටයුතු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ට යටත්ව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ සිට නව තාක්ෂණය භාවිත කරමින් අද (7) ආරම්භ කෙරේ.

යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය දක්ෂිණ අධිවේගී මාර්ගයේ කහතුඩුව අන්තර් හුවමාරු මධ්‍යස්ථානය අසලින් ආරම්භ වී ඉංගිරිය, රත්නපුර හරහා පැල්මඩුල්ල දක්වා ඉදි කෙරේ. මේ රුවන්පුර අධිවේගී මාර්ගයේ සම්පූර්ණ දුර කි.මී. 73.9කි. මේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ යෝජනා වූ ව්‍යාපෘතියකි.

රුවන්පුර අධිවේගී මාර්ගය අදියර 3ක් යටතේ ඉදි කිරීමට නියමිතය. ඒ අනුව එහි පළමු අදියර ලෙස කහතුඩුව සිට ඉංගිරිය දක්වා කි. මී. 24.3ක දුර ප්‍රමාණයක් ඉදිකරනු ලබයි. මාගා ඉංජිනේරු සමාගම මගින් මෙහි ඉදි කිරීම් කටයුතු කරනු ලබයි. මේ සඳහා රුපියල් බිලියන 54.70ක් වැය වේ. ඉදි කිරීම් කාලය මාස 30කි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සංවර්ධනයේ හිණිපෙත්ත කරා ගමන් කරන තිරසර රටක අභිවෘද්ධිය වෙනුවෙන් එහි ජීවත් වන ජනතාවට සහන දෙන මාර්ග පහසුකම් ඉතා ශක්තිමත්ව දීර්ඝ කාලයක් පවතින්නට ඒවා ඉදි කර මහජනතාව වෙත ජනගත කිරීම පවතින රජයේ මහා මාර්ග පිළිබඳ වගකීම බව ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරයි.

# එක් ප්‍රෝටීන වෙනසකින් වයිරසයේ හැසිරීම වෙනස් වෙනවා

## බෝ වීමේ වේගය සහ බරපතළකම වැඩියි

## සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය

**නුවන් කොඩිකාර**

වයිරසයේ එක ප්‍රෝටීනයක වෙනස් වීමකින් පවා එහි හැසිරීමෙහි සැලකිය යුතු වෙනසක් විය හැකි බවත් එවැනි වෙනස් වීම් නිසා බෝ වීමේ වේගය වැඩි වී ආසාදනයෙන් ඇති වන රෝගයේ බරපතළකම වැඩි විය හැකි බවත් සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය පවසයි.

එම නිසා නව කොවිඩ් ප්‍රභේදය ශීඝ්‍රයෙන් පැතිර යමින් තිබෙන හෙයින් වයිරසය ආසාදනය වීම වළකා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ක්‍රම තුනක් අනුගමනය කිරීම වැදගත් බව සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය සඳහන් කරයි.

අධික පිරිසක් ගැවසෙන ස්ථානවල රැඳී නොසිටීම, එකිනෙකා සමීපයේ සිට කතාබස් කරමින් හෝ ආහාර පාන ගැනීමෙන් වැළකී සිටීම සහ හොඳින් වාතාශ්‍රය නොලැබෙන ස්ථානයක රැඳී නොසිටීම මගින් කෝවිඩ් වැළඳීම නතර කර ගත හැකි බවද සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය කියයි.

මෙවැනි ස්ථාන හැකිතාක් දුරට මඟ හැරිය යුතු අතර, යම් අත්‍යවශ්‍ය හේතුවකට එවැනි ස්ථානයකට යෑමට වුව හොත්, එතැන ගත කරන කාලය හැකිතාක් දුරට අවම කර ගැනීම මඟින් අවදානම යම් තාක් දුරකට අඩු කර ගැනීමට හැකි වන බව එම කාර්යාංශය ප්‍රකාශ කරයි.

ප්‍රභේදය කුමක් වුවත් ඔබට ආරක්ෂා වීමට කළ යුත්තේ එම අවදානම් සාධක සහිත ස්ථාන නිවැරදිව හඳුනා ගෙන ඒවා මඟ හැරීමත්, දෑත් නිතර පිරිසුදුව තබා ගැනීම හා නියමිත ආකාරයෙන් මුව ආවරණ පැළඳීම මඟින් කොවිඩ් සම්ප්‍රේෂණ අවදානම බොහෝ දුරකට අඩු කර ගත හැකි බව එම කාර්යාංශය පවසයි.

01 වැනි පිටුවෙන්...

## බත්තුළුඔය විදුහලේ ...

මෙලෙස මියගොස් ඇත්තේ ආරච්චිකට්ටුව මුතුපන්තිය ග්‍රාමයේ පදිංචිව සිටි ඉසුරු මනෝජ් 21 නමැති අයෙකි. පසුගියදා (4) නිකුත් වූ උසස් පෙළ ප්‍රතිඵලවලින් කලා අංශයෙන් සම්මාන තුනක් මේ සිසුවාට හිමිව ඇත. පෙරේදා (5) මේ සිසුවා අන්තර්ජාලය හරහා ප්‍රතිඵල බලා පසුව සිය ඉස්සන් පොකුණට ගොස් ඇති අතර, එහිදී විදුලි සැර වැදී ඇත. පසුව ප්‍රදේශවාසීන් එක්ව මේ දරුවා හලාවත මහා රෝහලට රැගෙන පැමිණ ඇති අතර, එහිදී මියගොස් තිබේ.

උසස් පෙළ විභාගයට පෙනී සිටීමෙන් පසු මේ දරුවා ඉස්සන් වගාවක් ආරම්භ කර ඇති අතර, ඉන් එක් පොකුණක් ඔහු විසින් තනිවද තවත් පොකුණු දෙකක් හවුලේද කර ඇත. මේ දරුවාගේ මවුපියන් නැති අතර, ඔහු රැක බලා ගෙන ඇත්තේද මවගේ සහෝදරියකි.

මේ දරුවා ඉගෙන ගැනීමට අමතරව ක්‍රීඩාද කර ඇති අතර, විද්‍යාලය නියෝජනය කරමින් පළාත් මට්ටම දක්වා ගිය විද්‍යාලයේ කැපී පෙනෙන සිසුවකු වූ බව බත්තුළුඔය මහා විද්‍යාලයේ විදුහල්පති ඩබ්ලිව්. බී. එස්. කේ. තිසේරා මහතා පැවසීය. මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය ඊයේ (6) හලාවත මහ රෝහලේදී කර ඇත. මේ පිළිබඳ ආරච්චිකට්ටුව පොලිසිය හා විදුලි බල මණ්ඩලය විශේෂ පරීක්ෂණයක් ආරම්භ කර තිබේ.

## ධම්මික පැණියේ ...

මීට වසරකට පෙර තමා පැවසූ ආකාරයට අඩුම තරමින් දැඩි සත්කාර ඒකක ඇඳන් ප්‍රමාණය වැඩි කළේ නම් මේ වන විට වත්මන් තත්ත්වයට මුහුණ දීම සඳහා එය ශක්තියක් වනු ඇති බවද රනිල් වික්‍රමසිංහ මහතා කීය.

රනිල් වික්‍රමසිංහ මහතා මේ බව සඳහන් කළේ සූම් තාක්ෂණය ඔස්සේ එක්සත් ජාතික පක්ෂ ජ්‍යෙෂ්ඨයන් සමඟ ඊයේ පෙරවරුවේ පැවැත් වූ සාකච්ඡාවේදීය.

සකස් කර අවසන් කෙරුණු එක්සත් ජාතික පක්ෂ ප්‍රතිසංවිධාන වැඩපිළිවෙළ රනිල් වික්‍රමසිංහ මහතාට දැනුම් දීම සඳහා ඉහත සාකච්ඡාව පැවැත්විණි.

දැනට දිස්ත්‍රික් මට්ටමින් පමණක් කරන පී. සී. ආර්. පරීක්ෂණ අඩුම තරමින් ආසන මට්ටම දක්වා වත් වැඩි කළ යුතු බවද රනිල් වික්‍රමසිංහ මහතා එහිදී සඳහන් කළේය. කුඩා ආසනවලට එක් මධ්‍යස්ථානයක් ප්‍රමාණවත් වුවත් මොනරාගල වැනි විශාල ආසනවලට පී. සී. ආර්. මධ්‍යස්ථාන දෙක තුනක්වත් දිය යුතු බවද වික්‍රමසිංහ මහතා පෙන්වා දුන්නේය.

කොරෝනා රෝගීන් සඳහා දැඩි සත්කාර ඒකක ඇඳන් වැඩි කළ යුතු බව වසරකට පෙර තමා පෙන්වා දුන්නා සේම ඊටත් පෙර එක්සත් ජාතික පක්ෂ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයට පවා එම කාරණා ඇතුළත් කළ බවද වික්‍රමසිංහ මහතා සඳහන් කළේය.

කොරෝනා වසංගතය හමුවේ ලෝක සෞඛ්‍ය සංවිධානය දෙන උපදෙස් අනුව වැඩ කිරීම අනිවාර්ය බව කී රනිල් වික්‍රමසිංහ මහතා වසරකට අධික කාලයක් ධම්මික පැණියේ රස බැලූ රාජපක්ෂ ආණ්ඩුව දැන් බෙල්ලටම හිර වී ඇතැයිද කියා සිටියේය. ඇස්ට්‍රා සෙනිකා කොවිෂීල්ඩ් එන්නතේ දෙවැනි මාත්‍රාව සඳහා වෙනත් එන්නත් වර්ගයක් දීම ලෝක සෞඛ්‍ය සංවිධානය අනුමත කර නැතැයිද සාකච්ඡාවට සහභාගි වූ එජාප සභාපති වජිර අබේවර්ධන මහතා විමසූ පැනයකට පිළිතුරු දෙමින් රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.

## ෆේස්බුක් සාදයක් වටලා ...

මුහුදු බඩ ප්‍රදේශයක පවත්වා ගෙන යන සුරාබදු බලපත්‍ර නොමැති අවන්හලක මේ සාදය පවත්වා ඇති අතර, විදේශිකයන් හා නව යොවුන් වියේ පසු වන විශාල පිරිසක් මීට සහභාගි වී බව පැවසූ එම නිලධාරීන් මොවුන් සමාජ දුරස්ථභාවය හෝ ආරක්ෂිත ක්‍රමෝපායන් කිසිවක් සැලකිල්ලට නොගනිමින් සාදය තුළ හැසිරුණු දක්නට ලැබුණු බව ප්‍රකාශ කළහ.

මේ සාදය සඳහා සහභාගි වන අයවලුන් සඳහා ටිකට් පත සමඟ මත්පැන් විකිණීම කරන බවත් මූලික ප්‍රචාරණ දැන්වීම් තුළ සඳහන් කළ මිල රුපියල් දෙදහසකට ටිකට් පතක් අලෙවි කර ඇති බවත් එම නිලධාරීහු පැවසූහ.

සැකකරු අහංගම ප්‍රදේශයේම පදිංචි වයස අවුරුදු 28ක තරුණයකු වන අතර, සුරාබදු බලපත්‍රයක් නොමැතිව මත්පැන් විකිණීම හා විකිණීම සඳහා මත්පැන් ළඟ තබා ගැනීම යන චෝදනා මත අත්අඩංගුවට ගැනීමෙන් පසු සුරාබදු ඇප මත මුදා හැර, එළඹෙන ඉදිරි දිනකදී මොහු ගාල්ල මහේස්ත්‍රාත් උසාවිය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ හා සුරාබදු කොසමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්) කපිල කුමාරසිංහ හා සුරාබදු අධිකාරි (සුරාබදු විශේෂ මෙහෙයුම් කාර්යාංශයේ - දීපව්‍යාප්ත) චන්න වීරක්කොඩි මහත්වරුන්ගේ උපදෙස් මත සුරාබදු විශේෂ මෙහෙයුම් කාර්යාංශයේ (දීපව්‍යාප්ත) සුරාබදු ස්ථානාධිපති ප්‍රධාන සුරාබදු පරීක්ෂක ප්‍රිමේෂ් ප්‍රනාන්දු මහතාගේ මෙහෙයවීමෙන් සුරාබදු කෝප්‍රල් 773 සුදත් මහතාගේ තොරතුරකට සුරා බදු පරීක්ෂක අකිල රත්මලවින්න මහතා වැටලීම කර ඇති අතර, මේ වැටලීම සඳහා එම ඒකකයට අනියුක්තව රාජකාරි කරන සුරාබදු කෝප්‍රල්වරුන් වන 637 වීරසිංහ, 820 සිසිල්, 828 හර්ෂ, 922 සංජය, 997 නිලන්ත, සුරාබදු නියාමක 1141 රමිත, සුරාබදු නියාමක රියැදුරන් වන හේරත් සහ අනුර යන නිලධාරීහු සහභාගි වූහ.

## ඉන්දියාවේ සිට ...

සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මේ බව සියලු ගුවන් සේවා සමාගම වෙත දැනුම් දී ඇති බවත් එය වහාම ක්‍රියාත්මක කරන බවත් හෙතෙම අවධාරණය කළේය.

ඉන්දියාව තුළ දිනෙන් දින ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කොවිඩ් උවදුර හේතුවෙන් මේ පියවර ගත් බවත් කිසිදු හේතුවක් නිසා ඉන්දීය ජාතිකයන්ට ගුවන් මඟින් මෙරටට පැමිණීම හෝ මෙරටින් වෙනත් රටක් සඳහා මාරුවීම කළ නොහැකි බවත් හෙතෙම පැවසීය.

## වරාය නගර කොමිසමේ ...

ඒ අනුව කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත විවාදයට ගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී රැස්වීමට නියමිත පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කිරීමට නියමිතය.

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මෙතෙක් කථානායකවරයාට නොලැබීම හේතුවෙන් පසුගිය 5 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්වීමට නියමිතව තිබූ විවාදය නොපැවැත්වීමට මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය 4 වැනිදා පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කෙරිණි.

## හිමිකරුවන් නැති ...

එවැනි ගිණුම් නියාමනය සහ පාලනය කිරීමට රාජ්‍ය ව්‍යුහයේ පවතින ආයතන ඔස්සේ අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා පවතින නීති මත වැඩපිළිවෙළක් සැකසීම සඳහා අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ අලී සබ්රි මහතා සහ තමා එක්ව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බවත් ඊට අනුමැතිය ලැබුණු වහාම අවශ්‍ය පියවර ගැනීමට නියමිත බවත් ඇමැතිවරයා කීය.

එවැනි හිමිකරුවන් නොමැති ගිණුම් ඔස්සේ ත්‍රස්තවාදයට, අන්තවාදයට, ජාතිවාදයට අනුබල දෙන ක්‍රියා, තරුණ පරපුර නොමඟ යවන විෂමාචාර සහ හොරකම්, මැරකම් වැනි සමාජ විරෝධී ක්‍රියාවන්ට ආධාර අනුබල දීම් වන බවට ආරක්ෂක අංශවල නිරීක්ෂණයන්ට ලක්ව ඇති බැවින් රටේ ජාතික ආරක්ෂාවට සහ යහපත් සමාජ පැවැත්ම උදෙසා මෙවැනි පියවරක් ගන්නා බවත් හෙතෙම කීවේය.

## අවුරුදු සමයේ ...

පේරාදෙණිය, හක්ගල, ගම්පහ, හම්බන්තොට, අවිස්සාවේල්ල යන උද්භිද උද්‍යාන නැරඹීමට ගොස් ඇති දෙස් විදෙස් සංචාරකයන්ගේ සංඛ්‍යාව 154,354ක් බව සංචාරක අමාත්‍යාංශයේ ප්‍රකාශකයෙක් පැවසීය. වැඩිම දේශීය සංචාරක පිරිසක් පැමිණි උද්භිද උද්‍යානය වනුයේ හග්ගල උද්භිද උද්‍යානයයි. පැමිණි සංචාරකයන්ගේ පිරිස 63,011කි. පේරාදෙණිය උද්භිද උද්‍යානය නැරඹීමට 55,417ක් පැමිණ ඇති අතර, අවිස්සාවේල්ලට පැමිණ ඇති සංඛ්‍යාව 19,991කි.

# ඔක්සිජන් හිඟයක් රට තුළ නැහැ
# නව ජම්බෝ ඔක්සිජන් සිලින්ඩර් හාරදහසක් ඇණවුම් කළා



## විපක්ෂ නායකවරයා විහිළු සපයන අයකු බවට අද පත් වී ඇතැයි රාජ්‍ය ඇමැති, මහාචාර්ය චන්න ජයසුමන කියයි

## පාර්ලිමේන්තුව

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

ඔක්සිජන් ලබා ගැනීමේ හෝ සැපයීමේ හිඟයක් මේ වන විට රට තුළ නොමැති වුවද නව ජම්බෝ ඔක්සිජන් සිලින්ඩර් හාරදහසක් මිල දී ගැනීම සඳහා ඇණවුම් කර ඇතැයි රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා පාර්ලිමේන්තුවේදී පෙරේදා (05) ප්‍රකාශ කෙළේය.

රාජ්‍ය ඇමැති චන්න ජයසුමන මහතා මේ බව සඳහන් කළේ පවතින කොරෝනා වසංගත තත්ත්වය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී පසුගිය දෙදින පුරා පැවැති සභාව කල්තබන අවස්ථාවේ විවාදයට එක් වෙමිනි.

වේත්‍රධාරි නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුව පෙරේදා (05) රැස්විය.

ලිපි ලේඛන, වාර්තා හා පෙත්සම් ඉදිරිපත් කිරීමෙන් පසුව සභාව කල්තබන අවස්ථාවේ විවාදය ආරම්භ විය.

**වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැති චන්න ජයසුමන මහතා මෙසේ ද පැවසීය.**

මේ වන විට ඔක්සිජන් හිඟයක් රට තුළ නෑ. ද්‍රව ආකාරයෙන් ඔක්සිජන් ගබඩා කිරීමේ පහසුකම් රෝහල් රැසකට ලබාදීමට කටයුතු කළා. පළමුව දින දෙකක විවාදයක් අවසානේ පිළිතුරු කතාව කරන්න ලැබීම පිළිබඳව සතුටුවෙනවා. මේ වසංගත තත්ත්වය හමුවේ අපගේ සෞඛ්‍ය අංශ වෛද්‍යවරු ඉතා කැපවීමෙන් කටයුතු කරනවා. අභූත චෝදනාවක් සේ සියල්ල දකිමින් නිහඬව බලා සිටින මේ රටේ ජනතාවට මාගේ ස්තූතිය පළ කරනවා. මේ දින දෙක පුරාවට විපක්ෂය කළේ අවලාද නඟපු එක විතරයි. විවාදය අවසානයේ විපක්ෂයේ ඉදිරි පෙළ බොහෝදෙනා දැන් පැනලා ගිහින් තියෙනවා. හර්ෂ ද සිල්වා අමාත්‍යවරයා කියනවා පාස්කු ප්‍රහාරය නොසලකා හැරිය වගේ දෙයක් තමයි අප්‍රේල් 08 වෙනිදා අපේ ආණ්ඩුව කළේ කියලා. මම සම්පූර්ණයෙන්ම ඒ මතය ප්‍රතික්ෂේප කරනවා. අප්‍රේල් 08 වෙනිදා බොරලැස්ගමුව ප්‍රදේශයේ වැඩබිමකින් ආසාදිතයින් පස්දෙනකු හමුවූ බව ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අනුක විද්‍යා අංශය තහවුරු කරනවා. ඒ අනුව එම රෝගීන් ආශ්‍රිතව රෝගයේ විශේෂතා ඇති බවත් සඳහන් වුණා. ඒ අනුව අවශ්‍ය පරීක්ෂණ සිදු කළා. ඒ වගේම බුද්ධි අංශ නිලධාරීන් යොදවා මෙම රෝගීන්ගේ ආශ්‍රිතයින් වූ 800 ක පිරිසක් හඳුනාගන්නවා. ඒ අනුව පළමු, දෙවන හා තෙවන පෙළ ආශ්‍රිතයින් ලෙස මෙම පිරිස හඳුනාගත්තා. අපට හමුවූ ආසාදිතයන්ගේ සාම්පල ලබාගැනීමෙන් අනතුරුව සියලු දේඅපි පරීක්ෂා කළා.

ලොක්ඩවුන් කරන්න ලොක්ඩවුන් කරන්න කියනවා. අපි ගිය අවුරුද්දේ එක් වතාවක් ලොක්ඩවුන් කළා. ඒ වේලාවේ කියනවා අරින්න අරින්න කියලා. වහල තියෙනකොට කියනවා අරින්න අරින්න කියලා. දැන් කියනවා වහන්න වහන්න කියලා. මේක හරියටම වැරදි අදහසක්. මේ වගේ තමයි පාස්කු ප්‍රහාරය චුදිතයන්. අල්ලන්න අල්ලන්න අල්ලන්න කියලා කෑගැහුවා. ඇල්ලුවට පස්සේ දැන් කියනවා එළියට දාන්න කියලා. මේක දේශප්‍රේමී ආණ්ඩුවක්. කොරෝනා පිට දාගෙන මේ ආණ්ඩුව ගෙදර යවන්න කවුරු හරි උත්සාහ කරනවා නම් අපි ඒක කරන්න ඉඩ දෙන්නෙ නැහැ.

**මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (ස.ජ.බ.) -**

ආණ්ඩුව හිර වුණාම අපෙන් සහාය ඉල්ලනවා. ඡන්දයෙන් පසුව අපෙන් සහාය ඉල්ලුවා ද? විසිවැනි සංශෝධනය ගේන විට අපෙන් විමසුවා ද? නැහැ. බැරි වුණාම තමයි අපෙන් සහාය ආණ්ඩුව ඉල්ලන්නේ. මේ ආණ්ඩුව ආපුදා සිට හිතුවක්කාරී ලෙස කටයුතු කරනවා. ආණ්ඩුවේ හිතවතුන් දාලා තේරීම් කාරක සභාවක් පත් කරලා අපේ සහාය ඉල්ලන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. ජනවාරි 24 දාත්, පෙබරවාරි 05 දාත් අපේ විපක්ෂ නායකවරයා කොවිඩ් පාලනය ගැන කතා කළා.

**සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය -**

ආර්ථිකය රැක ගන්නා ගමන් කොවිඩ් පාලනය කරනවා. ආර්ථිකය නැතිව අපට පී.සී.ආර්., එන්නත් ගෙන්වීම අමාරු වෙනවා. මේ වසර තුළදී මෙරට ජනගහනයෙන් සියයට 60 ක් එන්නත්කරණයට ලක් කරනවා. දෙසැම්බර් වන විට මිලියන 13 ක් එන්නත් මෙරටට ලැබෙනවා. එන්නත්කරණය බණ්ඩනයකින් තොරව සිදු කරනවා.

**මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා -**

චීන බලවතුන්ට අපේ රටේ බින්න බහින්නට ඉඩ දීලා තිබෙනවා. ඉතිං ඉන්දියාව අපිත් එක්ක තරහා වෙන්නේ නැද්ද? සිරිමාවෝ මැතිනිය පවා චීනයෙන් වැඩ ගත්තා. නමුත් බින්න බහින්න දුන්නේ නැහැ. ඉන්දියාව කලාපීය බලවතා. කලාපීය බලවතාගේ සහාය නැතිව අපට ඉදිරියට යන්න බැහැ. අපි අගමැතිතුමාට කියන්නේ අපි සහාය දෙන්න සූදානම්. මේක අපේ රට. ඒ සහාය හරි විදියට ඉල්ලන්න ඕන. අපට තර්ජනය කරලා සහාය ගන්න බැහැ. පිළියන්දල ගත්ත තීරණය ගැන අගමැතිතුමා මොකද කියන්නේ. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය පිළියන්දල වැහුවා. නමුත් දේශපාලන අධිකාරිය විසින් ඒක ඇරියා. දොස්තරවරු දැන් ඉන්නේ මුල්ලක. මේවාට ඔළුවෙන් උත්තර දෙන්න ඕන. මස්පිඬුවලින් උත්තර දෙන්න බැහැ.

**පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා -**

කිරිඇල්ල මහතා කියනවා සහාය දෙන්න ලෑස්තියි කියලා. මීට දින දෙක තුනකට කලින් විපක්ෂ නායකයා කීවා කොවිඩ් දේශපාලන වාසියට හරවා ගන්නේ නැහැ කියලා. හක්කේ බුදුරැස් බොක්කේ දඩමස් වගේ ප්‍රකාශයක් තමයි විපක්ෂය කරන්නේ. විපක්ෂයෙන් අපට දෙන සහාය තමයි කටවහගෙන ඉන්න එක. වෙනත් සහායක් අපට විපක්ෂයෙන් අවශ්‍ය නැහැ. ලෝකයේ සෙසු රටවලට බැරි විදියට කොවිඩ් අපට පාලනය කර ගන්න හැකි වුණා. චීනයට බින්න බහින්න දීලා කියලා ඔබතුමා කියනවා. එහෙම එකක් නැහැ. මේ උවදුර සඳහා මුදල් ලබා ගැනීම ගැන තමයි කතා කරන්නේ. කිසිදු බාධාවකින් තොරව රජය එන්නත් මිල දී ගැනීමට, පී.සී.ආර්. කිරීමට, ඇඳන් සංඛ්‍යාව වැඩි කරන්නට මුදල් වෙන් කර තිබෙනවා.

**මහජන ආරක්ෂක ඇමැති සරත් වීරසේකර මහතා -**

ඉන්දියානු රහස් තොරතුරු පාස්කු ප්‍රහාරය එල්ල වන බවට කියද්දි කිසි දෙයක් නොකළ විපක්ෂය තමයි අද මේ කතා කරන්නේ. පාස්කු ප්‍රහාරය සිදු වන බවට දැන දැනත් කිසිවක් නොකළ විපක්ෂය තමයි අද අපි ගැන කතා කරන්නේ. පාස්කු ප්‍රහාරයට පෙර සිදු වූ සිද්ධීන්වලට අදාළව පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට හදන විට ඒවා විපක්ෂයෙන් වැළැක්වූවා.

**පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් ෆොන්සේකා මහතා (ස.ජ.බ.) -**

ඔබතුමා ඇඳපු නිල ඇඳුමට ලැජ්ජා කරන්න එපා. රණවිරුවකුට මිනී මරන්න බැහැ. තමුන්නාන්සේ මිනියක් මැරුවත් හිරේ යන්න ඕනෑ. ඒ ගැන තමයි මම කීවේ. ඒක හමුදාව පාවාදීමක් නොවේ.

**ඇමැති සරත් වීරසේකර මහතා-**

තමුන්නාන්සේ වීරයෙක් වෙන්න හදන්න එපා. ජිනීවා උණුසුම යන්න පෙර තමුන්නාන්සේ මේ වගේ ප්‍රකාශ කරන්නේ ඩොලර්වලට. ජනාධිපතිවරණයට පෙර ඩොලර් 527,000ක් තමුන්නාන්සේගේ ගිණුමේ තිබුණා. මුදලට රට පාවා දෙන්න එපා.

**මන්ත්‍රී සරත් ෆොන්සේකා මහතා -**

ඩොලර් අරගෙන ඒ වගේ තුට්ටු දෙකේ වැඩ කරන්නේ නැහැ.

**ඇමැති සරත් වීරසේකර මහතා -**

යුද්ධය දිනලා ජාතියේ ප්‍රණාමය දිනා ගත් පස්දෙනාගෙන් කෙනෙක් මම. ඒක තමුන්නාන්සේ දැන ගන්න. සුදු කොඩි ගැන ප්‍රකාශ කරලා ජාතිය පළමු වතාවට පාවා දුන්නා. සුනිල් රත්නායක රණවිරුවට මරණය නියම වන්නේ සිද්ධිය සිදු වී වසර 14කට පසුව රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවෙන්. මහේෂ්වරන් කියන කොටි ත්‍රස්තවාදියා කිවූ දේ තමයි සරත් ෆොන්සේකා දැක්කා වගේ කියන්නේ. පහත් විදියට තමන්ගේ සෙබළුන් පාවා දෙන්න පුළුවන් නම් තමුන්නාන්සේ ෆීල්ඩ් මාර්ෂල් නොවේ ලාන්ස් කෝප්‍රල් තත්ත්වයටවත් සුදුසු නැහැ. **මන්ත්‍රී සරත් ෆොන්සේකා මහතා -**

යටත් වූ 12000 මෙයා කියන විදියට මරා දාන්න ඕනෑ. ඒ වගේ මෝඩ කතා කියන විට තමයි ජාත්‍යන්තරය අපෙන් ප්‍රශ්න කරන්නේ.

**ඇමැති සරත් වීරසේකර මහතා -**

ඔබතුමාගේ මානසික තත්ත්වය අපට තේරෙනවා. තමුන්නාන්සේ මුදලට ජාතිය හා රණවිරුවන් පාවා දෙන බව සමස්ත ජනතාවම දන්නවා. දෙමළ ඩයස්පෝරාව සමග ඔබතුමාලා යටි ගිවිසුමක් තිබෙනවා. නැත්නම් ජනාධිපතිවරණය වේලාවේ කොහොමද දෙමළ ප්‍රදේශ ජයග්‍රහණය කළේ. ත්‍රස්තවාදීන් සමග යටි ගිවිසුමක් තිබූ බව ඉන් පේනවා.

**විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස -**

ස්ථාවර නියෝග 91 වගන්ති ගණනාවක් තිබෙනවා. ඒ වගන්ති සියල්ල උල්ලංඝනය කළා. ඒ බොරු චෝදනා සියල්ලක්ම හැන්සාඩ්වලින් ඉවත් කරන්න කියලා කථානායකතුමාගෙන් මම ඉල්ලනවා. සරත් ෆොන්සේකා මහතාට ත්‍රස්තවාදීන්ගෙන් බෝම්බ ප්‍රහාරයක් එල්ල වුණා. එහෙම බෝම්බයක් එල්ල වුණේ කොටි ඩයස්පෝරාවට උදව් කළ නිසා ද කියලා අපි අහනවා.

**ඇමැති සරත් වීරසේකර මහතා -**

බීබීසී එකට ෆොන්සේකා මහතා මොකද කිව්වේ. එහිදීත් ජාතියයි හමුදාවයි පාවා දුන්නා. ඔහු මානසික රෝගියෙක් වෙන්න ඕනෑ.

**පත් කළ මන්ත්‍රිනී හරිනි අමරසූරිය මහත්මිය (ජා.ජ.බ.) -**

වසංගතයේ ස්වභාවය තේරුම් ගෙන අපි මේ වෙලාවේ කටයුතු කළ යුතුයි. මේ වසංගතය නිවැරදි විදියට පාලනය හා කළමනාකරණය කිරීමට නම් වසංගතය ගැන නිවැරදි තොරතුරු ලබා ගත යුතුයි.

**(නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මහතා මුලසුනට පැමිණියේය.)**

**මන්ත්‍රිනී හරිනි අමරසූරිය මහත්මිය -**

එන්නතෙන් සියලු දේ විසඳෙන්නේ නැහැ. මේක වයිරසයක් කියන එක මතක තබා ගත යුතුයි. එන්නත දුන්නත් තව වසර දෙක තුනක් ගත වන තෙක් තවත් සෞඛ්‍ය උපදෙස් පිළිපදින්න වෙනවා. මෙවැනි වසංගතයක් තුළදී තමයි නායකත්වය කුමක්ද කියන එක අපට තේරුම් ගත හැකි වන්නේ. තමන් නොදන්නා දේ දන්නා අයගෙන් දැන ගැනීමට නායකත්වය කටයුතු කළ යුතුයි.

**පත් කළ මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග මහතා (පො.ජ.පෙ.)**

පළමු කොවිඩ් රැල්ල මර්දනය කළ රටවල් 10 අතරට ශ්‍රී ලංකාවත් ඇතුළත් වෙනවා. ආයුර්වේද දැනුම ප්‍රතික්ෂේප නොකළ යුතුයි. සිනොෆාම් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් පිළි නොගන්නා විට එය ප්‍රශ්න කරනවා. නමුත් අපේ දේශීය ඖෂධ නොපිළිගන්නා විට එය ප්‍රශ්න කරන්නේ නැහැ. චීනය නිරන්තරයෙන් උණු තේ පානය කරන එක අපට කළ නොහැකි ද?

**ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී සරත් ෆොන්සේකා මහතා (ස.ජ.බ.) -**

කොරෝනා උවදුර ගැන අවධානය යොමු වුණේ පසුගිය වසරේදී. විපක්ෂ නායකවරයා ඒ අවස්ථාවේ මුව ආවරණ නිසි ලෙස පළඳින්න කියලා ඉල්ලා සිටියා. කොරෝනාවලට වඩා ඒ අවස්ථාවේ මැතිවරණයට අපි ඉඩ දුන්නා. මිනුවන්ගොඩ පොකුර, පෑලියගොඩ පොකුර ආදී ලෙස පොකුරු ඇති වුණා. හමුදාවේ ගෞරවය තබමින් මම නිතරම කතා කරනවා.

**රාජ්‍ය ඇමැති ජානක වක්කුඹුර මහතා -**

සිංහල අවුරුද්දෙන් පසුව කොරෝනා රෝගීන් තරමක් වැඩි වුණා. ඒ වැඩි වුණත් එය පාලනය කරන්න රජයෙන් කටයුතු කරනවා. බෙලිහුල්ඔය පුහුණු මධ්‍යස්ථානයක් තිබෙනවා. ඒවා අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන බවට පත් කරනවා. රටේ වැඩි පිරිසකට අවශ්‍ය පහසුකම් අපි ලබාදෙනවා. නිවෙස්වල රෝගීන් සිටිනවා නම් එය අපට ගැටලුවක්. රට වහන්න පුළුවන් නම් හොඳයි කියලා අපිත් කීවා. මගේ ප්‍රදේශයේ හපුගොඩ මැතිවරණ කොට්ඨාසය වැහුවා.

**ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මහතා (ස.ජ.බ.)**

අද වන විට රටම කොරෝනා වසංගතයෙන් වෙළාගෙන සිටිනවා. ලංකාවේ කොතරම් ඇඳන් ප්‍රමාණයක් හැදුවා ද කියලා අපට දැනගන්න විදියක් නැහැ. ඒවා ඇහුවත් උත්තර දෙන්න කෙනෙක් නැහැ. ආණ්ඩුවේ අවධානය යොමුව තිබුණේ කොවිඩ් පාලනයට වඩා දේශපාලන කටයුතු කෙරෙහි. ඒ නිසා තමයි අද මේ වගේ තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ.

**ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා -**

මේ ප්‍රකාශය සම්පූර්ණ අසත්‍යයක්. මම තානාපතිවරුන් රැසක් සමග මේ කාරණය ගැන කතා කරනවා. ආණ්ඩුවට අවශ්‍ය දේවල් අපි රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් කතා කරලා ලබා ගන්නවා. විපක්ෂයේ අය වගේ චිත්‍රපටිවලට අපි පෙනී සිටින්නේ නැහැ. චිත්‍රපට නළුවන් ඔය පැත්තේ සිටිනවා. ඒවට අපි රැවටෙන්නේ නැහැ.

**මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මහතා -**

දේශපාලන ක්‍රීඩාව මේ සඳහා අවශ්‍ය නැහැ.

**කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා (ස.ජ.බ.) -**

රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා පාර්ලිමේන්තු සභාවට කැඳවීමට බාධාවක් නොමැති බවට නීතිපතිවරයා දැනුම් දී තිබෙනවා.

**සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත බෝග වගා, තේ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති කනක හේරත් මහතා -**

කොවිඩ් පළමු රැල්ල, දෙවැනි රැල්ල අපි සාර්ථකව මර්දනය කළා. අද තුන්වැනි රැල්ල ඇවිත් තිබෙනවා. ආර්ථිකය සුරක්ෂිත කරන ගමන් කොරෝනා පාලනය කිරීමට රජය පියවර ගන්නවා. කොරෝනා පාලනයට විපක්ෂය සහාය දෙනවා කියනවා. ගිහිං තානාපතිවරුන්ට කතා කරලා එන්නත් ගෙන්වීමට ඇණවුම් ලබා ගන්න. එය හොඳයි. හැබැයි එහෙම ඇණවුම් කරලා පෙන්වන්න. විපක්ෂය සහාය දෙන බව පවසමින් රජයට චෝදනා කරනවා. රට වහන්න කියනවා. එය ද විපක්ෂයෙන් ලබාදෙන සහාය. ඉදිරි අනාගතය ගැන සිතා කොවිඩ් පාලනය සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථාන හඳුනාගෙන පෙර සූදානමක් ඇති කර ගත යුතුයි.

**කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී නලීන් බණ්ඩාර ජයමහ මහතා (ස.ජ.බ.)**

විශ්වවිද්‍යාල නේවාසිකාගාර 84 ක ඇඳන් 33200 ක් තිබෙනවා. යහපාලනය කාලයේ තමයි මේවා හැදුවේ. ඒවා කොරෝනා අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස භාවිතා කරන්න පුළුවන්.

**(නියෝජ්‍ය කාරක සභා සභාපති මන්ත්‍රී අංගජන් රාමනාදන් මහතා මුලසුනට පැමිණියේය.)**

**පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි -**

අමෙරිකාව කොරෝනාව සාර්ථකව ජය ගත් බවට ඇතැමුන් සඳහන් කළත් එය බොරුවක්. ලෝකයේ බලවත්ම රට අමෙරිකාව. නමුත් ඒ රටටවත් මේ දේ ජය ගත නොහැකි වුණා. මේක ජාතික ව්‍යසනයක්. මේ ව්‍යසනය ජය ගැනීමට නම් ආණ්ඩුව සහ විපක්ෂයත් එක්ව කටයුතු කළ යුතුයි. චීන ආහාර පුරුද්ද මේ රෝගය වළක්වා ගැනීමට සෑහෙන්න බලපෑවා. ඔවුන්ගේ පුරුද්දක් වන්නේ උණුවෙන් ආහාරපානාදිය ගැනීමයි. එය මේ වයිරසය මර්දනයට හේතු වෙලා තිබෙනවා. අපේ දැනුම් පද්ධතිය මේ වයිරසය වළක්වා ගැනීමට යොදා ගත යුතුයි.

**පත් කළ මන්ත්‍රී එරාන් වික්‍රමරත්න මහතා (ස.ජ.බ.)**

කොරෝනා ව්‍යාප්තියට හේතු වී ඇත්තේ විශේෂඥයන්ගේ මතයට ඇහුම්කන් නොදීමයි. ජාතික ඖෂධ නියාමන අධිකාරිය අනුමත කරන එන්නත් මෙරට ජනතාවට ලබා දිය යුතුයි. ඒ වගේම දේශීය ඖෂධ ලබාදෙනවාට අපි විරුද්ධ නැහැ. එන්නතට අමතරව කාලීනව තීරණයක් ගත යුතුයි. ප්‍රමාද නොවී දැඩි සත්කාර ඒකක ඇඳන් ධාරිතාව වැඩි කර ගන්න ලෙස රජයෙන් ඉල්ලා සිටිනවා.

**වේවැල් , පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය රාජ්‍ය ඇමැති ප්‍රසන්න රණවීර මහතා -**

අපේ රට විශාලාවක් වන තෙක් විපක්ෂය බලා සිටිනවා. මේ වසංගතය ආරම්භයේ සිට රජය එය මර්දනය සඳහා අපමණ වූ වැඩ කොටසක් සිදු කර තිබෙනවා. ආර්ථිකය ආරක්ෂා කර ගනිමින් මේ ව්‍යසනයට සාර්ථකව අපි මුහුණ දෙනවා. ඉන්දියන් රජය මේ වසංගතය නිසා විශාල පීඩාවකට ලක්ව සිටිනවා. ඒ නිසා ඔවුන් නිෂ්පාදනය කරන එන්නත් අපේ රටට ලබාදීමට නොහැකිව තිබෙනවා. අපට පමණක් නොව ලෝක සෞඛ්‍ය සංවිධානයට අවශ්‍ය එන්නත් ප්‍රමාණයවත් ලබාදීමට නොහැකිව ඉන්දියාව සිටිනවා.

**මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රාවුෆ් හකීම් මහතා (ස.ජ.බ.) -**

ජාතික ව්‍යසනය පිළිබඳ කවුන්සිලය තවමත් පිහිටුවා නැහැ. එය ඉතාම ඉක්මනින් පිහිටුවිය යුතුයි. එසේ පිහිටුවීම සිදු කළහොත් විපක්ෂය විදියට ඉතා සාර්ථකව අපටත් මේ ව්‍යසනය ජය ගැනීමට සහාය දෙන්න පුළුවන්. ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් වෛද්‍ය ලක්කුමාර් ප්‍රනාන්දු මහතා ඉවත් කර තිබෙනවා.

**රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා -**

වෛද්‍ය ලක්කුමාර් මහතා ඖෂධ නියාමන අධිකාරියේ කාලසීමාව අවසන් නිසා තමයි අධිකාරියෙන් බැහැර වුණේ. එහෙම නැතිව කවුරුත් ඔහුව ඉවත් කළේ නැහැ.

**මන්ත්‍රී රාවුෆ් හකීම් මහතා,**

රාජ්‍ය බලය යොදා ගනිමින් මුස්ලිම් ජනතාව අනවශ්‍ය ලෙස බිය වැද්දීමට කටයුතු කළා. අටලුගම, අකුරණ මාස ගණනක් වසා තැබුවා.

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මන්ත්‍රී කපිල අතුකෝරල මහතා (පො.ජ.පෙ.) -**

මේ වෙලාවේ රටේ දේශපාලනය කරන වෙලාව නොවේ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මිනිසුන් බොහොම දුප්පත් මිනිසුන්. ඔවුන් දුක් විඳින විට අපට එය බලා සිටිය නොහැකියි. කාලයක් තිස්සේ තිබූ යුද්ධය නිසා ඔවුන්ට හරියට ඉගෙනීමක් නැහැ. නමුත් විපක්ෂය මේ වෙලාවේ කොවිඩ් හරහා දේශපාලනය කරන්න උත්සාහ කරනවා.

**කෑගල්ල දිස්ත්‍රික් මන්ත්‍රී කබීර් හෂීම් මහතා (ස.ජ.බ.),**

මේ ව්‍යසනය ආරම්භයත් සමඟ රටට තිබුණු ඇල්ම නිසා රජයට උපදෙස් ලබාදීම විපක්ෂ නායකවරයා විසින් සිදු කළා. නමුත් හරිම පිළිකුල් විදියට ඒ යෝජනා ආණ්ඩුව ප්‍රතික්ෂේප කළා. එන්නත අවශ්‍ය බව විපක්ෂ නායකවරයා කියන විට පැණිය සුදුසු බව ආණ්ඩුව කිව්වා.

**රාජ්‍ය ඇමැති ජයන්ත සමරවීර මහතා -**

කොවිඩ් මර්දන කාර්ය සාධන බළකාය පිහිටුවන්නේ 2020-01 -28 දායි. කොවිඩ් මර්දන වැඩපිළිවෙළ ආරම්භ කළේ අපට කවුරුත් කියලා නෙවෙයි. ආණ්ඩුවක් ලෙස ඒ වෙනුවෙන් ආරම්භයෙදීම අපි වැඩපිළිවෙළක් සකස් කළා. කොවිඩ් ආසාදිත චීන කාන්තාව ලංකාවෙන් හඳුනාගන්නත් කලින් තමයි අපේ ජනාධිපතිතුමා කොවිඩ් කාර්ය සාධන බළකාය පිහිටුවන්නේ. සජිත් ප්‍රේමදාස මහතා කිව්වේ ෆැකනිල් දෙන්න කියලා.

**කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී තුෂාර ඉඳුනිල් මහතා (සජබ),**

අපේ රටේ ලක්ෂ හැටනවයක ජනතාව ජනාධිපතිවරයා පත් කිරීමට කටයුතු කළා. රටේ තිබෙන ප්‍රශ්න ටික විසඳන්නට එතුමාට බලය ලබා දුන්නා. අද වන විට අපගේ රුපියල බාල්දු වෙලා. රුපියල රැට නගිනවා. උදේට බහිනවා. අද වන විට ජනතාවගේ ජීවන වියදම අහස උසට නැගලා. ආණ්ඩුව ගජමිතුරන් පිනවීම නතර කළ යුතුයි. ඒවගේම විදේශ ප්‍රතිපත්තියත් ගැටලු සහගතයි.

**මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා (පොජපෙ),**

බලවත් යැයි කියන බොහෝ රටවල් අද මෙම වසංගත තත්ත්වය නිසා බරපතළ අර්බුදයකට ලක් වෙලා. ලෝකයේ විශාල රටක් වන ඉන්දියාව අද අසාර්ථක වෙලා. එන්නත්කරණය අතින් ඔවුන් අසාර්ථකයි. එන්නත් නිෂ්පාදනය කරන රටක්. ඉන්දියාව අපේ අසල්වැසි රටක්. මේ අසල්වැසි රටේ තිබෙන අයහපත් සෞඛ්‍ය පුරුදු නිසා මේ තරම් ව්‍යසනයකට ඔවුන් මුහුණ දී තිබෙනවා. මේ වසර අවසානය වන විට අපේ රටේ ජනගහනයෙන් වැඩි පිරිසකට එන්නත් ලබාදීම අපගේ රජයේ ඉලක්කයයි.

**බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චාමර සම්පත් දිසානායක මහතා (පො.ජ.පෙ) -**

අද මේ යෝජනාව ඉදිරිපත් කරපු රාජිත සේනාරත්නත් නැහැ. ස්ථිර කරපු කෙනත් නැහැ. කොරෝනා වසංගතය නිසා තවම මැරිලා තියෙන්නේ 709 යි. නමුත් රාජිත සේනාරත්න මහතා සෞඛ්‍ය ඇමතිවරයා ලෙස කටයුතු කරපු කාලේ ඩෙංගුවලින් 788 ක් මියගිහිල්ලා තිබෙනවා. ඇස්ට්‍රා සෙනෙකා දෙවන මාත්‍රාව ගැනත් විවිධ කතා කියනවා.

**කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂ ද සිල්වා මහතා (සජබ) -**

විපක්ෂය ආණ්ඩුව කියල අපගේ භේදයක් නැහැ. අපි එකතු වී වැඩ කළ යුතුයි. ඒ වගේම සුවසැරිය ගිලන්රථ සේවය සඳහා අලුතින් ගිලන් රථ සියයකට වැඩි ප්‍රමාණයක් ලබාදීමට තීරණය කර තිබෙනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත විය යුතුයි. ඒ වගේම මෙහි සේවය කරන කාර්ය මණ්ඩලයටත් අපි ස්තුතිවන්ත විය යුතුයි. මෙම රැල්ල පළමු හා දෙවන කොවිඩ් රැල්ල වගේ නෙවෙයි.

**(මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා මුලසුනට පැමිණියේය.)**

**රාජ්‍ය ඇමැති අරුන්දික ප්‍රනාන්දු මහතා -**

ලංකාවේ පෞද්ගලික අංශය එන්නත ලබා ගැනීම වෙනුවෙන් මුදල් දෙන්න සූදානම් වුණා කියලා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා. ඒක වැරදියි. මුදල් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. එන්නත් ලබා ගැනීම ක්‍රමවේදයකට අනුව කළ යුතු වෙනවා.

මේ රටේ ලක්ෂ දහයක් වැනි පිරිසකට එන්නත් ලබාදී තිබෙනවා. ඖෂධ නියාමන අධිකාරිය කඩිනමින් සැලකිලිමත් වී මේ එන්නත් සම්බන්ධයෙන් සොයා බැලිය යුතුයි. ඒනිසා අපට ගැළපෙන එන්නත් මිල දී ගැනීම වෙනුවෙන් අපි හැමෝම එකතු වී කටයුතු කළ යුතුයි.

**කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක් අබේසිංහ මහතා (සජබ) -**

මේ රටේ ජනතාවට අවශ්‍ය එන්නත් ටික ලබාදෙන්න ආණ්ඩුවට වැඩපිළිවෙළක් තිබෙනව ද කියන ගැටලුව තිබෙනවා. අපේ රටට දවස ගානේ ගුවන් යානා එනවා. මේ ප්‍රශ්නය නිවැරදි ලෙස කළමනාකරණය කළ යුතුයි. අපි රජයට චෝදනා කරනවා නෙවෙයි, අඩුපාඩු හදාගන්න කියන්නේ. එන්නත එන්න මොන තරම් කාලයක් යයි ද දන්නෙ නැහැ.

**හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිප් වෙදආරච්චි මහතා (සජබ) -**

කොවිඩ් වසංගතය අද වන විට සියලු භේදයකින් තොරව ව්‍යාප්ත වෙනවා. ඒ නිසා මෙයට මුහුණ දීම සඳහා ශක්තිමත් වැඩපිළිවෙළක් අවශ්‍යයි. අපේ පළාත්වලත් මෙය ව්‍යාප්ත වෙලා. නිරෝධායනය වන පවුල් වෙත ලබාදෙන බඩු මල්ල ලබා දෙන්න. මේක තුළිනුත් දේශපාලනය කරන්න එපා.

**අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර මහතා (සජබ),**

මෙවැනි අවස්ථාවකදි වත් අපි එක්ව කටයුතු කළ යුතුයි. මේක ලෝක ව්‍යසනයක්. ඒ නිසා අපි ලෝක අත්දැකීම් ලබාගත යුතුයි. අද වන විට වියට්නාමය, චීනය වගේ රටවල් සාර්ථක වී තිබෙනවා. ඔවුන්ගෙන් අපි අත්දැකීම් ලබාගත යුතුයි. බිම්මට්ටමේ සිටින සියලු දෙනාට එන්නත ලබාදිය යුතුයි. ග්‍රාමසේවක මහත්වරුන්ට මේ එන්නත ලබාදිය යුතුයි. මේ වසංගතයෙන් ග්‍රාමසේවක මහතෙක් මිය ගියා.

**පාර්ලිමේන්තුව ලබන (18) වැනිදා යළි රැස් වේ.**

**නිරෝධායන කටයුතු සෞඛ්‍ය අංශවලට පමණක් කරන්න අමාරුයි**



මන්ත්‍රී සරත් ෆොන්සේකා

**විපක්ෂයෙන් අපට දිය හැකි සහාය තමයි කට වහගෙන ඉන්න එක**



ඇමැති මහින්ද අමරවීර

**ඉන්දීය රහස් තොරතුරු තිබියදී විපක්ෂය කිසි දෙයක් කළේ නෑ**



ඇමැති සරත් වීරසේකර

# රසායනික පොහොර භාවිතය ඉවත් කළ ලොව ප්‍රථම රට

## ශ්‍රී ලංකාව කිරීමේ ජනපතිගේ සිංහනාදය ගැන සතුටුයි

## කිසිම නායකයකු එවැනි එඩිතර ප්‍රකාශයක් මෙතෙක් කර නෑ

## මාධ්‍ය හමුවකදී ඕමාරේ කස්සප අනුනාහිමියෝ කියති

**රක්ෂණ ශ්‍රියන්ත**

රසායනික පොහොර භාවිතය මුළුමනින්ම ඉවත් කළ ලෝකයේ ප්‍රථම රට බවට මේ රට පත්කිරීමේ සිංහනාදය ජනාධිපතිවරයා පැතිරවීම ගැන සතුටු වෙන බවත් මෙරට සිටි කිසිදු නායකයකු එවැනි එඩිතර අභියෝගාත්මක ප්‍රකාශයක් සිදු කර නොමැති බවත් තුන්හෙළ ජාතික ව්‍යාපාරයේ සභාපති, ශ්‍රී රෝහණ සංඝ සභාවේ අනුනායක, ශාස්ත්‍රපති පූජ්‍ය ඕමාරේ කස්සප අනුනාහිමියෝ පැවසූහ.

තුන්හෙළ ජාතික ව්‍යාපාරය විසින් අද (06) නාරාහේන්පිට අභයාරාම විහාරස්ථානයේ දී "වස විස නැති මව්රටක්" යන්න තේමා කොට ගනිමින් සංවිධාන කර තිබූ මාධ්‍ය හමුවේදී උන්වහන්සේ මෙසේ පැවසූහ.

ඕමාරේ කස්සප අනුනාහිමියෝ වැඩිදුරටත් මෙසේද කීහ.

අප ජීවත්වන මේ රටේ අවට පරිසරය දිහා බැලුවාම බූවල්ලෙක් වගේ. අපව ගිලගන්න අවශ්‍ය කරන විදියට පරිසරය සකස් වෙලා තියෙනවා. අපට පේන විදියට මානවයාගේ ජීවිත තර්ජනයට එල්ල වන යම් යම් තත්ත්වයන් හමුවේ ජනතා ජීවිත පවත්වා ගැනීමේ අභියෝගයකට ජනතාව පත් වෙලා ඉන්නවා. ඒ අනුව විශේෂයෙන්ම පරිසරයේ ඇති වෙලා තිබෙන විශාල විනාශකාරී පිළිවෙත් මූලිකම කාරණයක් හැටියට අපි පෙන්නනවා.

අද බැලු බැලු හැමතැනම පරිසරයේ කෘෂි රසායනික තෙල්, වල් නාශක තෙල් භාවිතය, පොහොර භාවිතයෙන් මානවයාගේ දිවි පැවැත්මට බරපතළ තර්ජනයක් වෙලා තිබෙනවා. මෙන්න මේ නිසා අපි විශාල වශයෙන් අභියෝගයකට ලක් වෙලා තිබෙනවා ජීවත්වීම ගැන. අපි දන්න ඉතිහාසයේ විශේෂයෙන්ම 60 දශකයේ මුල් භාගයේ ඉදලා මේ රටේ කෘෂිකර්මයට එකතු කරගත්ත මේ කෘෂි රසායන තෙල් පොහොර භාවිතය බරපතළ ලෙස අද සිද්ධ වෙනවා. අද මිනිස්සු අකමැතියි. මේ තෙල් පොහොර භාවිතයෙන් මිදෙන්න. අස්වැන්න අඩු වෙනවා කියලා. ඒ අය ඒකෙන් මිදෙන්න අකමැතියි. හැබැයි මේ වසවිස සහිත තෙල් පොහොරවලින් ජන ජීවිතයට අත්වෙන ඉරණම හොඳටම පැහැදිලියි.

වකුගඩු රෝග හැදිලා මිනිස්සු මැරෙනවා. පිළිකා රෝග හැදෙන තත්ත්වය ඉතා බහුලයි. රට පුරාම ව්‍යාප්ත වෙලා පිළිකා රෝගීන් හැදෙනවා. ඒ වගේම වෙනත් බෝවෙන රෝග, දැන් මේ කොරෝනා රෝගය කොහෙන් ආව එකක්ද කියා අපට කියන්න බෑ. එක එක කතන්දර තියෙනවා. ජන ජීවිතයට මේ තරම් බලපෑම් එල්ල කරන මේ තත්ත්වය සමනය කරගැනීම අත්‍යාවශ්‍යයි. මූලය සලකා බලනකොට පේන්නේ කෘෂි රසායන භාවිතයේන මිනිසාට සිද්ධ වෙන හානියයි.

ඒ නිසා ජනාධිපති පැහැදිලි ප්‍රකාශයක් කර තිබෙනවා. ගත්ත පියවර ආපස්සට ගන්නේ නෑ කියලා. අපි කියවා බැලුවා මොකද්ද මේ කියලා. කියවලා බැලුවාම අපිට පේනවා රසායනික පොහොර භාවිතය මුළුමනින්ම ඉවත් කළ ලෝකයේ පළමු රට බවට මේ රට පත් කරනවා කියා මේ සිංහනාදය ජනාධිපතිතුමා පතුරවනවා. අපි සතුටු වෙනවා ඒ ගැන. මේ රටේ හිටපු එකම නායකයෙක්වත් 60 දශකයෙන් පසු හිටපු එක නායකයෙක්වත් මෙවැනි එඩිතර ප්‍රකාශයක් කරලා නෑ. මේක අභියෝගාත්මක ප්‍රකාශයක්. මේක අමාරුයි කරන්න.

මේක කියනකොටම ඇහැරුණු උදවිය ඇති. තමන්ට සිදුවුණු අලාභය ගැන සිතා පාඩුව ගැන හිතලා මේකට අවි අමෝරන්න සූදානම් වෙලා . මේ ගැන ජනාධිපතිතුමන්ට අවබෝධයක් තිබෙන බව පේනවා. එතුමා මේ කළ ප්‍රකාශය අපි භාරගන්න කැමතියි. සිවිල් සංවිධානයක් විදියට අපි හැමදාමත් හිටියේ මේ රට වෙනුවෙන්. මේ රටේ පැවැත්ම වෙනුවෙන්. මේ රටට යම් අභියෝගයක් එල්ල වෙනවා නම් දේශීය විදේශීය කුමන්ත්‍රණයන්ගෙන් එවැනි තැන්වල තුන්හෙළේ ජාතික ව්‍යාපාරය ඉන්නවා.

ඒ වගේම මේ රටේ මහපොළොව වනසමින් ක්‍රියාත්මක මේ කෘෂි රසායන, පොහොර, වල් නාශක භාවිතය මේවාට එරෙහිව අපි දීර්ඝකාලීනව කටයුතු කළා. මම කුඹුරු ගානේ ඇවිද්දා. මිනිස්සුන්ට වසවිස නැති ආහාර හැටියට සාම්ප්‍රදායික වසවිස නැති දේශීය ඖෂධීය සහිත බීජ වී, බිත්තර වී හොයලා ජනතාවට බෙදමින් අපි කටයුතු කළා එක යුගයක. හැබැයි මේක සිවිල් සමාජයට යන්න පුළුවන් එකක් නෙමෙයි. යම් පමණකට ක්‍රියාත්මක වෙන්න පුළුවන්. අපි සතුටු වෙනවා රටේ රාජ්‍ය නායකයා හැටියට ගෝඨාභය රාජපක්ෂ මහතා මේකට අත්පොත් තියපු එක පිළිබඳව. අපි එතුමාට පැහැදිලිව කියනවා ගත්ත පියවර ආපහු ගන්න එපා.

හිටපු ජනාධිපතිවරුන් ඇතැම්විට පියවර ගත්තා. අපට මතකයි ග්ලයිෆෝසේට් රසායනිකය තහනම් කරනවා. හැබැයි අවුරුද්දක් දෙකක් මේ තහනම ක්‍රියාත්මක වුණා. ඒක හෙමිහිට ඒ තහනම ක්‍රියාත්මක වීම අක්‍රිය වුණා. අද ග්ලයිෆෝසේට් හොරෙන් විකුණන්න ගෙන්නලා සල්ලි හොයන මිනිස්සු රටට හෙණ ගැහුණත් ඒවා හොරෙන් ගෙන්නලා හරි මෙහේ විකුණනවා. එවැනි මාෆියා මේ රට ඇතුළේ ඉන්නවා. විශේෂයෙන් මේ කෘෂි රසායන තෙල් පොහොර නිෂ්පාදනය කරන සමාගම් හා බැඳිච්ච යම් යම් පුද්ගලයන් මේ මාෆියාව යට ඉන්නවා. මොවුන් තමයි මේවා කිසි කෙනෙකුට කරන්න නොදී කඩාකප්පල් කරන්නේ.

ඒ නිසා ජනාධිපතිට අපි කියනවා ඔබතුමා තනි වෙන්න දෙන්නෙත් නෑ. ඔබතුමා තනිත් නෑ. හැබැයි ඔබතුමා මතක තියාගන්න ඕනෑ මේක ආපස්සට නොගන්න. ඒක තමයි අපි කියන්නේ. ආපස්සට



ගත්තොත් අපි වගේ ඉදිරිපත් වෙන සිවිල් සංවිධාන තනි වෙනවා. අපට ඉස්සහරට යන්න බැරුව යනවා. ඒ නිසා අපි බය නැතුව ඉදිරිපත් වෙනවා. කාබනික පොහොර නිෂ්පාදනයට පවා අපි අතගහන්න සූදානම්.

මේකට තරගකාරීව මුහුණ දෙන්න වෙනවා. මුතුරාජවෙල අපේ තුන්හෙළේ ජාතික විධායක සභිකයෙක් ඉන්නවා .අක්කර 35 ක් අයිති. අපිට ජනාධිපතිගේ දිරිය ලැබුණොත් අපි සැලසුම් කරපු මේ කෘෂි රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර නිෂ්පාදන කම්හලක් පවා ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. එතුමා දිස්ත්‍රික්ක වශයෙන් ගෙන්වන කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩපිළිවෙළට අපි සම්පූර්ණ සහාය දෙනවා. ඒ නිසා මේක අපි කියන්නේ අපි තනි කරන්නේ නැතුව කෙළින් ඉන්න කියලයි ජනාධිපතිට.

අපි විශ්වාස කරනවා ඔබතුමාට මේ රටේ යුද්ධය නැති කරන්න නායකත්වය දෙන්න පුළුවන් වුණා නම් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ අවශ්‍ය සංවර්ධනය කරන්න දුටුවන්ගේ මනනුවන් පහදවන මට්ටමින් ඒ සංවර්ධනය කොළඹ නගරයට ගෙනල්ලා ජයග්‍රාහී තත්ත්වයකට කොළඹ නගරය ගේන්න පුළුවන් වුණානම් මේකත් කරන්න බැරි නෑ. මේකට අත්පොත් තියපු එක ගැන අපි ඔබතුමාට ගරු කරනවා. ඔබතුමා මේක හිතලා තියෙන බව පේනවා හැබැයි තවත් හිතන්න,

කාබනික පොහොර වගාවට යොදන මේ වැඩපිළිවෙළ ගෙනියන්න ඉඩ නොදෙන වැඩපිළිවෙළ රටේ බොහෝ ඉස්සරහට මතුවෙයි. පුද්ගලයෝ මතුවෙයි. ඒ ගොල්ලන්ගෙන් යැපෙන ඒ ගොල්ලන්ගෙන් පඩි ලබන අය ඇතැම්විට ගහන්න පටන් ගනී. ඒ නිසා ජනාධිපතිට මේ කවර ගැහැලි හමුවේ වුවත් මේ කාබනික පොහොර භාවිතය කරමින් ඉතාම ඉක්මණින් ජනතාව වස විසෙන් තොර තත්ත්වයක ආහාර සපයන රජෙක් බවට පත්වෙන්නයි කියා අපි එතුමාට ගෞරවයෙන් ආරාධනා කරනවා.

**තුන්හෙළ ජාතික ව්‍යාපාරයේ මහලේකම් පන්නිපිටිය විද්‍යාලංකාර පිරිවෙනේ විහාරාධිපති කැකුණාවෙල වනරතන හිමි-**

අද දවසේ විශේෂයෙන්ම තුන්හෙළ ජාතික ව්‍යාපාරය මේ මාධ්‍ය සාකච්ඡාවෙන් කරන්නේ ඇත්තටම කාලීන අවශ්‍යතාවක්. එය කාලීන අවශ්‍යතාවක් කියා මා සඳහන් කරන්නේ අපේ සභාපති නායක ස්වාමින් වහන්සේත් ඒ වගේම අපේ අතපත්තු කන්දේ ආනන්ද නායක ස්වාමින් වහන්සේත් මේ වෙනකොට මේ රටේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාත් එඩිතරව, නිර්භිතව ගන්නට යෙදුණු ඉතාම වැඩදායක ක්‍රියාමාර්ගය පිළිබඳව අවශ්‍ය කරන කරුණු කාරණා පහදලා දෙන්න යෙදුණු නිසා. මේ රටේ භික්ෂූන් වහන්සේලා වශයෙන් මේ මහා සංඝරත්නයට පැවරිලා තියෙන වගකීමක් හා යුතුකමක්.

ජනාධිපති මේ ගත්ත තීරණයට ඇත්තටම මහා සංඝරත්නයේ ආශිර්වාදය නොමඳවම ලැබෙන්න ඕනෑ. එතුමා ගන්න දැඩි තීන්දුව තීරණය තමයි තිරසාර හරිත සමාජ අර්ථික රටාවක් මේ රටේ ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය කරන ආකාරයට රසායනික පොහොර නැවැත්වීමේ අභියෝගය. ලෝකයේ වටිනාම ධර්මද්වීපය ශ්‍රී ලංකාවයි. අපේ නායක ස්වාමීන් වහන්සේ පැහැදිලි කළා වගේම මේ උතුම් පුණ්‍ය භූමියේ මේ වනකොට ඇත්තටම ජීවත් වන ජනතාව ඉතාම භයානක බරපතළ අගාධයකට දවසින් දවස පත්වෙමින් යන බව රහසක් නෙමෙයි. සෞන්දර්ය, සොබාදහම මේ සියල්ල විනාශ කරන බරපතළ බලවේගයක් තමයි මේ රසායනික පොහොර භාවිතය. මට මේ වේලාවේ මතක් වෙනවා එක පුංචි දරුවෙක් කියන පුංචි සිංදුවක්.

**වක්කඩ ළඟ තිත්ත පැටව් ඔක්කොම මැරිලා**
**අනේ.. ඩිංගිරි මමේ මොකක්ද උන් කරපු වරද්ද?**

ඇත්තටම අපේ ආනන්ද හාමුදුරුවෝ මතක් කෙරුවා වගේම ගමේ වෙලේ, ඇළේ දොළේ කෝ අද තිත්ත පැටව්. කෝ කූඩැල්ලෝ, කෝ කකුළුවෝ. ඒ ඔක්කොම සත්තු විනාශ වෙලා. අර පොඩි දරුවා අහන වැරැද්ද තමයි සමස්ත වැසියන් දැන හෝ නොදැන බරපතළ ආකාරයකින් මේ රසායනික පොහොර භාවිතා කිරීම.

ජනාධිපතිතුමනි! ඔබතුමා විරෝදාර රාජ්‍ය නායකයෙක්. 30 අවුරුදු භයානක යුද්ධය නතර කරන්නට ඔබතුමා ලබා දුන්න ශක්තිය අතිශයින්ම බලසම්පන්නයි. කොළඹ නගරය මුළුමනින්ම ඔබතුමාගේ නායකත්වයෙන් ඔබතුමාගේ දර්ශනයෙන් අලංකාර නගරයක් කිරීමට හැකියාව ලැබුණා. අප්‍රේල් මාසේ 29 වැනිදා වනවිට ඔබතුමා ප්‍රකාශනය කරනවා රසායනික පොහොර ගෙනඒමේ අභියෝගය මා ජය ගන්නවා කියා.

ජය ගැනීම සඳහා රට දිනවීම සඳහා ඔබතුමාට තුරුණුවන්ගේ ආශිර්වාදය තුන්හෙළයේ ආශිර්වාදය නියත වශයෙන්ම අපි ලබා දෙනවා. ඔබතුමාගේ එඩිතර බව කොච්චරද, ඔබතුමා දන්නවා මේ කාරණයට තව අය එරෙහිව එනවා. ඒ එරෙහිව එනකොට තිබෙන ලොකුම බලවේගයක් තමයි ගොවීන්. සමහර විට ගොවින්ගේ අස්වනු ප්‍රමාණය අඩුවෙලා යන්න පුළුවන්. ආදායම් අඩුවෙලා යන්න පුළුවන්.

ඔබතුමා ඒ අභියෝගයට පිළිතුරක් දෙනවා ගොවියාගේ නිෂ්පාදන, ආදායම අඩුවෙලා යනවද ඒ සියල්ලටම රජය වගකියනවා. ඔබතුමා වගකියනවා. ආදායම් රාජ්‍ය මට්ටමින් දෙනවා. ඔබතුමා එඩිතරයි. ඔබතුමාගේ ශක්තිය තව තවත් වර්ධනය වේවා. ගත්තු තීරණය තීන්දුව මොනම හේතුවක් නිසාවත් ඉවත් කර නොගෙන මේ උතුම් ධර්මද්වීපය මේ ලෝකයෙන් සෞභාග්‍යමත් දේශයක් කරන්න ඔබතුමාට ශක්තිය ධෛර්ය ලැබේවායි කියා අපි තුන් හෙළය ජාතික ව්‍යාපාරය වශයෙනුත් සංඝරත්නය වෙනුවෙනුත් ඔබතුමාට අපේ ආශිර්වාදය ලබා දෙනවා.

**ආනන්ද විද්‍යාලයේ හිටපු නියෝජ්‍ය විදුහල්පති වැල්ලවත්ත සාම විහාරාධිපති ශාස්ත්‍රපති අතපත්තුකන්දේ ආනන්ද හිමි** - මේ රට ත්‍රස්තවාදී උවදුරෙන් නිදහස් කරගත්ත අභීත නායකයෙක් හැටියට තමයි මේ රටේ ජනතාව විශාල ඡන්ද සංඛ්‍යාවකින් එතුමා ජයග්‍රහණයට පත්කර රටේ නායකත්වය ලබාදීලා තිබෙන්නේ. ඒ ත්‍රස්තවාදී ව්‍යාපාරය වගේම රටට හානිදායක වැඩපිළිවෙළක් තමයි මේ කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය. දැන් ත්‍රස්තවාදය තිබුණේ අවුරුදු 30ක් විතර. මේ කෘෂි රසායනික ත්‍රස්වාදය දශක පහක හයක කාලයක් තිස්සේ මේ රටේ ක්‍රියාත්මක වෙනවා.

අපි පුංචි කාලයේ අපි ගම්වල ඉපදුණු අය. අපේ ගම්වල තිබුණු ඇළ දොළ අපි දැක්කා මාළු ඒවා ඇතුළේ ගමන් කරන විදිහ. ඒ වැව් අමුණු ගංගා පිරිලා ගියා. නමුත් දැන් අපි ඒ ගම්වලට ගියාම අපට පේනවා ඒවා මඩ කඩිති විතරයි. අර දැකපු කිසිම මාළුවෙක්, ජීවියෙක් අපිට දකින්න ලැබෙන්නේ නැහැ. මේ රටේ මිනිස්සු පේන්න මොන තත්ත්වයේ හිටියත් හැම මිනිහෙක්ම වස කන්න කැමති නැහැ. වසෙන් විසෙන් තොරව සාමාන්‍ය සුවපත් ජීවිතයක් ගත කරන්නයි මිනිස්සු කැමති. ඒ තත්ත්වය උදාකරදීමට ජනාධිපතිගේ අභිප්‍රාය ඉතා මැනවින් සාර්ථක වේවායි අපි මේ වෙලාවේ ප්‍රාර්ථනා කරනවා.

## අගමැති මහින්ද රාජපක්ෂ 2021/2022 ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ මුලසුනට:

# අප ඉදිරියේ ඇති භයානකම අභියෝගයට මුහුණ දීමට අවශ්‍ය නායකත්වය දෙනු ඇතැයි මට විශ්වාසයි

## ආසියානු සංවර්ධන බැංකුවේ 54 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී අගමැති කියයි

**රක්ෂණ ශ්‍රියන්ත**

අප ඉදිරියේ ඇති භයානක අභියෝගයට කාර්යක්ෂමව හා ඵලදායී ලෙස මුහුණදීමට හැකියාව ඇති බවත් ඒ සඳහා අවශ්‍ය නායකත්වය ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයනු ඇති බවට තමාට විශ්වාසයැයි ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) 54 වන වාර්ෂික මහා සභා රැස්වීමේ දී ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ මුලසුන හොබවමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසීය.

ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) පෙරේදා (05) පස්වරුවේ පැවති 54 වන වාර්ෂික මහා සභා රැස්වීමේ දී 2021/2022 වර්ෂය සඳහා ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ මුලසුනට අගමැති මහින්ද රාජපක්ෂ මහතා තේරී පත් විය.

මුදල් අමාත්‍යවරයා වශයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා මේ තනතුරට පත් වන විට ශ්‍රී ලංකාවේ ආසියානු සංවර්ධන බැංකු (ADB) අධිපති ධුරය හොබවමින් සිටියේය.

ජෝර්ජියාවේ ටිබිලිසිහි පැවැත්වීමට නියමිතව තිබූ මේ වාර්ෂික මහා සභා රැස්වීම වර්තමානයේ පවතින වසංගත තත්ත්වය හේතුවෙන් අන්තර්ජාල වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවැත්විණි. ඔස්ට්‍රියාවේ සහ මොන්ගෝලියාවේ ඒ.ඩී.බී අධිපතිවරු මේ රැස්වීමේ දී ආසියානු සංවර්ධන බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරුන් ලෙස තේරී පත් වූහ.

ආසියානු සංවර්ධන බැංකුවේ 55 වන වාර්ෂික මහා සභා රැස්වීම ලබන වසරේ කොළඹදී පැවැත්වීමට නියමිතය.

ආසියානු සංවර්ධන බැංකුවේ 54 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී අගමැති මහින්ද රාජපක්ෂ මහතා මෙසේද සඳහන් කළේය.

ආසියානු සංවර්ධන බැංකුවේ 54 වන වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වෙමින් මගේ අදහස් බෙදා ගැනීමට හැකිවීම භාග්‍යයක් කොට සලකමි. ලබන වසරේ මේ රැස්වීම කොළඹදී පැවැත්වීමට නියමිත නිසා එය තවත් විශේෂිත වේ.

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පෙර නොවූ විරූ ලෙස මිනිස් ජීවිත අහිමි වී ඇති අතර අපේ ජන ජීවිතය, සමාජය, ආර්ථිකය මෙන්ම වටිනා හර පද්ධති සහ අපගේ සංස්කෘතික භාවිත සියල්ල කඩාකප්පල් වී ඇත. එවැනි පසුබිමක නැවත සාමූහිකව නැගී සිටීමට සුදුසුම කාලය මෙය බව මම විශ්වාස කරමි.

මේ සියවස ආසියානු සියවසයි. අපේ කලාපය බොහෝ අර්බුදයන්ට මුහුණ දී තිබෙනවා. ඒ වගේම ඒවාට ඔරොත්තු දීමේ හැකියාව සඳහාත් ආසියාව ප්‍රසිද්ධියක් උසුලනවා. එබැවින් වර්තමාන වසංගත තත්ත්වය තුළ පවා අපගේ කලාපය ලෝක වර්ධනයට නායකත්වය දීම පුදුමයක් නොවේ.

නැගී එන ආසියාවට ලෝකය මෙහෙයවීමේ වගකීමක් තියෙනවා. දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන පරිසරයක් උදෙසා අප විසින් තිරසාර භාවිතය සහතික කළ යුතුයි.

අපගේ ප්‍රතිපත්තිමය විසඳුම් පාරිසරික හා සමාජීය වශයෙන් තිරසාර විය යුතුයි. අනාගත පරපුර සඳහා අපගේ ජීවන රටාව අප විසින් ආරක්ෂා කළ යුතු වෙනවා. දැන් අවශ්‍ය වන්නේ අපගේ පොදු ගැටලු විසඳා ගැනීමට සාමූහිකව සහයෝගයෙන් කටයුතු කිරීමයි.

මේ ඉලක්කය කරා යෑමට ස්වාභාවික සම්පත් වඩාත් කාර්යක්ෂමව භාවිතා කිරීමට අපට උපකාරී වන භාවිතය සහ තාක්ෂණය අනුගමනය කිරීමට අප සූදානම් විය යුතුයි.

ඒ නිසා "හරිත ආර්ථිකයක්" තුළ සේවාවන් සැපයීම පහසු කිරීමට ඩිජිටල්කරණයේ වැදගත්කම ශ්‍රී ලංකාව දැනටමත් හඳුනාගෙන තිබෙනවා. ඒ වගේම අපගේ රජය රාජ්‍ය අංශයේ මහජන සේවාවන් ඩිජිටල්කරණය කිරීම වේගවත් කර තිබේ.

ඊට අමතරව අප සියලු දෙනාම පොසිල ඉන්ධන මත යැපීම අඩු කළ යුතු වෙනවා. පොසිල ඉන්ධන භාවිතය අඩු කරමින් පුනර්ජනනීය බලශක්තිය දක්වා යොමුවීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සාමාජික රටවලට සහයෝගය දෙනු ඇතැයි අප විශ්වාස කරනවා.

නැගී එන ආසියාවේ පරිසර හිතකාමී තිරසර නගර බිහි කිරීමට ආසියානු සංවර්ධන බැංකුව විශාල සහයෝගයක් දිය යුතු යැයි අප විශ්වාස කරනවා. එය නව ප්‍රවේශයක් වනවා මෙන්ම ඒ තුළින් විධිමත් ලෙස සම්පත් කළමනාකරණය සිදු වනු ඇති.

අවධානය යොමු කළ යුතු තවත් වැදගත් අංශයක් වන්නේ කාන්තාවන් සවිබල ගැන්වීමයි. සාධාරණ සමාජයක් වෙනුවෙන් කාන්තාව ඉටු කරන තීරණාත්මක කාර්යය භාරය අප හඳුනාගත යුතුයි.

ආසියානු කලාපය මේ සම්බන්ධව සැලකිය යුතු ප්‍රගතියක සිටිය ද ඔවුන් වෙනුවෙන් තව තවත් සම්පත් යෙදවිය යුතු බව මම විශ්වාස කරමි.

මේ වසංගත තත්ත්වය හමුවේ ඉතා කඩිනමින් සාමාජික රටවල සහායට ඩොලර් බිලියන 20ක් බෙදාහරිමින් ආසියානු සංවර්ධන බැංකුව දුන් සහයෝගය අප සිහිපත් කළ යුතුයි.

එන්නත්කරණයට ශ්‍රී ලංකාවට සහ තවත් බොහෝ රටවලට ඩොලර් බිලියන 9ක් ලබා දී ඇති අතර එම සහයෝගයට ආසියානු සංවර්ධන බැංකුවට ස්තූතිවන්ත වීමට මම මෙය අවස්ථාවක් කරගනිමි.

අප ඉදිරියේ ඇත්තේ භයානක අභියෝගයක්. කෙසේ වෙතත් අපට එක්ව මේ අභියෝගයට කාර්යක්ෂමව හා ඵලදායී ලෙස මුහුණ දීමට හැකියාව ඇති බවත් ඒ සඳහා අවශ්‍ය නායකත්වය ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයනු ඇති බවත් මට විශ්වාසයි.

අවසාන වශයෙන්, ලබන වසරේ කොළඹදී පැවැත්වෙන ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ 55 වන වාර්ෂික මහා සභා රැස්වීමට ඔබ සැමට ආරාධනා කිරීමට ලැබීම සතුටට කරුණක්.

මේ වැදගත් සංවාදය අඛණ්ඩව පවත්වාගෙන යෑමට බලාපොරොත්තු වන අතර ඔබ සැමට ආරක්ෂිත සහ නිරෝගී දිවියක් ප්‍රාර්ථනා කරමි.



# අනුවණයන් සේ මරණයට අත වනමු ද?

ප්‍රභාකරන් කලකට පෙර හරි අපූරු කතාවක් කීවේය. ඒ කතාව වූ කලී වෙනෙකක් නොව, මේ රටේ මිනිස්සුන්ට යමක් මතකයේ තියෙන්නේ සතියක දෙකක කාලයක් පමණයි කී කතාවය. ඒ කතාව සහතික ඇත්තකි. අපට මහ විපතක් වුවද ඒ විපත සතියකින් දෙකකින් අමතක වෙයි. එක්කෝ හිතාමතාම අමතක කරති. ප්‍රභාකරන් එදා මේ රට වනසා දමන්නට බෝම්බ පිට බෝම්බ පුපුරවා හැරියේ මේ මිනිසුන්ට මහ විපතක් වුවත් එය දිනෙන් දෙකෙන් අමතක වන වාසිය දඩමීමා කර ගනිමිනි. මේ රට අක්‍රමණය කළ පරදේශක්කාරයෝ ද සිංහලයා උදෙසා කදිම කතාවක් කීහ. "සිංහලයා මෝඩයා කැවුම් කන්න යෝධයා" ඒ කතාවය. ඒ සහතිකයත් මේ රටේ මිනිසුන්ට කදිමට ගැළපෙන එකකි.

අපි මේ අන්ඩරදෙමළෙන් කියන්න යන්නේ මේ රටේ මිනිසුන් හරි පුදුම ජාතියක් බව කීමටය.

මුළු ලෝකයම මහා වසංගතයකට හසුව උතුර, දකුණ සොයාගත නොහැකිව ළතවෙද්දී මේ රටේ මිනිසුන් තාමත් මේ කොරෝනා ව්‍යසනය හරි හැටි තේරුම්ගෙන නැතැයි අපගේ වැටහීමය.

අසල්වැසි ඉන්දියාව ජීවමාන විශාලා නගරය සේ දිස්වෙද්දී මෙරට මිනිසුන් කොරෝනා වයිරසය පයිසෙකටත් ගණන් නොගෙන හැසිරෙන හැටි දකින විට අනේ අපොයි! කියා සිතෙන එක සාධාරණය. චීනයේ වූහාන් නගරයෙන් පළමු කොරෝනා රෝගියා හමු වූයේ ඉකුත් 2019 වසරේ අගෝස්තුවලදීය. චීනයේ මිනිසුන් හිටිහැටියේ මරණයට පත් වී යන හැටි දුටු මෙරට මිනිසුන් තුළ ද කිසියම් බියක් ජනිත වූයේ ඒ මරණ අතිශය භයංකර වූ නිසාය. චීනයේ වයිරසය අපේ රටට එන්නේ නැතැයි කී අය ද සිටිති. එහෙත් මාර්තු වන විට මේ මාරාන්තික වයිරසය මේ දූපතට ද ආවේ කොයි කාටත් යම් තැති ගැනීමක් ඇති කරමිනි.

රට පුරා තැනින් තැන කොරෝනා රෝගීන් මතු වන්නට පටන්ගත් සමයේ නම් මිනිසුන් නිවෙසට වී සිටින්නට වූයේ මර බිය නිසාය. රට පුරා පොලිස් ඇඳිරිනීතිය වැටිණි. කඩසාප්පු වසා දැමිණි. රජයේ මෙන්ම පෞද්ගලික ආයතන ද වසා දැමිණි. ඒ මරබිය දැනුණු නිසාය.

මීටරයක් දුරින් ඉන්න, නිතරම දෑත් පිරිසුදුව තබාගන්න, අත සෝදන්න, මුව ආවරණය පලඳින්න, සංචරණය සීමා කරන්න. කොටින්ම නිවෙසේ රැඳී සිටින්න. "ඔබ මේ ගෙවා දමමින් සිටින්නේ වැඩිම අවදානම් සහිත කාල පරිච්ඡේදයක්" ආදී වශයෙන් මේ වසංගතයේ මාරාන්තික බව හා බිහිසුණු බව පිළිබඳ මොන තරම් දැනුම්වත් කළත්, ටික ටික මාරයාගේ කෙරුවාව අපේ අයට අමතකව ගියේ අර ප්‍රභාකරන් කී කතාව සත්‍යය බව යළිත් තහවුරු කරමිනි.

මේ කොරෝනා වසංගතය මතුවුණේ අපේ රටෙන් නොවීම එක අතකට වාසනාවකි. නැතිනම් ඒ කරුමෙටත් වගවන්න වන්නේ රට කරවන පාලකයන්ටය. ඒ මේ රටේ හැටිය. විපක්ෂයේ උදවිය මේ මොහොතෙත් හැසිරෙන්නේ වයිරස පොදු සතුරා සමඟ නොව ආණ්ඩුව සමඟය. තවත් සමහරු මැයි රැලි තබන්නට අවශ්‍ය බව කියමින් කෑ ගැසූ හැටි මතකය. අදටත් ඇතැම් අය සෞඛ්‍ය උපදේශන තඹදොයිතුවකට මායිම් නොකරමින් කටයුතු කරන්නට යන්නේ ආණ්ඩුව මට්ටු කිරීමට සිතාගෙන දැයි අප දන්නේ නැත. නමුත් සමහර දේශපාලන පක්ෂවල නායකයන් හිතා මතාම සෞඛ්‍ය උපදේශන කඩා දමන බවට ද පෙනෙන්න තිබෙන කාරණාය.

ඇත්තටම කොරෝනා වයිරසය කර ඇති හානිය සුළුපටු නැත. මුළු ලෝකයේම ආර්ථිකය බිමට සමතලා වී යෑමේ අනතුරක් ද නිර්මාණය වෙමින් තිබේ. අපේ ආර්ථිකයට ද කර තිබෙන බලපෑම් අතිශය ප්‍රබලය. මේ විනාශය ඉදිරි දස වසරටම බලපාන ආකාරය පිළිබඳ පුරෝකථනය කිරීමට කල් වැඩිය.

අපි මේ අටුවා ටීකා පසෙකට තබමු. ශ්‍රී ලංකාවේ අපි, මේ වයිරසය හමුවේ හැසිරෙන හැටි හරි ද? තම තමන් තම තමන්ගේ හෘදය සාක්ෂියෙන් විමසිය යුතුව ඇත්තේ එයය.

බම්බලපිටියේ මිලාගිරිය පටුමගේ රාත්‍රී සමාජ ශාලාවක් වැටලීමට පොලිසියට සිදු වූයේ 03 වැනිදා රාත්‍රියේය. ඒ නිරෝධායන නීති රීති උල්ලංඝනය කරමින් සුපිරි සාදයක් පවත්වද්දීය. සුරූපී නිරූපණ ශිල්පීන් විසිපහක් ඇතුළු පිරිසක් පොලිස් අත්අඩංගුවට පත් වූයේ ඒ අනුවය. අත්අඩංගුවට ගත් පිරිසට අඩුව තිබුණේ 'අං' පමණකි.

රාත්‍රී සමාජශාලා, ප්‍රියසම්භාෂණ, මඟුල්, අවමඟුල් උත්සව තහනම් කර තිබියදී වනසතුන් වැනි පුතුන් මෙයාකාරයට හැසිරෙන්නේ ඇයි'දැයි සිතාගත නොහැකිය.

රටේ අනාගතය වන දරු පරපුරට ඉකුත් මාස දහතුනේදීම අකුරු ඉගෙන ගන්නට ද මේ මාරයා ඉඩ දී නැත. ඉකුත් වසරේ පාසල් පැවැත්විය යුතුව තිබූ දින එකසිය අසූ තුනෙන් පාසල් පවත්වා ඇත්තේ දින හැත්තෑ එකකි. බස්නාහිර පළාතේ දරුවන්ට ඒ දින ටිකත් අහිමිව ගියේ මතු පරපුරේ අනාගතයම අඳුරකට හෙළමිනි. මේ ගෙවී ගිය මාස හතර ද දරුවන්ගේ අධ්‍යාපනය විනාශ කර දැමූ මේ මාරයා සමඟ අත්වැල් බැඳගෙන ඩෙංගා නටන සුරූපිනියන් මී හරක්ටත් වඩා අනුවණ ලෙස හැසිරීම සාධාරණය කළ හැක්කේ කාට ද? එපමණක් ද, මේ නිරෝධායන ක්‍රියාවලිය කඩාකප්පල් කරන අමන මිනිසුන් රට හැම තැනකමය. මොන තරම් දැනුම්වත් කළත් සමහරුන්ට මේ උපදෙස් පිළිපදින්නට බැරිව තිබීම ජාතියේම අවාසනාවක් නොවේ ද?

දඹුල්ල ආර්ථිකය, හෝමාගම ආර්ථිකය, වේයන්ගොඩ ආර්ථිකය ආදී මධ්‍යස්ථානවල වෙළෙඳුන් හැසිරෙන හැටි දකින කල මේ වසංගතයෙන් ජනතාව බේරා ගන්නේ කෙලෙස ද? රටම ලොක්ඩවුන් කර පලක් නැත. විපක්ෂයට නම් අවශ්‍යව ඇත්තේ රටම ලොක්ඩ කර රටත් ආර්ථිකයත් ඩවුන් කර දැමීමටය. ඒ දේශපාලන වුවමනා දිනාගනු පිණිසය.

රාජිත සේනාරත්න මන්ත්‍රීවරයා නෙළුම් පොකුණ ගැන සඳහන් කරමින් එය නිරෝධායන මධ්‍යස්ථානයක් බවට පත් කරන්නයැයි පාර්ලිමේන්තුවේදී කළ කතාව අසන කල දේශපාලනඥයන්ගේ ඉලක්කය පැහැදිලිය.

මත්තල ගුවන්තොටුපොළේ වී ගබඩා කළ අනුවණ දේශපාලනඥයන් කොරෝනා වයිරසයත් දේශපාලන පාපන්දුවක් කරගන්නට තනන්නේ නම් මේ රටට අබසරණය.

මේ වයිරසය මොනතරම් ප්‍රබල, භයානක වයිරස ප්‍රභේදයක් දැයි ජයවර්ධනපුර ප්‍රතිශක්ති විද්‍යා හා අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානි මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය ඉකුත්දා කළ පැහැදිලි කිරීමවත් සමහරුන්ට තාමත් හරි හැටි අවබෝධ වී නැත.

දැනට මෙරට පැතිරී යන මේ වයිරස් ප්‍රභේදය තරුණ හා දරුවන්ට ද ඉතා ඉක්මනින්ම වැලඳෙන බව සෞඛ්‍ය බලධාරීහු පුන පුනා ප්‍රකාශ කරති. කිසිදු රෝග ලක්ෂණයක් නොමැතිව හුස්ම ගැනීමට අපහසු වී හිටි ගමන් නිව්මෝනියාව වැලඳී මියැදෙන තරමට මේ වයිරසය වර්ධනය වී ඇත. එහෙව් තත්ත්වයක් හමුවේ අප කළ යුත්තේ සෞඛ්‍ය අංශ මගින් දී තිබෙන සෞඛ්‍ය මාර්ග උපදේශන අකුරට පිළිපැදීමය.

"රට සම්පූර්ණයෙන්ම ලොක්ඩවුන් කර තේරුමක් නැත. මුළු රටම ලොක්ඩවුන් නොකර මාසයක් දෙකක් තුළ මේ වයිරසය පැතිරයෑම සම්පූර්ණයෙන්ම පාලනය කළ හැකියැයි" සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර මහතා කියා සිටී.

ඒ මහතා පෙන්වා දෙන පරිදි එය කළ යුත්තේ රටේ සියලු දෙනා එක හුයකට බැඳී දී තිබෙන සෞඛ්‍ය උපදේශන අකුරටම පිළිපැදීමය. "කොවිඩ් සමඟ ජීවත්වීම සංකල්පය අතහැර කොවිඩ් තුරන් කරමු" තේමාව යටතේ උපාය මාර්ගික සැලැස්මකට කටයුතු කළ යුතුයැයි ද ඒ මහතා කියයි. එසේ කරන්නේ නම් රටේ සාමාන්‍ය හා අත්‍යවශ්‍ය කටයුතු කරගෙන යන ගමන්ම මේ වයිරස සතුරා ද වර්ග කිලෝමීටර් 65,600 ක් පමණ වන මේ බිම් කඩින් තුරන් කර දැමිය හැකිය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මුල් අදියරේදී ඒ කටයුත්ත නිසියාකාරව කළ හැටි අපි දුටිමු. මේ වසරේ මාර්තු මාසය වන විට කොරෝනා වයිරසය පැතිරයෑම ඉතා සාර්ථක ලෙස පාලනය කළ බව පක්ෂ විපක්ෂ කොයි කවුරුත් පිළිගන්නා දෙයකි.

එහෙත් අප කොයි කාටත් එක් තැනකදී කොරෝනා මාරයා අමතකව ගිය බව පිළිගත යුතුය. ඒ ඉකුත් අවුරුදු සමයේදීය. අවුරුදු සමයේදී මිනිසුන් කඩසාප්පුවලට වැදී අලුත් ඇඳුම් ගන්නටත්, නෑදෑ ගමන් යාමටත් පටන්ගත් පසු වයිරස මාරයාට යළිත් ඔක්සිජන් ලැබිණි. ඒ මොහොතේ 'සංචරණය' සීමා කළේ වී නම් රට අද පත්ව තිබෙන තැනට ඇද නොවැටෙන බව ද ඇත්තකි. ජනමාධ්‍ය ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා ද කැබිනට් තීරණ දැනුම් දෙන සාකච්ඡාවේදී ඒ වරද නිහතමානීව පිළිගත් හැටි මතකය.

මිනිසුන් අතින් වැරදි සිදුවීම සාමාන්‍යය දෙයකි. වැරදි නිවැරදි කරගත හැකිය. ගිය නුවණ ඇතුන් ලවාවත් ආපසු ඇදිය නොහැකිය. ඇත්ත ඒකය. එහෙත් ඒ සිද්ධිය අපට කදිම පාඩමක් කරගත හැකිය. අප තාමත් පමා නැත.

තිස් වසරක ශාපලත් යුද්ධය කළ සමයේදී මොන තරම් නම් වැරදි අප අතින් සිදු වූයේ ද? ඒත් ඒ වැරදි අඩුපාඩු සියල්ල ගැන අවබෝධ කරගත් ත්‍රිවිධ හමුදා රණවිරුවන් නන්දිකඩාල් කලපුවේදී වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ කෙරුවාව හමාර කර දැමූවේ වරද නැවත නැවතත් නොකළ නිසාය. එදා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාත් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේත් නායකත්වය ගැන මේ රටේ මිනිසුන්ට අමතකව ගොස් නැත.

එදා ජනපති අද අගමැතිය. එදා ආරක්ෂක ලේකම් අද ජනපතිය. සතුරා වෙනස්ය. එදා සතුරා ඇසට පෙනෙන එකෙකි. ඒ සතුරා සිටියේ මිනිස් පලිහක සැඟවිලාය. මෙදා සතුරා නොපෙනෙන සතුරෙකි. මේ නොපෙනෙන සතුරා සිටින්නේ ඔලමොට්ටල මිනිසුන් පිරිසක් පලිහක් කරගනිමිනි. එනිසා ත්‍රස්තවාදය හා වසංගතය දෙවර්ගයක් වුව ද නසන්නට එය අභියෝගයක් නොවන බව අපගේ වැටහීමය.

කළ යුත්තේ ඔළමොට්ටල මිනිසුන් ටික වෙන්කර ගැනීමය. මුඛ ආවරණ නොදමන, දෑත් පිරිසුදු නොකරන, සංචරණ සීමා නොතකන මේ අධමයන්ට එරෙහිව නිරෝධායන නීති රීති දැඩි කළ යුතුය. දැනට හුදෙකලා කර ඇති ප්‍රදේශවලින් පවා පැන යන අධම මිනිස්සු සිටිති. රාත්‍රී සමාජ ශාලාවල බඩපිනුම් ගසන මිනිසුන් ද ගැහැනු ද සිටිති. මඟතොටේදී මුව ආවරණ බෙල්ලට දමාගෙන යන මී හරක් වැනි පිරිසට නිරෝධායන නීතිය තදින් ක්‍රියාත්මක කළ යුතුය.

මේ සටහන තබන විට අපේ රටේ මිනිසුන් එක්ලක්ෂ දහහත්දහස් පන්සිය තිහකට වඩා වැඩි පිරිසක් වයිරසය ආසාදිත ගොඩට වැටී සිටියහ. සුවය ලැබූ පිරිස එක්ලක්ෂ හැත්තෑපහකට වැඩිය. රෝහල්වල ප්‍රතිකාර ගන්නා පිරිස දහසය දහස් හත්සීය තිස් හතරකට වඩා වැඩි වී තිබිණි. මියගිය පිරිස හත්සීය විසිදෙනෙකි.

මේ වන විට කොවිඩ් මර්දන එන්නත පළමු මාත්‍රාව 928107 දෙනෙක්ට දී තිබිණි. දෙවැනි මාත්‍රාව ලබාගත් පිරිස 140721 දෙනෙකි.

මේ වන විට කොරෝනා වයිරස ප්‍රභේදය දිනෙන් දින වර්ධනය වන තත්ත්වයක තිබෙන බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය චන්දිම ජීවන්දර මහතා පවසයි.

එංගලන්ත ප්‍රභේදය, දකුණු අප්‍රිකා සහ බ්‍රසීල ප්‍රභේද ලෙස ප්‍රභේද තුනක් ද හඳුනාගෙන ඇත. දිනෙන් දින විකෘති ප්‍රභේද මතුවන තත්ත්වය හමුවේ ඒවාට ඔරොත්තු දෙන එන්නත් සොයා ගැනීමට සිදුවනු ඇතැයි ද වෛද්‍ය චන්දිම ජීවන්දර මහතාගේ අදහසයි.

තත්ත්වය එතරම් භයානකය. ඒ නිසා මේ වසංගතය පිළිබඳ පෙරට වඩා සැලකිලිමත්වීම අතිශය වැදගත්ය. බොරදියේ මාළු බෑමට කැසකවන ජාවාරම්කරුවන් ද විවිධ ප්‍රතිකාර පිළිබඳ ප්‍රචාර යවති. ඒවාට හසු නොවී සිටීමට ජනතාව අදිටන් කරගත යුතුය. අසල්වාසී ඉන්දියාව ජීවමාන විශාලාවක සිරිගෙන ඇති අයුරුවත් තේරුම්ගත යුතුය.

වෛද්‍ය ආචාර්ය චන්දිම ජීවන්දර මහතා පවසන්නේ වයිරසය මිහිපිටින් තුරන් කර දැමීමට නම් කළ යුත්තේ මිනිස් සිරුරට වයිරසය ඒම නතර කිරීමය. ඒ අතරතුර එන්නත්කරණයට සියලු දෙනා ලක් කළ යුතුය.

ඒ කාර්යය කෙරෙන තුරු පොදු මහජනතාව එකාවන්ව එකට එක්වී පෙළ ගැසිය යුත්තේ සිරුරකින් සිරුරකට මේ වයිරස් මාරයා ඒම වළක්වා ගැනීමටය. එය ඒ හැටි කජ්ජක් නොවන බව සැබවි. කළ යුත්තේ තම තමන් තම තමන්ට අවංකව, විනයගරුකව සෞඛ්‍යාරක්ෂිතව හැසිරීම පමණි.

දේශපාලනඥයන් මේ මොහොතේ හැසිරිය යුත්තේ ද වගකීමෙනි. නිරෝධායන නීතිය යටතේ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරී තිබෙන රාජකාරිය කඩා බිඳදමන දේශපාලන අලුගෝසුවන්ද බැඳ දැමිය යුතුය. එවැන්නන් සිදු කරන නිහීන ක්‍රියාවලින් සිදුවන්නේ රටත්, රටේ මුළු මහත් ජනතාවත් විපතට වැටීමය.

එනිසා මුඛ ආවරණ අහකට විසිකර දමන මෝඩ රැලක් විසින් කරන ප්‍රියසාද, මත්සාද, රාත්‍රි සමාජ ශාලාවල ජවුසන් සියල්ල නතර කරන තැනට නීති දැඩි කළ යුතුය.

එදා ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයා කී දෙයක් සිහියට නැඟේ. එදා ප්‍රේමදාස ජනාධිපතිවරයා කීවේ දෙකොන දැල්වුණ විලක්කුවක් තමාට ලැබුණ බවයි. එකක් උතුරේ යුද්ධයයි. අනෙක දකුණේ භීෂණයයි.

එදා සහ අද ගත් කල ගෝඨාභය රාජපක්ෂ මහතාට ලැබුණේ පෙර කිසිම රාජ්‍ය නායකයකුට නොලැබුණ අභියෝග ගොඩකි. මුළු ලෝකයම කොරෝනා උවදුරින් වැටිලාය. අමෙරිකාව, චීනය, ඉන්දියාව පමණක් නොව මුළු යුරෝපයම ඉන්නේ ගිනි ගොඩකය. මුළු ලෝකයේම නිෂ්පාදන බෙදාහැරීම් හා වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය දිනෙන් දින බිඳ වැටෙමින් තිබේ. මෙරටට වැඩිම විදේශ විනිමයක් ලැබුණ විදේශ රැකියා ක්ෂේත්‍රය කඩාවැටිලාය. සංචාරක කර්මාන්තය ගන්නට දෙයක් ඉතුරු කර නැත. ඇඟලුම් කම්හල් ටික දුවන්නේද එදා වේල සරි කර ගන්නා තාලයටය. තුනෙන් දෙකක ජනවරමක් ලබා රට සෞභාග්‍ය කරා ගෙන යන්නට බලා සිටි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට නොපෙනෙන වසංගත සතුරකු සමඟ සටන් කරමින් මේ අභියෝගය ජය ගැනීමට සිදුව තිබේ.

ඒ නිසා රටක්, ජනතාවක් ලෙස අප පෙළ ගැසිය යුතුය. ඒ මේ වසංගත සතුරාට එරෙහිවය. විපක්ෂයේ උදවිය මොන තරම් කෙනෙහිලි කළත් පොදු මහජනතාව සිටින්නේ මේ මාතෘභූමිය සතුරන්ගෙන් රැකගන්නා තැනකය. ඒ නිසා කොරෝනා සතුරා පැරදවීමට, අප අපගේ යුතුකම ඉටු කළ යුතුමය.

නැති නම් සිදු වන්නේ අප සියලු දෙනාට පණ පිටින් වැළලීමටය. සියල්ලට වඩා වටින්නේ නිසි ලෙස සෞඛ්‍ය උපදේශන පිළිපැදීමය. එවිට මේ සතුරා මහමුහුදට හෙළා මේ පින්බිමත් නෑ හිතවතුනුත් රැකගෙන අපට හෙටක් ගැන කල්පනා කළ හැකිය.

ශිරාන් රණසිංහ





## ඉතිහාසයේ මුල්වරට අශ්වාරෝහක - ජිම්නාස්ටික් ක්‍රීඩා ඉහළටම

# ශ්‍රී ලංකාවෙන් ටෝකියෝ ඔලිම්පික් දෙවැනි වරම මිල්කා ගෙහානිට

**ප්‍රින්ස් ගුණසේකර**

මේ වසරේ ටෝකියෝ නුවර පැවැත්වෙන ඔලිම්පික් ක්‍රීඩා උලෙළට සුදුසුකම් ලැබූ දෙවැනි ශ්‍රී ලාංකික ක්‍රීඩිකාව බවට පත් වීමට කලාත්මක රිද්මයානුකූල ජිම්නාස්ටික් ක්‍රීඩිකා මිල්කා ගෙහානි ද සිල්වා සමත් වෙයි. ඇය ටෝකියෝ ක්‍රීඩා උලෙළට සුදුසුකම් ලැබූ බව ඔලිම්පික් නිල වෙබ් අඩවිය ඊයේ තහවුරු කළේය. එම නිල වෙබ් අඩවියට අනුව ඉන්දියාවේ ප්‍රනාති නායක්ට වඩා මිල්කා ආසියානු මහාද්වීපයේ අංක එකේ ස්ථානයට පත්ව ඇත.

ටෝකියෝ නුවර පැවැත්වෙන ඔලිම්පික් ක්‍රීඩා උලෙළට මේ වන විටත් අශ්වාරෝහක ඉසව්ව නියෝජනය කරමින් ශ්‍රී ලංකා ක්‍රීඩිකා මැටිල්ඩා කාල්සන් සුදුසුකම් ලබා සිටී. ශ්‍රී ලංකා සම්භවයක් ඇති ඇය ජර්මනියේ පදිංචිව සිටින අතර, එහි සිට තරගවලට එක් වෙමින් ඔලිම්පික් පරිසාදන මට්ටමට ළඟා වූවාය. මේ අනුව ඔලිම්පික් ඉතිහාසයේ මුල්වරට ජිම්නාස්ටික් හා අශ්වාරෝහක ක්‍රීඩාවලින් ඔලිම්පික් වරම් ශ්‍රී ලංකාවට හිමි වීම විශේෂත්වයකි.

කලාත්මක රිද්මයානුකූල ජිම්නාස්ටික් ක්‍රීඩාවෙන් ආසියා කලාපයෙන් දැනට සුදුසුකම් ලබාගත් පළමු ක්‍රීඩිකාව මිල්කා ගෙහානි වන අතර, දෙවනියා බවට ඉන්දියාවේ ප්‍රනාති නායක් පත්ව සිටී.

කෙසේ වුවද ජූනි මාසය දක්වා ඔලිම්පික් පරිසාධන මට්ටමට ළඟා වීමේ අවස්ථා ඇති හෙයින් අන්තර්ජාතික ජිම්නාස්ටික් සම්මේලනය මිල්කා ගෙහානිගේ ඔලිම්පික් සුදුසුකම තහවුරු කරනුයේ එළැඹෙන ජූනි මාසයේදීය.

ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමයේ ලේකම් කපිල ජීවන්ත මහතා පැවසුවේ තම සංගමයට හෝ ජාතික ඔලිම්පික් කමිටුවට මේ පිළිබඳ නිල දැනුම්දීම තවමත් සිදු කොට නැති බවයි. එහෙත් ඔලිම්පික් ක්‍රීඩා උලෙළ නියමිත පරිදි පැවැත්වුව හොත් ශ්‍රී ලංකා ක්‍රීඩිකාවට සියයට සියයක අවස්ථාව ඇති බව ජීවන්ත මහතා 'දිනමිණ'ට පැවසීය.

ඔලිම්පික් ක්‍රීඩා උලෙළ ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 6කට අන්තර්ජාතික ඔලිම්පික් කමිටුවේ සහයෝගිතා ශිෂ්‍යත්ව අරමුදලින් මසකට රුපියල් ලක්ෂ 8 බැගින් ශිෂ්‍යත්ව හිමි කර දීමට ජාතික ඔලිම්පික් කමිටුව කටයුතු යෙදූ අතර, මිල්කා ගෙහානිට ද මසකට අමෙරිකානු ඩොලර් 670 බැගින් ශිෂ්‍යත්වයක් ලබා ජපානයේ වැඩි දුර පුහුණුවට යොමු කෙරිණි. එදා එම ශිෂ්‍යත්ව ප්‍රදානයත් සමඟ ජාතික ඔලිම්පික් කමිටු මහ ලේකම් මැක්ස්වෙල් ද සිල්වා මහතා මිල්කා ගෙහානිගේ දක්ෂතා දැක ඇය අනාගතයේ නියත වශයෙන්ම ඔලිම්පික් ක්‍රීඩිකාවක් වනු ඇතැයි අනාවැකි පළ කළේය.

"ඉතිහාසයේ කිසිදු දිනෙක ජිම්නාස්ටික් ක්‍රීඩාවෙන් අපේ කවුරුත් ඔලිම්පික් ගිහින් නෑ. ඒ වගේම අශ්වාරෝහක ක්‍රීඩිකාවක් ඔලිම්පික් සුදුසුකම් ලබා නෑ. ජාතික ඔලිම්පික් කමිටුව හැටියට සතුටට පත් වෙනවා මේ ක්‍රීඩා දෙකේම ඔලිම්පික් සිහින සැබෑ කරගන්නට මැදිහත්වීමට හැකිවීම ගැන" මැක්ස්වෙල් ද සිල්වා මහතා පැවසීය.

හිටපු ජිම්නාස්ටික් ජාතික ශූර හා ජිම්නාස්ටික් පුහුණුකරු රංජන තරංග යටතේ පුහුණුව ලැබූ ඇය මුලින්ම පිළියන්දල සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලයෙන්ද අනතුරුව පිළියන්දල මධ්‍ය විද්‍යාලයෙන් හා කොළඹ මෙතෝදිස්ත විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇත. වසර 2019දී ඇයගේ ක්‍රීඩා ජීවිතයේ හැරවුම් ලක්ෂය වූ අතර, ජපානයේ පුහුණුවකට අවතීර්ණ වීම එම කැපී පෙණෙන සිදු වීමය. ඇගේ ඔලිම්පික් සිහිනය සැබෑ කර ගැනීමේ ප්‍රධානතම මාවත එම ගමන් මග විය.

අන්තර්ජාතික තරග කිහිපයකදී ශ්‍රී ලංකාව නියෝජනය කර ඇති ගෙහානි 2011දී කනිෂ්ඨ ජාතික ජිම්නාස්ටික් ශූරිය වූවාය. අවස්ථා දෙකකදී ජාතික ශූරිය වීමට සමත් වූ ඇය පසුව 2016 දී පොදු රාජ්‍ය මණ්ඩලයීය යොවුන් ක්‍රීඩා උලෙළේ 6 වැනි ස්ථානයට පත් විය. ඇය 2018 යොවුන් ඔලිම්පික් ක්‍රීඩා උලෙළේදී ද ශ්‍රී ලංකාව නියෝජනය කර අත්දැකීම් ලැබූ ක්‍රීඩිකාවකි.



## අයිපීඑල් ඉතිරිය සැප්තැම්බරයේ?

කොරෝනා වසංගතයේ බලපෑම හේතුවෙන් ලොව ධනවත්ම ලීග් ක්‍රිකට් තරගාවලිය වන ඉන්දීය ප්‍රිමියර් ලීග් විස්සයි20 ක්‍රිකට් තරගාවලිය දින නියමයකින් තොරව කල් දැමීමට පසුගියදා කටයුතු කෙරිණි.

මේ තරගාවලිය අත්හිටුවීමෙන් ඉන්දීය ක්‍රිකට් ආයතනයට ඉන්දීය රුපියල් කෝටි 2000කට අධික පාඩුවක් සිදුව ඇති අතර, මේ හේතුවෙන් අයිපීඑල් සහ ඉන්දීය ක්‍රිකට් බලධාරීන් තරගාවලියේ ඉතිරි කොටස පැවැත්වීම සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේ.

මේ වන විට තරග 60කින් සමන්විත තරගාවලියේ තරග 29ක් ක්‍රීඩා කර ඇති අතර, ඉතිරි තරග 31 එළැඹෙන සැප්තැම්බර් මාසයේදී පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කර ඇතැයි වාර්තා වේ.

අයිපීඑල් සංවිධායකයකු පවසා ඇත්තේ සැප්තැම්බර් මාසයේ තරගාවලිය පැවැත්වීම කෙරෙහි අවධානයක් යොමුව ඇති බවත්, ඒ වන විට එංගලන්ත - ඉන්දියා තරගාවලිය නිමා වී ක්‍රීඩකයන් විස්සයි20 ලෝක කුසලාන තරගාවලියට සූදානම් වන බැවින් එම කාලය ගැන සලකා බලන බවත්ය.

අයිපීඑල් සභාපති බ්‍රිජේෂ් පටෙල් මහතා ද සැප්තැම්බර් මාසයේ තරගාවලිය පැවැත්වීම සම්බන්ධයෙන් සොයා බැලීමට කටයුතු කරන බව පවසා ඇත.

විස්සයි20 ලෝක කුසලානය ඔක්තෝබර් මස 18 සිට නොවැම්බර් මස 15 වැනිදා දක්වා පැවැත්වීමට නියමිත අතර, මේ තරගාවලියේ සත්කාරකත්වය ද අර්බුදයට ලක්ව ඇත්තේ ඉන්දියාවේ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙනි.



## දිමුත් අයිසීසී පිතිකරුවන් අතර දසවැනියා ආසන්නයේ

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් නායක දිමුත් කරුණාරත්න බංග්ලාදේශය සමග නිමා වූ ටෙස්ට් තරගාවලියෙන් පසුව අයිසීසී ටෙස්ට් ක්‍රිකට් පිතිකරුවන් ශ්‍රේණිගත කිරීමේ දසවැනියාගේ ආසන්නයටම පැමිණෙයි. දිමුත් බංග්ලාදේශය සමග නිමා වූ ටෙස්ට් තරග දෙකේදී ඉනිම තුනකට ක්‍රීඩා කොට ලකුණු 428ක් රැස් කිරීමෙන් අයිසීසී ටෙස්ට් ක්‍රිකට් පිතිකරුවන් අතර 11වැනි ස්ථානයේ පසු වේ.

පසුගිය කාලයේදී දිමුත් කරුණාරත්න අයිසීසී ටෙස්ට් ක්‍රිකට් පිතිකරුවන් ශ්‍රේණිගත කිරීමේදී 12වැනි ස්ථානයේ පසු වූ අතර, ලකුණු සාමාන්‍ය 142.66ක දක්ෂතාවකින් අවසන් කළ තරගාවලියෙන් පසු පියවරකින් ඉදිරියට පැමිණියේය. ඔහු එම තරගාවලියේදී ද්විත්ව ශතකයක්, ශතකයක් හා අර්ධ ශතකයක් වාර්තා කරමින් තරගාවලියේ වීරයා සම්මානයට ද පාත්‍ර විය. 2019 අගෝස්තු මාසය වන විට දිමුත් අයිසීසී ටෙස්ට් ක්‍රිකට් පිතිකරුවන් ශ්‍රේණිගත කිරීමේ හොඳම දක්ෂතාවට පත්ව 6 වැනි ස්ථානයේ සිටියේය.

අයිසීසී ටෙස්ට් ක්‍රිකට් පිතිකරුවන් ශ්‍රේණිගත කිරීමේ පළමු ස්ථානයේ නවසීලන්තයේ කේන් විලියම්සන් සිටින අතර, දෙවැනි හා තෙවැනි ස්ථාන වෙන් කර ගැනීමට ඔස්ට්‍රේලියාවේ ස්ටීව් ස්මිත් හා මර්නස් ලෙබුෂේන් සමත්ව සිටිති. ඇන්ජලෝ මැතිව්ස් 24 වැනි ස්ථානයට, නිරෝෂන් දික්වැල්ල 31 වැනි ස්ථානයට හා ධනංජය ද සිල්වා 32 වැනි ස්ථානයට පත්ව ඇත.

## අයිපීඑල් ගිය කැන්ගරුවන්ට මාලදිවයින් පිළිසරණ



ඉන්දියාවේ සිට පැමිණෙන කිසිදු පුද්ගලයකුට රටට ඇතුළු වීමට ඉඩ නොදීමේ නීතිය නිසා අයිපීඑල් ගිය ඔස්ට්‍රේලියානුවන් මාලදිවයින කරා යැවීමට කටයුතු කරයි.

ඔස්ට්‍රේලියානු ක්‍රිකට් ආයතනය සහ ඔස්ට්‍රේලියානු ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ සංගමය ඊයේ මේ බව තහවුරු කළේය.

මින් පෙර එම ක්‍රීඩකයන් ශ්‍රී ලංකාවට හෝ මාලදිවයිනට යැවීමට කටයුතු කරන බවට ඉන්දීය මාධ්‍ය වාර්තා කර තිබූ අතර, ඊයේ ශ්‍රී ලංකා රජය ඉන්දියාවේ සිට පැමිණෙන ගුවන් ගමන් තහනම් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් ඔවුන්ට ශ්‍රී ලංකාව සම්බන්ධ අදහස අත්හැර දැමීමට සිදු විය.

ඒ අනුව තරගාවලියට එක්ව සිටින ඔස්ට්‍රේලියානු ජාතික ක්‍රීඩකයන්, පුහුණුකරුවන්, තරග නිලධාරීන් සහ විස්තර විචාරයක් ඉන්දියාවේ සිට ආරක්ෂිතව මාලදිවයිනට ආරක්ෂිතව ගෙන යන බවත්, ඔවුන් අදාළ තහනම අවසන් වන තෙක් මාලදිවයිනේ රැඳී සිටින බවත් ඔස්ට්‍රේලියානු ක්‍රිකට් ආයතනය පවසා තිබිණි.

ඔස්ට්‍රේලියානු අගමැති ස්කොට් මොරිසන් මේ මස 15 වැනිදා වන තුරු මේ තහනම ක්‍රියාත්මක කිරීමට තීරණය කර අතර, කිසිවකු හෝ ඉන්දියාවේ සිට පැමිණෙන්නේ නම් ඔහුට හෝ ඇයට දඩ මුදලක් ගෙවීමට මෙන්ම සිර දඬුවම් විඳීමට ද සිදු වන බව පවසා ඇත.

අයිපීඑල් තරගාවලියට ක්‍රීඩකයන්, පුහුණුකරුවන් සහ විචාරකයන් ලෙස එක් වූ ඔස්ට්‍රේලියානුවන්ගෙන් ඇන්ඩෘ ටයි, ඇඩම් සම්පා සහ කේන් රිඩ්චිසන් කොරෝනා වයිරසයට බියෙන් ඉන්දියාවෙන් නික්ම ගියේ තරගාවලිය අත්හිටුවීමට සහ ඔස්ට්‍රේලියානු රජයේ තහනම පැනවීමට පෙරය.

ඉතිරිව සිටින ඔස්ට්‍රේලියානුවන් 40 දෙනා ඉන්දියාවෙන් පිට වන්නේ නම් තම රජයේ තහනම් කාලය (මැයි 15) නිමා වන තුරු වෙනත් රටක රැඳී සිටිය යුතුව ඇත. ඒ සඳහා ශ්‍රී ලංකාව සහ මාලදිවයින කෙරෙහි අවධානය යොමු කරමින් ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලය විශේෂ ගුවන්යානයක් යෙදවීමට සූදානමින් සිටියේය. මීට අමතරව ඔස්ට්‍රේලියානු රජයේ තහනම් කාලය මැයි 15 වැනිදා නිමාවෙන් පසු එම ක්‍රීඩකයන්ට මවුබිමට යෑමටත් ගුවන්යානයක් යෙදවීමට තීරණය කර ඇත.

මේ අතර, චෙන්නායි සුපර් කිංග්ස් පිලේ පිතිහරඹ පුහුණුකරු ලෙස කටයුතු කළ මයික් හසී කොරෝනා ආසාදනය වී ඇතැයි පෙරේදා තහවුරු වීම නිසා ඔහුට සෙසු සගයන් සමග එක්විය නොහැකි වී ඇත. මේ වන විට ඔහු දින 10 කාලසීමාවකට විශේෂ ආරක්ෂාව යටතේ නිරෝධායනය වෙමින් සිටී.

විස්තර විචාරකයකු ලෙස අයිපීඑල් තරගාවලියට එක්වී සිටි මයිකල් ස්ලේටර් සිය අගමැතිවරයා දැඩි විවේචනයට ලක් කරමින් ට්විටර් ගිනුමේ සටහනක් තබා ඇත.

"මේක මානුෂික ප්‍රශ්නයක්. ඉන්දියාවේ සිටින හැම ඔස්ට්‍රේලියානු ජාතිකයෙක්ම ලොකු බයකින් ඉන්නේ. ඔබේ පෞද්ගලික ජෙට්යානයෙන් ඉන්දියාවට ඇවිත් බලන්නකෝ පාරවල්වල මිනිස්සු මැරෙන හැටි." ඔස්ට්‍රේලියානු රජයේ තහනම නිසා මේ වන විට මාලදිවයිනේ සිර වී සිටින ස්ලේටර් එසේ සටහන් කර තිබේ.



## අයිපීඑල් තරගවලට ඔට්ටු ඇල්ලූ බුකීකරුවෝ 3ක් කොටු වෙති

අයිපීඑල් තරගාවලියට ඔට්ටු තැබූ බුකීකරුවන් තිදෙනකු කොටු කර ගැනීමට මුම්බායි පොලීසිය සමත් විය. අයිපීඑල් නියෝජනය කළ රාජස්තාන් රෝයල්ස් කණ්ඩායම රැඳී සිටි හෝටලයේදී ඔවුන් අත්අඩංගුවට ගත්තේ ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලයේ දූෂණ විරෝධී ඒකකය දුන් ඔත්තුවකට අනුවය.

ඉන්දිය රුපියල් 97,000ක් සහ ජංගම දුරකතන 8ක්, ලැප්ටොප් පරිගණකයක් සහ සුඛෝපභෝගී මෝටර් රථයක් ඔවුන් භාරයේ තිබී පොලිසිය සොයා ගත්තේය. මේ සියලු දෙනාම රාජස්තාන් වැසියන් වන අතර, ඉන් දෙදෙනකු මීට පෙරත් දේශීය තරගාවලියක් අතරතුර ක්‍රීඩකයන්ට සමීප වීමට උත්සාහ කිරීමක් වාර්තා වී තිබිණි.

## නක්රුමා සහ මේයර්ස්ට කොදෙව් ක්‍රිකට් වාර්ෂික ගිවිසුම්

බටහිර ඉන්දීය කොදෙව් ක්‍රිකට් ආයතනය විසින් 2021-22 තරග වාරය සඳහා වන ක්‍රීඩක කොන්ත්‍රාත් ගිවිසුම් පසුගියදා ප්‍රකාශයට පත් කළේය.

ඒ අනුව මේ වසර මුලදී බංග්ලාදේශයට එරෙහි ටෙස්ට් තරගාවලි ජයක් ගෙන ඒම සඳහා විශිෂ්ට දස්කම් දැක්වූ කයිල් මේයර්ස් සහ න්ක්රුමා බෝනර්ට පළමු වරට කොන්ත්‍රාත් ගිවිසුම් හිමිව තිබීම විශේෂත්වයකි.

ඔවුන් දෙදෙනාට අමතරව ජොෂුවා ද සිල්වා සහ අකීල් හෙසේන්ටද පළමු වරට කොන්ත්‍රාත් හිමිව තිබේ.

තරග රටා ත්‍රිත්වය (ටෙස්ට්, එක්දින හා විස්සයි20) සඳහාම වන කොන්ත්‍රාත් ගිවිසුම් හිමිව ඇත්තේ තුන් ඉරියව් ක්‍රීඩක ජේසන් හෝල්ඩර්ට පමණක් වීම ද කැපී පෙනෙන සිදුවීමක් වන අතර, මින් පෙර සියලු තරග රටා සඳහා කොන්ත්‍රාත් අත්සන් කර සිටි රොස්ටන් චේස්ට මෙවර එම අවස්ථාව අහිමි වී තිබේ.

රොස්ටන් සමග ශිම්රන් හෙට්මයර්, ඔෂේන් තෝමස්, ශෙල්ඩන් කොට්‍රෙල්, ෂේන් ඩව්රිච් සහ ෂමාර් බෲක්ස්ට ද මෙවර කොන්ත්‍රාත් අහිමි වී ඇත.

ක්‍රීඩකයන් 18 දෙනෙකුට මෙවර කොන්ත්‍රාත් හිමිව ඇති අතර, එම ගිවිසුම් ලබන වසරේ ජූලි 1 වැනිදා දක්වා වලංගු වේ.



බෝනර්

## ශ්‍රී ලංකා - බංග්ලාදේශ එක්දින ගැටුම් 23දා සිට ඩකාහිදී

ශ්‍රී ලංකා එක්දින ක්‍රිකට් කණ්ඩායම මේ මස බංග්ලාදේශයේ තරග සංචාරයක නිරත වීමට නියමිත අතර, ඊට අදාළ තරග කාලසටහන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් පසුගියදා නිවේදනය කරනු ලැබීය.

ජෛව ආරක්ෂිත බුබුළු (Bio Bubble) ක්‍රමය යටතේ පැවැත්වෙන, තරග 3කින් සමන්විත මේ තරගාවලිය මේ මස 23, 25 සහ 28 දිනවල දිවා රාත්‍රී තරග ලෙස ඩකාහි ශ්රේ බංග්ලා ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට නියමිතය. ඒ සඳහා එක්වන ශ්‍රී ලංකා පිල මේ 16 වැනිදා බංග්ලාදේශය බලා පිටත්ව යන අතර, එහිදී දින 3ක නිරෝධායන කාලයක් ගත කිරීමෙන් අනතුරුව පුහුණුවීම් ආරම්භ කරනු ඇත. අනතුරුව ශ්‍රී ලංකා සංචිතයේ ක්‍රීඩකයන් අතර, 21 වැනිදා පෙරවරු 9.30ට මීර්පූර්හි ජාතික පුහුණු විද්‍යායතන පිටියේදී පුහුණු තරගයකට එක්වන අතර, තරගාවලිය නිමා වීමෙන් පසු ශ්‍රී ලංකා කණ්ඩායම යළි 29 වැනිදා මෙරටට පැමිණීමට නියමිතය.

මේ තරගාවලිය 2023 එක්දින ලෝක කුසලාන සුපර් ලීග් තරගාවලියට ඇතුළත් වන අතර, එම තරගාවලිය ඉලක්ක කරමින් ශ්‍රී ලංකා සංචිතයේ වෙනස්කම් රැසක් සිදු කර ඇතැයි වාර්තා වේ. ඒ අනුව ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයන් රැසකට එක්දින සංචිතයේ ස්ථාන අහිමිව ඇති අතර, කුසල් ජනිත් පෙරේරා එක්දින නායකත්වයට පත් කර ඇතැයි ද වාර්තා පළ වී තිබේ.

මේ අතර, මේ තරගාවලියට එක්වීම සඳහා අයිපීඑල් තරගාවලියට එක්ව සිටි බංග්ලාදේශ තුන් ඉරියව් ක්‍රීඩක ශකීබ් අල් හසන්ට සහ මුෂ්ටෆිසූර් රහ්මාන්ට අවස්ථාව අහිමි වනු ඇතැයි වාර්තා වේ. ඔවුන් බංග්ලාදේශයට පැමිණිය ද දින 14ක පූර්ණ කාලීනව ස්වයං නිරෝධායනයකට ලක් විය යුතු බවට එරට වෛද්‍ය විශේෂඥයන් නිර්දේශ කර තිබීම ඊට හේතු වී ඇත.

මේ ක්‍රීඩකයන් දෙදෙනාගේ නිරෝධායන කාලසීමාව ලිහිල් කර දෙන ලෙසට බංග්ලාදේශ ක්‍රිකට් ආයතනය එරට රජයෙන් ඉල්ලීමක් කර තිබුණ ද එය ප්‍රතික්ෂේප වී තිබේ.

මේ තරගාවලියට එක්වන 23 දෙනකුගෙන් සමන්විත බංග්ලාදේශ මූලික සංචිතය පසුගියදා ප්‍රකාශයට පත් කෙරිණි.

**බංග්ලාදේශ මූලික සංචිතය** - ටමීම් ඉක්බාල්, නයිම් ෂෙයික්, ඉම්රුල් කයිස්, ලිටන් දාස්, සෞම්‍යා සර්කාර්, නජ්මුල් හුසේන් ෂැන්ටෝ, ශකිබ් අල් හසන්, මුෂ්ෆිකූර් රහීම්, මොහොමඩ් මිතුන්, මහමුදුල්ලා, අෆිෆ් හුසේන්, මොසැඩ්ඩෙක් හුසේන්, මහේඩි හසන්, මෙහීඩි හසන්, ටයිජුල් ඉස්ලාම්, නසුම් අහමඩ්, සයිෆුදින්, මුෂ්ටෆිසුර් රහ්මාන්, රුබෙල් හුසේන්, ටස්කින් අහමඩ්, හසන් මහමුද්, ෂෝරිෆුල් ඉස්ලාම්, ෂොහිදුල් ඉස්ලාම්.

වාමාංශික දේශපාලනයේ මතක හිටින යුගයක් ඉතිහාසයේ ලියැවී තිබේ. ඒ 1935-1970 අතර කාලයයි. විවිධ සටන්, අභියෝග, මත ගැටුම් අතරින් ඒ යුගය ඔපවත් විය. පිලිප්, ලෙස්ලි, රොබට්, චම්ලි, දොස්තර ඇස්.ඒ., ඇන්. ඇම්. , කොල්වින්, වර්නන්, බී. ජේ. ප්‍රනාන්දු වැනි මුල් කාලීන සමසමාජ ආරම්භකයන් මෙන්ම පසු කාලයේ දී ෆ්ලොරන්ස් (කිරිඇල්ල), කැරොලයින් (දඹදෙණිය), කුසුමා (අවිස්සාවේල්ල), කුසලා (බොරැල්ල) ,සහ කැලණිය අසුන හරහා විවියන් ද සටන්කාමී දේශපාලනයට එක් වූවාය. හිරබත් කෑම, පොලිස් පහර දීම්, නීතිය සමග හැංගිමුත්තන් කිරීම් වැනි එදා විප්ලවවාදී දේශපාලන අංග අපේ කතා නායිකා විවියන්ගේ දිවියට ද අලුත් ඒවා නොවීය. පාසලේ ශිෂ්‍ය නායිකාවක වූ ඇය පාසල් වියේදීම සිය මාමාවරුන්ගේ දේශපාලනයට එක් වූවාය. ඒ, අධිරාජ්‍යවාදී පොපි මල් ව්‍යාපාරයට එරෙහිව බොරලුගොඩින් ඇරඹුණු සූරිය මල් ව්‍යාපාරයට එක් වෙමිනි.

# වාමාංශික දේශපාලනයේ රතු මල විවියන්



## අඹු-සැමි යුවළ

1956 පැවති මහ මැතිවරණයෙන් අඹු-සැමි ජෝඩු දෙකක් ජය ගෙන තිබුණි. ලංකා සම සමාජ පක්ෂයෙන් උතුරු කොළඹ අසුනට තරග වැද ඉන් ජය ගත්තේ විවියන් ගුණවර්ධන මහත්මියයි. ඇය එජාපයේ සිල්වා විජේරත්න මහතාට වඩා වැඩි ජන්ද 7,352ක් ගෙන තිබුණි. ඇගේ සැමියා වූ ලෙස්ලි ගුණවර්ධන පානදුර අසුන ජයගෙන පාර්ලිමේන්තුවට ආවේය.

1956 පාර්ලිමේන්තුවට ආ අනෙක් අඹු-සැමි යුවළ වූයේ අවිස්සාවේල්ල දිනූ මහජන එක්සත් පෙරමුණේ පිලිප් ගුණවර්ධන සහ කිරිඇල්ල අසුන දිනූ කුසුමා ගුණවර්ධන යුවළය.

විවියන් ගුණවර්ධන අන් මන්ත්‍රීවරියන්ට වඩා සුවිශේෂී වෙනසක් පළ කළ කාන්තාවක වූවාය. විප්ලවීය දේශපාලනයේ දක්නට ලැබෙන සටන්කාමී චරිතයක් වූ ඇය වරෙක පොලිස් ප්‍රහාරවලට ද මුහුණ දුන්නාය. වරෙක හිරබත් කෑවාය. වාමාංශික ව්‍යාපාරයේ බොරලුගොඩ පිලිප් - රොබට් දෙදෙනාගේ වැඩිමහල් සොහොයුරිය වූ එමලි ඇන්ජලීන්ගේ දියණියක වූ විවියන්ගේ පියාණන් වන්නේ වෛද්‍යා ඩී.ඒ. ගුණතිලකය.

විවියන් සිය සොහොයුරිය වූ ටියුලින් සමග නේවාසිකව සිප් සතර හැදෑරුවේ කොළඹ මියුසියස් බාලිකාවෙනි. ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගය සමත් වූව ද පියා ඇයව විශ්වවිද්‍යාලයට යැවීමට කැමති වූයේ නැත. මාමා වූ රොබට් ගුණවර්ධනගේ රහසිගත වැඩපිළිවෙළක් අනුව ඇය කොළඹ යුනිවර්සිටි කොලීජියට එක්ව ඉන් උපාධිය ලැබුවාය.

ශ්‍රී ලංකාව පුරා පැතිරී ගිය මැලේරියා වසංගතයේදී සූරියමල් ව්‍යාපාරය සමඟ එක්ව රෝගී ජනතාව සුවපත් කිරීමට ඇය ද එම පිරිසට එක් වූවාය.

## රාත්‍රී භෝජන සංග්‍රහය

1937 අප්‍රේල් මාසයේදී ආණ්ඩුකාර ආර්.ඊ. ස්ටබ්ස් විසින් මාක් ඇන්ටනී බ්‍රෙස්ගර්ඩ්ල් නැමැත්තාට ලංකාවෙන් පිටවීමට නියෝගයක් නිකුත් කර තිබුණි. දින 11ක් පොලීසිය මගහරිමින් සැඟවී සිටි බ්‍රෙස්ගර්ඩ්ල් එම මැයි 5 වැනිදා කොළඹ රැස්වීමකට සහභාගී විය. තම පුංචි අම්මා වූ කැරොලයින් ගුණවර්ධන සමග විවියන් ද එම රැස්වීම නැරඹීමට ගියාය.

රැස්වීම නිමාවූ පසු මාමා වූ පිලිප් විවියන්ටත් සොයුරියටත් රාත්‍රී ආහාරයට ආරාධනා කළේය. එය සූදානම් කර තිබුණේ කොළඹ ටුවෙන්ටියත් සෙන්චරි ක්ලබ් හෝටලයේය. ඒ රාත්‍රී භෝජන සංග්‍රහයේදී හමුවූ ලෙස්ලි ගුණවර්ධන එදින තම ආදරය ප්‍රකාශිත සටහනක් විවියන්ට ලැබීමට සැලැස්වූයේය. එහෙත් විවියන්ගේ පියා ඔවුන්ගේ සම්බන්ධයට එරෙහිව සිටියේය. එබැවින් විවියන්-ලෙස්ලි ආදර කතාව නිම වූයේ අධිකරණයෙනි.

ලෙස්ලි ගුණවර්ධනගේ අයිතිවාසිකම් වෙනුවෙන් එදා උසාවියේ පෙනී සිටියේ නීතිඥ ජේ. ආර්. ජයවර්ධනය. දෙපාර්ශවයයේ කරුණු දැක්වීමෙන් අනතුරුව ඔවුන්ගේ විවාහයට අවසර ලැබිණි. 1939 දී විවියන්-ලෙස්ලි අතිනත ගත්හ.

1940 දී විවියන් රෝහල්ගත වූයේ කුලුඳුල් දරුවා බිහි කිරීමටය. ලෙස්ලි ඇය බලන්නට රෝහලට ආවේ හෙදියක ලෙස වෙස් වළාගෙනය.

## බෝගම්බර හිර ගෙදර

සම සමාජ පක්ෂ නායකයන් බෝගම්බර හිර ගෙදරට කොටු වී සිටි අවස්ථාවේ පක්ෂයේ නියමය වූයේ ඔවුන් සියලු දෙනා ඉන්දියාවට පැන යා යුතු බවය. අවසානයේ ඔවුන් හිරගෙදරින් පැන ඉන්දියාවට ගියේය. 1941 දෙසැම්බරයේ විවියන්ට ද ඉන්දියාවට යෑමට සිදු විය.

ලෙස්ලි ඉන්දියාවේදී ට්‍රොස්කිවාදී කණ්ඩායම් එක් රැස් කිරීමේ කටයුතුවල නිරත වූයේය. මදුරාසිය, දිල්ලිය, බොම්බාය, ගෝව ආදී ප්‍රදේශවල ආරූඪ නම්වලින් පෙනී සිටිමින් බ්‍රිතාන්‍ය පාලකයන්ට එරෙහිව දේශපාලන ගමනක නිරත වෙමින් විවියන් ද ඔහු සමඟ වසර 5ක දුෂ්කර හා බියකරු කාලයක් ඉන්දියාවේ ගත කළාය.

දෙවැනි ලෝක මහා සංග්‍රාමය නිමා වූ පසු විවියන් යළි ලංකාවට ආවද ඒ වන විට ලංකා සම සමාජ පක්ෂය දෙකඩ වී තිබිණි. බොල්ෂෙවික් ලෙනින්ස්ට් පක්ෂය කොල්වින් ආර්. ද සිල්වාගේ නායකත්වයෙනුත් ලංකා සම සමාජ පක්ෂය පිලිප් ගුණවර්ධනගේ නායකත්වයෙනුත් ඇරඹී තිබිණි. විවියන් එක් වූයේ බොල්ෂෙවික් ලෙනින්ස්ට් පක්ෂයටය.

1947 දී ඇය ගෙන් ගෙට ගියේ කොළඹ මහ නගර සභා මැතිවරණය වෙනුවෙනි. හැව්ලොක් ටවුම අසුන නියෝජනය කරමින් 1954 වන තුරු නැවත 1960 සිට 1969 දක්වාත් ඇය කොළඹ නාගරික මන්ත්‍රී ධුරයේ කටයුතු කළාය.

## කළු කොඩි

1953 හර්තාලයේදී එජාපයට එරෙහිව ජනතාව කළු කොඩි එසවූ අවස්ථාවේ කොළඹ මහ නගර සභාවේ වහලයේ කුඹ ගසේ කළු කොඩියක් එස වූයේ විවියන් ය. 1956 පැවති මහ මැතිවරණයෙන් ජයගත් විවියන් පාර්ලිමේන්තුවට පා තැබුවාය. එහෙත් 1960 මැතිවරණයෙන් ඇය පරාජයට පත් වූයේ ජන්ද 144කිනි. 1964 දී බොරැල්ල අසුන සඳහා පැවති අතුරු මැතිවරණයෙන් ජයගෙන විවියන් යළි පාර්ලිමේන්තුවට පිවිසියාය. ඇය එම ජූනි මාසයේදී ශ්‍රී ලංකා-සම සමාජ සභාග ආණ්ඩුවේ පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ උප ඇමැතිනිය වූවාය. මෙරට උප ඇමැති පදවියකට පත් වූ ප්‍රථම කාන්තාව වූයේ ඇයයි.

1970 මහ මැතිවරණයට දෙහිවල-ගල්කිස්ස ආසනයට තරග වැදුණු විවියන් එම අසුන ද දිනා යළිත් පාර්ලිමේන්තුවට ආවාය. (ඇගේ සැමියා වූ ලෙස්ලි ගුණවර්ධන ද පානදුර අසුන දිනා එවර පාර්ලිමේන්තුවට ආවේය.) 1983 වසරේ ජාත්‍යන්තර කාන්තා දිනයේදී සාමය හා නිරායුදකරණය වෙනුවෙන් පැවති රැස්වීමකට විවියන් සහභාගි වූවාය. අනතුරුව ඇමරිකානු තානාපති කාර්යාලය දක්වා පෙත්සමක් බාර දීමට ගිය ගමනේදී පොලිසිය ඊට අවහිර කළේය.

**ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගය සමත් වූව ද පියා ඇයව විශ්වවිද්‍යාලයට යැවීමට කැමති වූයේ නැත. මාමා වූ රොබට් ගුණවර්ධනගේ රහසිගත වැඩපිළිවෙළක් අනුව ඇය කොළඹ යුනිවර්සිටි කොලීජියට එක්ව ඉන් උපාධිය ලැබුවාය.**

මේ අවහිරය ගැන කොල්ලුපිටිය පොලීසියට පැමිණිලි කිරීමට ගිය අවස්ථාවේ එහි ස්ථානාධිපතිවරයා සහ කොස්තාපල් කෙනෙකු ඇයට කළ පහර දීම එදා සමස්ත කාන්තා පරපුරම හෙළා දුටුවෝය.

## ජනදින පත්‍රය

1965 බොරැල්ල අසුනින් විවියන් පැරදුනේ එම්. එච්. මොහොමඩ්ටය. එබැවින් ඇය 'ජනදින' පත්‍රයේ සේවයට ගියාය. අසුන දිනූ එම්.එච්. මොහොමඩ් එම ආණ්ඩුවේ කම්කරු රැකී රක්ෂා හා නිවාස ඇමැතිවරයා විය.

විවියන් 'ජනදින' පත්‍රයට පාර්ලිමේන්තු රැස්වීම් වාර්තා කිරීමට පුවත්පත් වාර්තාකරුවන්ගේ ගැලරියට වී සිටි අවස්ථාවක ඇමැති මොහොමඩ් ඇය සිටිනා තැන දුටුවේය.

කුමන මොහොතක හෝ ඇයට ඇනුම් පදයක් කීමට ඇමැති මොහොමඩ් අවස්ථාවක් එන තුරු බලා සිටියේය. දිනක් ඊට අවස්ථාවක් උදා විය.

විවියන් එදා පුවත්පතක පළ කළ පුවතක් අල්ලා ගෙන පාර්ලිමේන්තුව අමතමින් සිටි ඇමැති මොහොමඩ් එක් අවස්ථාවක විවියන් සිටි මාධ්‍ය ගැලරිය දෙස බලමින් මෙසේ කීවේය.

"ගරු කථානායකතුමනි, මාත් සමග බොරැල්ල අසුනට තරග කළ කාන්තාව පරාජයට පත් වුණා. නමුත් පොඩි වෙනසක් තිබෙනවා. ආසනය දිනුවත් මම යට. ඇය උඩ..."

ඇමැතිවරයාගේ කතාව ඇසුණු විවියන්ට උන් හිටි තැන් අමතක විය. පය ලා සිටි සෙරෙප්පුව අතට ගත් ඈ එය පෙන්වමින් "මම දෙන්නේ එයාට සෙරෙප්පුවෙන්" යැයි කීවාය.

සභා ගැබේ සිටි මන්ත්‍රීවරුන්ට සිද්ධිය දැක ගත හැකි විය. සභා ගැබේ සිනා හඬ මතු විය. සිදු වූයේ කුමක්දැයි කථානායක ඇල්බට් එෆ්. පීරිස් මහතා ආසන්නයේ සිටි පාර්ලිමේන්තු නිලධාරියකුගෙන් විමසුවේය.

සිද්ධිය දැනගත් කථානායකවරයා විවියන්ට සති දෙකක කාලයකට පාර්ලිමේන්තු පරිශ්‍රයට ඇතුළුවීම තහනම් කළේය.

පාර්ලිමේන්තුව කල් තැබූ විගසම විවියන් ගැලරියේ සිට මන්ත්‍රීවරුන් පිටවන දොරටුව දෙසට ගියේ ඇමැති මොහොමඩ්ට ප්‍රතිප්‍රහාරයක් එල්ල කිරීමටය.

සිද්ධිය දුර දිග යනු දුටු ජේ.ආර්. ජයවර්ධන, ඇමැති මොහොමඩ්ව ඒ වන විට වෙනත් දොරටුවකින් පිටතට යවන්නට කටයුතු කළේය. සෝපානය ළග රැකගෙන සිටි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විවියන් සන්සුන් කර පිටතට කැදවාගෙන ගියාය.

බන්ධුල ගුණරත්න



# වමේ පක්ෂ සමගි කිරීමේ

48 ඇමති මණ්ඩලය



# රොබට් ගුණවර්ධනගේ අරගලය

**මෙරට පාර්ලිමේන්තු මැතිවරණ ඉතිහාසයේ පළමු තීරණාත්මක මහා මැතිවරණය පවත්වනු ලැබුවේ 1947 දීය. 1945 සැප්තැම්බර් මස ප්‍රසිද්ධියට පත් කළ සෝල්බරි කමිටුවේ නිර්දේශ මත 1947 වසරේදී මෙරට පැවැත්වූ පළමු පාර්ලිමේන්තු මැතිවරණයට අවශ්‍ය මූලික නෛතික රාමුව සකසා ගන්නා ලද්දේය. පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර 95කට මහජන නියෝජිතයන් තෝරා ගැනීම සඳහා 1947 අගෝස්තු මස 23 වැනි දින සිට සැප්තැම්බර් මස 20 වැනි දින දක්වා එනම්, දින 19ක් පුරා පැවැති එම මහ මැතිවරණය මෙරට දේශපාලනඥයන්ට, දේශපාලන පක්ෂවලට මෙන්ම ඡන්දය දීමට සුදුසුකම් ලැබූ ජනතාවටද නුහුරු අත්දැකීමක් වූහ.**

1947 මහ මැතිවරණයට ලංකාවේ වාමාංශික පක්ෂ තුන තරග කළේ වෙන වෙනමය. සමසමාජ පක්ෂයේ බළකොටු පිහිටා තිබුණේ අවිස්සාවේල්ල, රුවන්වැල්ල, යටියන්තොට ප්‍රදේශයේ සහ රත්නපුර දිස්ත්‍රික්කයේය. බෝල්ෂෙවික්වරු මොරටුව සිට කළුතර දක්වා වෙරළ තීරයේ ද, කොමියුනිස්ට්වරු ගාල්ල මාතර දිස්ත්‍රික්කවල ද ශක්තිමත් වූහ. කොළඹ නගරයේ පක්ෂ තුනටම සැලකිය යුතු බලයක් තිබුණි. කෙසේ වුවද මෙසේ වෙන වෙනම තරග කිරීම නිසා ඔවුන්ට ආසන ගණනාවක් අහිමි වූ බව සඳහන් කළ යුතුය. ඒ අනුව මෙම මැතිවරණයෙන් සම සමාජ පක්ෂය ආසන 10ක් ද, බොල්ෂෙවික් පක්ෂය ආසන 5ක් ද සහ කොමියුනිස්ට් පක්ෂය ආසන 3ක් ද වශයෙන් වාමාංශිකයන් ආසන 18ක් දිනාගත් අතර ප්‍රකාශිත ඡන්දවලින් සියයට විස්සක් පමණ ඔවුන්ට අත් විය.

## ප්‍රගතිශීලි රජයක්

1947 මැතිවරණය මෙරට වාමාංශික ප්‍රගතිශීලි රජයක් පිහිටුවීමට තිබූ කුලුඳුල් අවස්ථාව බව සඳහන් කරන රොබට් ගුණවර්ධන, ඒ වන විටත් සම සමාජ පක්ෂයෙන් වෙන්ව සිටි කණ්ඩායම් ඒකරාශී කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටියේය. ඒ පිළිබඳ වූ සිදුවීම් ඔහු සඳහන් කරන්නේ මෙසේය.

"1947 මැතිවරණයට පසුව උදා වූ ගම්පහ අතුරු මැතිවරණයද සම සමාජ බොල්ෂෙවික් සමගය තවත් ඇත්වීමට හේතු විය. මැතිවරණ දේශපාලන සටනේ ට්‍රොස්කිවාදීන්ට සිදු වූ ඒ අවාසනාවන්ත සිදු වීමෙන් පසුව ද මේ පක්ෂ දෙක එක්කිරීමේ උත්සාහය මම අත් නොහළෙමි.

1947 ඔක්තෝබර් මාසයේ ලංකා මෝටර් සේවක සමිතියේ වැඩ වර්ජනයක් ඇති විය. මෙයට රත්මලාන දුම්රිය වැඩපොළේ කම්කරුවෝ ද, කොලොන්නාවේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ කම්කරුවෝ ද, දෙමටගොඩ දුම්රිය අංගනයේ සේවකයෝ ද, විදුලි දෙපාර්තමේන්තුවේ කම්කරුවෝ ද සහ වරායේ ඉංජිනේරු කණ්ඩායම් ද සහභාගි වූහ.

## කම්කරු පිරිස

දින කීපයක් මේ වැඩ වර්ජනය කෙරීගෙන යන විට එය අසාර්ථක වීගෙන යන බව පෙනිණි. ඇන්.ඇම්. පෙරේරාට ඕක්ෆීල්ඩ් වතුයාය මිලදී ගැනීමට මුදලින් උපකාර වූ සිරිල් සොයිසාට අයිති සවුත්වෙස්ටන් බස් කොම්පැනියේ කම්කරු පිරිස පසුවදා වැඩට යාමට තීරණය කර ඇති බව අපට ආරංචි විය. අප සිටි කොල්ලුපිටියේ ගාලු පාරේ අංක 238 දරන තැන හර්මන් අප්පු කීවේ පාන්දර ගල්කිස්සේ වැඩපොළට ගිය හොත් කම්කරුවන් පසුවදා වැඩට යාම නැවැත්විය හැකි බවය. පසුදා පාන්දර අප ස්වාමීන් වහන්සේලා පහළොස්නමක් පමණ වාහනවල ගල්කිස්සට පිටත් කර හැර පසුව පිලිප් ගුණවර්ධන අයියා සහ මම එහි ගියෙමු. වැඩපොළට ඇතුළු වූ අප පිලිප් අයියා පිට්ටනියේ දකුණු පැත්තෙන් ද, මම වම් පැත්තෙන්ද කම්කරුවන් සමඟ කතා කරමින් ඉදිරියට ගමන් කළෙමු. එවිට බස් රථයක් දෙකක් ඉදිරියට ඇද්දවීමට සූදානම් වූ බැවින් පිලිප් අයියා ඉදිරියට ගොස් රථයේ රියැදුරුට කතාකොට, "මේ වැඩවර්ජනය සාර්ථක කරගෙන ආවා මෙතෙක් කල්, මේ කම්කරුවන්ගේ අයිතිවාසිකම් අපි රැක්කා. මෙය කම්කරු පංතියේ සටනක් නිසා මෙය කඩන්නට එපා" කියා බසය ඉදිරියේ බිම දිගා විය. නමුත් රියැදුරෝ දෙතුන් දෙනෙක් බස් රථ ඉදිරියට ඇද්ද වූහ. අපි ඒවා නවත්වා වැඩ වර්ජනය දිගටම ගෙන යාමට සැලැස්වීමු.

## නඩු තීන්දුව

පිලිප් බස් රථය තුළට නැඟ රියැදුරන්ට තර්ජනය කර රිය පැදවීම වැළැක්වූවා යැයි කියමින් ඔහුට විරුද්ධව නඩු පවරන ලදි. නඩු තීන්දුවෙන් ඔහු වැරදිකරු විය. ඔහු සිරගත විය. ඒ උඩ ඔහුට මන්ත්‍රී ආසනය අහිමි විය. පාර්ලිමේන්තුවට පත්වී මාස කිහිපයකින් එසේ ඔහුට ආසනය අහිමි විය. ඒ අනුව අතුරු මැතිවරණයට කුසුමා ගුණවර්ධනට තරග කිරීමට සිදු වූ අතර කුසුමාට නිතරගයෙන් පත් වීමට එවර හැකි වුවාය.

ලංකා සමසමාජ පක්ෂයේත් බොල්ෂෙවික් පක්ෂයේත් පරමාර්ථ එකම වූ අරමුණක් බැවින් පක්ෂ දෙක ඒකාබද්ධ කර ඉදිරියට ගෙනයාම පිණිස ඒකාබද්ධ කොමිටියක් ඇති කළ යුතු යැයි තීරණය කෙරිණි. මේ අවස්ථාවේ ඉන්දියාවේ බොල්ෂෙවික් සහෝදරවරු සමග සාකච්ඡා කර ගැනීම පිණිස පක්ෂය විසින් මා තෝරා ඉන්දියාවට යවන ලදී. එසේ ඉන්දියාවට ගොස් ඉන්දියන් බොල්ෂෙවික් පක්ෂයේ සහෝදරවරු සමඟ සාකච්ඡා කර ආපසු පක්ෂ දෙක ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙළ ගෙන යාම පිළිබඳ පක්ෂය තුළ තීරණයක් කළේය. ඒ තීරණයෙන් තුන් මසකට පසු ලංකා සම සමාජ පක්ෂය සහ බොල්ෂෙවික් පක්ෂයේ සමගගි සම්මේලනයක් පැවැත්වීමට තීරණය විය. එම තීරණය ගත්තේ පිලියන්දල වේරහැර කිට්ටුව නිවසක පැවැත්වූ රැස්වීමකිනි.

## ඒකාබද්ධ වැඩපිළිවෙළ

සමගි කොමිටිවල වැඩවලට ඇන්.ඇම් මුලින් සහාය දුන්නේය. වේරහැර තබන ලද රැස්වීමේදී පිලිප් යම් ප්‍රශ්නයක් ඉදිරිපත් කළ අවස්ථාවේ ඇන්. ඇම් වෙනස් විය. මේ වෙනස්වීම අනුව ඇන්.ඇම් පිලිප් සමග ඊට පසු ඒකාබද්ධ වැඩපිළිවෙළට විරුද්ධව වැඩ කරගෙන ගියේය. සම්මේලනය පැවැත්වීමට දින කීපයකට පෙර මම ඇන්.ඇම් හමුවීමි. "මේ ඒකාබද්ධ වීමට සහාය දෙන්න. සම්මේලනය සාර්ථක වෙනවා. මෙතෙක් කාලයක් වෙන්වී සිටි කණ්ඩායම් ඒකරාශි කළ හැකියි. කම්කරු පංතියේ හැප්පීම අපට වළක්වා ගත හැකියි. එම නිසා පක්ෂය ඉදිරියට ගෙනයාම පිණිසත් මේ අවස්ථාවේදී ඒකාබද්ධ වීම අවශ්‍යයි. එම නිසා ඈත් නොවී එන්න" කියා මම කීවද ඇන්. ඇම්. මැළි වී වෙනම ගමනක් ගියේය. අන්තිමේ ජූනි මස 4 වැනිදාට සතියකට පමණ පෙර ඇන්.ඇම්. ඒකාබද්ධ සම්මේලනයට කැමති විය. මෙසේ සැලසුම් වූ සම්මේලනය ජූනි 4 වැනිදා උදේ 9ට කොළඹ නගර ශාලාවේදි පැවැත්වුණි. පිලිප් මේ සම්මේලනයට ආවේ නැත. ඔහු තම කණ්ඩායමත් සමග වෙනම වැඩ කරන්නට තීරණය කර තිබුණි.

## පක්ෂ කාර්යාලය

සම්මේලනය පැවැත්වූ දිනට පසු දින පිලිප් කොල්ලුපිටියේ ගාලු පාරේ 238 දරන අප පක්ෂ කාර්යාලය බලෙන් අල්ලා ගත්තේය. මේ වන විට මම සිටියේ අත කැඩී ඇදේය. සම්මේලනයට ගියේද අත කැඩී තිබියදීය. මම අත කැඩී ඇඳේ සිටින විට පක්ෂයේ ප්‍රධාන ලේකම් ලෙස්ලි පැමිණ "පිලිප් කාර්යාලය බලෙන් අල්ලාගෙන. අපට එතැනට යන්න බැහැ. රොබට්ට පමණයි යන්න පුළුවන්. පක්ෂයේ අය පන්සීයක් පමණ කාර්යාලයට යාර එකසිය පනහකට පමණ ඈතින් වට වී සිටිනවා. පිලිප් එයාගේ විශේෂ කණ්ඩායමක් සමග කාර්යාලය තුළ බලය පාමින් සිටිනවා" යැයි කීය. "මගේ අත කැඩී තිබුණත් එය එල්ලාගෙන හෝ එතැනට යනවා. ලෙස්ලි මාව කාරයේ දමාගෙන ගොස් කාර්යාලය ළඟින් බස්සවන්න" යැයි කීවෙමි. ලෙස්ලි කාර්යාලයට නුදුරින් මා බස්සවා යන්නට ගියේය. පක්ෂයේ අය හාර පන්සියයක් පමණ ද, පක්ෂයෙන් බාහිර පිරිස් හාර පන්සියයක් පමණ ද කාර්යාලයට නුදුරින් සිටියහ. මම ඉදිරියට ගොස් කාර්යාලයට ඇතුළු වන්න තැත් කරන විට එතැන සිටි පිරිසක් මාව වැළැක්වූහ. මෙය අපේ පක්ෂ කාර්යාලය මට අවහිර කරන්න කිසිවකුට බැහැ. පක්ෂයේ තීරණවලට පටහැනිව ක්‍රියාකරගෙන යාමට පිලිප් බලෙන් කන්තෝරුව අල්ලා ගත්තා නම් ඔහුට එයට ඉඩ දෙන්න බැහැ. මාව වළක්වන්න කිසිවෙකු ඉදිරිපත් වුව හොත් එය කළ හැක්කේ මගේ මළ කඳ උඩින් කියා මා කියද්දි එතැන සිටි අය ඈත් වූහ.

## සටන්කාමීන්

මම මූලික මේසය ළඟ වාඩි වී දුරකතනයද ළඟ ඇතිව උදේ අට හමාරේ පමණ සිට සවස හය පමණ වන තෙක් සිටියෙමි. පක්ෂයෙන් කැඩී ගිය විරුද්ධ කොටස්ද සිටියහ. දොර ළඟ පිලිප්ගේ අය මුර කරගෙන සිටි බැවින් එළියේ සිටි අය ඇතුළට ආවේ නැත. ඔවුන් සටන්කාමීන් වුව ද නායක පිරිස ඈත්ව සිටි හෙයින් සාමාන්‍ය අය ද ඈත්ව සිටියහ. ලෙස්ලි, කොල්වින්, ඇන්.ඇම් ආදී කිසිවකු එතැනට ආවේ නැත. මා පමණි එතැන සිටියේ. සවස හය පමණ වන තෙක් එතැන සිටින විට ලෙස්ලි, ඇන්.ඇම්, කොල්වින් ආදීන් කිහිප වරක් මට දුරකතනයෙන් කතා කළා."රොබට් උදේ සිට ඔතැන සිටියා. අතකුත් කැඩී තියෙනවා. අතට ප්‍රතිකාර කරන්න දොස්තර එන්න යැයි නිතර මතක් කරනවා. ඔතැන හිඳීමේ ඇති තේරුමක් නැහැ. ඒ නිසා ඔතන අතහැරලා එන්න" කියා කීහ. මම සවස එතනින් නැගිට දොස්තර පීරිස් වෙත ගොස් අතට බෙහෙත් දමා ගත්තෙමි.

ඒ දිනවල මෙම සිදුවීම පුවත්පත්වල නිතර පළ විය. ඒ අනුව ටයිම්ස් පත්තරයේ "අපූරු සහෝදරයෝ" නමින් පිලිප් එක අතකින් කඩුවක් ගෙන, රොබට් අතක් කරේ එල්ලා ගෙන අනෙක් අතින් කඩුවක් ගෙන කාර්යාලය ගැනීමට සටන් කරන ආකාරයට විකට චිත්‍රයක් පළ විය.

1935 දී 'සමසමාජ' බැනරය යටතේ සංවිධානය වූ ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය වසර දහයක් වැනි කෙටි කාලයක් තුළ දේශපාලන පක්ෂ තුනකට කැඩී යාම එම විකල්ප දේශපාලන බලවේගය දුබල කිරීමට හේතු වූ ආකාරය 1947 මහ මැතිවරණ ප්‍රතිඵලය මඟින් මනාව පෙන්නුම් කරන ලදි. ඒ අනුව රොබට් ගුණවර්ධන විසින් දේශපාලන උපාය, උපක්‍රම මඟින් වාමාංශික පක්ෂවල සමඟියක් ඇති කිරීමට ක්‍රියාකාරීව මැදිහත් වුව ද පසුකාලීනව දක්ෂිණාංශික ආණ්ඩු සමඟ සහාග දේශපාලනය කිරීම දක්වා දෝලනය වූ ආකාරයක් අවසානයේ හඳුනාගත හැකිය.

**එම්. තාරික්**

---



ආර්. සරවනමුත්තු

# සරවනමුත්තු ගෙදර යැවූ මෙරට ප්‍රථම ඡන්ද පෙත්සම

**වාර්ගික නියෝජනය මත පදනම්ව ව්‍යවස්ථාදායක සභාවට මන්ත්‍රීන් පත් කිරීමේ ක්‍රමය යටත් විජිතවාදී බ්‍රිතාන්‍යයන් විසින් ඉවත් කරන ලද්දේ 1927 නොවැම්බර් 13 වැනිදා මෙරටට පැමිණි ඩොනමෝර් සාමි ප්‍රමුඛ ඩොනමෝර් කොමිෂන් සභාවේ යෝජනා මගිනි.**

ඒ අනුව සර්වජන ඡන්ද බලය වයස 21ට වැඩි ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වයටම හිමි කර දුන් අතර ලංකාව කොට්ඨාස 50කට බෙදා ඉන් මන්ත්‍රීවරු 50ක් තෝරා ගැනීමටත් 08 දෙනෙක් ආණ්ඩුකාරයා විසින් පත් කිරීමටත්, රාජ්‍ය ලේකම්, නීති ලේකම් හා මුදල් ලේකම් නිල බලයෙන් ව්‍යවස්ථාදායක සභාව නියෝජනය කිරීමටත් ඒ අනුව 61 දෙනකුගෙන් සමන්විත රාජ්‍ය මන්ත්‍රණ සභාවක් පිහිටුවීමටත් ඉන් යෝජනා විය. 1931 ජූනි මාසයේ ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාව සඳහා මන්ත්‍රීන් තෝරා ගැන්මේ ඡන්ද පැවැත්වුණි. අද මෙන් එක දිනක මේවා සිදු නොවූ අතර ජූනි මාසය තුළ මන්ත්‍රීන් 50ක් තෝරා ගැනීම සිදු විය. එම මැතිවරණයේදී මන්ත්‍රීවරු 50 දෙනාගෙන් 09 දෙනෙක් නිතරගයෙන් පත් වීම විශේෂයකි.

යාපනය සහ උතුරු ප්‍රදේශයේ දෙමළ අපේක්ෂකයන් නාම යෝජනා දීම ප්‍රතික්ෂේප කළ නිසා දෙමළ මන්ත්‍රීවරු තිදෙනෙක් පත් වූයේ වෙනත් ප්‍රදේශවලිනි. මුල්ම මැතිවරණය උතුරු කොළඹ ඡන්ද කොට්ඨාසයේ පැවැති අතර දොස්තර රත්නජෝති සරවනමුත්තු මහතා සර්වජන ඡන්දයෙන් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවට (රාජ්‍ය මන්ත්‍රණ සභාවට) තේරී පත් වූ ප්‍රථම දෙමළ මන්ත්‍රීවරයා විය.

| | | |
|---|---|---|
| දොස්තර ආර්. සරවනමුත්තු | - ඡන්ද | 11855 |
| දොස්තර එච් ඇන් පීරිස් | - ඡන්ද | 6063 |
| ඩී.බී. ද සිල්වා | - ඡන්ද | 2027 |
| ඒ. රාමනාදන් | - ඡන්ද | 150 |
| වැඩි ඡන්ද | | 5792 |

එම මැතිවරණයේදී හැටන් ඡන්ද කොට්ඨාසයට පැරී සුන්දරම් මහතා නිතරගයෙන් තේරී පත් වූ අතර තලවාකැලේ කොට්ඨාසයට එස්.පී වෛත්‍යලිංගම් දෙමළ මන්ත්‍රීවරයාත් තේරී පත් විය. ප්‍රථමයෙන්ම උතුරු කොළඹ ඡන්ද කොට්ඨාසයෙන් තේරී පත් වූ දොස්තර ආර්. සරවන මුත්තු මහතාට විරුද්ධව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් වූ අතර ලංකාවේ ප්‍රථම මැතිවරණ ඡන්ද පෙත්සම ලෙස ද එය හැඳින්වේ. එම ඡන්ද පෙත්සමේ ප්‍රථම වග උත්තරකරු වූ දොස්තර සරවන මුත්තු මහතාගේ තේරී පත් වීම ඡන්ද පෙත්සම විභාග කිරීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අහෝසි කළේය. මැතිවරණ දූෂණයටද ඔහු වරදකරුවකු කළ බැවින් ප්‍රථම වරට වසර 07කට ඔහුගේ සිවිල් අයිතිවාසිකම් ද අධිකරණය මගින් අත්හිටුවනු ලැබීය. ඒ අනුව 1932 මැයි 28 වැනි දින අතුරු මැතිවරණයක් උතුරු කොළඹ ආසනයට පැවැත්වූ අතර සැමියාගේ දේශපාලන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යාමට සරවනමුත්තු මහතාගේ බිරිඳ ඉදිරිපත් විය. අපේක්ෂකයන් තිදෙනකු පරදා ඇය වැඩි ඡන්ද 8701කින් ජය ගත්තාය.

| | | |
|---|---|---|
| නේසම් සරවන මුත්තු මිය | - ඡන් | 13114 |
| එම් එල් එම් රෙයාල් | - ඡන්ද | 4413 |
| දොස්තර එම්. එම්. පීරිස් | -ඡන්ද | 3333 |
| ඩබ්.බී.පෝල් සිංගර් | - ඡන්ද | 116 |
| වැඩි ඡන්ද | | 8701 |

එම උතුරු කොළඹ අතුරු මැතිවරණයේදී සිවිල් අයිතිවාසිකම් අහිමි වූ සිය සැමියා වූ දොස්තර ආර්. සරවනමුත්තු ඇයට ආධාර උපකාර කරන ලද බව ප්‍රකාශ කරමින් ඇයට විරුද්ධවද ඡන්ද පෙත්සමක් ඉදිරිපත් විය. එය විභාග කළ එල්. සී. ඩෝල්ටන් විනිසුරුවරයා උතුරු කොළඹට නේසන් සරවනමුත්තු මහත්මියගේ පත්වීම අවලංගු කළේය. 1932 සැප් 27 වැනි දින දුන් එම නඩු තීන්දුව අනුව ඇයගේ පත්වීම අවලංගු වුවත් නැවත ඉදිරිපත් වීමේ හැකියාව තිබිණි. මෙලෙස සරවනමුත්තු මහතා මාස 08ක් උතුරු කොළඹ මන්ත්‍රීවරයා වුවද ඔහුගේ බිරිඳ නේසන් සරවනමුත්තුට මන්ත්‍රී ධුරය දැරිය හැකි වූයේ තුන් මාසයක් පමණි.

1932 නොවැම්බර් 12 වැනි දින පැවැති දෙවැනි අතුරු මැතිවරණයේදී ද නේසන් සරවනමුත්තු මහත්මිය ජය ගන්නේ ඉදිරිපත් වූ ප්‍රතිවාදියා ඡන්ද 7730කින් පරාජය කරමිනි.

| | | |
|---|---|---|
| නේසන් සරවනමුත්තු | - ඡන්ද | 8106 |
| එම්.වී කාසිචෙට්ටි | - ඡන්ද | 376 |

මේ අනුව ප්‍රථම දෙමළ මන්ත්‍රීවරයාට ප්‍රථම ඡන්ද පෙත්සමින් මන්ත්‍රී ධුරය අහිමි වුවත් ඔහුගේ බිරිඳ 1936 පැවැති දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභාවටද වැඩි ඡන්ද 4943කින් තේරී පත් වූවාය.

**සමරසේන මුදලිගේ**



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි

### දවසේ රාහු කාලය

උදේ 10.31 සිට 12.07 දක්වා, රාත්‍රී 10.40 සිට 12.07 දක්වා

### දින තත්ත්වය

මේෂ රවි 24 භාග බක් අව එකොළොස්වක තිථිය ලත් කිවි දින ඉර උදාව 5.55ට, ඉර බැසීම 6.19ට. පුවපුටුව නැකත දහවල් 12.29න් ගෙවී උත්‍රපුටුව නැකත ලබයි. බක් අව එකළොස්වක තිථිය සවස 03.37 න් ගෙවී බක් අව දොළොස්වක ලබයි. වෛධෘති යෝගය රාත්‍රී 07.33න් ගෙවී විශ්කම්භ යෝගය ලබයි. බාලව කරණය සවස 3.37න් ගෙවී තෛතිල කරණය ලබයි.

විෂ කලාව - පෙකණිය, අමෘත කලාව - කන

මරු සිටින දිසාව - ගිනිකොන, යෝගිනි - නිරිත

### 2021 මැයි 07 සිකුරාදා හෝරාව ලබා ගෙවී යන අයුරු.

**උදේ**
05.55 - 06.55 දක්වා - සිකුරු හෝරාව
06.55 - 07.55 දක්වා - බුධ හෝරාව
07.55 - 08.55 දක්වා - සඳු හෝරාව
08.55 - 09.55 දක්වා - සෙනසුරු හෝරාව
09.55 - 10.55 දක්වා - ගුරු හෝරාව
10.55 -11.55 දක්වා - කුජ හෝරාව

**සවස**
11.55 - 12.55 දක්වා - රවි හෝරාව
12.55 - 01.55 දක්වා - සිකුරු හෝරාව
01.55 - 02.55 දක්වා - බුධ හෝරාව
02.55 - 03.55 දක්වා - සඳු හෝරාව
03.55 - 04.55 දක්වා - සෙනසුරු හෝරාව
04.55 - 05.55 දක්වා - ගුරු හෝරාව

**රාත්‍රී**
05.55 - 06.55 දක්වා - කුජ හෝරාව
06.55 - 07.55 දක්වා - රවි හෝරාව
07.55 - 08.55 දක්වා - සිකුරු හෝරාව
08.55 - 09.55 දක්වා - බුධ හෝරාව
09.55 - 10.55 දක්වා - සඳු හෝරාව
10.55 -11.55 දක්වා - සෙනසුරු හෝරාව

**අලුයම**
11.55 - 12.55 දක්වා - ගුරු හෝරාව
12.55 - 01.55 දක්වා - කුජ හෝරාව
01.55 - 02.55 දක්වා - රවි හෝරාව
02.55 - 03.55 දක්වා - සිකුරු හෝරාව
03.55 - 04.55 දක්වා - බුධ හෝරාව
04.55 - 05.55 දක්වා - සඳු හෝරාව






**බබාට නමක්**

දහවල් 12.29 දක්වා පුවපුටුව නැකත උදාව පවතින නිසා එතෙක් උපදින දරුවන්ට සෙ, සො, ද, දි අකුරුද ඉන් පසු උත්‍රපුටුප නැකත උදා වන නිසා එතැන් සිට උපදින දරුවනට දු, ථ අකුරුද දිනට අදාළව ච, ජ, ඡ අකුරුද මුල්කර බබාට නමක් දැමීම සුබයි.

## දවසේ ලග්න පලාපල

**මේෂ ලග්නය - රාජකාරියේ දුෂ්කරතා**

මේෂ ලග්නයට අනුව අද ඔබට තම ජීවිතයේ කණගාටුදායක ආරංචියක් නිසා සිතේ කනස්සල්ල මතු කෙරේ. තම රාජ්‍ය තාන්ත්‍රික කටයුතු කෙරේ වැඩි කැපවීමක් කිරීමට සිදු වන අතර, ඒ වෙනුවෙන් දුර බැහැර රාජකාරි කටයුත්තකට යාමටද සිදු වනු ඇත. රැකියා ස්ථානගත සතුරු කරදර මතු කෙරෙන දිනකි. දණහිසට අපලයි. පරිස්සම් වන්න.

**වෘෂභ ලග්නය - යහපත් මානසිකත්වයක්**

වෘෂභ ලග්නයට අනුව අද ඔබට හදිසි ධන සම්පත් උදා කෙරෙන අතර, නව ආයෝජනයකට ඉඩ සැලසේ. ලග්නගතව සිටින සුබ ග්‍රහ සංයෝගයට අනුව යහපත් මානසික තත්ත්වයෙන් එදිනෙදා කටයුතු සුභවාදීව කරගෙන යාමට හැකිවේ. තම දින චරියාවේ වෙනසක් සමඟ කාර්ය බහුලතාව ද දක්නට ලැබේ. උගුරේ ආසාදනයක් මතු කෙරෙන දිනකි.

**මිථුන ලග්නය - කටයුතු බහුලවේ**

මිථුන ලග්නයට අනුව ඔබට අද ඉතා කාර්ය බහුල වනු ඇත. එදිනෙදා සුපුරුදු ලෙස කරගෙන ආ කටයුතු අඩාළ වන බව පෙනේ. හිසට අගුණ පළ කරන නිසා ප්‍රවේශම් වන්න. තම ආර්ථිකයේ සුබවාදී වෙනසක් වෙන්වන දිනකි. මවු පාර්ශ්වයේ කෙනකුගෙන් සහාය ලැබෙන අතර එය මූල්‍යමය සහයෝගයක් ද වෙයි.

**කටක ලග්නය - සතුටුදායක ආරංචි**

කටක ලග්නයට අනුව අද ඔබට පෙර පිං මහිමයට මෙන් ඉතා උසස් ජීවන තත්ත්වයකට පත් වන පෙර ලකුණු පළවේ. ඒ අනුව කලක් තමාට අහිමිව තිබූ දේපළක උරුමයක් පිළිබඳ සතුටුදායක ආරංචි ලැබෙනු ඇත. තමාගේ ඥාති පාර්ශවයේ හා දරුවන් සම්බන්ධ කටයුතු කෙරෙහි සුභවාදී තත්ත්වයකි. උෂ්ණ ගති මතු කෙරෙන නිසා සැර උෂ්ණ ආහාරපාන අවම කරන්න.

**සිංහ ලග්නය - රැකියා ස්ථානගත යහපත්කම්**

සිංහ ලග්නයට අනුව අද ඔබට රැකියා ස්ථානගත යහපත්කම් උදා වේ. තම යුගදිවියට බලපා තිබූ බාහිර බලවේගයක් අවසන් වනු ඇත. දේශපාලනික වශයෙන් ඔබට කෙනකුගෙන් තිබූ බලපෑමක් අවසන් වන අතර, ආර්ථික වශයෙන් ඔබට ලැබෙන්නට තිබූ මුදලක් ද ලැබෙනු ඇත. පපුවේ වියළි ගති මතුවේ. සැර, උෂ්ණ, තෙල් ආහාර අවම කරන්න.

**කන්‍යා ලග්නය - නව ව්‍යාපාරික සැලසුම්**

කන්‍යා ලග්නයට අනුව අද ඔබගේ දින චරියාවේ වෙනස්කමක් මතු විය හැකිය. කරගෙන ආ කටයුතු සාර්ථකත්වය නිසා නව ව්‍යාපාරික කටයුත්තකට අතගසයි. ආගමික මුහුණුවරක් උසුලන කටයුතු රැසක නියැළෙන අතර, ඔබ බලාපොරොත්තු වූ පරිදි රැකියාවේ උසස් වීමක් මෙන්ම අනාගතය වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගයක් සාර්ථක වනු පෙනේ.

**තුලා ලග්නය - අධික වියපැහැදම්**

තුලා ලග්නයට අනුව අද ඔබට ඉතා ප්‍රවේශම් විය යුතු දිනකි. හදිසි අනතුරු පෙන්වයි. දණහිසට අපලයි. තම දරුවකුට අගුණ වන අතර ඒ වෙනුවෙන් කාලය, ශ්‍රමය, ධනය වැය කිරීමට ද සිදුවේ. තමා කෙනකුට දී තිබූ මුදලක් යළි ඔබ අතට පත් වීමට ඉඩ ඇතත්, එය උදා වී ඇති තත්ත්වය අනුව ඉතා ශීඝ්‍රයෙන් වියදම් වන බවක් පෙනේ. කල්පනාවෙන් කටයුතු කරන්න.

**වෘශ්චික ලග්නය - නිවෙස් අලංකරණ කටයුතු**

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට නිවසේ උත්සවශ්‍රීයක් උසුලනු පෙනේ. පවුලට නව සාමාජිකයින් එකතු වනු ඇත. පිටස්තර අය නිවසට පැමිණෙන අතර නිවසේ අලංකරණ කටයුතු කෙරේද දැඩි පරිශ්‍රමයක් දැරීමට කටයුතු කරනු ඇත. නර්තන අංශයේ අයට සිය කුසලතා වර්ධනයට ඉඩප්‍රස්තාව ලැබෙන දිනකි. හිසට වධ දෙන කටයුතු යෙදෙනු ඇත.

**ධනු ලග්නය - හදිසි ලැබීම්**

ධනු ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. හදිසි ධන සම්පත් රැකියා උසස්වීම් මෙන්ම යුගදිවියේ යහපත්කම් උදාවේ. පිටස්තර අයකු වෙතින් ලැබෙන ප්‍රතිපාදනයක ප්‍රතිඵලයක් ලෙස ඔබට අනාගත මූල්‍ය සැලසුමකට ඉඩ සැලසේ. පාඩුපිට පවත්වාගෙන ආ ව්‍යාපාරයක ලාභ මතු කෙරෙන අතර, එය සාර්ථක කර ගැනීමට බොහෝ දෙනකු ඉදිරිපත් වන දිනකි.

**මකර ලග්නය - සතුරු බලවේගයක්**

මකර ලග්නයට අනුව අද ඔබට යුගදිවියේ අවුල් මතු කෙරෙනු ඇත. තම දුර්වලතාවක් හේතුකොටගෙන බලපාන සතුරු බලවේගයක් ක්‍රියාත්මක වෙයි. සිතට කනස්සල්ල හා සැකය නිසා බොහෝ සැලසුම් අඩපණ වන බව පෙනේ. රැකියා ස්ථානගත කටයුතුවල අපිළිවෙළක් ඇති වේ. කෙසේ හෝ හදිසි දේපළ ලැබීමක් පිළිබඳ සතුටුදායක ආරංචි ලැබේ.

**කුම්භ ලග්නය - පිය පාර්ශ්වයේ උරුමයක්**

කුම්භ ලග්නයට අනුව අද ඔබට තම ජීවිතයේ අධිෂ්ඨානය ඉහළ යන කටයුත්තකට මඟ පෑදේ. දිගටම කරගෙන ආ ව්‍යාපාරයක ප්‍රතිලාභ ඉහළ යාම නිසා සතුටුදායක දිනකි. රැකියාවේ කටයුතු අඩාළ විය හැකි වුව ද තම ප්‍රධානීන්ගේ දෝෂදර්ශනයට ලක් වීමට ඉඩ ඇත. පිය පාර්ශ්වයේ උරුමයකට හේතු වේ. යටි බඩේ අසනීප, සැර උෂ්ණ ගති මතු වේ.

**මීන ලග්නය - ආර්ථික ශක්තිය ඉහළ නැංවේ**

මීන ලග්නයට අනුව අද ඔබට තම ආර්ථික ශක්තිය ඉහළ නැංවෙනු ඇත. පෙර දිනක කර තිබූ ආයෝජනයකට අනුව ප්‍රතිලාභයක් පෙන්වයි. තමාට විකුණා ගැනීමට නොහැකිව තිබූ ඉඩමක් සාධාරණ මිලකට විකුණා ගැනීමට හැකි වන අතර, එම මුදල් සුභවාදී ආයෝජනයකට යොමු කිරීමට හැකි වේ. තම නිර්මාණශීලි හැකියාව මෙන්ම කලා කුසලතා ඔප්නංවාගත හැකි දිනකි.

# මත්තලට නව ගුවන් සේවා ආකර්ෂණය කර ගැනීමට විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනවා

## සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග



මත්තල මහින්ද රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළට නව ගුවන් සේවා ආකර්ෂණය කර ගැනීමට විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පැවසීය.

ඒ අනුව මෙරටට පැමිණෙන සියලුම ගුවන් සේවා සමඟ මත්තල ගුවන් තොටුපොළට ගුවන් ගමන් ආරම්භ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවත් වත්මන් කොවිඩ් තත්ත්වය පාලනය වීමෙන් පසු ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් ඇමැතිවරයා කියා සිටියේය.

මත්තල අන්තර්ජාතික ගුවන් තොටුපොළට පැමිණෙන ගුවන් යානා සහ ගුවන් මගීන් ආකර්ෂණය කර ගැනීමේ උපක්‍රමයක් ලෙස සැලසුම් කළ ගුවන් සමාගම් (Scheduled Air lines) සඳහා වසරක ගොඩ බැස්සවීමේ සහ නවතා තැබීමේ ගාස්තු නිදහස් කර ඇති හෙයින් ගොඩබැස්සවීමේ බදු( Embarkation Tax) වසර දෙකක් සඳහා නිදහස් කර ඇති බව ඒ මහතා ප්‍රකාශ කළේය.

මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළට නව ගුවන් ගමන් ආරම්භ කිරීම සම්බන්ධයෙන් ලොට් පොලිෂ්, ලයන් එයාර්, එයාර් අස්ථානා, යුක්රේන් එයාර් ලයින්, ඉන්ඩිගෝ, එලායින්ස් එයාර්, එයාර් ඉන්ඩියා, එමිරේට්ස්, එයාර් විස්තාරා, මෝල්ඩිවියන් එයාර්, සලාම් එයාර් වැනි ගුවන් සමාගම් සමඟ මූලික සාකච්ඡා අවසන් කර ඇතැයි ඇමැතිවරයා සඳහන් කළේය.


එහි ප්‍රතිඵලයක් ලෙස ගුවන් සමාගම් 08ක් වරින් වර නව ගුවන් ගමන් මත්තල ගුවන් තොටුපොළ හරහා සිදු කර ඇති බව පැවැසූ රණතුංග මහතා ස්කැට්, එයාර් අස්තානා, මෝල්ඩිවියන් එයාර්, යුක්රේන් එයාර්, ඉන්ඩිගෝ එයාර්, සලාම් එයාර්, එමිරේට්ස් එම ගුවන් සමාගම් බව පැවසීය.

පසුගිය මාර්තු 31 වන විට මත්තල ගුවන් තොටුපොළින් ගුවන් ගමන් වාර 687 ක් ක්‍රියාත්මක වූ අතර 33,450 කට අධික ගුවන් මගීන් සංඛ්‍යාවක් ඉන් ගුවන් ගමන් පහසුව ලබාගෙන ඇතැයි ද ඇමැතිවරයා සඳහන් කළේය. විදේශයන්හි පැවැත්වෙන ගුවන් සමාගම් සමුළු සඳහා සහභාගී වී මත්තල ගුවන් තොටුපොළ ප්‍රවර්ධනය කිරීමට ද සැලසුම් කර තිබූ බව හෙතෙම කීය.

මත්තල ගුවන් තොටුපොළ සංවර්ධනයට පස් අවුරුදු සංවර්ධන සැලැස්මක් ද සකස් කර තිබේ. ගුවන් ගමන් වාර වැඩි කිරීම, මගී භාණ්ඩ පර්යන්ත හා ගුදම්වල පහසුකම් වැඩි දියුණු කිරීම, ගුවන් යානා නඩත්තුව සහ අලුත්වැඩියා කිරීමේ පහසුකම් ඇති කිරීම, තීරු බදු සහිත සාප්පු සංකීර්ණයක් ද මේ වන විට මගී පර්යන්තයේ ස්ථාපිත කර තිබෙන අතර එහි පහසුකම් වැඩි දියුණු කිරීමට තවදුරටත් කටයුතු කරන බව ද ඇමැතිවරයා සඳහන් කළේය.

# ජනතාව පිට වරද පටවනවා වෙනුවට රට ගැන සිතා කටයුතු කිරීම වගකිවයුත්තන්ගේ අරමුණ විය යුතුයි

## එක්සත් සංවර්ධන පෙරමුණේ ලේකම් ගයාන් කණිෂ්ක



කොවිඩ් - 19 වසංගතය හමුවේ ඉන්දියාව විසාලා මහනුවරක් බවට පත්ව මිනී ගොඩගැසෙමින් තිබෙන මොහොතක එවැනි තත්ත්වයකට අප රට පත් නොකර ආරක්ෂා කර ගැනීමට වගකිව යුත්තන් සතුව සැලසුම් තිබෙන්නේදැයි ජනතාවට හෙළිදරව් කළ යුතු බව එක්සත් සංවර්ධන පෙරමුණේ ලේකම් ගයාන් කණිෂ්ක කුලතුංග මහතා පැවසීය.

කොරෝනා වසංගතයෙන් ජනතාව ආරක්ෂා කර ගැනීමට ප්‍රමුඛ කාර්යය විය යුත්තේ එන්නත්කරණය වන බව දැන දැනත් එයට මූලිකත්වය ලබා දීමට වගකිව යුත්තන්ගේ ප්‍රමාදය පිළිබඳ සිය පෙරමුණේ කනස්සල්ල පළ කරන බව හෙතෙම කීය.

මිලියන 22ක් ජීවත්වන රටක තවමත් එන්නත් ලබා දී ඇත්තේ 5%කට වඩා අඩු ප්‍රමාණයකට බවත් ජනතාව පිට වරද පටවනවා වෙනුවට රට ගැන සිතා කටයුතු කිරීම වගකිවයුත්තනගේ අරමුණ විය යුතු බවත් කඩුවෙල අරංගල පැවැති එම පෙරමුණේ පාක්ෂිකයන් දැනුවත් කිරීමේ රැස්වීමකට එක්වෙමින් ලේකම්වරයා කියා සිටියේය.

සියලු දේ දේශපාලනීකරණයට ලක් කරමින් එක් එක් අයගේ වුවමනාව මත රට විනාශ වීමට නොදී ජනතාවගේ ජීවිත රැක ගැනීමට මූලිකත්වය ලබාදීම සියලු දෙනාගේ වගකීම බව මතක තබා ගත යුතු යැයිද ඒ මහතා ප්‍රකාශ කළේය.

තම දේශපාලන අරමුණු සහ ලාභ ලැබීමේ අරමුණු පසෙකලා රටත්, ජනතාවත් වෙනුවෙන් හැකිතාක් එන්නත් මිලදී ගෙන ජනතාවගෙන් 70% ප්‍රමාණයකටවත් කඩිනමින් එන්නත් ලබාදීමට කටයුතු කිරීම ප්‍රධාන අරමුණ කර ගත යුතු බව පැවැසූ ගයාන් කණිෂ්ක මහතා අධ්‍යාපන කටයුතු සඳහා නිසි රැකවරණය ලබා දීමේ ක්‍රියාදාමයක් ද තවම වගකිවයුත්තන් තුළ තිබේදැයි පැහැදිලි නොවන බව කියා සිටියේය.

පාර්ලිමේන්තුවේ නොමනා හැසිරීම් රටාවක් පෙන්නුම් කිරීමද රටේ පරිහානියේ මූලික ලක්ෂණයක් බව පැහැදිලි වන බවද ලේකම්වරයා පැවසීය.

# කරාපිටියේ රෝහල් ව්‍යාපෘතිය පහසුවෙන්ම කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් කළ හැකියි

## එජාප සභාපති වජිර අබේවර්ධන

**ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ**

ගාල්ල දිස්ත්‍රික්කය ප්‍රමුඛ රටේ නොයෙකුත් ප්‍රදේශවල පසුගිය රජය සමයේ ඉදි කරන ලද ගොඩනැගිලි රැසක් ප්‍රයෝජනයට නොගෙන තිබෙන බැවින් ඒ සියල්ල කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථාන බවට පත් කර ගන්නා ලෙස තමා රජයෙන් ඉල්ලා සිටින බව එක්සත් ජාතික පක්ෂ සභාපති හිටපු ඇමැති වජිර අබේවර්ධන මහතා පැවසීය.

ගාල්ල කරාපිටියේ ඉදි කර තිබෙන රෝහල් ව්‍යාපෘතිය පහසුවෙන් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් බවට පත් කළ හැකි බව පෙන්වා දෙන අබේවර්ධන මහතා ඒ අනුව එහි කොරෝනා රෝගීන් 800කට 900කට පමණ ප්‍රතිකාර ලබාදිය හැකි බව සිහිපත් කළේය.

පසුගියදා කොළඹ පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී ගාල්ල දිස්ත්‍රික්කයේ කොරෝනා රෝගය ව්‍යාප්ත වීම හා රෝහල් පහසුකම් සම්බන්ධව මාධ්‍යවේදියකු නැගූ පැනයකට පිළිතුරු දෙමින් මේ බව සඳහන් කළ වජිර අබේවර්ධන මහතා තවදුරටත් මෙසේද කීය.

ගාල්ල දිස්ත්‍රික්කයේ කොරෝනා ව්‍යාප්තිය ඉතා නරක තත්ත්වයට පත්ව තිබෙනවා. මේ තත්ත්වය හමුවේ රෝගීන්ට ප්‍රමාණවත් ඇඳන් හා පහසුකම් රෝහල්වල ඇත්තේ නැහැ. අපේ පාලන කාලයේදී මෙන්ම ඊට පෙර පැවැති පාලන කාලයේ "එල්මට් කෝල්" නැමති පදනමෙන් කරාපිටියේ රෝහල් ව්‍යාපෘතියක් ආරම්භ කළා. එහි වැඩ කටයුතු නිම වී තිබෙන නිසා එය වහාම භාවිතයට ගන්නා ලෙස අපි රජයෙන් ඉල්ලා සිටිනවා.

මේ රෝහලේ කොරෝනා රෝගීන් 800කට 900කට පමණ පහසුකම් සැලසිය හැකියි. ඔක්සිජන් සැපයිය හැකි ආකාරයට ගොඩනගා තිබෙන මේ රෝහලට අවශ්‍ය වන්නේ ප්‍රධාන ඔක්සිජන් ටැංකි ටික පමණයි. එමෙන්ම ත්‍රී ෆේස් ට්‍රාන්ස්ෆෝමර්, මළ අපවහන පද්ධති හා ඊට අවශ්‍ය පහසුකම් සපයාගත යුතුව තිබෙනවා. එම අඩුපාඩු කඩිනමින් සපුරනවානම් මෙය ප්‍රයෝජනයට ගත හැකියි.

අධික මුදලක් වැය කරමින් ඉදිකරන ලද මේ නව ගොඩනැඟිල්ල අපේ පාලන කාලයෙන් පසු අතහැර දමා තිබෙනවා. මෙහි තිබෙන සුළු අඩුපාඩුකම් සම්පූර්ණ කර එය ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් කඩිනමින් ප්‍රයෝජනයට ගත යුතුයි.



ගාල්ල දිස්ත්‍රික්කයේ පමණක් නොව රටේ වෙනත් ප්‍රදේශවල ද පසුගිය රජය සමයේ ඉදිකරන ලද මෙවැනි ගොඩනැඟිලි රැසක් තිබෙනවා. එම ගොඩනැඟිලිද කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර කරන ස්ථාන බවට පත් කරගන්නා ලෙස රජයෙන් ඉල්ලා සිටිනවා.

## අධිකරණය නොමඟ යැවීම ඇතුළු තවත් චෝදනා:

# ශානි අබේසේකර ඇතුළු සැකකරුවෝ ජූනි 19 තෙක් තවදුරටත් රිමාන්ඩ්

**සුභාෂිණී සේනානායක**

අසත්‍ය සාක්ෂි නිර්මාණය කර අධිකරණය නොමඟ යැවීම ඇතුළු තවත් චෝදනා සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රිමාන්ඩ් බාරයේ සිටින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා සහ ඇඹිලිපිටිය පොලිසියට අනුයුක්ත සේවය කරන ලද උප පොලිස් පරීක්ෂක රෝහණ මෙන්ඩිස් ඇතුළු සැකකරුවන් තිදෙනා ලබන ජූනි මස 19 වැනිදා දක්වා තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස ගම්පහ මහාධිකරණය ඊයේ (05) නියෝග කළේය.

සිද්ධියට අදාළව නඩුව කැඳවූ අවස්ථාවේදී ශානි අබේසේකර ඇතුළු සැකකරුවන් තිදෙනා අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ ගම්පහ මහේස්ත්‍රාත් මංජුල තිලකරත්න මහතා මේ නියෝගය කළේය.

ශානි අබේසේකර මහතා, ඇඹිලිපිටිය පොලීසියට අනුයුක්තව සේවය කළ උප පොලිස් පරීක්ෂක මෝහන මෙන්ඩිස් සහ විශ්‍රාමික උප පොලිස් පරීක්ෂක නවරත්න ප්‍රේමතිලක යන අය මෙලෙස තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි.

## පොල් මිල

### පොල් සංවර්ධන අධිකාරිය - ප්‍රකාශිත දිනය 2021/05/05

1. පොල් මිල
(අ) වෙළෙඳපොළ මිල ගණන් 2021.04.16 -2021.04.22 (මූලාශ්‍රය - HARTI)

| | | තොග මිල | සිල්ලර මිල |
|---|---|---|---|
| ලොකු ප්‍රමාණය | ගෙඩියක මිල රු. | 68.00 - 70.00 | 80.00 - 90.00 |
| කුඩා ප්‍රමාණය | ගෙඩියක මිල රු. | 60.00 - 65.00 | 60.00 - 75.00 |

(ඇ) දේශීය ගොවිපළ මිල රු/ගෙඩි 1000ක් (ලෙලි නොගසන) රු/මෙ.ටො.1ක මිල (ලෙලි ගසන ලද)

| | | |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 60,000 - 65,000 | 115,000 -120,000 |
| පුත්තලම් දිස්ත්‍රික්කය | 65,000 - 72,000 | 110,000 -116,000 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 60,000 -65,000 | 110,000 -115,000 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 65,000 - 68,000 | 110,000 - 112,000 |

2.කොප්පරා - දේශීය වෙළෙඳපොළ මිල 05/05/2021
බාද්‍ය කොප්පරා (රු/කි.ග්‍රෑ.250ක්) -
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා (රු/කි.ග්‍රෑ.250ක්) - 105,000
තෙල් සිඳින විශිෂ්ට අංක 2 කොප්පරා (රු/කි.ග්‍රෑ.250ක්) - 85,000
තෙල් සිඳින සාමාන්‍ය කොප්පරා (රු/කි.ග්‍රෑ.250ක්) -
3.දිසිදි පොල්
සියුම් මධ්‍යම ශ්‍රී ලංකා (දේශීය) (රු./කි.ග්‍රෑ.1 ක්) 580 - 600 සා
(රු./කි.ග්‍රෑ.1 ක්) 580 - 600 සා
ශ්‍රී ලංකා - නැව තෙක් මිල (රු./කි.ග්‍රෑ.1 ක්)
4.පොල් තෙල් (තොග මිල)
දේශීය මිල (රු./මෙ.ටො.1ක්) 700, 000 - 730,000 සා
පිලිපීන් (මි.ර.ගැ/රොටඩෑම්) ඔයිල් වල්ඩ් (2021.04.22) (රු./මෙ.ටො.1ක්) 338,967
5. පුන්නක්කු (රු./මෙ.ටො.1ක්) 65,000 - 80,000 වි
6. ගුදිරි කොහු (රු./කි.ග්‍රෑ.50 ක්) 950 - 1,400 වි
7. ඕමැට් කොහු (රු./කි.ග්‍රෑ.50 ක්) 3,750 - 5,000 වි
8. මිශ්‍ර කොහු (රු./කි.ග්‍රෑ.50 ක්) 1,650 - 1,800 වි
9. බ්‍රිස්ටල් කොහු බැමි 1 (රු./කි.ග්‍රෑ.50 ක්) 5,000 - 7,5 00 වි
10. බ්‍රිස්ටල් කොහු බැමි 2 (රු/කි.ග්‍රෑ. 50ක්) 8,000 -9,000 වි
11. පොල් ලෙලි මිල (03-05-2021)

| දිස්ත්‍රික්කය | පොල් ලෙලි 1000ක මිල (රුපියල්) |
|---|---|
| පුත්තලම | 4,500 - 5,000 |
| ගම්පහ | 4,500 - 5,000 |
| මාතර | 4,500 - 5,000 |
| කුරුණෑගල | 4,500 - 5,500 |

තෙතමනය 50% වැඩි පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.00
තෙතමනය 40% - 50% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.50
තෙතමනය 30% - 40% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 8.50
තෙතමනය 20% - 30% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 9.50
තෙතමනය 10% - 20% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 10.50
තෙතමනය 10% අඩු පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 13.00
12. පොල් කටු (රු/මෙ. ටො. 1ක්) 25,500 -26,500 වි
13. පොල් කටු අඟුරු (2021-04-16 - 2021-04-22) (රු/මෙ.ටො. 1ක්) 97,000.00 වි
(තෙතමනය - 12%, අඟුරු කුඩු - 3%)
14. පොල් ඉරටු (රු./මෙ.ටො. 1ක්) 42,000 - 45,000 වි
**වි - විකුණුම් මිල සා.- සාමාන්‍ය මිල**

## Knowledge City Malabe ප්‍රථම ගොඩනැගිල්ල විවෘත කෙරේ



ඇක්සස් රෙසිඩෙන්සීස් සහ ෆෝසයිට් ඉන්ජිනියරින් සමාගම් එක්ව ගෙනෙන Knowledge City Malabe (KCM) ව්‍යාපෘතිය පසුගියදා අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා අතින් විවෘත විය. නගරයක් ඇතුළත සියලු පහසුකම්වලින් හෙබි තවත් නගරයක් ලෙස නිර්මාණය කෙරෙන මේ ව්‍යාපෘතිය, සාමාන්‍ය ජීවන රටාවකට අවැසි සියලු පහසුකම්වලින් හෙබි අතර, සමස්ත ව්‍යාපෘතියෙන් 50%කට වැඩි ප්‍රමාණයක් වෙන්වන්නේ අධ්‍යාපනය හා බැඳුණු ක්‍රියාකාරකම් සඳහා වීම කැපී පෙනේ.

මේ ව්‍යාපෘතිය යටතේ ඉදි කළ පළමු ගොඩනැගිල්ල මහල් 7කින් සහ වර්ග අඩි 150,000ක වපසරියකින් යුතු දැවැන්ත ගොඩනැගිල්ලකි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිළි ගැනීම ලැබූ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් වන Horizon කැම්පස් ආයතනයේ ඉගෙනුම ලබන සිසුන් 3,200ක් පමණ මේ ගොඩනැගිල්ලේ පහසුකම් අත්විඳීමට නියමිතය. ඊට අමතරව Spark Academy ආයතනය මෙහි 6වැනි මහලට පිවිසෙමින් තොරතුරු තාක්ෂණ අංශයේ අධ්‍යාපන කටයුතු කිරීමට අපේක්ෂිතය. මේ උසස් අධ්‍යාපන ආයතනය තුළ අධි තාක්ෂණික පරිගණක විද්‍යාගාර 6ක්, විද්‍යාගාර 3ක්, පුස්තකාල, අවන්හල්, rooftop ආලින්දයක් මෙන්ම 400කට අසුන් පැනවිය හැකි නවීන ශ්‍රවණාගාරයක් ද ස්ථාපිත කර ඇත. ව්‍යාපෘතිය එළිදැක්වීමේ අවස්ථාවට සහභාගි වූ අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පැවසුයේ සමාජ අවශ්‍යතාවන්ට අනුකූලව විෂය මාලා සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, විවිධ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කරමින් සිටින බවය. එහිදී මෙරට අනාගත පරපුරේ අධ්‍යාපනය වෙනුවෙන් KCM හරහා ලැබෙන පිටුවහල පිළිබඳ ඇමැතිවරයා ප්‍රශංසාත්මකව අදහස් දැක්වීය.

## SUPERBOX On-line නව සුපිරි වෙළෙඳසල



ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පරිපූර්ණ හා සියලු සේවා එකම ස්ථානයකින් දෙන On-line සුපිරි වෙළෙඳසල වන superbox.lk පසුගියදා ආරම්භ කෙරිණි. මෙමගින් වඩාත් ඉක්මනින් හා පහසුවෙන් පාරිභෝගිකයන් වෙත භාණ්ඩ ගෙනගොස් භාරදීමට අපේක්ෂා කෙරේ. නැවුම් ආහාර, ශීත කළ හා අධිශීත කළ ආහාර ද්‍රව්‍ය හා වියළි ආහාර ද්‍රව්‍ය ඇතුළුව පුළුල් පරාසයක පැතිරුණු භාණ්ඩ වර්ග රාශියක් මේ ඔස්සේ මිලදී ගැනීමට ශ්‍රී ලාංකිකයන්ට අවස්ථාව සැලසෙනු ඇත. ව්‍යාපාර ලොවේ ප්‍රමුඛයන් දෙදෙනකු වන සිදත් කොඩිකාර සහ දුලිත් හේරත් යන මහත්වරුන් එක්වී SUPERBOX නිර්මාණය කර තිබේ. අද දවසේ ගුණාත්මක භාවයෙන් ඉහළ, ඉක්මන් හා විශ්වාසනීය on-line ග්‍රොසරි භාණ්ඩ අලෙවි හා ඩිලිවරි සේවා වෙනුවෙන් පවතින විශාල ඉල්ලුම හඳුනාගමින් මේ පියවර ගන්නා ලදි. ඒ අනුව, භාණ්ඩ ගබඩා කිරීම, ප්‍රසම්පාදනය, අලෙවි කිරීම සහ මිලදී ගන්නා භාණ්ඩ ගෙනගොස් භාරදීම ඇතුළුව සියලු කටයුතු SUPERBOX මගින් කරනු ඇත. මීට ඉහතදී රටේ ප්‍රමුඛතම පාරිභෝගික භාණ්ඩ සමාගමක ප්‍රධාන විධායක නිලධාරිවරයකු ලෙස සේවය කළ සිදත් කොඩිකාර මහතා ශ්‍රී ලංකා සිල්ලර වෙළෙඳ ව්‍යාපාරිකයන්ගේ සංගමයේ සභාපති ලෙසද කටයුතු කර තිබේ. දුලිත් හේරත් මහතා සුප්‍රකට kapruka.lkහි නිර්මාතෘවරයාය.

# MARKET PRICE

## රට වටා මිල ගණන්



| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| **පහත රට එළවළු** | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 90 | 120 | 45 | 45 | 30 | - | ගෝවා | 90 |
| අළු කෙසෙල් | 100 | 120 | 70 | 40-70 | 20-25 | 40-50 | කැරට් | 100 |
| පිපිඤ්ඤා | 100 | 120 | 50 | 50-60 | 20 - 30 | 25-30 | ලීක්ස් | 50 |
| වැටකොළු | 160 | 160 | 120 | 110 | 50-60 | 20-30 | රාබු | 50 |
| බණ්ඩක්කා | 140 | 120 | 80 | 70-80 | 60-75 | 50-60 | බීට්රූට් | 50 |
| කරවිල | 160 | 100 | 120 | 90 | 110 | 50-70 | අර්තාපල් | 110 |
| පතෝල | 140 | 120 | 80 | 100-110 | 50 | - | අර්තාපල් රතු | 95 |
| මාළු මිරිස් | 240 | 280 | 220 | 120 | 80-100 | - | නෝකෝල් | 60 |
| බටානා | - | 120 | 80 | 70 | 75-85 | - | බෙල්පෙපර් රතු | 350 |
| මුරුංගා | 360 | - | - | - | - | - | කහ | 350 |
| එළබටු | 140 | - | 100 | 90 | 50-70 | 55-60 | කොළ | 220 |
| කැකිරි | 80 | 100 | 40 | 30 | 15-20 | 10-20 | බැසිල් | 330 |
| නෝකෝල් | 160 | 120 | 120 | 90 | 60-70 | - | චයිනීස් කැබේජ් | 170 |
| මඤ්ඤොක්කා | 80 | 80 | 80 | - | 30 | 30-35 | රෙඩ් කැබේජ් | 450 |
| බතල | - | - | 60 | - | 40-50 | 60-65 | සැල්දිරි | 450 |
| දඹල | 160 | - | 110 | 110 | 110 | - | කොත්තමල්ලි කොළ | 200 |
| මැකරල් | 140 | 120 | 70 | 80 | 80 | 50-60 | අයිස්බර්ග් | 220 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 60 |
| බෝංචි | 200 | 160 | 120 | 120 | 120 | - | රතුසලාද | 350 |
| ගෝවා ගෙඩි | 160 | 160 | 80 | 110 | - | 60-65 | මිංචි | 220 |
| කැරට් | 180 | 180 | 140 | 140-145 | 140-130 | 90-100 | පාස්ලි | 220 |
| ලීක්ස් | 120 | 120 | 60 | 70-75 | - | - | රූබා | 60 |
| රාබු | 120 | 100 | 6 | 40-70 | 60 | 25-30 | රෝස්මරි | 700 |
| තක්කාලි | 140 | 120 | 120 | 40-70 | 60-70 | - | බ්‍රොකෝලි | 550 |
| බීට්රූට් | 120 | 120 | 50 | 70 | 85-90 | 30-45 | මල්ගෝවා | 400 |
| සලාද | - | 200 | 250 | 50 | 130-150 | - | රතුරාබු | 450 |
| ගෝවා කොළ | 160 | - | 30 | 30 | - | - | පැවර්ලි | 220 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 170 |
| අන්නාසි | 140 | 200 | 120 | 100 | 80-100 | 70-90 | කහ සුකිනි | 170 |
| ඇඹුල් කෙසෙල් | 120 | 140 | 70 | 40 | 30-50 | 35-40 | දිගරාබු | 100 |
| කෝලිකුට්ටු | 220 | 280 | 180 | 180 | 100-130 | 130-140 | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 140 | 140 | 80 | 50 | 30-50 | 50-55 | මාළුමිරිස් | 200 |
| ඇඹුන් | 200 | 200 | 140 | - | - | - | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | - | - | 120 | 60 | - | - | | |
| ගස් ලබු | 120 | 150 | 120 | 60 | 30-40 | 45-55 | | |
| ඇපල් (ආනයනික) | 60 – 80 | - | 60 | - | - | - | | |
| මිදි (දේශීය) | - | - | - | - | - | - | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | 900 | - | - | - | | |
| මිදි (ආනයනික කොළ) | 1100 | 1200 | 990 | - | - | - | | - |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස් - අලුත් (සම රහිත) | 580 | 750 | 530 | - | 550 | - | | - |
| කුකුළු මස් - ශීත කළ (සම සහිත) | 480 | 650 | 550 | - | - | - | | - |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 200 | 260 | 120 | 70 | 100-140 | 50-100 | | |
| දෙහි | 180 | 200 | 180 | 120 | 70-80 | 80-90 | | |
| අමු ඉඟුරු | - | 500 | 300 | - | - | 190-200 | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 96-115 | 110 | 110 | 105 | - | - | | |
| සුදු නාඩු | 96-120 | 105 | 115 | 113-114 | 106-107 | - | | |
| රතු කැකුළු | 89-100 | 95 | 95 | 92-97 | 100 | - | | |
| සුදු කැකුළු | 93-100 | 100 | 110 | 104 | - | - | | |
| සුදු කැකුළු සම්බා | 108 | - | 120 | - | 130 | - | | |
| තම්බපු කැකුළු සම්බා | 110 | 135 | 155 | 130 | 138-140 | - | | |
| කිරි සම්බා | 125-200 | 190 | 190 | - | 198 | - | | |



### දැනගෙන ගන්න රන් මිල

| |
|---|
| කැරට් 21 - 94937 |
| කැරට් 22- 99458 |
| කැරට් 24- 108500 |

# පිළියන්දල හුදෙකලා කිරීම ඉවත් කිරීමට ඇමැති ලොකුගේ මැදිහත් වූ බවට සමාජ මාධ්‍ය ගෙන යන ප්‍රකාශ බොරු

## කැස්බෑව නගර සභා සභාපති ඇතුළු මන්ත්‍රීවරු කියති

**සුභාෂිණී සේනානායක**

කොවිඩ් 19 ව්‍යාප්තිය හේතුවෙන් පිළියන්දල පොලිස් බල ප්‍රදේශය තුළ සිදු කළ හුදෙකලා කිරීම ඉවත් කිරීමට ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා මැදිහත් වූ බවට මාධ්‍ය සහ සමාජ මාධ්‍ය සිදු කරන ප්‍රකාශ සම්පූර්ණයෙන්ම අසත්‍ය බව කැස්බෑව නගර සභාවේ සභාපති ලක්ෂ්මන් පෙරේරා මහතා ඇතුළු මන්ත්‍රීවරු පවසති.

මාධ්‍ය සහ සමාජ මාධ්‍යවල පැතිර ගිය පුවත සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඔවුහු මේ බව කියා සිටියහ.

දැනුම්දීමකින් තොරව එකවර වසා දැමීමට කටයුතු කිරීම හේතුවෙන් විශාල පිරිසක් නගරය කරා පැමිණීම හේතුවෙන් කොවිඩ් ව්‍යාප්තිය වර්ධනය වනු ඇති බවට ලැබුණු දැනුම්දීම් සහ සිදුකළ නිගමනය මත නිසි අධීක්ෂණය මත තීරණය කරන ලෙස ගාමිණී ලොකුගේ මහතා සෞඛ්‍ය අංශවලින් ඉල්ලීමක් පමණක් කළ බව කියා සිටි ඒ මහතා සෞඛ්‍ය අංශ සහ බුද්ධි අංශ සිදු කළ පරීක්ෂණවලින් අනතුරුව පමණක් කොවිඩ් රෝගීන් කීප දෙනෙක් සිටි ප්‍රදේශවල හුදෙකලා තත්ත්වය ඉවත් කිරීමට පියවර ගත් බවද කියා සිටියේය.

සභාපතිවරයා ඇතුළු මන්ත්‍රීවරුන් මේ බව කියා සිටියේ පෙරේදා(05) කැස්බෑව නගර සභාවේ පැවැති මාධ්‍ය හමුවකට එක් වෙමිනි.

එහිදී ඒ මහතා මෙසේද කීය.

මේ වනවිට ග්‍රාම සේවා වසම් 23න් 13ක් හුදෙකලා කර තිබෙනවා. 2020 මාර්තු මස 11 සිට මේ දක්වා කොවිඩ් රෝගීන් 1184ක් වාර්තා වී තිබෙනවා. පසුගිය දින 14ක් තුළ රෝගීන් 730ක් වාර්තා වී තිබෙනවා.

ගාමිණී ලොකුගේ මහතාගේ යෝජනාවක් අනුව පිළියන්දල රෝහල කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් බවට විශාල මුදලක් වෙන් කරමින් කටයුතු කළා.

වැතර රෝහලද වෙන් කරමින් කටයුතු කරනවා. හුදකලා කිරීම සීමා කෙරුණේ සෞඛ්‍ය නිර්දේශ අනුවයි. ඇතැම් වසම්වල රෝගීන් හතර පස් දෙනෙක් නිසා ප්‍රදේශයම වසා දැමීම හේතුවෙන් ජන ජීවිත කඩා වැටෙනවා. මේ වනවිට නිවාස 15627ක් හුදකලා කර තිබෙනවා. මේ අයට රුපියල් 5000ක බඩු මල්ලක් ලබාදීමට කටයුතු කරමින් සිටිනවා.

ඒ සඳහා රුපියල් කෝටි 08ක් පමණ වැය වෙනවා. කැස්බෑව සහ බෝකුන්දර එන්නත් 25000ක් ලබා දී අවසන්. ගාමිණී ලොකුගේ මහතා කියන්නේ පරිනත දේශපාලන නායකයෙක්. එතුමා සෑම අවස්ථාවකදීම ජනතාව පැත්තේ සිටගෙන කටයුතු කරන නායකයෙක් බවද ඒ මහතා කියා සිටියේය.

නියෝජ්‍ය සභාපති කරුණාපාල මුහන්දිරම් ආරච්චි, හිටපු නගරාධිපති සුමන රණවීර, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී ධර්මදාස පණ්ඩිතරත්න, මන්ත්‍රීවරුන් වන ප්‍රසාද් රාජපක්ෂ, කමල් රන්ජන් ධර්මදාස, මොහාන් පෙරේරා, කේ. දයාවතී, දයංගනී පෙරේරා, ඇතුළු පවුලේ මහත්ම මහත්මීහු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# සුවසැරිය සේවාවට අලුතින් ගිලන් රථ ලබාගැනීමට රාජ්‍ය ඇමැතිනී සුදර්ශනී කළ යෝජනාව කාලෝචිත තීරණයක්

## පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා

සුවසැරිය සේවාවට අලුතින් ගිලන් රථ 112ක් ලබාගැනීමට රාජ්‍ය ඇමැති සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය කර තිබෙන යෝජනාව මේ මොහොතේ ඉතා කාලෝචිත තීරණයක් බව පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා පැවසීය.

1990 සුවසැරිය රටේ ජනතාව වෙනුවෙන් දිනෙන් දිනම දියුණුවට පත් වීම පිළිබඳව. මා හදවතින්ම සතුටු වන බවත් පක්ෂ පාට භේදයකින් තොරව හරිදේ කරමින් රට ඉදිරියට ගෙන යෑමට වැදගත් වන බවත් හෙතෙම කීය.

එක් ආණ්ඩුවක් කරපු දේ අනිත් ආණ්ඩුව නතර කිරීමත්, ආණ්ඩුවෙන් ආණ්ඩුවට ප්‍රතිපත්ති මාරුවීම නිසා ලංකාව අද මේ තත්ත්වයට වැටී තිබෙන්නේ ඒ නිසායැයි ඒ මහතා කියා සිටියේය.

මන්ත්‍රීවරයා මෙසේද කීය.

සුවසැරියට විවේචන ආවා. කරන්න එපා කිව්වා. නමුත්, ඒ ව්‍යාපෘතියේ තිබෙන සාර්ථකත්වය රටම පිළි ගෙන තිබෙනවා. ඒ ගැන මට අවංක සතුටක් දැනෙනවා. සමහරු කිව්වා, මේ ගිලන් රථ ටික ඉවර වුණාම මේ ව්‍යාපෘතියත් ඉවර වෙයි කියලා. නමුත් මේ ව්‍යාපෘතිය වෙනුවෙන් වර්තමාන රජයද දක්වන ඉහළ දායකත්වය වෙනුවෙන් මා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම, සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ ඇමැතිවරියටත්, මේ ව්‍යාපෘතිය වෙනුවෙන් ස්වේච්ඡාවෙන් නායකත්වය දෙන දුමින්ද රත්නායක මහතාටත්, සොහාන් ද සිල්වා මහතා ඇතුළු සුවසැරිය කාර්ය මණ්ඩලයටත් රට වෙනුවෙන් ඔවුන් කරන සේවය වෙනුවෙන් මා ස්තූතිවන්ත වෙනවා.

ඒ වගේම මේ ව්‍යාපෘතිය සිදුකිරීමට නොමඳ සහයෝගය දුන් හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාටත් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතාටත් මා ස්තූතිවන්ත වෙනවා.


ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Pradeshiya Sanwardhana Bank

# බේරා නොගත් රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පහත සඳහන් කර ඇති ශාඛා, කාර්යාල හා උකස් මධ්‍යස්ථානවල සහ 2019.04.01 දිනට පෙර ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ ශාඛාවන්හිද උකස් තබන ලද පහත දක්වෙන වගුව පරිදි 2021-06-18 දින දක්වා බේරා නොගත් රන් භාණ්ඩ 2021.06.19 දින සිට පහත සඳහන් පළාත් කාර්යාලවල, දිස්ත්‍රික් කාර්යාලවල සහ ශාඛා කාර්යාලවල දී ප්‍රසිද්ධ වෙන්දේසියේ අලෙවි කරනු ලැබේ. සියලුම වෙන්දේසි පෙරවරු 09.00 ට ආරම්භ කෙරේ.

| උගස ලබාගත් අවසාන දිනය | උකස් කාලය | පදනම් වූ දිනය | ගත වූ කාලය |
|---|---|---|---|
| 2020.04.30 | මාස 12 කාලයක් සඳහා උකස් කළ | 2021.04.30 | වර්ෂ 01 ක් ගත වූ |
| 2020.10.31 | මාස 06 කාලයක් සඳහා උකස් කළ | 2021.04.30 | මාස 06 ක් ගත වූ |
| 2021.01.31 | මාස 03 කාලයක් සඳහා උකස් කළ | 2021.04.30 | මාස 03 ක් ගත වූ |

**පළාත් කාර්යාල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මධ්‍යම (දු. ක. 0812214115/6/7) | උතුරු මැද (දු. ක. 0252223080 / 0252225214) | වයඹ (දු. ක. 0372231880) | සබරගමුව (දු. ක. 0452224566) | ඌව (දු. ක. 0552223635) | බස්නාහිර (දු. ක. 0332248731 / 0332248583) | නැගෙනහිර (දු.ක. 0652225881) | දකුණ (දු. ක. 0412226208/9) |

**දිස්ත්‍රික් කාර්යාල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මහනුවර (දු.ක.0812214124 / 0812214115/6/7) | පොළොන්නරුව (දු.ක. 027-2223212) | කුරුණෑගල (දු. ක. 0372268323) | රත්නපුර (දු.ක. 0452230512) | මොණරාගල (දු.ක. 0552273930) | ගම්පහ / කොළඹ (දු.ක. 0332234922) | අම්පාර (දු.ක. 0632223420) | හම්බන්තොට (දු.ක. 0472240647/8) |
| මාතලේ (දු.ක. 0662051332/3) | අනුරාධපුර (දු. ක. 0252223080) | පුත්තලම (දු.ක. 0322223448) | කෑගල්ල (දු.ක. 0352230333) | බදුල්ල (දු.ක. 0552224192) | කළුතර (දු.ක. 0342264276 / 0342262526) | මඩකලපුව (දු.ක. 0652225845) | මාතර (දු.ක. 0412231585) |
| නුවරඑළිය (දු.ක. 0522224552 / 0522222630) | උතුර දිස්ත්‍රික්කය (දු.ක. 0212280180) | | | | | | ගාල්ල (දු. ක. 0912222458) |

**බස්නාහිර පළාත**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අගලවත්ත | අවිස්සාවේල්ල | බදුරලිය | බේරුවල | බුලත්සිංහල | දිවුලපිටිය | දෙඩංගොඩ | ගම්පහ | ගෝනපොල | හෝමාගම | හොරණ | ඉංගිරිය |
| ජා-ඇල | කළුතර | මීගහතැන්න | මිල්ලනිය | මිනුවන්ගොඩ | මීරිගම | මිරිස්වත්ත | මොරගහහේන | මොරොන්තුඩුව | මීගමුව | මතුගම | මාවරමණ්ඩිය |
| නිට්ටඹුව | නුගේගොඩ | පානදුර | පිළියන්දල | රාගම | වාද්දුව | වලගෙදර | වරකාගොඩ | කැලණිය | කිරිදිවැල | කොලොන්නාව | |

**මධ්‍යම පළාත**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආගරපතන | දඹුල්ල | දන්තුරේ | දවුලගල | ගලේවෙල | ගම්පොල | ගිනිගත්හේන | හගුරන්කෙත | හතරලියද්ද | හැදෙණිය | උඩුදුම්බර | උඩවෙල |
| මහනුවර | මහනුවර දෙවන නගර | කටුගස්තොට | කොටගල | ලග්ගල | මැණික්හින්න | මාරස්සන | සෙංකඩගල | මාතලේ | මොරයාය | වත්තේගම | විල්ගමුව |
| නාවුල | නාවලපිටිය | නිල්දණ්ඩාහින්න | නුවරඑළිය | පේරාදෙණිය | පූජාපිටිය | පුඩළුඔය | රත්තොට | රිකිල්ලගස්කඩ | තෙල්දෙණිය | | |

**උතුරු මැද පළාත**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුර නව නගර | අනුරාධපුර | අරලගන්විල | බකමූණ | බෝගස්වැව | චුන්නක්කම් | ගල් අමුණ | ගලෙන්බිඳුණුවැව | ගල්නෑව | ගෝනපතිරාව | මන්නාරම | මැදවච්චිය |
| හිඟුරක්ගොඩ | යාපනය | කදුරුවෙල | කදුරුවෙල නව නගර | කහටගස්දිගිලිය | කනගරායන්කුලම | තිරප්පනේ | කැකිරාව | කිලිනොච්චි | මනම්පිටිය | මැදිරිගිරිය | මිහින්තලේ |
| තඹුත්තේගම නගර | පොළොන්නරුව | පුලස්තිගම | රඹෑව | සෙවනපිටිය | සිරිපුර | තලාව | තඹුත්තේගම | වව්නියා | | | |

**වයඹ**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පඩුවස්නුවර | අලව්ව | අඹන්පොල | ආනමඩුව | බෝවත්ත | හලාවත | දුම්මලසූරිය | ගල්ගමුව | ගිරිඋල්ල | ඇතුගල්පුර | ඉබ්බාගමුව | කිරිමැටියාන |
| කුලියාපිටිය | කුරුණෑගල | මහවැව | මහව | මාම්පුරි | මාවතගම | මැල්සිරිපුර | මුන්දලම | නාරම්මල | නාත්තණ්ඩිය | නවගත්තේගම | නිකවැරටිය |
| පාලකුඩා | පන්නල | පරගහදෙණිය | පැරකුම්පුර | පොල්පිතිගම | පොතුහැර | පුත්තලම | රිදීගම | සාන්තආනාපුර | වාරියපොල | කල්පිටිය | වෙන්නප්පුව |

**සබරගමුව පළාත**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරනායක | බලංගොඩ | බුලත්කොහුපිටිය | දෙහිඕවිට | දරණියගල | දේවාලේගම | ඇහැලියගොඩ | ඇඹිලිපිටිය | එරත්න | ගොඩකවෙල | හෙම්මාතගම | කහවත්ත |
| කලවාන | කෑගල්ල | කෑගල්ල දෙවන නගර | කිරිඇල්ල | කිතුල්ගල | කොලොන්න | කොටියාකුඹුර | කුරුවිට | මාවනැල්ල | නෙළුම්දෙණිය | නිවිතිගල | පැල්මඩුල්ල |
| පිටගල්දෙණිය | පොතුපිටිය | පුලිඟුපිටිය | රක්වාන | රඹුක්කන | රත්නපුර | රුවන්වැල්ල | ශ්‍රී පලාබද්දල | වරකාපොල | වැලිගෙපොල | යටියන්තොට | |

**ඌව පළාත**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැල්ලවාය | බඩල්කුඹුර | බදුල්ල | බණ්ඩාරවෙල | බිබිල | බෝගහකුඹුර | බුත්තල | දියතලාව | ගිරාඳුරුකෝට්ටේ | හල්දුම්මුල්ල | හපුතලේ | කන්දකැටිය |
| ලුණුගල | මඩුල්ල | මහියංගනය | මාලිගාතැන්න | මැදගම | මීගහකිවුල | මොණරාගල | පස්සර | රිදීමාලියද්ද | සෙවනගල | සියඹලාණ්ඩුව | තණමල්විල |
| ඌව පරණගම | වැලිමඩ | | | | | | | | | | |

**නැගෙනහිර පළාත**


| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාලච්චේන | අක්කරෙයිපත්තු | අම්පාර | දෙහිඅත්තකණ්ඩිය | කල්මුණේ | සමන්තුරේ | මහඔය | නින්දවූර් | උහන | පොතුවිල් | දමන | මඩකලපුව |
| මඩකලපුව දෙවන නගර | වෙන්කලඩි | එරාවූර් | කලවන්චිකුඩි | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය දෙවන නගර | කන්තලේ | කාත්තන්කුඩි | කොක්කඩිචෝලෙයි | මුතූර් | | |

**දකුණ පළාත**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අහංගම | අඟුණකොලපැලැස්ස | අක්මීමණ | අකුරැස්ස | අම්බලන්තොට | බද්දේගම | බලපිටිය | බරවාකුඹුක | බටපොල | බෙලිඅත්ත | මාතර නගර | දෙයියන්දර |
| දෙනියාය | දෙවිනුවර | දික්වැල්ල | ඇල්පිටිය | ගාල්ල | ගන්දර | ගෝනගල්පුර | හක්මන | හම්බන්තොට | හම්බන්තොට දෙවන නගර | හික්කඩුව | ඉමදූව |
| කැකණඳුර | කළුවැල්ල | කඹුරුගමුව | කඹුරුපිටිය | කරන්දෙණිය | කරාපිටිය | කටුවන | කිරින්ද | ලුනුගම්වෙහෙර | මාවරල | මිද්දෙනිය | මිරිස්ස |
| මොරවක | නෙලුව | පඹුරණ | පිටබැද්දර | පිටිගල | රත්න | සූරියවැව | තංගල්ල | තල්ගස්වල | තිස්සමහාරාමය | තිහගොඩ | උඩුගම |
| ඌරගස්මංහන්දිය | ඌරුබොක්ක | වලස්මුල්ල | වරාපිටිය | වීරකැටිය | වැලිගම | යක්කලමුල්ල | | | | | |

වෙන්දේසි දින කල්දැමීම හෝ ඒකාබද්ධ කර පැවැත්වීම හෝ අවලංගු කිරීමේ බලය බැංකුව සතුය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී,**
**ණය හා අයකිරීම්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය, නො. 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.**
**2021.04.20**



## බ්‍රිතාන්‍ය -ඉන්දියා ආර්ථිකය ගොඩ ගන්න මගක්:

# නව වෙළෙඳ හා ආයෝජන අවසන්

### එක්සත් රාජධානියට රැකියා 6,500ක්

බ්‍රිතාන්‍යය සහ ඉන්දියාව ඩොලර් බිලියන 1ක් වටිනා නව වෙළෙඳ හා ආයෝජන අවසන් කර ඇති අතර එයින් එක්සත් රාජධානියේ රැකියා 6, 500කට වැඩි ප්‍රමාණයක් නිර්මාණය කර තිබේ. අගමැති බොරිස් ජොන්සන් සහ ඔහුගේ ඉන්දීය සගයා වන නරේන්ද්‍ර මෝඩි අතර අඟහරුවාදා පැවැති මාර්ගගත හමුවකදී මේ ගනුදෙනුව අත්සන් කරන ලදී. මේ ආයෝජන වැඩිදියුණු කළ වෙළෙඳ හවුල්කාරිත්වයේ (ඊටීපී) කොටසක් වන අතර එය 2030 වන විට එක්සත් රාජධානියේ-ඉන්දියානු වෙළෙඳාමේ වටිනාකම දෙගුණයක් කිරීමේ අභිලාෂය සකසනු ඇති අතර පුළුල් නිදහස් වෙළෙඳ ගිවිසුමක් (එෆ්ටීඒ) සඳහා වැඩ ආරම්භ කිරීමේ හවුල් අභිප්‍රාය ප්‍රකාශ කරනු ඇත.

“අප අද ප්‍රකාශයට පත් කර ඇති රැකියා 6, 500කට වඩා වැඩි ප්‍රමාණයක් පවුල් හා ප්‍රජාවන්ට කොරෝනා වයිරසයෙන් ගොඩ ඒමට සහ බ්‍රිතාන්‍ය හා ඉන්දීය ආර්ථිකයන් නංවාලීමට උපකාරී වනු ඇත” යැයි ජොන්සන් පැවසීය. බ්‍රිතාන්‍යය විසින් එළිදක්වන ලද වෙළෙඳ හා ආයෝජන පැකේජයේ සෞඛ්‍ය ආරක්ෂණය සහ තාක්ෂණය වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි එක්සත් රාජධානියට සිදුකරන නව ඉන්දියානු ආයෝජනවලින් ඩොලර් මිලියන 533කට අධික ප්‍රමාණයක් අඩංගු වේ. ඩොලර් බිලියන 240 කට වැඩි වටිනාකමක් ඇති නව ව්‍යාපාර උත්පාදනය කිරීමට අපේක්ෂා කරන එක්සත් ජනපදයේ සේරම් ආයතනය විසින් එහි එන්නත් ව්‍යාපාරයට සහ රටේ නව විකුණුම් කාර්යාලයකට ඩොලර් මිලියන 240ක ආයෝජනයක් ඇතුළත් වේ.

# මැතිවරණයෙන් පසු බටහිර බෙංගාලයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දරුණු වෙයි







බටහිර බෙංගාලයේ පසුගියදා පැවැති මැතිවරණයෙන් අනතුරුව කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය පැතිර යමින් පවතින අතර, ජාතික කාන්තා කොමිෂන් සභාවේ (එන්.සී.ඩබ්ලිව්) සභාපති රේඛා ෂර්මාගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් බටහිර බෙංගාලයට ගොස් පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවල දී කාන්තාවන්ට එරෙහි ප්‍රහාර පිළිබඳව විමර්ශනය කිරීමට නියමිතය. එන්.සී.ඩබ්ලිව් විසින් නිකුත් කරන ලද නිවේදනයක දැක්වෙන්නේ නන්දිග්‍රාම් හිදී කාන්තාවන්ට පහර දෙන බවට වීඩියෝ පට ට්විටර් වෙබ් අඩවියේ පළ කිරීමෙන් පසුව මෙවැනි ප්‍රහාර පිළිබඳව දැනුම්වත් වූ බවයි.

“කොමිසම දැඩි ලෙස කලබලයට පත්ව ඇති අතර කාන්තාවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් බැරෑරුම් ලෙස සලකනු ලැබේ යැයි රේඛා ෂර්මා පවසයි. මැයි 3 වන දින භාරතීය ජනතා පක්ෂ නායකයන් වන කයිලාෂ් විජයවර්ගියා සහ සම්බිට් පත්‍රා නන්දිග්‍රම්හි පක්ෂ කාර්යාලය කොල්ලකෑමට ලක්වූ වීඩියෝ පට මෙන්ම පක්ෂයේ කාන්තා ආධාරකරුවන්ට ශාරීරිකව පහර දෙන වීඩියෝ පට බෙදාගෙන තිබේ. ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව සොයා බලා චූදිතයන් අත්අඩංගුවට ගන්නා ලෙස කොමිසම බටහිර බෙංගාල නියෝජ්‍ය පොලිස්පතිවරයාට ලිපියක් යවා ඇත. මේ අතර අගමැති නරේන්ද්‍ර මෝදි අඟහරුවාදා බටහිර බෙංගාල ආණ්ඩුකාර ජගදීප් ධන්කර් හමුවී ප්‍රාන්තයේ පශ්චාත් ඡන්ද ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ වාර්තා පිළිබඳ දැඩි කනගාටුව පළ කළේය. භාරතීය ජනතා පක්ෂය, සීපීඅයි (එම්) සහ කොංග්‍රසය ඇතුළු විවිධ දේශපාලන පක්ෂ චෝදනා කර ඇත්තේ තම කාර්ය මණ්ඩලයට ජයග්‍රාහී ත්‍රිනමූල් කොංග්‍රස් සාමාජිකයන් පහර දුන් බවයි.

AROUND THE WORLD
ලොව වටා

# දකුණු බ්‍රසීලයේ ළදරු පාසලකට ඇතුළු වූ පුද්ගලයකු මන්නා පිහියකින් පහර දී පස්දෙනකු මරා දමලා





දකුණු බ්‍රසීලයේ ළදරු පාසලකට ඇතුළු වූ 18 හැවිරිදි පුද්ගලයකු විශාල මන්නා පිහියකින් පහරදීමෙන් පස් දෙනකු මියගොස් ඇති බව පොලිසිය පවසයි. ඝාතනයට ලක්වූවන් අතර වයස අවුරුදු දෙකකට අඩු දරුවන් තිදෙනකු සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනකු සිටී. පසුව ප්‍රහාරකයා ආයුධයෙන් තමාටම හරවාගෙන පහරදීමෙන් අසාධ්‍ය තත්ත්වයේ පසුවන බව පොලිස් ප්‍රකාශයෙක් පැවසීය. සැන්ටා කැටරිනා ප්‍රාන්තයේ කුඩා නගරයක් වන සවුදාඩේස්හි මේ ප්‍රහාරය පිටුපස පැවැති අරමුණ කුමක්ද යන්න පැහැදිලි නැත. සිද්ධිය වන අවස්ථාවේ ළමයින් විශාල ගණනක් ගොඩනැගිල්ලේ සිටි අතර කාර්ය මණ්ඩලය ඔවුන් සැඟවීමට උත්සාහ කළ බව නිලධාරීහු පැවසූහ. සිව්වන දරුවාට සුළු තුවාල සිදුවී ඇතැයි පැවසේ.

යුද හමුදා පොලිසිය පවසන්නේ ප්‍රාදේශීය වේලාවෙන් 10:35 ට (13:35 GMT) අසල්වැසියන්ගෙන් ඇමතුම් කීපයක් ලැබී ඇති බවයි. ඔවුන් ආයුධ සන්නද්ධව සිටි පුද්ගලයකු ළදරු පාසලට ඇතුළු වී කාර්ය මණ්ඩලයට හා ළමයින්ට පහර දුන් බව වාර්තා විය. පොලිසිය පවසන්නේ නම් නොකෙරුණු මේ පුද්ගලයා මුලින්ම ළදරු පාසලට පිවිසෙන ස්ථානයේ සිටි ගුරුවරියකට පහර දුන් බවයි. ඔහු ඇයව එක් කාමරයකට කැඳවාගෙන ගිය අතර එහි දී ඔහු ළමයින්ට ද පහර දී ඇත. 9, 000 ක පමණ ජනතාවක් සිටින සවුදාඩේස් නගර මධ්‍යයේ මේ ළදරු පාසල පිහිටා ඇති අතර ග්ලෝබෝ ප්‍රවෘත්ති සේවයට අනුව එය වයස අවුරුදු 3ට අඩු ළමයින් ගැන කටයුතු කරයි.

# ඔස්ට්‍රේලියානු හිටපු දඟ පන්දු යවන්නකු වූ මැක්ගිල් පැහැරගෙන ගොස් පහර දී මුදාහරී



ඔස්ට්‍රේලියානු හිටපු දඟ පන්දු යවන්නකු වූ මැක්ගිල් ක්‍රෙමෝර්න් රාත්‍රියේදී මිනිසුන් පිරිසක් විසින් බලහත්කාරයෙන් මෝටර් රථයකට නංවාගෙන ගොස් ඇතැයි පොලිසිය පවසයි. පසුව ඔහුව නගර සීමාවෙන් පිටත පිහිටි බ්‍රින්ජලි වෙත ගෙන යන ලද අතර එහි දී ඔහුට තුවක්කුවකින් පහර දුන් බවට චෝදනා එල්ල විය. මැක්ගිල් ඔහුගේ පීඩාකාරී තත්ත්වයට පත්වී පැයකින් පමණ පසුව නිදහස් විය. ඔහුව නිරිතදිග උපනගරයක් වන බෙල්මෝර් වෙත ගෙන ගොස් නිදහස් කර ඇති බව පොලිසිය පවසයි.

මේ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් කණ්ඩායම් සාමාජිකයන් වයස අවුරුදු 27, 29, 42 සහ 46 යන වයස්වල පසුවන්නන් වන අතර ඔවුන්ට එරෙහිව බදාදා නඩු පවරනු ඇතැයි පොලිසිය පවසයි. ඔස්ට්‍රේලියානු මාධ්‍ය පැවසුවේ මේ ක්‍රීඩකයා සිඩ්නිහි පහළ-උතුරු වෙරළ තීරයේ ජීවත් වූ බවත් ඔහු පැහැරගෙන ගොස් ඇති බවත්ය. ඔහුගේ වර්තමාන තත්ත්වය පිළිබඳ බලධාරීන් තවමත් තොරතුරු හෙළි කර නොමැත. මැක්ගිල් ද තවමත් සිද්ධිය පිළිබඳ අදහස් පළ කර නොමැත.

# එවරස්ට් කඳවුරේ කොවිඩ් රෝග ලක්ෂණ ඇති කඳු නගින්නන්ගේ සංඛ්‍යාව වැඩියි

### බරපතළ පිපිරීමක් අත ළඟ



නේපාලයේ එවරස්ට් කඳවුරේ කඳු නගින්නන් සහ බලධාරීන් පවසන්නේ කොවිඩ් -19 රෝග ලක්ෂණ සහිත කඳු නගින්නන්ගේ සංඛ්‍යාව සහ ආසාදිත බව තහවුරු කිරීම් වැඩි වෙමින් පවතින බවත්, බරපතළ පිපිරීමක් ඇතිවීමේ භීතිය වැඩි කරන බවත්ය. කත්මණ්ඩු අගනුවර පිහිටි රෝහල්වලින් තහවුරු වූ රෝගීන් 17 දෙනෙකුගේ වාර්තා ලැබී ඇති බවත්, කඳවුරේ සිට කඳු නගින්නන් ගණනාවක් යවා ඇති බවත්, ඉහළ කඳවුරුවලට ප්‍රතිකාර කළ යුතු බවත් කඳවුරු බලධාරීහු පැවසූහ. එවරස්ට් කඳවුරෙන් පැමිණීමෙන් පසු රෝගීන් කිරීටක වයිරස් සඳහා ධනාත්මක පරීක්ෂාවක් කර ඇති බව CIWEC සායනයේ කත්මණ්ඩුහි පෞද්ගලික රෝහලක කාර්ය මණ්ඩලය තහවුරු කළේය.

එවරස්ට් කඳවුරේ ආසාදන සිද්ධීන් පිළිබඳව කිසිදු දැනුමක් නොමැති බව පවසමින් නේපාල රජය මෙතෙක් ප්‍රතික්ෂේප කර ඇති අතර, නිලධාරීන් විසින් තත්ත්වය කොතරම් දුරට අවතක්සේරු කර ඇත්දැයි යන බිය නිසා කන්ද වැසීමට ගවේෂණ කටයුතු සඳහා වැඩි පීඩනයක් ගෙන එනු ඇත. වසංගතය අතරතුර පසුගිය වසරේ එවරස්ට් තරණය කළ විදේශීය කඳු නගින්නන් නේපාල රජයට ප්‍රධාන ආදායම් මාර්ගයක් වේ.

# රුමේනියාවේ විශාල වලසකු වෙඩි තබා ඝාතනය කරලා



මාර්තු මාසයේ රුමේනියාවේ දඩයම් කිරීමේ සංචාරයකදී යුරෝපා සංගමයේ රටවල ජීවත් වූ විශාලතම වලසාට ලිච්ටෙන්ස්ටයින් කුමාරයකු වෙඩි තබා ඝාතනය කර ඇතැයි පරිසර උද්ඝෝෂකයෝ සැක කරති. සමහර ගොවිපොළවලට හානි කළ ගැහැනු වලසකුට වෙඩි තැබීමට එමානුවෙල් වොන් උන් සූ ලිච්ටෙන්ස්ටයින් කුමරුට අවසර දී ඇති බව ඔවුහු කියති. එහෙත් ඔහු වෙඩි තබා ඇත්තේ ගැහැනු සතෙකු නොව ආතර් නම් 17 හැවිරිදි දුඹුරු වලසකුටය. ඔස්ට්‍රියාවේ වෙසෙන කුමාරයා තවමත් ප්‍රතිචාර දක්වා නොමැති අතර ඔහු වෙත ළඟාවීමට මාධ්‍ය දැරූ උත්සාහයන් අසාර්ථක වී තිබේ. “අපට කුමාරයා සමඟ පෞද්ගලික ගැටලුවක් නැත,” පරිසර කණ්ඩායමේ නියෝජිත ග්‍රීන් ගේබ්‍රියෙල් පෝන් බීබීසීයට පැවසීය.



# ට්‍රම්ප් අලුතින් වෙබ් අඩවියක් අරී

ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් නව “සන්නිවේදන” වෙබ් අඩවියක් ක්‍රියාත්මක කර ඇති අතර, එය එක්සත් ජනපදයේ හිටපු ජනාධිපතිවරයාගේ “මේසය මත සිට” අන්තර්ගතය ප්‍රකාශයට පත් කරන බව පවසයි. ට්‍රම්ප් මහතාව ට්විටර් විසින් තහනම් කරන ලද අතර ජනවාරි මාසයේ කැපිටල් කෝලාහලයෙන් පසුව ෆේස්බුක් සහ යූ ටියුබ් විසින් ද අත්හිටුවන ලදී. හිටපු ජනාධිපතිවරයා එතැන් සිට පුවත්පත් නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ නිකුත් කර ඇත. පරිශීලකයන්ට පෝස්ට්වලට කැමැත්ත ප්‍රකාශ කිරීමට හැකි වනු ඇත. තවද ඒවා ට්විටර් සහ ෆේස්බුක් ගිණුම්වල ද බෙදා ගත හැකිය. ට්‍රම්ප් මහතා ස්ථිරවම තහනම් කළ යුතුද යන්න පිළිබඳව ෆේස්බුක් හි අධීක්ෂණ මණ්ඩලයේ තීරණයක් ගැනීමට දිනකට පෙර මේ පියවර ගෙන තිබේ. ට්‍රම්ප්ගේ ජ්‍යෙෂ්ඨ උපදේශක ජේසන් මිලර් මීට පෙර පවසා තිබුණේ නව සමාජ මාධ්‍ය වේදිකාවක් ක්‍රියාත්මක කරන බවයි.

# ඡන්දෙන් පසු බටහිර බෙංගාලයේ ගැටුම්වලින් 17ක් මරුට






ඉන්දියාවේ බටහිර බෙංගාල ප්‍රාන්තයේ ඉරිදා සිට පළාත් පාලන මැතිවරණයෙන් පසු ඇති වූ ගැටුම්වලින් පුද්ගලයන් 17 දෙනකු මිය ගොස් තිබේ. ඔවුන් සියල්ලෝම ප්‍රාන්තයේ පාලක ත්‍රිණමූල් කොංග්‍රසයට සහ ප්‍රාන්තයේ විපක්ෂය වන භාරතීය ජනතා පක්ෂයට අයත් අය බව වාර්තා සඳහන් කරයි. වත්මන් ටී.එම්.සී. තෙවැනි වරටත් බලයට පත්වීමෙන් පසු ප්‍රචණ්ඩත්වය ඇති වූ බව වාර්තා වේ. එහෙත් මරණය හෝ ප්‍රචණ්ඩත්වය ආරම්භ වූයේ කුමකින් ද යන්න පොලීසිය තවම තහවුරු කර නොමැත. භාරතීය ජනතා පක්ෂය චෝදනා කරන්නේ ටී.එම්.සී. පාක්ෂිකයන් තම සාමාජිකයන්ට පහර දුන් බවයි. එහෙත් ටී.එම්.සී. එම චෝදනාව ප්‍රතික්ෂේප කර ඇති අතර තම සාමාජිකයන් හත් දෙනකු ගැටුම්වලින් මියගිය බව පවසා තිබේ. භාරතීය ජනතා පක්ෂය කියා සිටියේ ප්‍රචණ්ඩත්වයට තම සාමාජිකයන් නව දෙනකු අහිමි වූ බවයි.

# ස්පාඤ්ඤයේ මැඩ්රිඩ්හි කොන්සර්වේටිව් නායකයාට ජය හිමි වෙයි



ස්පාඤ්ඤයේ මැඩ්රිඩ්හි ප්‍රාදේශීය දිස්ත්‍රික්කයේ කොන්සර්වේටිව් නායකයා කටුක මැතිවරණ සටනකින් පසු විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ඇත. ජනප්‍රිය පක්ෂ (පීපී) ආසන දෙගුණයකටත් වඩා වැඩි වුවද, ඉසබෙල් ඩියාස් අයුසෝ තවමත් බහුතරය අඩුවී ඇති අතර ඇය අන්ත දක්ෂිණාංශය සමඟ සන්ධානගත විය හැකිය. වසංගතය පුරාම මැඩ්රිඩ් හි බාර් සහ සාප්පු විවෘතව තබා ගැනීමෙන් ඇය සමාජවාදී ප්‍රමුඛ මධ්‍යම රජය ප්‍රතික්ෂේප කළාය. අපේක්ෂකයන් කිහිප දෙනෙකුට මරණීය තර්ජන එල්ල වීමෙන් පසු ඉහළ ආරක්ෂාවක් තිබුණි. අයුසෝ මහත්මිය තම පක්ෂයේ අපේක්ෂකයා ලෙස පත්වීම සඳහා ඉග්ලේෂස් මහතා නියෝජ්‍ය අගමැති ධුරයෙන් ඉල්ලා අස්වී තිබේ. අඟහරුවාදා ඡන්ද ප්‍රතිඵලයෙන් පසුව ඔහු කියා සිටියේ තමන් දේශපාලනයෙන් ඉවත් වන බවයි.

# රත්මලාන ශ්‍රී විමලාරාමාධිපති අත්තුඩාවේ පියරතන නාහිමි ආදාහන කටයුතු අද



බස්නාහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක ගල්කිස්ස හේන විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය, ශාසනාරක්ෂක බල මණ්ඩලයේ හිටපු ලේඛකාධිකාරී රත්මලාන ශ්‍රී විමලාරාමාධිපති ප්‍රවචනකීර්ති ශ්‍රී විනයාචාර්ය මුළු දිවයිනටම සාම විනිසුරු අත්තුඩාවේ පියරතන නාහිමියෝ අපවත් වූහ.

උන්වහන්සේ විචිත්‍ර ධර්ම දේශකයාණන් වහන්සේ නමක් වශයෙන් ශාසනය වෙනුවෙන්ද, දහම් පාසල් ආචාර්යවරයකු වශයෙන් අධ්‍යාපනික වශයෙන්ද සුවිශාල සේවයක් කළ මහ තෙරනමකි.

රත්මලාන ශ්‍රී විමලාරාම විහාරස්ථානයේ දේහය තැන්පත් කර ඇති අතර ආදාහන පෙරහර අද (07) ප.ව. 2.00ට විහාරස්ථානයෙන් වැඩම වීමෙන් අනතුරුව ආගමික කටයුතු කිරීමෙන් පසු ආදාහන කටයුතු ප.ව.3.00ට ගල්කිස්ස දුම්රියපොළ පාර මවුන්ට් ක්‍රීඩාංගණයේදී සිදු කෙරේ.

# ශ්‍රී ලංකාවේ ඉස්සන්ට ජෝර්දානයේ ඉහළ ඉල්ලුමක්

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට යහපත් ප්‍රවණතාවක් ඇති කරමින් මෙරට ඉස්සන්ට ජෝර්දාන වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති වී තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ වන්නමෙයි ඉස්සන් මෙට්‍රික් ටොන් 5.6 ක ඇණවුමක් ජෝර්දානයෙන් ලැබී තිබෙන අතර ජෝර්දානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිය ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු යටතේ මේ ඇණවුම ලබා ගැනීමට හැකි වී තිබෙන බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි. මෙරට වන්නමෙයි ඉස්සන් ජෝර්දාන් වෙළෙඳපොළට ඇතුළු වූ පළමු අවස්ථාව මෙය වන අතර දැනට ජෝර්දානයේ අලෙවි කරන්නේ වියට්නාම සම්භවයකින් යුත් වන්නමෙයි ඉස්සන්ය.

මේ නිෂ්පාදනය හඳුන්වාදීම සඳහා ශ්‍රී ලංකා තානාපතිනී ශානිකා දිසානායක මහත්මිය ජෝර්දාන කළමනාකාරිත්වය සමඟ කළ සාකච්ඡාවලින් පසුව, ජෝර්දානයේ එච්ටීසී ඇක්වාකල්චර් (HTCey Aquaculture (Pvt) Ltd) සමාගම විසින් මේ ඉස්සන් ඇණවුම ශ්‍රී ලංකාවට බාර දී තිබේ.

ගුණාත්මක මුහුදු ආහාර සඳහා ජෝර්දානයේ පවතින ඉල්ලුමෙන් විශාල අපනයන ප්‍රමාණයක් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මුහුදු ආහාර සමාගම්වලට වෙළෙඳ හා ව්‍යාපාරික අවස්ථා තවදුරටත් දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ක්‍රියාශීලී ලෙස ජාලගත වී ඇත.

# ජාතික අත්පිටපත් තරගයේ නිර්මාණ භාර ගැනීමේ අවසන් දිනය 31 තෙක් දීර්ඝ කරයි

**උපාලි කරුණාරත්න**

රටේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ජාතික අත් පිටපත් තරගයේ නිර්මාණ භාර ගැනීමේ අවසන් දිනය මේ මස 31 දින දක්වා දීර්ඝ කර තිබේ.

එම නිර්මාණ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (ප්‍රකාශන අංශය), 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල ලිපිනයට අත්පිටපත් තුනකින් යුතුව ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය යුතුය. අත්පිටපත් බහා එවන කවරයේ ඉහළ කෙළවරේ ජාතික අත්පිටපත් තරගය-2021 යනුවෙන් සඳහන් කළ යුතු අතර මේ පිළිබඳ වැඩි විස්තර 0112882667 දුරකතන අංකයෙන් හෝ www.culturaldept.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් දැනගත හැකිය.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් නවකතා, කෙටිකතා, පද්‍ය සංග්‍රහ, ළමා කතා, සාහිත්‍ය, ඉතිහාසය, සංස්කෘතිය, පුරා විද්‍යාව, නාට්‍ය කලාව, නර්තනය, චිත්‍ර හා මූර්ති, සිනමා, ඡායාරූප හා ජනශ්‍රැති යන විවිධ විෂයන්ට අදාළ ශාස්ත්‍රීය හෝ පර්යේෂණ ග්‍රන්ථ නිර්මාණයන්හි නිරතව සිටින නවක ලේඛක, ලේඛිකාවන් දිරිමත් කිරීම අරමුණු කර ගනිමින් ජාතික අත්පිටපත් තරගය සිංහල, දමිළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

# කොවිඩ් හමුවේත් මීගමුවේ ධීවරයන් මසුන් ඇල්ලීමට ගිහින්



කොරෝනා වසංගතය පැවතියද මීගමුවේ ධීවර වෘත්තිකයෝ මසුන් ඇල්ලීමට යති. බහුල ලෙස හාල්මැස්සන් අසු වුණු බෝට්ටුවකින් ඊයේ (6) කොටුව ක්‍රීඩාංගණය අසල මුහුදු තීරයේදී හාල්මැස්සන් ගලවමින් සිටි අයුරු.

*ඩී. මිහිඳුකුල - කොච්චිකඩේ*



## ලංසු කැඳවීමේ ආරාධනාවයි

### මැතිවරණ කොමිෂන් සභාව

**පරිගණක යන්ත්‍ර හා ලැප්ටොප් පරිගණක මිලදීගෙන සවිකිරීමේ ප්‍රසම්පාදනය**

**S/8 (CCXXXII)**

මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් කොමිෂන් සභා ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් අයිතමය වෙනුවෙන් සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | ප්‍රසම්පාදනයේ නම හා විස්තරය | ලංසු සුරක්ෂණයේ වටිනාකම (ශ්‍රී.ල.රු.) | ලංසු විවෘත කිරීම |
|---|---|---|---|
| S/8 (CCXXXII) | පරිගණක යන්ත්‍ර හා ලැප්ටොප් පරිගණක මිලදීගෙන සවිකිරීමේ ප්‍රසම්පාදනය | 130,000.00 | 2021 ජුනි 02 දින ප.ව. 2.00 ට |

01. ලංසු කැඳවීම, ජාතික තරගකාරී ලංසු ක්‍රමය (NCB) මගින් සිදු කරනු ලැබේ.
02. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන්ට මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන ශාඛාව මගින් අවශ්‍ය වැඩි විස්තර ලබාගත හැකි අතර, පහත දැක්වෙන ලිපිනයේදී 2021 මැයි මස 07 දින සිට 2021 ජුනි මස 01 දින දක්වා ලංසු කැඳවීමේ ලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
03. ලංසුකරුවන්ට ලිඛිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 1,000.00 ක මුදලක් මැතිවරණ කොමිෂන් සභාවේ ගිණුම් අංශය වෙත මුදලින් පමණක් ගෙවීමෙන් අදාළ ලංසු කැඳවීමේ ලේඛන කට්ටලයක් 2021 මැයි මස 07 දින සිට 2021 ජුනි මස 01 දින දක්වා සතියේ රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබාගත හැකිය.
04. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන පහත ලිපිනයට 2021 ජුනි මස 02 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ පළමු මහලේ පිහිටි ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරය ඉදිරිපිට තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම 2021 ජුනි මස 02 දින ප.ව. 2.00 ට සිදු කරනු ලැබේ. එම අවස්ථාව සඳහා ලංසුකරුවන්හට හෝ ලංසුකරුවන්ගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. ශ්‍රී ලංකාව තුළ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් රු. 130,000.00 ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.
05. ඉහත සඳහන් කර ඇති ලිපිනය වනුයේ,

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**මැතිවරණ කොමිෂන් සභාව,**
**සරණ මාවත, රාජගිරිය.**
**දු.ක. 0112-868441**
**2021.05.05**

---

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

## නාගරික සංවර්ධන අධිකාරිය

## ලංසු කැඳවීමේ ආරාධනය

**කොළඹ 80 CLUB ප්‍රතිසංස්කරණය කිරීම සඳහා MVAC, ELV සහ තොරතුරු තාක්ෂණ, ගිනි, එල්පීජී, මුළුතැන්ගෙයි වාතාශ්‍රය, උණුසුම් ජලය සහ සිසිල් ජලය සහ සිරස් ප්‍රවාහන පද්ධති සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂාකිරීම, පැවරීම, භාරදීම සහ අඩුපාඩු විසඳීම**

**කොන්ත්‍රාත් අංක : 46/UDA/MEP-Work/80 Club/2021/019**

1. නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), සභාපති විසින් කොළඹ 07 නිදහස් මාවත, අංක 25 හි පිහිටි කොළඹ 80 Club ප්‍රතිසංස්කරණය කිරීම සඳහා MVAC, ELV සහ තොරතුරු තාක්ෂණ, ගිනි, එල්පීජී, මුළුතැන්ගෙයි වාතාශ්‍රය, උණුසුම් ජලය සහ සිසිල් ජලය සහ සිරස් ප්‍රවාහන පද්ධති සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම, පැවරීම, භාරදීම සහ අඩුපාඩු විසඳීමට අදාළ කොන්ත්‍රාත්තුව සඳහා පහත විස්තර කර ඇති පරිදි නිපුණතාපූර්ණ සහ සුදුසුකම් සහිත ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලබන අතර, ඇස්තමේන්තු පිරිවැය රුපියල් 61,584,000/- + එකතු කළ අගය මත බද්ද වේ.

   කොන්ත්‍රාත් කාලය ලිත් දින 45 කි.
2. ජාතික තරගකාරි ලංසු පටිපාටිය මත ලංසු ඉදිරිපත් කළ යුතුය.
3. කොන්ත්‍රාත් ප්‍රදානයේදී සුදුසුකම් ලබන සාර්ථක ලංසුකරුවන් අසාදු ලේඛන ගත නොවිය යුතු අතර විද්‍යුත් හා යාන්ත්‍රික සේවාවන්හි විශේෂත්වය සහිතව CIDA ලියාපදිංචි ශ්‍රේණිය EM1 විය යුතුය.
4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමේ සුදුසුකම් අතරට
   I. පසුගිය වසර පහක MEP පළපුරුද්ද සහිත අවම වශයෙන් සමාන ව්‍යාපෘති දෙකක වැඩ. එක් ව්‍යාපෘතියක් සඳහා වන කොන්ත්‍රාත් වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන 50ක් විය යුතු අතර, වැඩ අවම වශයෙන් 70% ක්වත් සම්පූර්ණ කළ යුතුය.
   II. පසුගිය වසර පහ තුළ සිදු කරන ලද MEP වැඩ කටයුතු වල සාමාන්‍ය වාර්ෂික පරිමාව අවම වශයෙන් රුපියල් මිලියන 200 විය යුතුය.
   III. ඕනෑම අත්තිකාරම් ගෙවීමකින් තොරව අවම වශයෙන් මුදල් ප්‍රවාහ සහ ණය පහසුකම් රුපියල් මිලියන 30 කි. ණය පහසුකම් බත්තරමුල්ල, සෙත්සිරිපාය - අදියර 1, 9 වන මහල, නාගරික සංවර්ධන අධිකාරිය, සභාපති වෙත යොමු කළ යුතුය.
5. අභිලාෂයක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු බත්තරමුල්ල, "සෙත්සිරිපාය", 7 වන මහල, නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රසම්පාදන ඒකකය, ප්‍රසම්පාදන ප්‍රධානී, දුරකථන අංක 011-3358006 හා ෆැක්ස් අංක 011- 2874546 වෙතින් ලබා ගත හැකි අතර, 2021 මැයි මස 10 වන දින සිට 2021 මැයි මස 24 වන දින දක්වා වැඩකරන දිනවල පෙ. ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ප්‍රසම්පාදන ඒකකයේදී නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කළ හැක.
6. උනන්දුවක් දක්වන ලංසුකරුවන් වෙත ඉංග්‍රීසි භාෂාවෙන් යුතු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් බත්තරමුල්ල, "සෙත්සිරිපාය " - අදියර 1, 7 වන මහල, නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රසම්පාදන ඒකකය, ප්‍රසම්පාදන ප්‍රධානී, වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් අංශයේ සරප් වෙත ආපසු නොගෙවන ගාස්තු වන රුපියල් 16,500/- + බදු ගෙවීමෙන් පසු 2021 මැයි මස 10 වන දින සිට 2021 මැයි මස 24 වන දින දක්වා කාලය තුළ ලබා ගත හැක.
7. ඉදිරිපත් කරනු ලබන කොන්ත්‍රාත්තුව සඳහා දෙපිටපතකින් යුතුව ලංසු වෙනම කවරවල බහා පහත සඳහන් ලිපිනයට 2021 මැයි මස 25 වන දින පෙ. ව. 11.00 ට හෝ ඊට ප්‍රථම එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් කිරීමත් සමගම පැමිණ සිටින නම්කර ඇති ලංසු තබන්නන්ගේ නියෝජිතයන් ඉදිරියේදි ලංසු විවෘත කරනු ලබේ.

   සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ප්‍රසම්පාදන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය, 7 වන මහල, "සෙත්සිරිපාය" - අදියර 1, බත්තරමුල්ල.
8. ලංසුව 2021 අගෝස්තු මස 23 වන දින දක්වා වලංගු වේ.
9. සියලුම ලංසු සමඟ රුපියල් 62,000/- ක ලංසු සුරක්ෂයක් ඉදිරිපත් කළ යුතුය. (ලංසු ලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව). ලංසු සුරක්ෂණය 2021 සැප්තැම්බර් මස 20 වන දින දක්වා වලංගු විය යුතුය.
10. පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2021 මැයි මස 18 වන දින පෙ. ව. 10.00 ට බත්තරමුල්ල, "සෙත්සිරිපාය" අදියර - 1, නාගරික සංවර්ධන අධිකාරිය, 7 වන මහල, ප්‍රසම්පාදන ඒකකයේ දී පැවැත්වේ . තවද වැඩ බිම් පරීක්ෂාව සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ - බස්නාහිර පළාත) දුරකථන අංක 011 2877539 ඇමතීමෙන් විස්තර ලබා ගත හැක.
11. ලංසු සකස් කිරීම හා ඉදිරිපත් කිරීම හෝ වැඩබිම් පරීක්ෂාවන්ට සහභාගි වීම සම්බන්ධයෙන් ලංසුකරුවන් විසින් දරනු ලබන වියදම් සඳහා සේවායෝජකයා වගකිව යුතු නොවේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**නාගරික සංවර්ධන අධිකාරිය (ප්‍රධාන),**
**7 වන මහල,**
**"සෙත්සිරිපාය " අදියර 1,**
**බත්තරමුල්ල.**

---

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## සංශෝධිත දැන්වීමයි

**2021 අප්‍රේල් 25 වන දින ඉරිදා ඔබ්සවර් පුවත්පතේ සහ 2021 අප්‍රේල් 28 වන දින සිලෝන් ඩේලි නිව්ස්, දිනමිණ හා තිනකරන් පුවත්පත්වල පළකරන ලද**

2021 ජුනි 30 වන දින විවෘත කිරීමට නියමිත ඉහත සඳහන් ටෙන්ඩරයෙහි

**ලංසුකරුවන්ට උපදෙස් අංක දෙක (02) ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සංශෝධනය කොට ඇත.**

| | |
|---|---|
| ටෙන්ඩර් අංකය | CES/FP/04/PT/6200 (MP) |
| ටෙන්ඩර් නාමය | නැගෙනහිර බහාලුම් පර්යන්තයේ බහාලුම් මෙහෙයවීමේ උපකරණ ප්‍රසම්පාදනය |
| ලංසුකරුවන්ට උපදෙස් අංක දෙක (02) පළවූ ආකාරය | ලංසුකරු ඉහත සඳහන් කර ඇති සමාන උපකරණ සැපයීමේ ව්‍යාපාරයේ යටත් පිරිසෙයින් පසුගිය වසර පහ (05) තුළ නිරතව සිටිය යුතුයි. |
| ලංසුකරුවන්ට උපදෙස් අංක දෙක (02) සංශෝධනය විය යුතු ආකාරය | ලංසුකරු ඉහත සඳහන් කර ඇති සමාන උපකරණ සැපයීමේ ව්‍යාපාරයේ යටත් පිරිසෙයින් පසුගිය **වසර දහය (10)** තුළ නිරතව සිටිය යුතුයි. |

අනෙකුත් කොන්දේසි නොවෙනස්ව පවතී.

**සභාපති - අමාත්‍ය මණ්ඩලයෙන් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC),**
**වරාය හා නාවික අමාත්‍යාංශය,**
**නො.19, චෛත්‍ය පාර, කොළඹ 01.**

---

## අභිලාෂය ප්‍රකාශ කිරීම් කැඳවීම

### වාරි වැව්වල ධාරිතාව වැඩිකිරීම සඳහා වැව්වල පිරී ඇති පස් / වැලි / රොන්මඩ හා කාබනික අපද්‍රව්‍ය ඉවත් කර ගැනීම

වාරි සෞභාග්‍යා ජාතික වැඩ සටහන යටසේ දිවයින පුරා පිහිටි කුඩා වැව්/අමුණු 5000 කඩිනමින් පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කරන අතර, 2021 වසර තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වැව්/අමුණු 1000 ක් මේ වන විට වැඩ ආරම්භ කරමින් පවතී.

මෙහිදී අබලන්ව ඇති වැව් බැමි, සොරොව්, පිටවාන් හා ඇළ පද්ධති ශක්තිමත් කිරීම මෙන්ම ජල රැඳවුම් ධාරිතාව වැඩිකර ගැනීම අරමුණු කරගෙන වැව්වල විද්‍යාත්මකව හා පාලනයකින් යුතුව හඳුනාගත් ප්‍රමාණවල පස්/වැලි/රොන්මඩ හා අපද්‍රව්‍ය ඉවත් කිරීමද අපේක්ෂා කෙරේ.

2021 වසරේ වැඩසටහන යටතේ කරන ලද සමීක්ෂණ අනුව මෙසේ කුඩා වැව් ආශ්‍රිතව ඉවත් කරනු ලබන ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් කර්මාන්ත අමුද්‍රව්‍ය ලෙස භාවිත කිරීමේ විභවයක් ඇති බවත්, මේ සඳහා පෞද්ගලික අංශයේ සහාය ලබා ගනිමින් රජයට වියදමක් නොමැතිව හා අමතර ආදායමක් උපයමින් මෙම ද්‍රව්‍ය ඉවත් කිරීමේ හැකියාව ඇති බවත් පෙනී ගොස් තිබේ.

ඒ අනුව එක් ස්ථානයකින් ඝන මීටර් 5000 ට වඩා විශාල ප්‍රමාණ ඉවත් කිරීමට යෝජිත වැව් වල පස්/වැලි/රොන්මඩ හා අපද්‍රව්‍ය ඉවත් කරගෙන යාමට උනන්දුවක් දක්වන පෞද්ගලික ව්‍යවසායකයින් වෙතින් අභිලාෂය ප්‍රකාශ කිරීමේ ප්‍රකාශන කැඳවීමටත්, එසේ ලියාපදිංචි වන්නා වූ අය වෙතින් තරගකාරී ලෙස මිල ගණන් කැඳවා රජයට වඩාත් වාසිදයක වන පරිදි ඒ ඒ වැව් වල ඉහත ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට ඉඩ ලබාදීමටත් තීරණය කර ඇත.

ඒ අනුව උනන්දුවක් දක්වන ව්‍යවසායකයින් පහත දැක්වෙන අයදුම්පත සම්පූර්ණ කර 2021 **මැයි මස 18 දිනට පෙර** ලැබෙන සේ පහත ලිපිනයට මා වෙත එවන ලෙස කාරුණිකව ඇරයුම් කරමි.

එක් එක් දිස්ත්‍රික්කයට ලියාපදිංචි වීමේ ගාස්තුව ලෙස රුපියල් 1,000.00 ක මුදලක් ළඟම දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන සහකාර / නියෝජ්‍ය කොමසාරිස් කාර්යාලය වෙත ගෙවා ලදු පතක් ලබාගෙන එය අයදුම් පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතු වේ.

**මූලික කොන්දේසි :**

01. වැව අලුත්වැඩියා කරන / භාරකාරීත්වය දරන රාජ්‍ය ආයතන විසින් පෙන්වා දෙන ස්ථාන හා මට්ටම් අනුව පමණක් ඉහත ද්‍රව්‍ය ලබාගත යුතු අතර, තේරීමකින් තොරව මිශ්‍ර ද්‍රව්‍ය සියල්ල අදාළ වැව් පිටියෙන් ඉවත් කරගත යුතු වේ.
02. ප්‍රවාහනයේදී හා අගය එකතු කිරීමේ ක්‍රියාවලිය සඳහා අදාළ වන බලපත්‍ර ව්‍යවසායකයා විසින් තම වියදමින් ලබාගත යුතු වේ.
03. අදාළ රාජ්‍ය ආයතන විසින් නියම කරනු ලබන කැනීම් ප්‍රමාණ කිසිසේත් නොඉක්මවිය යුතු අතර, අනුමත යන්ත්‍ර පමණක් භාවිත කළ යුතුය.
04. රජය විසින් නියම කරනු ලබන අවම ඒකක මිල ගණනකට යටත්ව ඉවත් කරනු ලබන ඉහත ද්‍රව්‍ය ප්‍රමාණය සඳහා යෝජිත මුදල රජයට ගෙවීමට එකඟ විය යුතුය.
05. අදාළ ද්‍රව්‍ය ඉවත් කිරීම හා එම අවස්ථාවල හානිවන මාර්ග හෝ වෙනත් රජයේ දේපළක් යථාවත් කර දීම කළයුතු අතර, ඒ බව සනාථ කිරීම සඳහා රජය විසින් නියම කරනු ලබන ඇප තැන්පතුවක් තැබීමට එකඟ විය යුතුය.
06. ග්‍රාමීය වැව් / අමුණු සංවර්ධනය කිරීමේ කාර්යයේදී පස්, වැලි, මැටි හා රොන්මඩ ඉවත් කිරීමේදී වටිනා ඛණිජ සම්පත් (මැණික් ඉල්ලම් හෝ ලෝහ නිධි යනාදී ....) හෝ පුරාවස්තු හමුවුවහොත් වහාම ඒ බව වැව් භාර ආයතනය දැනුවත් කිරීමට කැනීම් කටයුතු සිදුකරන ආයතනය විසින් කළ යුතුය. ඒ අනුව වැව භාර ආයතනය එම කැනීම් කටයුතු වහාම නතර කර මේ පිළිබඳව බලය ඇති රාජ්‍ය ආයතන (උදා : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යනාදී . . . .) විධිමත් පරිදි දැනුවත් කර අවශ්‍ය සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. මෙලෙස හමු වන ඛණිජ සම්පත් කැනීම් භූමියෙන් ඉවත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

**ඉංජි.ඩී.ඩී. ආරියරත්න**
**ලේකම්,**
**ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය,**
**නො. 11, ජාවත්ත පාර, කොළඹ 05.**

**වාරි වැව්වල ධාරිතාව වැඩිකිරීම සඳහා පිරී ඇති පස්/වැලි/රොන්මඩ හා කාබනික අපද්‍රව්‍ය ඉවත් කර ගැනීම සඳහා ආදර්ශ අයදුම්පත්‍රය**

01. ආයතනයේ / ව්‍යවසායකයාගේ නම
02. ජාතික හැඳුනුම්පත් අංකය / සමාගම් ලියාපදිංචි අංකය
03. ලිපිනය
04. දුරකථනය - ස්ථාවර : ෆැක්ස් : ඊමේල් : ජංගම :
05. අපේක්ෂා කරන ද්‍රව්‍ය ප්‍රමාණය (මිශ්‍ර පරිමාව) - ඝන මීටර්
06. ද්‍රව්‍ය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ කුමන කාර්යයක් සඳහාද යන්න හා අගය එකතු කිරීමේ ක්‍රමවේදය කෙටියෙන් පැහැදිලි කරන්න.
07. ද්‍රව්‍ය ලබා ගැනීමට උනන්දු වන දිස්ත්‍රික්කය (එකක් හෝ වැඩි ගණනක් ප්‍රමුඛතා අනුව පිළිවෙලින්)
08. බලයලත් අයගේ අත්සන / නිල මුද්‍රාව
09. දිනය

# ශ්‍රී ලංකා-ඔස්ට්‍රේලියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට මඟ පාදාවි

## ශ්‍රී ලංකා-ඔස්ට්‍රේලියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව ලේකම් රාජ්‍ය ඇමැති කනක හේරත්:

ශ්‍රී ලංකාව සහ ඔස්ට්‍රේලියාව අතර පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට මඟ පාදනු ඇති බව සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත බෝග, තේ කර්මාන්තශාලා නවීකරණය සහ තේ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති කනක හේරත් මහතා පැවසීය.

නව වැනි පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව ලේකම්වරයා ලෙස රාජ්‍ය ඇමැති කනක හේරත් මහතා තේරී පත් වූ අතර පුනර්ජීවන රැස්වීමේදී බලශක්ති ඇමැති උදය ගම්මන්පිල මහතා සභාපති ලෙස තේරී පත් විය.

කථානායක මහින්ද යාපා අබේවර්ධන, ඔස්ට්‍රේලියාවේ මහ කොමසාරිස් ඩේවිඩ් ජෝන් හොලි සහ පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මේ රැස්වීමට අමාත්‍යවරුන්, රාජ්‍ය ඇමැතිවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කීප දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර දශක ගණනාවක් තිස්සේ කිට්ටු මිතුරන් වූ බැවින් පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය දෙරටටම ආශීර්වාදයක් වනු ඇති බවත් දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සංගමය යොදා ගත හැකි බවත් ඒ මහතා කීය.

ශ්‍රී ලංකා සිසුන් සිය ගණනක් ඔස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය ලබන අතර සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවක් වාර්ෂිකව ඔස්ට්‍රේලියාවේ අධ්‍යාපන අවස්ථා ලබා ගනී. තවත් දහස් ගණනක් ශ්‍රී ලාංකික පුරවැසියන් පුහුණු සේවකය ලෙස විවිධ අංශවල රැකියාවල නිරතව සිටිති. එබැවින් අධ්‍යාපන හා රැකියා අංශන්හි අභිවෘද්ධිය සඳහා මිත්‍රත්ව සංගමය යොදා ගත හැකිය. එපමණක් නොව එය දෙරට අතර සංචාරක ක්ෂේත්‍රයට මහත් පිටිවහලක් වනු ඇතැයි හේරත් මහතා පැවසීය.

ඕස්ට්‍රේලියානු ආර්ථිකයේ දියුණුවට ශ්‍රී ලාංකික වෘත්තිකයන් 170,000 කට අධික පිරිසක් දායක වන බවත් අප රටවල් දෙක භූගෝලීය වශයෙන් දුර බැහැරින් පිහිටියත් ඔස්ට්‍රේලියාව අපේ ජනතාවගේ හදවතට සමීපයි." කථානායකවරයා තවදුරටත් පැවසීය. උප සභාපතිවරුන් ලෙස මොහොමඩ් මුසම්මිල්, හෙක්ටර් අප්පුහාමි සහ රවුෆ් හකීම් තේරී පත් විය. මීට අමතරව, භාණ්ඩාගාරික ලෙස සහ නියෝජ්‍ය ලේකම් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය උපුල් ගලප්පති මහත්වරු තේරී පත් වූහ.

# වරාය නගර පනත ගැන ආණ්ඩුවේ හදිසි වීම පිටුපස තිබෙන්නේ භයානකකමක්

## ජවිපෙ නායක අනුර කුමාර දිසානායක

**නදී මාණික්‍යගේ**

වරාය නගර පනත පිළිබඳ ආණ්ඩුවේ හදිසිය පිටුපස ඇත්තේ භයානකකම බවත් එය රටේ ස්වෛරීභාවයට ප්‍රශ්නයක් මෙන්ම කළු ආර්ථික මධ්‍යස්ථානයක් විය හැකි බවත් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක මහතා පැවසීය.

ආණ්ඩුවට මේ වරාය නගරය පනත ආර්ථිකයේ හැරවුම් ලක්ෂ්‍යයක් යැයි මෙය සම්මත කර ගැනීම හදිස්සි කළ ද අපට මේ සම්බන්ධව වෙනස් මතයක් තිබෙන බව පක්ෂ මූලස්ථානයේ මාධ්‍ය හමුවක් කැඳවමින් දිසානායක මහතා කීය.

හෙතෙම වැඩිදුරටත් මෙසේද කියා සිටියේය.

ආණ්ඩුව පසුගිය අප්‍රේල් මස 08 වැනිදා කොළඹ වරාය නගරය කොමිෂන් සභා පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ පනතින් ලංකාවේ බදු පනත් 07ක් එම ප්‍රදේශයට අදාළ නොවන බවත් තවත් පනත් 14ක් මේ ප්‍රදේශයේ වෙනස් කිරීමට හෝ නිදහස් කිරීම්වලට යටත් බවත් යෝජනා කර තිබුණා. මුදල් විශුද්ධිකරණය කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් වීමේ අනතුරක්ද මෙහි තිබුණා. එසේම මේ ප්‍රදේශය ලංකාවේ කිසිම පළාත් පාලන ආයතනයකට හෝ පරිපාලන ව්‍යුහයකට ඇතුළත් නොවන බවද ප්‍රකාශ වුණා. මේ ප්‍රදේශයේ පදිංචි පුරවැසියන්ට ඡන්ද බලය අහිමි වෙනවා. මේ සියල්ල වෙනුවට 05-07 අතර පිරිසකගෙන් යුත් කණ්ඩායමකට මේ ප්‍රදේශයේ අධිකාරි බලය හිමිවන බව මෙයින් යෝජනා කෙරුණා.

එම කෙටුම්පතට අනුව එම පුද්ගලයන් ශ්‍රී ලාංකිකයන් නොවීමටද ඉඩ තිබුණා. මේ පිරිසෙන් බහුතරයක් ශ්‍රී ලාංකිකයන් වන බවට ආණ්ඩුව එය සංශෝධන කරන බවට අධිකරණයට කරුණු ඉදිරිපත් කළ බවටද වාර්තා වුණා. මෙමගින් මෙතරම් අතිශය අහිතකර බලපෑම් සහිත අධිකාරියකට විදේශිකයන්ද ඇතුළත් බව ඉතාම පැහැදිලියි.

මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ මුල් අවස්ථාවේ සිටම ආණ්ඩුවේ යටි අරමුණක් තිබුණා. ඒ මේ පනත පිළිබඳව සමාජයේ විධිමත් සංවාදයකට ඉඩක් නොතැබීමයි. නිදසුනක් ලෙස ආණ්ඩුව මේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවේ පසුගිය අප්‍රේල් 08 වැනිදායි. ව්‍යවස්ථාව අනුව පනතකට එරෙහිව පුරවැසියකුට අධිකරණයට යා හැක්කේ එම දිනයේ සිට සතියක් තුළයි.

# ශ්‍රී ලංකා-සිංගප්පූරු ගැනුම්කරු හා විකුණුම්කරු අතර හමුවක්

**මහින්ද අලුත්ගෙදර**

ආහාර අංශයේ වර්ධනය වේගවත් කිරීමට ශ්‍රී ලංකාවේ හා සිංගප්පූරුවේ ගැනුම්කරු හා විකුණුම්කරු අතර හමුවක් එන්ටර්ප්‍රයිස් සිංගප්පූර් ආයතනය සහ එරට ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සහභාගීත්වයෙන් පවත්වා තිබේ.

වෙබ්නාර් සාකච්ඡාවක් ලෙස පැවැති හමුවේදී සිංගප්පූරු ගැනුම්කරුවන් සහ බෙදාහරින්නන් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ සැපයුම් හැකියාව සහ ප්‍රධාන අපනයන කෘෂි නිෂ්පාදනවල සුවිශේෂත්වය විදහා දැක්වීමට අවස්ථාව ලබාදී තිබෙන බව විදේශ සබඳතා අමාත්‍යාංශය පවසයි

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මාලනී බැද්දෙගමගේ මහත්මිය විසින් ශ්‍රී ලංකාවේ සැපයුම් හැකියාව සහ කෘෂි ආහාර නිෂ්පාදන අපනයනය තවදුරටත් පුළුල් කිරීම සඳහා අපනයන නැඹුරු කෘෂි නිෂ්පාදන සඳහා ආයෝජන දිරිගැන්වීම් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකර තිබේ. සිංගප්පූරු ව්‍යාපාරික සම්මේලනයේ ගෝලීය ව්‍යාපාර අංශයේ විධායක අධ්‍යක්ෂ සූ වෙයි-චී මහතා සහ මහ කොමසාරිස් ශෂිකලා ප්‍රේමවර්ධන මහත්මිය මේ අවස්ථාවේ දී අදහස් දක්වා ඇත.

සිංගප්පූරුවේ උනන්දුවක් දක්වන ගැනුම්කරුවන් සහ බෙදාහරින්නන් සහ ශ්‍රී ලංකාවේ අදාළ අපනයන සමාගම් සමඟ තනි තනිව හමුවීම් සංවිධාන කරන ලද අතර ව්‍යාපාර අන්තර් සැසි 20 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා පහසුකම් සපයන ලද අතර, සිංගප්පූරුවේ සහ ශ්‍රී ලංකා සමාගම්වල ප්‍රධාන පෙළේ සමාගම් 60ක් මේ අවස්ථාවට සහභාගී වී තිබේ.

මහ කොමසාරිස් කාර්යාලයේ වාණිජ අංශය විසින් මේ අංගය සඳහා ශ්‍රී ලංකාවේ සහ සිංගප්පූරුවේ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කර තිබේ.

# අභිලාෂය ප්‍රකාශ කිරීමයි

## අධිකරණ අමාත්‍යාංශය (MOJ)

## යෝජිත ඉදිකිරීම් සඳහා උසාවි ගොඩනැගිල්ල සැලසුම් කොට පෙර - සැකසුම් සකස් කිරීම

01. අධිකරණ අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපති විසින්, පහතින් විස්තර කොට ඇති පරිදි පෙර – සැකසුම් කළ උසාවි ගොඩනැගිලි සැලසුම් කොට ඉදිකිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය කොන්ත්‍රාත් කාලය දින 120 ක් වේ.

02. ද්විත්ව කවර ක්‍රමවේදය යටතේ, ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ. (ලංසුකරු විසින්, මූලික තොරතුරු, සැලසුම් / තාක්ෂණ යෝජනා හා මූල්‍ය යෝජනා පිටපත් දෙකක් වශයෙන් ඉදිරිපත් කළ යුතුය. අදාළ යෝජනාවලට, වෙනස් වූ, මුද්‍රා, තැබූ කවර දෙකක් තිබිය යුතු අතර, මුල් කවරය තුළ මූලික තොරතුරු ද, සැලසුම් / තාක්ෂණ යෝජනාව ද, දෙවන කවරයේ මූල්‍ය යෝජනා ද ඇතුළත් විය යුතුය) තාක්ෂණික සුදුසුකම් ලබන ලංසුකරුවන්ගේ ලංසු මිල ගණන් මූල්‍ය ලංසුව විවෘත කරනු ලබන අවස්ථාවේදී හඬගා කියවනු ලැබේ.

| අංකය | ව්‍යාපෘති නාමය | කොන්ත්‍රාත් අංකය | අවිනිශ්චිත පිරිවැය ඇස්තමේන්තුව - රුපියල් මිලියන - | ඉක්ටෑඩ් (සීඩා) ශ්‍රේණිය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු - රුපියල් - | ලංසු ඇපකරය - රුපියල් - |
|---|---|---|---|---|---|---|
| 01 | තිකවැරටිය – යෝජිත ඉදිකිරීම් සඳහා පෙර – නිමි උසාවි ගොඩනැගිලි සැලසුම් කොට සකස් කිරීම | MOJ/AC/26/34/2021 | 38 | C5 &C4 | 6,000.00 | 380,000.00 |
| 02 | කැකිරාව – යෝජිත ඉදිකිරීම් සඳහා පෙර – නිමි උසාවි ගොඩනැගිලි සැලසුම් කොට සකස් කිරීම | MOJ/AC/26/35/2021 | 67 | C4 &C3 | 13,000.00 | 670,000.00 |
| 03 | අවිස්සාවේල්ල – යෝජිත ඉදිකිරීම් සඳහා පෙර – නිමි උසාවි ගොඩනැගිලි සැලසුම් කොට සකස් කිරීම | MOJ/AC/26/36/2021 | 92 | C4 &C3 | 18,000.00 | 910,000.00 |
| 04 | පුත්තලම – යෝජිත ඉදිකිරීම් සඳහා පෙර – නිමි උසාවි ගොඩනැගිලි සැලසුම් කොට සකස් කිරීම | MOJ/AC/26/37/2021 | 70 | C4 &C3 | 15,000.00 | 700,000.00 |
| 05 | සමන්තුරේ – යෝජිත ඉදිකිරීම් සඳහා පෙර – නිමි උසාවි ගොඩනැගිලි සැලසුම් කොට සකස් කිරීම | MOJ/AC/26/38/2021 | 26 | C5 &C4 | 5,000.00 | 270,000.00 |
| 06 | මනම්පිටිය– යෝජිත ඉදිකිරීම් සඳහා පෙර – නිමි උසාවි ගොඩනැගිලි සැලසුම් කොට සකස් කිරීම | MOJ/AC/26/39/2021 | 32 | C5 &C4 | 5,000.00 | 320,000.00 |
| 07 | ඇඹිලිපිටිය – යෝජිත ඉදිකිරීම් සඳහා පෙර – නිමි උසාවි ගොඩනැගිලි සැලසුම් කොට සකස් කිරීම | MOJ/AC/26/40/2021 | 40 | C5 &C4 | 7,500.00 | 400,000.00 |
| 08 | වාලච්චේන – යෝජිත ඉදිකිරීම් සඳහා පෙර – නිමි උසාවි ගොඩනැගිලි සැලසුම් කොට සකස් කිරීම | MOJ/AC/26/41/2021 | 95 | C4 &C3 | 18,000.00 | 900,000.00 |
| 09 | කුච්චාවේලි – යෝජිත ඉදිකිරීම් සඳහා පෙර – නිමි උසාවි ගොඩනැගිලි සැලසුම් කොට සකස් කිරීම | MOJ/AC/26/42/2021 | 46 | C5 &C4 | 10,000.00 | 460,000.00 |

03. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ 12, උපරිමාධිකරණ සංකීර්ණයේ, අධිකරණ අමාත්‍යාංශයේ, 03 වන මහලේ, සැලසුම් අංශයේ ගණකාධිකාරී වෙතින් ලබාගත හැක.

දුරකථනය – 0112438178

04. ඉහත වගුවේ සඳහන් ආපසු නොගෙවන ගාස්තු ගෙවීමෙන් හා කොළඹ 12, උපරිමාධිකරණ සංකීර්ණයේ, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, රාජකාරී දිනවල 2021.05.10 දින සිට 2021.05.28 දින දක්වා 0900 පැය හා 1500 පැය අතර කාලය තුළ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

05. ලංසු, **සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC), අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12** යන ලිපිනය වෙත ගෙනැවිත් භාරදීමෙන් හෝ කොළඹ 12, අධිකරණ අමාත්‍යාංශයේ සැපයුම් අංශයේ, තුන්වන මහලේ, ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන්, 2021.06.01 දින පෙරවරු 11.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

06. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් නිකුත් කළ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය. එම ලංසු ඇපකරය, කොන්දේසි විරහිත හා ඒක්ෂණ බැඳුම්කරයක් වශයෙන් විය යුතු අතර, කොළඹ 12 උපරිමාධිකරණ සංකීර්ණයේ, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් නමට ගත්, 2021 සැප්තැම්බර් 28 දින දක්වා වලංගු එකක් විය යුතු අතර, එහි වටිනාකම ඉහත වගුවේ සඳහන් කොට ඇත.

07. මේ සම්බන්ධ පෙර – ලංසු හමුවක්, **අධිකරණ අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී** 2021.05.17 දින 1000 පැයට පැවැත්වීමට නියමිතය.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**අධිකරණ අමාත්‍යාංශය,**
**උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12.**

අමිල ප්‍රභාත් වනසිංහ-අනුරාධපුර අතිරේක



# මානන්කට්ටිය ජන ජීවිතයට වන අලින්ගෙන් දැඩි බලපෑම්

ගලෙන්බිඳුණුවැව සිට අනුරාධපුරයට පිවිසිය හැකි මාර්ගයක් වන යකල්ල ගල්කුළම ප්‍රධාන මාර්ගයේ මානන්කට්ටිය ප්‍රදේශයට දෛනිකව පැමිණෙන වන අලි රංචු හේතුවෙන් ජන ජීවිතයට දැඩි ලෙස බලපෑම් එල්ලවී තිබේ.
දෛනිකව සවස් කාලයේ මානන්කට්ටිය වැව අසල ප්‍රදේශය ඇතුළු අවට ගම්මාන වල ජනතාව රංචු පිටින් පැමිණෙන වන අලි නැරඹීම සඳහා පැමිණෙන අයුරුද දක්නට ලැබේ. එහි පැමිණෙන ජනතාව පවසන්නේ මෙම ස්ථානයේ දක්නට ලැබෙන වන අලි රංචුව රාත්‍රී කාලයට තම වගා බිම් වෙත පැමිණ වාගාවන් විනාශ කර දමන බවයි.
ඒ අනුව මානන්කට්ටිය ,ඉලිප්පුකන්නිය,වන්නන්කුලම,උඩියන්කුලම හා පළුගොල්ලාගම යන ගම්මාන වලට වන අලි තර්ජන උග්‍රවී තිබේ.
මේ අතර හුරුළුවැව වැව් රක්ෂිතයෙන් පැමිණි වන අලි රංචුවක් (04) රාත්‍රී කාලයේ ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ උල්පත් පාර ගම්මානයේ කෙසෙල් ,පොල් ඇතුළු ගොඩ බෝග රැසක් විනාශ කර දමා ගොස් තිබේ.
මෙම හුරුළුවැව රක්ෂිතයෙන් වසර කිහිපයක සිට පැමිණෙන වන අලි රංචු හේතුවෙන් උඩකල්ලාගම , මහසෙන්පුර , යකල්ල හා හුරුලු හන්දිය යන ප්‍රදේශවල ජනතාවද දැඩි භීතියට පත්ව තිබේ. වන අලි නිසි වේලාවක් නොමැතිව නිරන්තරයෙන් මෙම ප්‍රදේශවල සැරි සැරීම නිසා මෙලෙස තමන් දැඩි ජීවිත අවධානමකට ලක්ව තිබෙන බව ජනතාව පවසති.
නිවෙස් ආසන්නයට පැමිණ වගා හානි කරන වන අලි පලවා හැරීමට උත්සහ කිරීමේදී එම වන අලි තමන් පසුපස හඹා එන බව ගම්වාසීහු පවසති .මීට අමතරව යකල්ල -ගල්කුලම ප්‍රධාන මාර්ගයේ මානන්කට්ටිය වැව අසලදී වන අලි රංචුවක් පාරේ ගමන් කරමින් තිබූ ත්‍රී රෝද රථයකට ඉකුත්දා(03)සවස



හතට පමණ පහරදී ත්‍රිරෝද රථයට දැඩි හානි කර තිබේ.
මෙලෙස වසර කිහිපයක සිට හුරුලුවැව හා මානන්කට්ය යන රක්ෂිත වලින් නිරන්තරයෙන් ගම් වදින වන අලි වගා භූමි වලට සහා දේපළවලට මෙන්ම ජීවිතවලට දැඩි තර්ජනයක් එල්ල කරන බවත් අලි පලවා හැරීමට අලිවෙඩිවත් නොමැති බවත් තම වගා භූමි සහ ජීවිත දේපළ ආරක්ෂා කර ගැනීමට නම් හුරුළු වැව සිට ඒරු වැව දක්වා විදුලි වැටක් කඩිනමින් ඉදිකර දෙන ලෙස ජනතාව බලධාරින්ගෙන් ඉල්ලා සිටිති.

විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ

# මාමාගේ පිහි පහරින් බෑණා මරුට

මාමණ්ඩිය විසින් සිය බෑණා වෙත එල්ල කරන ලද පිහිපහරකින් ඔහු ජීවිතක්ෂයට පත්වී ඇති අතර සැකකාර මාමණ්ඩිය අකුරැස්ස , පෝරඹ ඥාති නිවෙසක සිටියදී 05 වෙනි දින සැකපිට අත්අඩංගුවට ගත් බව මොරවක පොලිසිය කියයි.
මෙලෙස මියගොස් ඇත්තේ මොරවක , බානගල 4 කණුව පදිංචිව සිටි 33 හැවිරිදි සේනානායක ගමගේ ඉන්දික තුෂාර නැමැති අයයි.
සිය දියණියගේ දරුවා අසනීපයෙන් පසුවන බැවින් තලංගල්ල ප්‍රදේශයේ පදිංචිව සිටින සැකකරු තම බිරිය සහ දරුවකු සමඟ ඉකුත් 04 වෙනි දින බානගල එම නිවෙසට ගොස් ඇත. බිරිය සහ දරුවා අසල පිහිටි වෙළෙඳසලක් වෙත ගොස් සිටියදී බෑණා (දියණියගේ ස්වාමිපුරුෂයා) නිවෙසට පැමිණ ඇති අතර සැකකරු සහ බෑණා අතර බහින් බස්වීමක් ඇතිවී එය දුරදිග ගොස් ඇත. මෙම අවස්ථාවේදී සැකකරු විසින් සිය බෑණා වෙත පිහිපහරක් එල්ල කර ඇත. පිහි පහරින් බරපතළ තුවාල ලද බෑණා රෝහල්ගත කරන ලද අතර එම අවස්ථාවේදීම ඔහු මියගොස් තිබූ බව පොලිසිය සඳහන් කරයි.
ඒ අතරතුර සැකකාර මාමණ්ඩිය සිය බිරිය සහ දරුවා එම නිවෙසේ සිටියදී ඔහු අකුරැස්සේ , පෝරඹ ඥාති නිවෙසක් වෙත පැමිණ තිබුණි. ලද පැමිණිල්ල අනුව මොරවක පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සංජීව සෙනෙවිරත්න මහතාගේ උපදෙස් මත මොරවක පොලිසිය අකුරැස්ස පොලිසියේද සහාය ඇතිව සැකකරුව 05 වෙනි දින අත්අඩංගුවට ගැනිණි.

දිනමිණ දසත දස අත ම එක තැන

ඊ.සී.ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

# පත්තිනි මෑණියන්ගේ ප්‍රතිමාව හොරු අරන්

හලාවත මුන්නේශ්වරම දේවාලයේ ඇතුළත තැන්පත් කර තිබූ පත්තිනි මෑණියන්ගේ ප්‍රතිමාවක් කිසිවකු විසින් පෙරේදා ( 5 දා ) දහවල් සොරා ගෙන ගොස් ඇති බවට පැමිණිල්ලක් ලද බව හලාවත පොලිසිය කියයි.
මෙරට මෙන්ම දකුණු ඉන්දීය හින්දු බැතිමතුන් අතර විශේෂ ගෞරවාදරයට පාත්‍රවී ඇති මෙම දේවාල ශ්‍රී ඊශ්වර මහ දෙවියන්ගේ කමින් කැප කර ඇත.මේ දිනවල කොරෝනා අවදානමක් පැවැතියක් සෞඛ්‍ය නීති රීති අනුගමනය කරමින් බැතිමතුන් දේවාලයට ඇතුළු වී සිය ආගමික කටයුතු වලට එක්වීමට ඉඩ දී ඇති බවත් කියයි.
මෙම ප්‍රතිමාව තැන්පත් කර තිබූ ස්ථානයේ සවි කර තිබූ cctv යන්ත්‍රය මෙයට දින කිහිපයකට කලින් කාර්මික දෝෂයකට ලක්වීම නිසා අක්‍රියව පැවැති නිසා ප්‍රතිමාව ගෙන යන කිසිම සටහනක් දැක ගත වු නොහැකිව ඇති අතර දේවාල තුළ ඇති cctv දර්ශනයන්හි ද මෙම සොර කම සම්බන්ධයෙන් පැහැදිලි දසුනක් දැක ගත නොහැකි ව ඇති බවත් පූජකවරයා පැවසීය.

දමන සමුහ කේ.ඒ.මෛත්‍රීපාල

# ‘ඌව දීප’ පුවත්පත පිළිගන්වයි



ඌව පළාත් සභාවේ මාසික නිල පුවත්පත “ඌව දීප,,2021 වර්ෂයේ කලාපය ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ.ජේ.එම්. මුසම්මිල් මහතාට පිළිගැන්වීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මංගල විජේරත්න මහතා අතින් සිදු කෙරිණි. මෙම අවස්ථාවට පුවත්පතේ විධායක අධීක්ෂණය කළ ප්‍රධාන ලේකම් පී.බී. විජේරත්න අධ්‍යාපන ලේකම් සන්ධ්‍යා අඹන්වල සම්බන්ධීකරණය කළ සහකාර ලේකම් සුවිමාලි දිසානායක ප්‍රධාන කර්තෘ ප්‍රසන්න පත්මසිරි මහත්ම මහත්මීහුද සහභාගි වූහ.

අරණායක ප්‍රදීප් කුමාර ධර්මරත්න

# වෙළෙඳසලක් කඩා බඩු සොරා ගත්තැයි ගුරුවරයෙක් අත්අඩංගුවට

අරණායක උස්සාපිටිය ප්‍රදේශයේ වෙළෙඳසලක් කඩා රුපියල් දෙලක්ෂ විසි දහසක් පමණ වටිනා භාණ්ඩ සොරාගත් බව කියන පාසල් ගුරුවරයකු 05 දා අරණායක පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.
අත්අඩංගුවට ගෙන ඇති සැකකාර පාසල් ගුරුවරයා මාවනැල්ල ප්‍රදේශයේ පාසලක සේවය කරන 37 හැවිරිදි අයෙකි.සැකකරු විසින් සොරාගත් කිරිපිටි,සැමන්,බිස්කට්,හාල්,ඇතුළු භාණ්ඩ රැසක්ද සැකකරුගේ නිවෙසේ තිබී සොයාගත් බව අරණායක පොලීසිය පවසයි.
04 දා රාත්‍රියේ සැකකාර පාසල් ගුරුවරයා වෙළෙඳ සලේ බිත්තියක් කඩා වෙළෙඳ සලට ඇතුළු වී එහි තිබූ භාණ්ඩ සොරාගෙන ඇති බවට වෙළෙඳ සලේ හිමිකරු විසින් අරණායක පොලීසියට පැමිණිලි කොට ඇත.
එම පැමිණිල්ල අනුව පොලීසිය සිදුකළ විමර්ශනවලින් පසු සැකකරු හා සොරාගත් භාණ්ඩ අරණායක පොලීසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සම්පත් කුමාර මහතා ඇතුළු නිලධාරී කණ්ඩායමක් විසින් 05 දා දහවල් අත්අඩංගුවට ගෙන තිබේ.
සැකකාර ගුරුවරයා පොලීසියට ප්‍රකාශ කර ඇත්තේ තමාට අයත් ගොඩනැගිල්ලක කාමරයක් කුලියට ගෙන පැමිණිලිකරු සිල්ලර වෙළෙඳසලක් වසර දහයක පමණ කාලයක් පවත්වාගෙන යන බවත් එම වෙළෙඳසල ඉවත්කර ගන්නා ලෙස කිහිප අවථාවකම දැනුම් දුන්නද ඔහු එය ඉවත් කර ගැනීමට කටයුතු නොකළ බැවින් එය කඩා ඉවත් කිරීමට කටයුතු කළ බවකි.
අරණායක පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බුද්ධික පනාවෙල මහතාගේ උපදෙස් මත අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සම්පත් කුමාර ,උප පොලිස් පරික්හෂක හරිස්චන්ද්‍ර පොලිස් සැරයන්වරුන් වන 16360 විජේතුංග, 35754 මුණසිංහ, කාන්තා පොලිස් සැරයන් 3967 අධිකාරී යන මහත්ම මහමීහු සැකකරු අත්අඩංගුවට ගෙන වැඩිදුර පරික්ෂණ පවත්වති.

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

# කසගස් කැළයට ගිනිතබලා



යාපනයේ වඩමරච්චි දකුණ මනල්කාඩු ප්‍රදේශයේ පිහිටි ස්වභාවික කසගස් කැළයට 5 දා කිසියම් පුද්ගලයකු විසින් ගිනි තැබීම නිසා අක්කර තුනක පමණ ප්‍රදේශයක පිහිටි කසගස් මුළුමනින්ම විනාශ වී ගොස් තිබේ.
ගින්න හට ගැනීමත් සමගම ප්‍රදේශයේ ආරක්ෂක අංශ සාමාජිකයන් විශාල පිරිසක් පැමිණ ගින්න මැඬපැවැත්වීමට පියවර ගෙන තිබේ.
කස ගස් වනයට ගිනි තැබූ පුද්ගලයා සෙවීම පිණිස පලෙයි පොලීසිය පරීක්ෂණ ආරම්භ කොට තිබේ.

වෝල්ටර් දයාරත්න - අනුරාධපුර දිසා විශේෂ

# අනුරපුරයෙන් කොරෝනා ආසාදිතයෝ 47ක්

අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් කොරෝනා ආසාදිතයන් හතළිස් හත්දෙනෙකු 5 වැනි දින කරන ලද පරීක්ෂණවලින් හඳුනාගෙන ඇත.
මේ අය අතරින් දාහහත් දෙනකු (17) මහ නගරසභා සීමාව තුළින් හඳුනා ගෙන ඇති අතර අනිකුත් අය ගලෙන්බිඳුනුවැව, රාජාංගනය, තඹුත්තේගම යන ප්‍රදේශවලින් හඳුනාගෙන ඇතැයි අනුරාධපුර වසංගත රෝග විද්‍යා ඒකකයේ විශේෂඥ වෛද්‍ය තේජන සෝමතිලක මහතා සඳහන් කරයි.
මේ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිවෙස්වල ස්වයං නිරෝධායනයට දෙදහසක් (2000) පමණ දෙනා ලක්ව ඇති අතර එම අය වෙතට රුපියල් දසදහසක් වටිනා ආහාර මල්ලක් ලබා දීමට සැලසුම් කර ඇතැයිද පැවසේ.

ඇම්. නෙල්සන් පියරත්න කතරගම සමූහ

# කතරගම පාළුවට ගිහින්



කොරෝනා වයිරසය හේතුවෙන් වන්දනාකරුවන් නොපැමිණීම නිසා කතරගම ප්‍රධාන බස් නැවතුම්පොළ පාළුවට ගොස් ඇත. මේ අතර නගරයේ බොහෝ වෙළෙඳසල් සහ ආපන ශාලා ආදියද වසා දමා ඇත. පින්තූරයේ පෙනෙන්නේ පාළුවට ගොස් ඇති කතරගම ප්‍රධාන බස් නැවතුම්පළයි.

එන්. විජේරත්න - නාගොඩ විශේෂ

# කාන්තා දිනයදා කළුතර වැඩසටහන් රැසක්





2021 ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් කළුතර දිස්ත්‍රික්කය තුළ ජයිකා ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් හට භාණ්ඩ බෙදා දීම කළුතර දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩල සඳහා අලෙවි කුටි බෙදාදීම සහ විශේෂ ව්‍යාපෘති සඳහා වන කාන්තාවන්හට උපකරණ බෙදාදීමේ වැඩසටහනක් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.
ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සහ කළුතර දිස්ත්‍රික් කාර්යාලයීය කාන්තා කටයුතු අංශය එක්ව සංවිධාන කළ මෙම වැඩසටහන පැවැති අවස්ථාවට ආරාධිතයන් සහ කළුතර දිස්ත්‍රික්කයෙහි අදාළ ප්‍රතිලාභි කාන්තාවෝද සහභාගි වූහ.

බුලත්කොහුපිටිය සමූහ - ඩබ්ලිව් රෝහණ

# හොරෙන් ප්‍රවාහනය කළ දැව තොගයක් අත්අඩංගුවට



දෙහිඕවිට අඩවි වන කාර්යාලයේ නිලධාරීන් විසින් 5 දින රාත්‍රී 11 ට පමණ රුවන්වැල්ල,ගෝනගල්දෙණිය ප්‍රදේශයේදී නීති විරෝධිව මහෝගනී දැව කඳන් 8 ක් ප්‍රවාහනය කළ ලොරි රථයක් එහි රියැදුරු සමඟ අත්අඩංගුවට ගෙන තිබේ.මෙම දැව කඳන් තොගය ගෝනගල්දෙණිය,රත්තාගල ප්‍රදේශයේ සිට ගම්පහ ,කිරිඳිවැල ප්‍රදේශයට ප්‍රවාහනය කරනඅතරතුර මෙසේ අත්අඩංගුවට ගෙන ඇති අතර අත්අඩංගුවට පත් දැව කඳන්වල වටිනාකම රුපියල් ලක්ෂයක් පමණ වන බව අඩවි වන කාර්යාලය පවසයි.සැකකරු රුවන්වැල්ල මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.
දෙහිඕවිට අඩවි වන නිලධාරී ප්‍රදීප් වෛද්‍යසේකර,රුවන්වැල්ල බීට්ටු වන නිලධාරී ඊ උදේසිරි,මාලිබොඩ බීට්ටු වන නිලධාරී සී කේ හේරත්,වන ක්ෂේත්‍ර සහකාර එස් කුමාරතුංග,වගා මුරකරු ආර් රත්නායක,වගා මුරකරු සරත් කුමාර හා රියැදුරු පී නිමල්සිරි යන මහත්වරු මෙම වැටලීම සඳහා සහභාගි වී තිබේ.

ටී.කේ.මහින්ද වැලිගම සමූහ

# නිදන් ගැනීමට ගිය දෙදෙනෙක් අත්අඩංගුවට



වැලිගම,වැල්ලාන,කොට්ගලකන්ද ප්‍රදේශයේ නුගගසක් අසල තිබූ ගල්තලාවක නිදන්ගැනීමට ගිය පුද්ගලයන් දෙදෙනකු සමඟ පූජා භාණ්ඩ හා උපකරණ අත්අඩංගුවට ගැනීමට වැලිගම පොලිසියේ දුෂණ මර්දන අංශය සමත් වෙයි.
දකුණු පළාත් නියෝජ්‍ය පොලිස්පති ජයන්ත පළිහක්කාර මහතා ට ලැබුණු තොරතුරක් පරිදි මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි චන්දන හේරත් මහතාගේ උපදෙස් පරිදි වැලිගම පොලිස් ස්ථානාධිපති අබේසේකර මහතාගේ මෙහෙයවීම යටතේ දුෂණ මර්දන අංශයේ ස්ථානාධිපති අමරසේන මහතා ඇතුළු පොලිස් නිලධාරින් පිරිසක් වැටලීම සිදු කළහ. එහිදී සැකකරුවන් සිව් දෙනකු පලා ගොස් ඇත.ඔවුන් අත්අඩංගුවට ගැනීමට වැලිගම පොලිසිය වැඩිදුර පරික්ෂණ පවත්වයි. සැකකරුවන් මාතර මහේස්ත්‍රාත් හමුවට ඉදිරිපත් කිරීමට නියමිතය.



හැටන් - චන්දන ජයවීර

# මස්කෙළිය ගිනිගත්හේන අඹගමුව රෝහල් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස සංවර්ධනයට







මධ්‍යම පළාත් රජයේ රෝහල් තුනක් කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීමට පියවර ගෙන තිබේ.

මධ්‍යම පළාතට අයත් මස්කෙළිය, ගිනිගත්හේන සහ අඹගමුව යන ප්‍රාදේශීය රෝහල් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස වැඩිදියුණු කොට පවත්වාගෙන යෑමට සැලැසුම් කොට ඇතැයි මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතීඥ ලලිත් යූ. ගමගේ මහතා පැවැසීය.

අඹගමුව ප්‍රාදේශීය රෝහල ඇඳන් සියයකින් සමන්විත වන ලෙස කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීමටත් මස්කෙළිය හා ගිනිගත්හේන ප්‍රාදේශීය රෝහල් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස වැඩිදියුණු කොට පවත්වාගෙන යෑමටත් තීරණය කොට ඇති බවද ඒ මහතා කීය.

ඒ අනුව මස්කෙළිය ප්‍රාදේශීය රෝහල කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ කටයුතු මේ දිනවල කඩිනමින් සිදු කරමින් පවතී. මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන මස්කෙළිය ප්‍රාදේශීය රෝහල මහල් 4කින් සමන්විත වේ.

1972 වසරේදී ජනතා අයිතියට පවරා දී ඇති මේ රෝහල මඟින් ගම්මාන 4ක් නගර 4ක් හා තේ වතු 37ක් ආවරණය කෙරේ. මේ ප්‍රදේශවල වතු කම්කරුවන් ඇතුළු සමස්ත ජනතාව ලක්ෂ 2කට ආසන්න පිරිසක් සිටිති.

ශ්‍රීපාද වන්දනා සමයේදී හදිසියේ රෝගාතුර වන වන්දනාකරුවන්ට ප්‍රතිකාර ගැනීම සඳහා ආසන්නයේම පිහිටි රෝහල වන්නේ ද මස්කෙළිය ප්‍රාදේශීය රෝහලය. වාට්ටු සංකීර්ණ 6කින් සමන්විත වන මස්කෙළිය ප්‍රාදේශීය රෝහලේ මේ වන විට ක්‍රියාත්මක වන්නේ බිම් මහලේ පිහිටි හදිසි ප්‍රතිකාර අංශය, බාහිර රෝගී අංශය, දන්ත වෛද්‍ය ඒකකය හා වෛද්‍ය සායනය පමණි. වාට්ටු සංකීර්ණය පිහිටි මහල් 3ක් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා කඩිනමින් පිළිසකර කරමින් පවතී. මධ්‍යම පළාතේ කොවිඩ් රෝගීන් සඳහා වන ඇඳන් සංඛ්‍යාව 1456 ක් දක්වා ඉහළ නැංවීමටත් ඒ අනුව පළාතේ රෝහල් 12ක් ඇතුළු තරුණ සේවා සභාවට අයත් යොවුන් නිකේතන මධ්‍යස්ථාන කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන යාමට පියවර ගන්නා බවද ඒ මහතා වැඩිදුරටත් පැවැසීය.

එස්. දියගහගේ - දකුණු පළාත් සංචාරක

## ගාල්ලේ නිරෝධායන නීති කඩ කළ 259ක් අත්අඩංගුවට

කොරෝනා වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩ සටහනකදී නිරෝධායන නීති රීති උල්ලංඝනය කරන ලද පුද්ගලයන් 259 අත්අඩංගුවට ගත් බව ගාල්ල පොලීසිය පවසයි.

ගාල්ල පොලීසිය පසුගියදා (01) පදික වෙළෙඳ සල් හිමියන්, බස් රියැදුරන්, කොන්දොස්තරවරුන් සහ ගාල්ල නගරයට පැමිණි ජනතාවට දැනුම්වත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදි.

මෙහිදී මුඛ ආවරණ නොමැතිව නිරෝධායන නීති රීති උල්ලංඝනය කරන ලද 259ක් අත් අඩංගුවට ගත් අතර එම පිරිසෙන් 219කට දැඩිලෙස අවවාද කොට මුදා හරිනු ලැබූ අතර 40කට නඩු පැවරීමට කටයුතු කර ඇත.

ගාල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් වන විකුම් ගිනිගේ, දුල්ශාන් නාගහවත්ත මහත්වරුන්ගේ උපදෙස් පරිදි මූලස්ථාන පොලිස් පරීක්ෂක කපිල සේනාපතිද සිල්වා මහතා ඇතුළු නිලධාරීහු මේ දැනුම්වත් කිරීමේ වැඩසටහන පැවැත්වූහ.

දිලිප් නිශ්ශංක - බලපිටිය සමූහ

## සූදු කෙළියේ යෙදුණු කතුන් දෙදෙනකු ඇතුළු හතරකට අත්හිටුවූ සිර දඬුවම්

නිරෝධායන නීති උල්ලංඝනය කරමින් මුදල් ඔට්ටුවට සූදු කෙළියේ යෙදුණු විත්තිකරුවන් දෙදෙනකුට සහ විත්තිකාරියන් දෙදෙනකුට බලපිටිය මහෙස්ත්‍රාත් චරිත ජයම්පති මහතා හමුවට ඉදිරිපත් කිරීමෙන් පසුව එක් අයකුට දෙදහස් හයසිය බැගින් 10400 ක දඩයක් නියම කළේය.

අම්බලන්ගොඩ පොලීසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක බණ්ඩාර මහතා පැමිණිල්ල ඉදිරිපත් කරමින් අධිකරණයට කරුණු කියා සිටීමෙන් පසුව මහෙස්ත්‍රාත්වරයා සූදු කෙළියේ වරදට මාස හයක ලිහිල් සිර දඬුවම් නියම කර අවුරුදු හතකට අත්හිටවූ සිර දඬුවම් නියම කළේය. අම්බලන්ගොඩ පොලීසියේ වැටලීම් භාර නිලධාරී උප පොලිස් පරීක්ෂක ගීතා නන්ද සිල්වා පැමිණිල්ල මෙහෙයවීය.

කපිල සෝමරත්න - පාණදුර සමූහ

## කළුතර කොවිඩ් රෝගීන්ට සියලු පහසුකම් සැපයීමට කොවිඩ් පාලන කමිටුවේදී උපදෙස්

කොවිඩ් 19 වයිරසය ආසාදනය වූ රෝගීන් ප්‍රතිකාර සඳහා කළුතර දිසාවේ සියලුම රජයේ ග්‍රාමීය සහ ප්‍රධාන දිසා රෝහල්වලට දිනපතාම ඇතුළත් කෙරෙන බවත් වෛද්‍යවරුන් හෙද හෙදියන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් අපහසුතාවයන්ට මුහුණපැවත් ඔවුන් දිවා රාත්‍රී තම රාජකාරි යුහුසුළුව ඉටුකරන බවත් කළුතර දිසාවේ කොවිඩ් 19 වයිරස පාලන කමිටුවේ රැස්වීමේදී අනාවරණය විය.

රෝගීන් රෝහල්වලට ඇතුළත් කිරීම වැඩිවන විට ඇඳන් හිඟයක් පවතින බව ද වෛද්‍යවරු පෙන්වා දෙති. කළුතර දිසා ලේකම් කාර්යාලයේදී පැවත්වූ මේ කමිටු රැස්වීමේ මුලසුන හෙබවූ වරාය සහ නාවික අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මහතා සඳහන් කළේ රජය විවිධ බාධකවලට මුහුණ පෑවත් ජනතාව එම රෝගයෙන් ගලවා ගැනීම සඳහා රජය සියලුම ක්‍රියා මාර්ග ගෙන ඇති බවය

කළුතර දිසාවේ රෝහල්වලට ඇතුළත් වන කොවිඩ් රෝගීන් සඳහා එම රෝහල්වල ඇඳන් හිඟයක් මතුවන බවත් සමහර ග්‍රාමීය රෝහල්වලට අවශ්‍ය ප්‍රමාණවත් ඔක්සිජන් සිලින්ඩර් රෝහල්වල නොමැති බවත් සඳහන් කළ අමාත්‍යවරයා පෞද්ගලික අංශයෙන් ඔක්සිජන් සිලින්ඩර් මිලදී ගැනීට හැකි බවද ඉඩ පහසුකම් හෝ ඇඳන් අඩුවක් තිබෙනම් ඒ ගැන සොයාබලා කටයුතු කිරීමට කළුතර සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාට හැකි බව ද පැවැසීය.





විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ



## පිටබැද්දර ගෙවතු වගාවට කහ පැළ බෙදා දෙයි

සෑම ගෙවත්තකටම කහ පැළ බඳුනක් ලබාදීමේ ජාතික වැඩසටහනට සමගාමීව පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කහ පැළ බෙදාදීමේ වැඩසටහන පසුගිය 01 වෙනි දින පැවැත්විණි. පිටබැද්දර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති සහ මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පිටබැද්දර, දැරංගල 1 පියවර ජනපදාරාමයේදී සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුකූලව මේ වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. මහා සංඝරත්නය ඇතුළු දැරංගල ගොවි සංවිධානයේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් මේ වැඩසටහන පැවැති අතර ගුණාත්මක බවින් ඉහළ කහ පැළ සෑම ප්‍රදේශයකම ගොවිජන සේවා මධ්‍යස්ථානවල කෘෂිකර්ම මධ්‍යස්ථානවලින් ලබාගත හැකි බව මෙහිදී සඳහන් කෙරිණි.

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ



## ත්‍රිකුණාමලය නව අතිරේක දිසාපතිවරයා (ඉඩම්) රාජකාරි අරඹයි

ත්‍රිකුණාමලය අතිරේක දිසාපති (ඉඩම්) ලෙස පත්වූ පී.ආර්. ජයරත්න මහතා දිසාපති කාර්යාල සංකීර්ණයේ පිහිටි අතිරේක දිසාපති (ඉඩම්) කාර්යාලයේදි සිය ධුරයේ රාජකාරි ඇරැඹී ය.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියකු වන පී.ආර්. ජයරත්න මහතා 2006 දි පරිපාලන සේවාවට එක්වූ නිලධාරියෙකි. දිඹුලාගල හා නොච්චියාගම සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස කටයුතු කර ඇති ඒ මහතා කැබැතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් ලෙස ද කටයුතු කර තිබේ.නව තනතුරට පත්වීමට පෙර ඒ මහතා අවසන් වරට සේරුනුවර ප්‍රාදේශීය ලේකම් ලෙස රාජකාරි කර තිබේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිධාරියකු වන ඒ මහතා නව තනතුරට අමතරව සේරුනුවර වැඩ බලන ප්‍රාදේශීය ලේකම් ලෙස ද කටයුතු කරයි.

සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

## කාන්තාවක දිය නාන අයුරු බැලුවැයි පොලු පහර කෑ තරුණයෙක් මරුට

අසල්වාසි නිවෙසක විවාහක කාන්තාවක එම නිවෙසේ ජල ටැංකියෙන් දිය නාන අයුරු නැරඹීමේ සිද්ධියක් සම්බන්ධයෙන් ඇතිවූ බහින් බස්වීමක් දුර දිග යෑමෙන් ඇතිවූ ගැටුමකින් මාතලේ කිවුල ප්‍රදේශයේ තරුණයකු පසුගිය 1 දින ඝාතනය වී ඇතැයි රත්තොට පොලීසිය පවසයි.

එම ගැටුමෙන් ඝාතනය වී ඇත්තේ කිවුල , නිල්දියදහර ගම්මානයේ සුප්‍රමනියම් ආරුමුගම් ශ්‍රී පවන් ( 28 ) නොහොත් රාජු නමැත්තකුය. මාතලේ පාරාවත්ත ප්‍රදේශයේ සිට පැමිණ සිටි තරුණයන් පිරිසක් හා ඝාතනට ලක්වූ පුද්ගලයා අතර බහින් බස් වීම සිදු ඇති අතර පාරාවත්ත ප්‍රදේශයෙන් පැමිණි තරුණයන් විසින් අදාළ තරුණයාට යකඩ පොල්ලකින් පහරදී ඇති අතර එම පුද්ගලයා මාතලේ දිස්ත්‍රික් මහ රෝහලට ගෙන යමින් සිටියදී ජීවිතක්ෂයට පත්ව ඇති බව පොලිසිය කියයි. එම සිද්ධියට සම්බන්ධ බවට සැකපිට මාතලේ පාරාවත්තේ සිට පැමිණි වයස අවුරුදු (21) හා (23) පුද්ගලයන් දෙදෙනකු රත්තොට පොලීසිය විසින් එදිනම (01) රාත්‍රී අත් අඩංගුවට ගෙන තිබේ.

මාතලේ කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අනුරුද්ධ බණ්ඩාරනායක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අජිත් වංශනාථ මහත්වරුන් හා රත්තොට පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හර්බට් ද සිල්වා මහතාගේ උපදෙස් මත රත්කොට පොලීසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක හේරත් මහතා ඇතුළු කණ්ඩායම සිද්ධිය පිළිබඳව වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

සී .ගමගේ - සොරණාතොට සමූහ

## නීති කඩන බස් රථවල තොරතුරු මේ අංකවලට දැනුම් දෙන්න

රජය මඟින් ලබා දී තිබෙන කොවිඩ් 19 සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් පිළිනොපදිමින් ඌව පළාතේ පෞද්ගලික බස්රථවල මෙන්ම බදුල්ල සිට ධාවනය කැරෙන අන්තර් පළාත් දුර ගමන් සේවා බස්රථවල නියමිත ආසන ගණනට වඩා වැඩිපුර මගීන් පටවා ගෙන බස්රථ වටලා එම බස්රථවල රියැදුරු, කොන්දොස්තරවරුන්ගේ සහ බස්රථයේ බලපත්‍ර තහනම් කිරීමට කටයුතු කරන බව ඌව පළාත් සභාවේ ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති සුසිල් කුමාර මහතා පසුගියදා (3) පවැසීය.

විශේෂයෙන් මේ දිනවල රටපුරා පැතිර යමින් පවතින කොවිඩ් 19 වයිරසය හේතුවෙන් රජය මගින් කොවිඩ් 19 සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් මාලාවක් පනවා තිබෙන බවද ,මගී ප්‍රවාහන බස් රථ වල නියමිත ආසන ගණනට පමණක් මගීන් ප්‍රවාහනය කරන ලෙසටද උපදෙස් ලබා දී තිබෙන බවද හෙතෙම කීය.

එහෙත් ඇතම් බස්රථවල මේ සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් පිළිනොපදිමින් නියමිත ආසන ගණනට වඩා මගීන් පටවා ගෙන ප්‍රවාහනය කරන බවට තොරතුරු අනාවරණය වී ඇතැයි සුසිල් කුමාර මහතා පවසයි.

බදුල්ල සිට ධාවනය කැරෙන අන්තර් පළාත් දුර ගමන් සේවා පෞද්ගලික බස්රථ වල එසේ මිසෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් පිළිනොපදිමින් වැඩිපුර මගීන් ප්‍රවාහනය කරන බස්රථ පරීක්ෂා කර අදාළ නිතීය ක්‍රියාත්මක කිරීමේ බලය රජයේ ප්‍රවාහන අමාත්‍යවරයා මෙන්ම ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් ඌව පළාත් සභාවේ ප්‍රවාහන සේවා අධිකාරියට ලබා දුන් බවද එහි සභාපති සුසිල් කුමාර මහතා සඳහන් කළේය.

සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් පිළිනොපදිමින් මුඛ ආවරණ නොපැලඳ, නියමිත ආසන ප්‍රමාණයට වඩා වැඩිපුර මගීන් ප්‍රවාහනය කරන බස්රථ සම්බන්ධයෙන් 0552225003, 0552220222, 0552225015, යන දුරකථන අංක වලට හෝ 0702044222 වට්ස් ඇප් අංකයට දැනුම් දෙන ලෙසට ජනතාවගෙන් ඉල්ලයි.

පී. මද්දුමගේ - මාවරල සමූහ

## දකුණු පළාත් ආණ්ඩුකාරවරයා සහ දකුණු නාවික පෙදෙසේ ආඥාපතිවරයා අතර හමුවක්

දකුණු පළාත් ආණ්ඩුකාර අචාර්ය විලී ගමගේ මහතා සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ දකුණු නාවික පෙදෙස භාරව අලුතින් වැඩ භාරගත්, නව ආඥාපති රියර් අද්මිරාල් ප්‍රසන්න හේවගේ මහතා අතර හමුවක් පසුගියදා (3) ආණ්ඩුකාර කාර්යාලයේදී පැවැත්විණි.

මෙහිදී දකුණු පළාත තුළ සිදුකරන සෞභාග්‍යයේ දැක්ම වැඩසටහනට අනුව සිදු කරන සංවර්ධන කටයුතු වෙනුවෙන් නාවික හමුදාවේ දක්ෂිණ අනුකණ්ඩයේ සහාය අවශ්‍ය අවස්ථාවලදී ලබා දීමට පියවර ගැනීමට සූදානම් බව පැවැසූ ප්‍රසන්න හේවගේ මහතා කොරෝනා ව්‍යාප්තිය මැඩ පැවැත්වීමට රජය ගෙන යන වැඩ පිළිවෙළට අනුගතව සිදුකළ හැකි සෑම දෙයක්ම සිදු කිරීම තම අපේක්ෂාව බව ද සඳහන් කර ඇත.



සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ සා මහානාම විතානගේ - මල්වාන සමූහ

## බියගම කොරෝනා රෝගීන් වැඩි වෙලා

බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාව ඉකුත් තෙදින තුළ 110 කින් වැඩි වී ඇති බවත් වයිරසය ආසාදිත රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා නව මධ්‍යස්ථාන දෙකක් බියගම ප්‍රදේශයෙන් හඳුනාගෙන ඇතැයිද පසුගියදා (2) බියගම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සමන් පෙරේරා මහතා පැවැසීය.

බියගම මැතිවරණ කොට්ඨාසයේ සියලු ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන අයුරින් කොවිඩ් ආසාදිතයන් වාර්තා වී ඇති බවත් මාකොල, හෙයියන්තුඩුව, බියගම, දෙල්ගොඩ, අකුරුමුල්ල, කදුබොඩ ප්‍රදේශ වලින් වැඩි වශයෙන් ආසාදිතයන් හමුවී ඇති අතර ගෝනවල ප්‍රදේශයේ කුඩා දරුවකුගේ උපන්දින සාදයකට සහභාගි වූ 13 දෙනකු කොරෝනා ආසාදිතයන් ලෙස පසුගියදා (2) හඳුනා ගත් බව ද සමන් පෙරේරා මහතා පැවැසීය.

බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ කොරෝනා ආසාදිත රෝගීන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර කිරීම වෙනුවෙන් මල්වාන බන්ගලාහේන ප්‍රදේශයේ මදුසා පාසල් පරිශ්‍රය සහ සපුගස්කන්ද තරුණ සේවා පුහුණු මධ්‍යස්ථානය මේ වන විට හඳුනාගෙන ඇති බවත් බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි එස්.ප්‍රසන්න මහතාගේ උපදෙස් මත අහඹු පීසීආර් පරීක්ෂණ 200ක් සහ රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණ 100ක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය තුළ දිනපතා සිදුකරන බව බියගම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක

සී. ගමගේ - සොරණාතොට සමූහ

## ගෙවත්තේ කංසා වැවූ සැකකරු ඇලේ

නිවෙසක ගෙවත්තක තිබූ කංසා වගාවක් පසුගියදා (2) වටලා කංසා පැළ 19ක් සමග සැකපිට පුද්ගලයකු බිබිල ඇකියන්කුඹුර මාදුරුඔය ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගත් බව රිදීමාලියද්ද පොලීසිය පවසයි. බදුල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජී.කේ.ජේ. අපොන්සු, බදුල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වසන්ත කන්දේවත්ත, සහකාර පොලිස් අධිකාරි 1 ප්‍රදීප් වීරසේකර මහත්වරුන්ගේ උපදෙස් මත රිදීමාලියද්ද පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රුවන් චන්දික වීරකෝන් මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# ජේ.ආර්.ටත් කුඩය පෙන්වූ දිඹුලාගල හාමුදුරුවෝ

**දිඹුලාගල ආරණ්‍ය සේනාසනාධිපති ලෙස කටයුතු කළ කිතලගම සීලාලංකාර නාහිමියන් 1995 වර්ෂයේ මැයි මස 26 වැනි දින එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීනහු විසින් ඝාතනය කළහ. තමන්ටම අනන්‍ය වූ ආකාරයකින් සමාජ මෙහෙවරක නියැළුණු උන්වහන්සේ මෙරට දේශපාලනඥයන් සමඟ ගැටීම් රැසකටම මුල් වූ භික්ෂූන් වහන්සේ නමක් වූහ. මේ නිසාම තර්ජන, ගර්ජන රැසකට මුහුණ දුන්නද උන්වහන්සේ ඝාතනය වන තෙක්ම තම මෙහෙවර ඉටු කළහ.**

මාතර වල්පිට ආරණ්‍යයේදී පැවිදි වූ සීලාලංකාර හිමි පොලොන්නරුවට වැඩම කළේ තරුණ භික්ෂූන් වහන්සේ නමක් ලෙසය. පසුව පලුගස්දමන ප්‍රදේශයේ සොහොන් පිට්ටනියක වූ නුග ගසක් ආවාසය කරගත් උන්වහන්සේ භාවනායෝගී කටයුතු සඳහා සොහොන් පිටියේ වූ කුඩා ගොඩනැගිල්ල යොදා ගත්හ. කල්ගත වෙත්ම පලුගස් දමන ප්‍රදේශයේ ජනාවාස බිහි වන්නට විය. ඒ සමගම ප්‍රදේශයෙන් නික්ම හඳපානාගල කැලෑවට විත් එහි ගල් ගුහාවක් වාසයට තෝරා ගත්හ.

මෙසේ භාවනා යෝගීව වැඩ සිටින උන්වහන්සේට ගම්වාසීන්ගෙන් නොයෙක් ඇප උපස්ථාන ලැබෙන්නට විය. එහෙත් ජනතාව ගෙවන ජීවිතය සුවපහසු වූවක් නොවන බව කෙටි කලකින්ම සීලාලංකාර හිමියන්ට ප්‍රත්‍යක්ෂ වූහ. ඒ අනුව ආරණ්‍යගත භික්ෂුවක් ලෙස තමා ගෙවන ජීවිතය වෙනුවට දුක් විඳින මිනිසුන්ගේ ජීවිත සුවපත් කිරීමට කටයුතු කළ යුතු බව උන් වහන්සේ තීරණය කළහ.

## පීඩිත ජන ජීවිතය

පීඩිත ජන ජීවිතය නංවාලීමට හොඳම මඟ ඔවුන්ගේ දරුවන්ට අධ්‍යාපනය දීම බව සීලාලංකාර හිමියන්ට අවබෝධ වූහ. ඒ අනුව පාසලක් ආරම්භ කිරීමට උන්වහන්සේ උත්සාහ කළහ. එහෙත් එය සාර්ථක වන බවක් දක්නට නොලැබිණි. කුසට අහරක් නොමැතිව කුඩා දරුවන්ට අධ්‍යාපනය දීමෙන් ඵලක් නොවිණි. අනතුරුව පොලොන්නරුවට පා ගමනින්ම වැඩම කළ උන්වහන්සේ ගැමියන්ගේ ජීවිතවලට අවශ්‍ය එදිනෙදා දේ ලබා ගත හැකි මාර්ග සොයා බලන ලදි. තවද පාසලට පැමිණෙන දරුවන්ට උදෑසන සහ දිවා ආහාර දෙන වැඩපිළිවෙළක් ආරම්භ කළේය. ඒ සමගම පාසලේ ශිෂ්‍ය ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වන්නට විය. පසුකාලීනව සෝරිවිල මහා විද්‍යාලය බවට පත් වූයේ මේ පාසලය.

එකල දිඹුලාගල ගල් ලෙන්හි වාසය කළේ වැදි ජනතාවය. දඩයමින් ඔවුන් ගෙවන ජීවිතය පිළිබඳ සීලාලංකාර හිමියන්ට පැහැදීමක් තිබුණේ නැත. ක්‍රමානුකූලව මේ පිරිස එයින් ගලවා ගැනීමට කටයුතු කළ උන්වහන්සේ වැදි නායකයා වූ මිල්ලානගේ කුඩා පුතු මහණ කර ශාසනයට එක්කර ගත්හ.

“මගේ පුතා නායක හාමුදුරුවෝ මහණ කර ගත්තා. එදා උන්වහන්සේ කිව්වා මස් කන්න එපා කියලා. මම මස් කෑම අත්හැරියා. බත් කන්න කියලා හාමුදුරුවොයි අපිට කිව්වේ. එදා පටන් අපි මුවා, ගෝනා, තලගොයා, ඌරා, වඳුරා මරාගෙන කෑවේ නැහැ. නායක හාමුදුරුවෝ ආව දවසේ ඉඳලා අපි නැවත ඉපදුණා. කොළ අතු පට්ටා ඉණෙන් ගැලවුණා. අපට ඇඳුම් අඳින්න දුන්නා. බත් කන්න ඉගැන්නුවා. බුදුන් වඳින්න ඉගැන්නුවා.“

## උතුරු මැද පළාත

කවදත් වැහි කාලය, පායන කාලය කියා විශේෂයක් පොලොන්නරුවට තිබුණේ නැත. ඒ කුමන කාලයක් වුව ජනතාවට දුෂ්කර විය. ඔවුහු දිවි ගෙවූයේ ඉතා අපහසුවෙනි. මෙවැනි ඛේදවාචකයක් 1958 දී දිඹුලාගලට දැඩිව බලපෑම් කළේය. එම වර්ෂයේදී ඇති වූ ගංවතුර නිසා උතුරු මැද පළාත සම්පූර්ණයෙන්ම වාගේ යට විය. දිඹුලාගල වැසියන්ට තම ජීවිතය රැක ගැනීමට තිබුණේ දිඹුලාගල කන්ද කරා යෑම පමණි. එහෙත් මිනිසුන්ට කුස පුරවා ගැනීමට කිසිවක් මේ කන්දේ තිබුණේ නැත. ඔවුන් දින ගණනාවක් කැලෑ ගස්වල ගෙඩි හා කොළවලින් යැපිණි. මේ කාලයේ සීලාලංකාර නාහිමියෝ කළ හැකි බොහෝ දේ ජනතාව වෙනුවෙන් කළහ. ගංවතුර යම් පමණකට බැස යනු දුටු උන් වහන්සේ තම සිවුර ඔළුවේ බැඳගෙන නානකඩය පිටින් පොලොන්නරුව දෙසට පිහිනා ගියහ. දිසාපති කාර්යාලයට ගිය උන්වහන්සේ ගම්වැසියන් රැසක් කෑමට බීමට කිසිවක් නොමැතිව දිඹුලාගල කන්දේ සිටින බවත් ඔවුන්ට වහාම පිළිසරණක් අවශ්‍ය බවත් දන්වා සිටියහ. ඒ වනතෙක් දිසාපතිවරයා මේ සම්බන්ධයෙන් කිසිවක් නොදැන සිටි අතර හෙතෙම වහාම අසරණව සිටි පිරිසට කෑම යැවීමට කටයුතු කළේය. එය දිඹුලාගල හිමියන්ගේ මැදිහත් වීමෙන් සිය ගණනකගේ ජීවිත බේරා ගැනුණු අවස්ථාවක් විය.

## ජනතාවගේ ප්‍රශ්න

වියළි කාලය ද මෙවැනිම අත්දැකීම් රැසකට මුහුණ දීමට ජනතාවට සිදු විය. ඒ සෑම අවස්ථාවකම පිහිටට පැමිණියේ දිඹුලාගල නාහිමියන්ය. වැසි නැතිව මහ පොළොව සමඟ හෙට්ටු වෙමින් ගෙවන මිනිසුන්ගේ උත්සාහයේ තරමට ප්‍රතිඵල නොලැබිණි. තවත් විටක වසංගත මේ පළාතම වෙළා ගත්හ. ඒ සෑම විටම ජනතාවගේ ප්‍රශ්න අවශ්‍ය බලධාරීන්ට යොමු කර විසඳුම් දීමට උන්වහන්සේ කටයුතු කළහ.

ජනතාව වෙනුවෙන් තමා අපේක්ෂිත අරමුණු ඉටු නොවන විට දැඩි තීරණ ගැනීම ද උන්වහන්සේගේ ස්වභාවය විය. මේ නිසාම උන්වහන්සේ අත වූ කුඩයෙන් පහර කෑ බොහෝ පිරිසක් ද වූහ. මෙලෙස කුඩ පහර කෑ පිරිස් අතර රජයේ නිලධාරීහු මෙන්ම දේශපාලකයෝ ද වූහ.

එක් අවස්ථාවක මනම්පිටිය විහාරස්ථානය සෑදීමට සූදානම් වන විට එම ස්ථානය ඉදිරිපිට මිනිසෙක් හරක් මස් කඩයක් විවෘත කර වෙළෙඳාම් කරන ආකාරය නායක හිමියෝ දුටුවහ. එහෙත් එය නොදැක්කා සේ සිට පන්සල ඉදි කළ උන්වහන්සේ විහාරස්ථානයේ වැඩ නිම කිරීමෙන් පසුව මස් කඩය අයින් කරගන්නැයි එහි අයිතිකරුට කීහ.

“උඹ කව්ද මට යන්න කියන්න මෙතන ලොක්කා මම. මට ඕනේ හැටියටයි. මෙතැන වැඩ කරන්නෙ. පලයන් යන්නැ” යි අයිතිකරුවා ගෝරනාඩු කළේය. ඒ සමගම ප්‍රතික්‍රියා දැක් වූ සීලාලංකාර නාහිමියෝ,

“අපියි යකෝ මෙතැන ලොක්කෝ” කියා අතැතිවූ කුඩය වෙළෙන්දාගේ හිස මතට පතිත කළේ දැතින් ම ය.

“ටා” යන හඬින් තට්ටයට පහර වැදුණු වෙළෙන්දා පහර කා ගෙනම දුවන්නට විය. ඔහුගේ පිරිවරද කැලෑ වැදුණ හ. මස් කඩය ද වැසී ගියේය. කල් යත්ම දිඹුලාගල නාහිමියන් සමඟ සුහද වූ මේ ව්‍යාපාරිකයා පන්සලට දානය පවා පිරිනැමූ බව කියවේ.

සීලාලංකාර හිමියන්ගේ කුඩ පහර කෑ බොහෝ දෙනෙකුට එය අමිහිරි අත්දැකීමක් විය. වරෙක මඩකළපුවේ දකුණු කෙළවරේ සිට දෙමළ ජාතිකයෝ පිරිසක් තම ආධිපත්‍ය පෙන්වමින් සිටියහ.

## එඩිතර ගතිය

දිස්ත්‍රික් සීමා වෙනස් කිරීම, සිංහල ගම්මානවලට දෙමළ නම් දැමීම, සිංහල පුද්ගල නාමවලට දෙමළ පුද්ගල නාම දැමීම මෙහිදී සිදුවෙමින් තිබුණි. දිනක් සීලාලංකාර හිමියන්ට මේ ව්‍යාපාරය හා සම්බන්ධ වූ ග්‍රාම සේවා නිලධාරියකු හමු විය.

ග්‍රාම නිලධාරියාගේ අසාධාරණ ක්‍රියාවට උන්වහන්සේගේ කුඩය පිළිතුරු දුනි. එය අවසාන වූයේ කුඩය කැඩී යාමෙනි. තවත් අවස්ථාවක උන්වහන්සේගේ කුඩ පහර කෑ නගරාධිපතිවරයකු හතර ගාතින් ම ඇද වැටිණි.

මේ අතර දිනක් ඉඩම් පිළිබඳ ඇති වූ ගැටුමක් උග්‍ර වූ අවස්ථාවකදී,

”දිසාපතිලට ගහලම කුඩ හයක් කැඩුණා. හත් වැනි කුඩයත් කඩන්නේ නැතිව මේ සිංහලයන්ට ඉඩං දීපං” යැයි උත්සව වේදිකාව මතට නැගී තර්ජනය කෙළේ දහස් ගණනක් මිනිසුන් ඉදිරිපිටය. කිතලගම සීලාලංකාර හිමියන්ගේ පැවතිමේ එඩිතර ගතිය රජයේ මැති ඇමැතිවරුන් කෙරේ වුව එලෙසින්ම විය.

අවශ්‍ය තැන විවේචනයත්, අවශ්‍ය තැන ප්‍රශංසාවටත් කිසි විටකත් උන්වහන්සේ මැළි නොවිණි. දිනක රජයේ අමාත්‍යවරයකු වූ පෝල් පෙරේරා මහතාට බැණ වැදුණු සීලාලංකාර නාහිමියෝ ඔහුව එළවා දැමීමට කටයුතු කළහ.

තවත් අවස්ථාවක උන්වහන්සේ ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතාට කුඩයක් ඔසවා තර්ජනය කළහ. මෙලෙස උන්වහන්සේගේ මැදිහත්වීම තුළ ජනතාවගේ ආරක්ෂාව ද නිතැතින්ම සැලසිණි.

## අපේ රජ්ජුරුවෝ

මහවැලි කලාපයේ පදිංචි වූ ජනතාව අතරින් බොහෝ පිරිසක් නූගතුන් වූහ. ඔවුනට රජයේ නිලධාරීන් සමඟ ගැටී කටයුතු කිරීමට හැකියාවක් තිබුණේ නැත. මේ නිසාම නිලධාරීන්ගේ විවිධ උපක්‍රමවලට, අතවරවලට ගොදුරු බවට පත් වීමට මේ ගැමියන්ට සිදු විය. මේ අවස්ථාවලදී ගම්වාසීන්ට තිබූ ශක්තිය වූයේ දිඹුලාගල නාහිමියන්ය. උන්වහන්සේ ගැමියන්ගේ ප්‍රශ්න සමඟ සිටීම නිසා ගැමියන්ට නිලධාරීන්ගෙන් සිදු වන අසාධාරණකම් බොහෝ දුරට අවම විය.

එකල උන්වහන්සේ නිතරම දැක ගත හැකි තැනක් වූයේ පොලොන්නරු කච්චේරි භූමියයි. ශාසනික වුවමනා මෙන්ම ප්‍රදේශයේ දිළිඳු ජනතාවගේ වුවමනා රැසක් ද රැගෙන කච්චේරියට යන උන්වහන්සේ ඒවා සියල්ල කච්චේරි බලධාරීන්ට යොමු කළහ. එකින් එක ගම්මුන්ගේ ගැටලු නිරාකරණය වන්නට වූයේ සීලාලංකාර හිමියන්ගේ මේ මැදිහත්වීම නිසාවෙනි.

“දිඹුලාගල හාමුදුරුවෝ කියන්නේ අපේ රජ්ජුරුවෝ. අපේ පණ ඉතිරිවෙලා තියෙන්නේ හාමුදුරුවෝ නිසා” යැයි ජනපදවාසීහු නිතරම ප්‍රකාශ කළහ.

1994 වර්ෂයේ අග භාගයේදී රජය සහ එල්. ටී. ටී. ඊ. ය අතර සාම සාකච්ඡා ඇරඹී තිබිණි. සාකච්ඡා පැවැත්වෙන කාලයේදී එනම් 1995 ජනවාරියේ දිනක රාත්‍රියේ කොටි ත්‍රස්තයන් පස්දෙනකු දිඹුලාගල පන්සලට පැමිණියහ.

“ස්වාමි.... ස්වාමි.... අපිට සපෝට් කරන්න ස්වාමි” යැයි එල්.ටී.ටී ඊ සාමාජිකයෙක් නා හිමියන්ගෙන් ඉල්ලා සිටියේ ය.

“අපි දැන් සාකච්ඡා කරගෙන යනවා; ඉල්ලන දේ නොලැබුණොත් යුද්ධ කරනවා” යැයි තවත් ත්‍රස්තවාදියෙක් කියන්නට විය.

මේ සියල්ල සාවධානව අසා සිටි දිඹුලාගල නාහිමියෝ, “උඹලා යුද්ධ කරනවා නම් අපිත් යුද්ධ කරනවා. මේක සිංහල අපේ උරුමය. උඹලත් අපිත් සමඟ සාමයෙන් ඉඳපල්ලා. නැතිව උඹලට වෙනම කොටසක් දීමට අපි සූදානම් නැහැ” යැයි පිළිතුරු දුන්හ.

කෙටි කලකින්ම යුද්ධය නැවැත ඇරඹිණි. මේ අවධියේ දිඹුලාගල ආසන්න ප්‍රදේශ පැවැතියේ අනාරක්ෂිතවය. මේ අවස්ථාවේදී ද ජනතාවගේ ආරක්ෂාව සීලාලංකාර නාහිමියන්ට ප්‍රබල අභියෝගයක් විය.

“උඹලා බයවෙන්න එපා. මම ඉන්නවා. කොටි උඹලට ගහන්නේ මාව මරලා, මාව මරණකම් උඹලා යන්න එපා” යැයි උන්වහන්සේ ගම්වාසීන්ට ප්‍රකාශ කළහ.

කෙසේ වෙතත් ගම්වාසීන්ගෙන් මෙන්ම විහාරස්ථානයේ වැඩ වාසය කරන භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව පිළිබඳ ගැටලුව එන්න එන්නම උග්‍ර විය. රජයෙන් ද සාධාරණ පිළිතුරක් නොලැබෙන බව උන්වහන්සේට පෙනෙන්නට තිබිණි. එහිදී පාලකයන්ට චෝදනා මුඛයෙන් කතාකළ උන්වහන්සේ මෙසේ කීහ.

## මලිය දේව පුරය

“භික්ෂූන් වහන්සේ 825 ක් දිඹුලාගල ඉන්නවා. මං ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, අපිට වහාම හමුදා ආරක්ෂාව සපයන්න කියලා, එහෙම බැරි නම් වහාම දිඹුලාගලට මිනී පෙට්ටි 825ක් එවන්න” යැයි කියා සිටියහ.

මෙලෙස සෑම විටම බොහෝ නිර්භයව අදහස් දැක්වීමට පෙලඹී සිටි සීලාලංකාර හිමියෝ භාවිත කර තිබුණේ රජය මඟින් දුන් වාහනයකි.

මේ අතර දිනයක මේ වාහනය ආපසු රජයට පවරා ගන්නා බව ප්‍රකාශ විය. එයට උන්වහන්සේ ප්‍රතිචාරය දැක්වූයේ වෙනම ආකාරයකිනි.

“මම ඒ අයට කියන්න කැමැතියි. පුළුවන් නම් වාහනය ගන්න. මම බය නැහැ. මම මේ පළාතට ආවේ වාහනවලින් නොවේ. පයින් ඇවිත් මිනිසුන් සමඟ එකතු වෙලා කැලෑ එළිකරලා මේ පළාත්වල මිනිස්සු පදිංචි කරවලා ගම්මාන බිහි කළේ. ඒ සඳහා ඇවිදලා මගෙ යටි පතුල් දෙකත් ටයර් එකක් බවට පත් වෙලා. ඊටත් ජනතාවට සේවය කරන්න යන්න වාහන අවශ්‍ය නැහැ. මට පයින් ගිහින් ඒක කරන්න පුළුවන්” යැයි කීහ.

ප්‍රදේශයේ ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා සීලාලංකාර හිමියෝ ඕනෑම අයකු සමඟ ගැටීමට සූදානම්ව සිටියහ. එහිදී නායකයා, සේවකයා තරාතිරම උන්වහන්සේට වැදගත් නොවීම විශේෂය.


මේ අතරම උන්වහන්සේට එල්ල වූ ප්‍රධාන චෝදනාවක් විය. ඒ උග්‍ර ජාතිවාදියකු ලෙස පෙනී සිටි අයකු බවය. එය වෙනම කතා කළ යුතු මාතෘකාවක් වන අතර කෙසේ වෙතත් උන් වහන්සේ දෙමළ ජාතිකයකු සමඟ එකතු වී ‘මලිය දේව පුරය‘ නම් ගමක් පිහිටුවා තිබිණි. සිංහල මෙන්ම දෙමළ ජනතාවද මෙහි ජීවත් වූහ. නාහිමියන් ද නිතරම ඔවුන්ගේ දුක සැප සොයා බැලූ බව කියැවේ. ඒ සමගම ප්‍රදේශයේ දෙමළ ජනතාවගෙන් පන්සලට දානය පවා ලැබුණු බව වාර්තාවේ.

“කොටි මෘගයෝ. ඒත් දෙමළ වැසියන් අහිංසකයි. ඇයි අපිට සමඟියෙන් ඉන්න බැරි?“ එක් අවස්ථාවක උන්වහන්සේ විමසූහ.

මේ තත්ත්වය හමුවේ කොටි ත්‍රස්තවාදීන් අවබෝධ කර ගත් දෙයක් තිබුණි. ඒ දිඹුලාගල නාහිමියන්ගේ ජීවිතය විනාශ කර දැමුවහොත් දිඹුලාගල පමණක් නොව සේරුවාවිල, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශ රැසක දහස් ගණනක් ජනතාව ද නොමරා මරා දැමිය හැකි බව ය.

මේ අනුව ඝාතනය සැලසුම් කළ එල්.ටී.ටී. ඊය 1995 මැයි මාසයේ 26 වැනි දින උදෑසන තම ඉලක්කය කරා තුවක්කුකරුවෝ යෙදවූහ. දිඹුලාගල කුඹුරු යාය නැරඹීමට යමින් සිටි කිතලගම සීලාලංකාර නාහිමියන් තම කුඹුරුයාය ආසන්නයේම අවසන් හුස්ම හෙළූහ.

**මලික් චමින්ද ධර්මවර්ධන**



”දිසාපතිලට ගහලම කුඩ හයක් කැඩුණා. හත් වැනි කුඩයත් කඩන්නේ නැතිව මේ සිංහලයන්ට ඉඩං දීපං” යැයි උත්සව වේදිකාව මතට නැගී තර්ජනය කෙළේ දහස් ගණනක් මිනිසුන් ඉදිරිපිටය. කිතලගම සීලාලංකාර හිමියන්ගේ පැවතිමේ එඩිතර ගතිය රජයේ මැති ඇමැතිවරුන් කෙරේ වුව එලෙසින්ම විය.

# දේශපාලනයේ වාර්තා පොත්වලට ගිය මොලමුරේලා

ශ්‍රී ලාංකේය දේශපාලන වංශකතාව තුළ මොලමුරේ පරම්පරාවට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. මොලමුරේ පරම්පරාවේ චරිත කිහිපයක්ම, 20 වන සියවසෙහි ලාංකීය දේශපාලනය තුළ නොමැකෙන නම් තැබූවෝ වූහ. ඔවුහු දේශපාලන වාර්තා පොත් අතර ද සිය නාමයන් රැන්දූ චරිත වූහ. ලංකාවේ ප්‍රථම කතානායක සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා, ව්‍යවස්ථාදායකයට පත් වූ පළමු කාන්තාව ඇඩ්ලින් මොලමුරේ මහත්මිය, එකම පවුලේ මව සහ දුව සෙනෙට් සභාවක් නියෝජනය කළ පළමු අවස්ථාව වැනි ලාංකීය දේශපාලනයේ බිඳ හෙළිය නොහැකි සුවිශේෂී වාර්තා රැසක් ම තැබූ දේශපාලන පරපුරක් ලෙස මොලමුරේ පරපුර ඉතිහාසගත වෙයි.

## මොලමුරේ පරපුරේ ඉතිහාසය

මොලමුරේ පරපුර, අතීත උඩරට රාජධානි යුගයේ සිට පැවත ආ ප්‍රබල ප්‍රභූ පරම්පරාවකි. සබරගමුව මඩුවන්වෙල පරපුරෙන් මොලමුරේලා පැවත ආහ. 18 වැනි සියවසේ අග භාගය දක්වා මඩුවන්වෙල පරපුරේ වතගොත දිවෙයි. සබරගමුවේ මඩුවන්වෙල වලව්ව මොලමුරේ පරපුරේ කේන්ද්‍රස්ථානය විය.

## ලංකාවේ පළමු කතානායක සර් ෆ්‍රැන්සිස් මොලමුරේ


ෆ්‍රැන්සිස් මොලමුරේ

සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවේ කතානායක ධුරයට පත් පළමු පුද්ගලයා විය. ඔහු කොළඹ ශාන්ත තෝමස් විද්‍යාලයෙන් සිප් සතර හැදෑරූ අතර පාසල් කාලයේ ඉගෙනුමට දක්ෂ ශිෂ්‍යයකු වූවා මෙන්ම ක්‍රිකට් ක්‍රීඩාවට ද දක්ෂයෙක් විය. උසස් අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව නීතිඥ වෘත්තියට පිවිසෙන ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා ලංකා ජාතික සංගමයේ ප්‍රබල සාමාජිකයෙක් වෙමින් ලාංකීය දේශපාලනයට අත්පොත් තැබීය. 1924 වර්ෂයේ කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවට තේරී පත් වන ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා 1931 වසරේදී දැදිගම ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් විය. සර් ෆ්‍රැන්සිස් මොලමුරේ කතානායක ධුරයට තේරී පත් වන්නේ මේ යුගයේදීය. ඉන් පසු 1947 වසරේ පැවති ලක්දිව පළමු පාර්ලිමේන්තු මැතිවරණයට ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා තරග කළේ බළන්ගොඩ ආසනය නියෝජනය කරමින් ය. එහිදී මොලමුරේ මහතා වැඩි ඡන්දයෙන් නැවතත් මැති සබයට තේරී පත් විය. 1947 පිහිට වූ පාර්ලිමේන්තුවේ කතානායක ධුරයට ද සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා තේරී පත් විය.

## පනාමුරේ ඇතා

සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා ශ්‍රී ලංකා දේශපාලනය තුළ ආන්දෝලනාත්මක සිද්ධි කිහිපයකටම හසු වූ චරිතයක් ද විය. ඒ අතරින් පනාමුරේ ඇතාගේ සිද්ධිය ප්‍රධාන තැනක් ගනී. 1950 දශකයේ මුල් භාගයේ ලංකාවේ ආන්දෝලනාත්මක සිද්ධියක් වූ පනාමුරේ ඇතා මරා දැමීමේ සිද්ධියේදී සමාජයේ දෝෂාරෝපණය කෙළින්ම එල්ල වූයේ සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතාටය. පනාමුරේ ඇත් ගාල මඩුවන්වෙල පරම්පරාවේ අයිතිය යටතේ පැවති බූදලයකි. පනාමුරේ ඇතා වෙඩි තැබීමකින් ඝාතනයට ලක් වන අතර එවකට ඇත්ගාලේ අයිතිය දැරුවේ සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා ය. එම නිසාම සමාජය විසින් ඇත් ඝාතනයේ චෝදනාව මොලමුරේ මහතා වෙත එල්ල කොට තිබුණි.

සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා 1951 වසරේදී මෙලොවින් සමුගන්නේ ඉතාම අවාසනාවන්ත අයුරිනි. 1951 ජනවාරි මාසයේ පාර්ලිමේන්තුව රැස් වූ අවස්ථාවේ සිය කතානායක අසුන මතම සිහිසුන් වී ඔහු මෙලොවින් සමු ගන්නේ හෘදයාබාධයක් හේතුවෙනි. කෙසේ නමුත් ලක්දිව දේශපාලන වංශකතාව තුළ සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා සුවිශේෂී චරිතයකි.

## ව්‍යවස්ථාදායකයට පත් වූ පළමු කාන්තාව ඇඩ්ලින් මොලමුරේ



පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය ලංකාවේ පමණක් නොව ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයේ බහුල වශයෙන් සාකච්ඡාවට බඳුන් වන මාතෘකාවකි. එදා මෙදා තුර ලාංකීය පාර්ලිමේන්තු ඉතිහාසය තුළ පාර්ලිමේන්තුව නියෝජනය කළ කාන්තාවෝ රාශියක්ම වෙති. එහි සමාරම්භක කාන්තාව ලෙස ඉතිහාසගත වන්නේ ඇඩ්ලින් මොලමුරේ මැතිනියයි. ඇඩ්ලින් මොලමුරේ මහත්මිය පාර්ලිමේන්තුවට තේරී පත් වන්නේ අතුරු මැතිවරණයකිනි. 1931 රාජ්‍ය මන්ත්‍රණ සභාවට රුවන්වැල්ල ආසනයෙන් නිතරගයෙන් තේරී පත් ව සිටි ජේ. එච්. මීදෙණිය අධිකාරම හදිසියේ අභාවප්‍රාප්ත වීම නිසා හිස් වූ මන්ත්‍රී ධුරය සඳහා එම අතුරු මැතිවරණය පැවැත්විණි.

මීදෙණිය අධිකාරම් යනු ඇඩ්ලින් මොලමුරේ මැතිණියගේ පියාණන් විය. පියාණන්ගේ ඇවෑමෙන් මැතිවරණයට ඉදිරිපත් වූ ඇඩ්ලින් මොලමුරේ මහත්මිය ජනතා ඡන්දයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්වීමට භාග්‍යය උදා කර ගත්තාය. ඇය සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතාගේ බිරිඳ ද වූවාය.

## ප්‍රථම වරට සෙනෙට් සභාව නියෝජනය කළ මව සහ දුව

සර් ෆ්‍රැන්සිස් මොලමුරේ සහ ඇඩ්ලින් මොලමුරේ මහත්මියගේ එකම දියණිය වූයේ සීතා මොලමුරේ සෙනෙවිරත්න මහත්මියයි. 1967 වසරේ සෙනෙට් සභාවට තේරී පත්වන සීතා මොලමුරේ මහත්මිය එහිදී සෙනෙට් සභා ඉතිහාසයේ වාර්තාවක් ද පිහිටුවූවාය. 1961 වසරේදී සිය මව සෙනෙට් සභාවෙන් ඉවත් ව සිටියත් මවක් සහ දුවක් සෙනෙට් සභාව නියෝජනය කළ පළමු අවස්ථාව ලෙස එම අවස්ථාව ඉතිහාසගත විය.

මේ අන්දමින් බලන කල ලාංකීය දේශපාලන ඉතිහාසයේ මොලමුරේ පරම්පරාවට සුවිශේෂී ස්ථානයක් හිමි ව තිබුණි. එපමණක් නොව මොලමුරේ පරම්පරාවට නෑකම් කියූ සුවිශේෂී දේශපාලන චරිත රැසක්ම ලක්දිව දේශපාලන භූමිකාව තුළ එදා සිට අද දක්වාම දැක ගත හැකි වෙයි.

ආර්. මහීෂ්වර



# කළුතරින් බිහි වූ එකම අගමැති

**1933 මැයි පස් වැනිදා මිල්ලෑවේ දී ජන්මලාභය ලැබූ රත්නසිරි වික්‍රමනායක (දෙවැනි පුතා) කැටුව දයාබර පියාණන්වූ එකල ගම්පති බැද්දගේ සයිමන් රාලහාමි අකුරු කියාදෙන්නට මිල්ලෑව රජයේ පාසලට පිවිසියේය. ලොකු ඉස්කෝලේ මහත්තයා කිරිවත්තුඩුවේ ලියෝනිස් ගුරුතුමාය. කළු කෝට් බෑයකින් ද සුදු සරමකින් ද සැරසී සිටි තේජවන්ත පෙනුමකින් යුතු ලොකු මහත්තයාට රත්නසිරි දරුවා බුලත් හුරුල්ලක් දී දෙදණ නවා වැන්දේය. ලොකු මහත්මයා පුංචි දරුවාගේ හිස ඉතා ආදර දයාවෙන් පිරිමැද්දේය.**

පුතේ 'අ' යන්න කියන්න. පුතේ 'ආ' යන්න ගල්ලෑල්ලේ අඳින්නේ මෙහෙමයි. අම්මා පුංචි පුතාගේ ගල්කූර කඩදාසි දවටනයකින් වෙළා දැඩි බව දුටු පුංචි පුතා සිහින් හඬින් 'අ' යන්න කීවේය. 'අ' යන්න ගල්ලෑල්ලේ ලීවේය.

හොඳ පුතා අයන්නෙන් එන නමක් කියන්න.

"අම්මා.."

රාලහාමි මේ දරුවා හොඳට ප්‍රවේශම් කරගන්න. අපේ ගම් පළාතේ හතර මායිමකවත් මේ වගේ දරුවකු මම දැකලා නෑ. හෙට ඉඳන් ඉස්කෝලෙට එවන්න.

මිල්ලෑව මහ ගෙදර සිට ගමේ පාසලට ඒ තරම් දුරක් නැත. පුංචි රත්නසිරි පාසලට දුනු කරත්තෙන් එක්කරගෙන එන්නේ හෙන්දිරික් මාමාය. සමහර දිනෙක ඒ කරත්තයට අතරමගදී හමුවන සගයෙක් ද එක් කරගෙන යෑම රත්නසිරිගේ පුරුද්දක් විය.

දැන් පුංචි රත්නසිරි හතර වැනි පන්තියේය. එහි ගුරුවරයකුගේ නෑයකුගේ දඩබ්බර දරුවකු ද ඒ පන්තියේ විය. අර දරුවා දිනක් රත්නසිරිට කකුල් මාට්ටුවක් දැම්මේය. රත්නසිරි බිම වැටුණි. රත්නසිරිගේ දකුණු කකුලෙහි දණහිස ලෙලි ගැසී ඇත. ඔහු දඟකාරයා දෙස මොහොතක් බලා සිටියේය. ප්‍රතිවාදියාට දිගට හරහට පහර දුන්නේය. දැන් දෙදෙනාම ගුරුවරයා ඉදිරිපිටය. පන්තියේ දරුවන් බලා සිටියදී පන්තිභාර ගුරුවරයා රත්නසිරි දරුවාට වේවැල් පාර කීපයක් ගැසීය. රත්නසිරි හැඬුවේ නැත. ගුරුවරයා දෙස මොහොතක් බලා සිටියේය.

"වැරැද්ද කරපු එකා හිනාවෙවී බලා ඉන්නවා. එයාගෙන් මුකුත් ඇහුවේ නෑ."

ගල්ලෑලි පොත් රැගත් රත්නසිරි කරත්තය එන තෙක් බලා නොසිට ගිනි අව්වේම මහ ගෙදරට දිව්වේය. අම්මා කලබලයෙන් දුවගෙන ආවාය. ඒ සැනින්ම තාත්තත් පැමිණියේය. සියලු තතු කියූ දරුවා "තාත්තේ මං මේ ඉස්කෝලෙට ආයෙමත් යන්නෙ නෑ." යි පැවසුවේය.

එතැනින් පටන් ගත් රත්නසිරිගේ ගමන්මග පන්නිපිටිය ධර්මපාල විදුහල හරහා කොළඹ ආනන්ද විදුහල දක්වා දික්වූයේය. ධර්මපාල විදුහලේ විදුහල්පති වූ ලෝරිස් මහතා රත්නසිරි ශිෂ්‍යාට සිංහල භාෂාව හරි හැටියට ඉගෙන ගන්නට අවශ්‍ය අක්ෂර භාවිතය ද පද ගැළපුම ද නිවැරදිව කියා දුන්නේය.

ආනන්ද විදුහලේ අයියා වික්‍රමනායක මුනිදාස ඉගෙන ගත්තේය. විදුහල්පති එල්. එච්. මෙත්තානන්ද ගුරු දේවයන්ගේ දැඩි විනය පාලනය මෙන්ම පොත්පත් සඟරා පිරී තිබුණු පුස්තකාලයෙන් රත්නසිරිට නව ලෝකයක් උදා විය. මේ අතර මාස කීපයකට පසු දිනක ගෙදරින් හදිසි පණිවුඩයක් ලැබුණි. තාත්තාට මුදලි මුහන්දිරම් ධුරයක් ලැබෙන හෙයින් එදින උත්සවයට ගෙදර පැමිණෙන ලෙසය. ඒ වන විටත් ආනන්ද විදුහලේ පරිසරයෙන් ද කියවූ පොත පත ඇසුරෙන් ද මෙත්තානන්ද චින්තනයෙන් ද පෝෂිතව සිටි රත්නසිරි මුහන්දිරම් පට්ටම ලැබෙන උත්සවයට එන්නේ නැතැයි පණිවිඩකරු මඟින්ම තාත්තාට දැන්වීය.

ඒ කාලයේ රට පිළිගත් ලොකුම වෘත්තීය වූයේ එංගලන්තයට ගොස් ලැබෙන අධි නීතිඥ උපාධියයි. නැතිනම් පෙරකදෝරුවකු වීමයි. වත්පොහොසත්කම් ඇති ලාංකීය ප්‍රභූ පවුල් හිමියෝ ඒ බලාපොරොත්තුව ඔස්සේ දරුවන් එංගලන්තයට යැවූහ. සයිමන් වික්‍රමනායක මුහන්දිරම් රාලහාමි රත්නසිරි එංගලන්තයේ ලින්කන් ඉන් නීති පීඨයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සකස් කළේය. ආනන්දයේ දී ඉතා ඉහළින් වර්ධනය වූ රත්නසිරිගේ කථිකත්වය එංගලන්තයේ නීති පීඨයේ දී සරුඵල දරා වැඩුණේ රට රටවල හිත මිතුරන්ගේ ආභාෂය ඔස්සේය. එක්සත් රාජධානියේ ලාංකික ශිෂ්‍ය සංවිධානයේ සභාපති වශයෙන් රත්නසිරි පත් වූයේ ආසියා අප්‍රිකා හිතමිතුරන්ගේ යෝජනා මධ්‍යයේය.

එකල ලෝක ප්‍රජාව තුළ පැන නැගෙමින් තිබුණොත් නොබැඳි ව්‍යාපාරය පිළිබඳ වඩාත් හැඟීම වඩාත් තීව්‍ර කිරීම උදෙසා ශිෂ්‍ය සංවිධානය ඔස්සේ පුළුල් කාර්යභාරයක් ඉටු කළ හැකි බව රත්නසිරි අවබෝධ කර ගත්තේය. සංවිධානයේ සභාපති වූ රත්නසිරි වික්‍රමනායක 1954 ශ්‍රී ලංකාවේ නිදහස් උළෙලක් එංගලන්තයේ හෝටල් නගර ශාලාවේදී පැවැත්වීමට අවශ්‍ය සංවිධාන කටයුතු විධිමත් ලෙස සකස් කළේය. එංගලන්තයේ සිය ගොවිපොළ වෙත පැමිණ සිටි ලංකා අගමැති සර් ජෝන් කොතලාවල ප්‍රධාන ආරාධිත වශයෙන් සම්බන්ධ කරගත්තේය. රත්නසිරි සහ එවකට අගමැති පොල්තෙල් පහන් දැල්වූහ. නීති පීඨයේ මධ්‍යම පරීක්ෂණයෙන් ඉතා ගෞරවාන්විතව සමත්ව සිටි රත්නසිරි අවසාන පරීක්ෂණයට මුහුණ දෙමින් සිටි අවධියේ අසන්නට ලැබුණේ ඉතාම කනගාටුදායක පුවතකි.

හොරණ ඡන්ද කොට්ඨාසයට ඉදිරි මැතිවරණයේදී වමෙන් තරග කරන්නට සංවිධාන සකස් කරමින් සිටි සොහොයුරු මුනිදාස වික්‍රමනායක අනපේක්ෂිත සිද්ධියකින් මරණයට පත් වූ පුවත දැනගත් වහාම රත්නසිරි ආපසු මවුබිමට පිවිසියේය. මහජනයාගේ සෝ සුසුම් මධ්‍යයේ 1959 අප්‍රේල් 10 ආදාහන කටයුතු සිදු කෙරිණි.

එදින සවස අටට පමණ මිල්ලෑව මහ ගෙදර මිදුලේ හදිසි තීරණාත්මක සාකච්ඡාවකි. එහිදී ගත් තීරණ රත්නසිරි තරුණයාගේ බාප්පා පුහුවල ගංගාරාමයේ විහාරාධිපති ධම්මතිලක හිමිපාණන්ගේ ද විද්‍යාරතන පිරිවෙනෙහි පරිවේණාධිපති මහනුවර ධම්මරතන හිමිපාණන්ගේ ද අධීක්ෂණයට ලක්ව ඒකමතිකව සහා සම්මතව තිබුණි. මිල්ලෑව පාසලේ එදා සමකාලීනයෝ මහ පවුරක් මෙන් සැදී බැඳී සිටියහ.

රත්නසිරි වික්‍රමනායකගේ එතෙර ගමන නතර විය. මේ වන විට පියා ජීවතුන් අතර නැත. රත්නසිරිට බරපතළ තීරණයක් ගන්නට ජනතාවගේ ඉල්ලීම ප්‍රබල විය. ඊළඟ වසරේ පැවැත්වෙන මහ මැතිවරණයට හොරණ ඡන්ද කොට්ඨාසයෙන් තරග කරන්නට අවශ්‍ය මග සැකසිණි.

1960 මහ මැතිවරණය මාර්තු 19 වැනිදාට පැවැත්වීමට දින නියම විය. මහජන එක්සත් පෙරමුණේ නායක පිලිප් ගුණවර්ධන බෞද්ධ ජන බලවේගයේ නායක ආනන්ද විදුහල්පති සමඟ දාම්පෙ මෙත්තානන්ද විද්‍යාරත්න පිරිවෙනේ රැටියල පඤ්ඤාසාර, පුහුවල ගංගාරාමයේ විද්‍යාලාධිපති උඩුවේ ධම්මතිලක හිමිපාණන් ප්‍රධාන මහා සංඝරත්නය පෙරමුණ බලය ගැනීම් ශක්තිමත් කළහ. කරුණාසේන ජයලත්, පුෂ්පකුමාර ප්‍රේමරත්න ප්‍රධාන නියමු අවශ්‍ය ප්‍රචාරය ලබා දුන්හ. 1931 දී ආරම්භ වූ හොරණ ඡන්ද කොට්ඨාසයට මුල්වරට රයිගම් කෝරළයෙන් රයිගම් පුත්‍රයකු හොරණට පත්වෙමින් 1960 දී රත්නසිරි හොරණ මන්ත්‍රී ලෙස පත් විය.

1960 මාර්තු රාජාසන කතාවේදී රත්නසිරි තනි හිතට තනි තීන්දුවක් ගෙන තවත් මන්ත්‍රී සගයන් නව දෙනෙක් සමඟ නායකත්වයට එරෙහිව හොරණ ජනතාවගේ පැත්ත ගත්තේය. රාජාසන කතාවෙන් එජාප රජය පරාජය විය. හොරණ බල ප්‍රදේශයේ සියලු පොදුජන හිතවාදීන් සමඟ මහා කඩුල්ලක් පැන 1961 ජූලි මැතිවරණයේදී මැති සබයේ වැජඹුණේ ය. 1965 ජනවාරි 10 වැනිදා ඓතිහාසික ගමන් මඟකට මුල පුරමින් ඡන්ද කොට්ඨාසයේ පාසල් විසිහතක් පරිත්‍යාග කළ රත්නසිරි 1965 මැතිවරණයෙන්ද විජයග්‍රහණය කළේය. 1970 මැතිවරණයේ ද විශිෂ්ට ජයග්‍රහණයක් හිමි කරගෙන නියෝජ්‍ය අධිකරණ අමාත්‍ය ධුරයට පත් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය 1972 ජනරජය ගොඩනගන්නට මුළු මහත් ශක්තියක් ලබා දුන් රත්නසිරි පිය උරුමයෙන් තමන්ට හිමි වූ ඉඩම් ජනතාව සතු කරන්නට පෙරමුණ ගත්තේය. 1970-77 දක්වා පුළුල් ජන මෙහෙවරක නිරත වූ රත්නසිරි ඇමැති කෙනකු ලෙස පරාජයට පත් වූයේය. රත්නසිරි දේශපාලන වශයෙන් පරාජය වීමේ මුල් පියවර වැටුණේ හැත්තෑහතේ මැයි පළමු වැනිදා පොකුණුවිට දී යැයි කීමෙහි ද වරදක් නැත. ශ්‍රී ලංකාවේ ඡන්ද සටනින් පරාජය වූ බහුතරයක්ම විදේශගත වෙති. නැත්නම් තමන්ගේ හුරු පුරුදු වෘත්තියෙහි ව්‍යාපාරයෙහි යුක්ත වෙති. වසර දහ අටක් දේශපාලනය කළ රත්නසිරිට ඒ කිසිවක් නැත. නීතිඥ වෘත්තියේ අවසාන විභාගයට පෙනී සිටීම සඳහා එංගලන්තයට යාමට පවා මුදල් නැත.

අපේ ජාතියට මවු-පිය උරුමයෙන් හිමි වගාව සඳහා රත්නසිරි හොරගල දාම්පේ පොල් ඉඩමෙන් යළිත් ජීවිතය පටන් ගත්තේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පැවති අර්බුද හමුවේ 1978දී රත්නසිරි ශ්‍රීලනිප පක්ෂයේ මහලේකම් ධුරයට පත් කෙරෙණි. ඒ කතාවේ ඉතිහාසය දිගය. සංකීර්ණය. 1982 ජනාධිපතිවරණයේ මහා බරට කර ගැසූ රත්නසිරි ඉන් පරාජය ලැබ 1982 ජනමත විචාරණයේ දී නැක්සලයිට් චෝදනාවෙන් කොළඹ වරාය පොලිසියේ මාස දෙකක් පමණ සිරබත් කන්නට සිදුවිය. පසුව චෝදනා රහිතව නිදහස් කෙරිණි. ඔහු දීර්ඝ දේශපාලන ජීවිතයෙන් නාමිකව සමුගෙන 1993 බස්නාහිර පළාත් සභා මැතිවරණයෙන් ජයග්‍රහණය කර ඇති පළාත් ඇමති ධුර හතරක වගකීම හිස මතට ගත්තේය.

1994 මැතිවරණයේ දී මහා බරක් කර ගසමින් අමාත්‍ය ධුර 3ක් සමග සභානායක ධුරයට පත් කෙරෙණි. ජයග්‍රාහී දීර්ඝ ගමන් මගට පිවිසි ඔහු 2010 ඔක්තෝබර් 10 වැනිදා අගමැති ධුරයට පත්වූයේ කළුතර දිස්ත්‍රික්කයෙන් පළමු වරට අගමැතිවරයකු පත් වීමේ ඓතිහාසික වාර්තාවක් ද තබමිනි. 2005 නොවැම්බර් 27 දා යළිත් අගමැති ධුරයට පත්වූ රත්නසිරි ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා නායකත්වය දුන් එල්ටීටීඊ විරෝධී ජන බල මෙහෙයුමට මුළු ශක්තියම ලබා දුන්නේ ආත්ම පරිත්‍යාගයෙන් සහ දැඩි අධිෂ්ඨාන ශක්තියකිනි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ එල්ටීටීඊ සංවිධානයට එරෙහි යුද මෙහෙයුම කරද්දී අගමැති වශයෙන් රත්නසිරි වික්‍රමනායක රට ඇතුළත ජන පවුර ශක්තිමත් කළේය. කෙතරම් කාර්යබහුල මෙහෙවරක නියුක්ත වුවද ඔහු හොරණ ජනතාවගේ ආරක්ෂාව විමසන්නට සතියකට වරක් අනිවාර්යෙන් හොරණ පුරවරය ප්‍රධානව කළුතර දිස්ත්‍රික්කයට පැමිණියේය. 2010 මැතිවරණයෙන් පසු රත්නසිරි වික්‍රමනායක රාජ්‍ය කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ධුරයට පත් වූයේය.

2015 ජනාධිපතිවරණයේ දී ඔහු මහින්ද රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණය උදෙසා පුළුල් මෙහෙයුමක නිරත වූයේය. ඉන්පසු සෞඛ්‍ය හේතූන් මත හොරගල දාම්පේ සුපුරුදු නිවහනෙහි විවේක සුවයෙන් පසු විය. 2016 දෙසැම්බර් මස 27 වැනිදා මුළු දේශයම අඳුරු කරමින් ජීවිතයෙන් සමුගත්තේය.

1960 මාර්තු මස සිට 2016 අග භාගය දක්වා අගමැති ධුරය ප්‍රධානව ධුර ගණනාවක වගකීම් ඉසිලීය. ඒ සියලු කාර්යභාරයන් අතරතුරත් හොරණ ප්‍රගතිශීලී ජනතාවට එතුමා දැක් වූ අසීමිත ගෞරවය, සහයෝගය වෙනුවෙන් අපි ඒ ශ්‍රේෂ්ඨ ජනතා නියමුවාණන් සදා සිහිපත් කරමු.

බන්දුල ආර්. ගුණවත්න

දේශවංශය
සංස්කරණය - උදිත ගුණවර්ධන
මෙම සියලු ලිපි සංවාදයට විවෘත බව සලකන්න.
දේශපාලනය හා සම්බන්ධ ඔබේ ලිපි අපට එවන්න.
'දේශවංශය', දිනමිණ, අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
deshawanshaya@lakehouse.lk

දිනමිණ The Dinamina

# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම

**(පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය)**

### විසිතුරු පැළ ව්‍යාපෘතියක් සඳහා බිම් කොටසක් බදුදීම

සී/ස කුරුණෑගල වැවිලි සමාගටම අයත් අත්තනගල්ල පළාත් වතු කොට්ඨාසය මගින් පාලනය වන අත්තනගල්ල බෙදුමෙහි පිහිටි හෙක්ටයාර් 4.67 ක ප්‍රමාණයක විසිතුරු පැළ ව්‍යාපෘතියක් පහසුකම් සැපයීමේ පදනම මත වර්ෂ 10 ක කාලයක් සඳහා බදුදීමට මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. මෙම භූමියේ විසිතුරු පැළ වගාවක්ද සහිතය.

පොල් වගාවකින් හා රඹුටන් පැළ වගාවකින් සමන්විත මෙම භූමියේ එම වගාවන්ගේ නඩත්තු කටයුතු සහ අස්වැන්න ලබා ගැනීම කුරුණෑගල වැවිලි සමාගම විසින් සිදු කරනු ලබයි.

මේ සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් ටෙන්ඩර්පත් කැඳවන අතර අදාළ ටෙන්ඩර්පත් පහත ලිපිනයෙන් හෝ ඌරාපොල පිහිටි අත්තනගල්ල පළාත් වතු කාර්යාලයෙන් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා ආපසු නොගෙවනු ලබන රු. 500/- ක මුදලක් ගෙවා ලබා ගත හැක.

ටෙන්ඩර්පත් නිකුත් කිරීම 2021.06.01 වන දින ප.ව. 12.30 න් අවසන් වන අතර එදින ප.ව. 2.00 දක්වා ටෙන්ඩර්පත් බාර ගනු ලැබේ. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත, ටෙන්ඩර්පත් බාර ගැනීම අවසන් කරන වේලාවට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලන ලෙස දැනුම් දෙමු. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"විසිතුරු පැළ ව්‍යාපෘතියක් සඳහා බිම් කෙටසක් බදුදීම"** ලෙස සටහන් කරන්න. ටෙන්ඩර්පත් විවෘත කිරීම 2021.06.01 දින ප.ව. 2.30 ට පහත ලිපිනයේදී සිදු කෙරේ. මේ සඳහා ඔබට හෝ ඔබගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක.

ටෙන්ඩර්පත් යොමුකිරීමේදී රු. 50,000/- ක ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් මුදලින් කුරුණෑගල වැවිලි සමාගම වෙත ගෙවිය යුතු අතර එම රිසිට්පතේ පිටපතක් ටෙන්ඩර්පත සමග අමුණා එවිය යුතුය. (මෙය අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල පිහිටි ප්‍රධාන කාර්යාලය වෙත පමණක් ගෙවිය යුතුය) ටෙන්ඩරය හිමි වන බදු ගැණුම්කරු විසින් ටෙන්ඩරය භාරගන්නා අවස්ථාවේදී මුදලින් රුපියල් මිලියනයක්, ආරක්ෂක තැන්පතුවක් ලෙස බදුකාලය අවසන් වනතුරු කුරුණෑගල වැවිලි සමාගමේ තැබිය යුතුය.

අත්තනගල්ල පළාත් වතු අධිකාරී සමග සාකච්ඡා කර සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා අදාළ භූමිය පරීක්ෂා කළ හැක. (දුරකථන අංකය : 071-6884093)

ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

වැඩි විස්තර සඳහා කුරුණෑගල වැවිලි සමාගමේ අලෙවි කළමනාකරු අමතන්න. (දුරකථන අංක 071-6884085)

**සභාපති - ටෙන්ඩර් මණ්ඩලය**
**කුරුණෑගල වැවිලි සමාගම,**
**අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල.**
**2021.05.07**

## රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථාවල තනතුරු සඳහා පත් කෙරෙන / නම් කෙරෙන පුද්ගලයන්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව මගින් මෙහි පහත දක්වා ඇති තනතුරු සඳහා පත්කර ඇති / නම් කර ඇති අයගේ යෝග්‍යතාවය පරීක්ෂා කර බැලීමට නියමිතය: -

| අංකය | නම සහ ලිපිනය | තනතුර |
|---|---|---|
| 1 | එම්.ආර්.කේ. ලෙනගල මහතා<br>නො. 40 බී, සමුළු නිවාස කොළඹ 05 | කොරියානු ජනරජයේ ශ්‍රී ලංකා තානාපති වශනේ නම් කරන ලද |
| 2 | කිමාලි ප්‍රනාන්දු මහත්මිය<br>නො. 14/2, වෝඩ් පෙදෙස, කොළඹ 07. | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 3 | රාජා ඒ. එදිරිසූරිය මහතා<br>2000 ප්ලාසා, නො. 25, නව රෝහල පාර, මහල් නිවාස 1202, ශ්‍රී ජයවර්ධනපුර. | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සභාපති වශයෙන් පත් කරන ලද. |
| 4 | මහාචාර්ය එන්.ටී.එස්. විජේසේකර මහතා නො. 45, පළමු පටුමග, මැදවැලිකඩ පාර, රාජගිරිය. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 5 | දර්ශනි ලහඳපුර මහත්මිය<br>නො. 498/2, රුවන්පුර, අග්ගොන, මුල්ලේරියාව. | සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති වශයෙන්පත් කරන ලද |
| 6 | ඉංජිනේරු ජේ.ඒ.බී. ජයතිලක මහතා<br>අංක. 109, පන්සල පාර, ජුලම්පිටිය, වීරකැටිය | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 7 | රත්නසිරි කළුපහන මහතා<br>නො. 47/ඒ, සුනේත්‍රාදේවි පාර, කොහුවල, නුගේගොඩ. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 8 | රේණුක පෙරේරා මහතා<br>නො. 365, නාගහවත්ත පාර, කොටිකාවත්ත, මුල්ලේරියාව. | ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති වශයෙන් පත් කරන ලද. |
| 9 | විජිත හේරත් මහතා<br>නො. 4/1, එදිරිවීර පෙදෙස, දෙහිවල. | ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 10 | අතුල ප්‍රියදර්ශන ද සිල්වා මහතා<br>නො. 344/3ඒ, ඇරව්වල, පන්නිපිටිය. | සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 11 | බී.කේ. ජගත් පෙරේරා මහතා<br>නො. 373/බී, වෙදගේවත්ත, මාගම්මන, හෝමාගම. | ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 12 | රංජිත් සේපාල මහතා<br>නො. 46/8, ගැමුණු පෙදෙස, සේනානායක මාවත, නාවල. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 13 | මහාචාර්ය එස්.ආර්.ඩී. රෝසා මහතා<br>නො. 1310/2, හෝකන්දර පාර, පන්නිපිටිය. | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 14 | ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා<br>"ඩිලේ", ඉරබඳගම, සඳලංකාව. | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 15 | ආචාර්ය නිහාල් ජයතිලක මහතා<br>නො. 465/2, වැලිවිට පාර, කඩුවෙල. | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති වශයෙන් පත් කරන ලද. |
| 16 | ජගත් වික්‍රමසිංහ මහතා<br>නො. 402/6, ගම්මාන පාර, පන්නිපිටිය. | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 17 | මහින්ද පතිරණ මහතා<br>නො. 214/7/1, ජය මාවත, වටරැක, පාදුක්ක. | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 18 | සී. දිල්හාරා අමරසේකර මහත්මිය<br>නො. 53, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල. | ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපති වශයෙන් පත් කරන ලද. |
| 19 | වෛද්‍ය කේ.ඒ.එස්. ගමගේ මහතා<br>නො. 11, වලගම්බා මාවත, බොරුපන පාර, රත්මලාන. | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සභාපති වශයෙන් පත් කරන ලද. |
| 20 | ජයන්ත වික්‍රමසිංහ මහතා<br>නො. 7/1, සම්නර් පෙදෙස, බොරැල්ල, කොළඹ 08. | පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය සහ පොල් පර්යේෂණ ආයතනයේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 21 | කුමුදුනි ගුණසේකර මහත්මිය<br>නො. 102/5, දෙලේකනත්ත පාර, මාවිත්තර, පිළියන්දල. | කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලද |

ඉහත පත් කිරීම් / නම් කිරීම් සම්බන්ධයෙන් කරුණු දැක්වීමට කවර හෝ සංවිධානයක් හෝ පුද්ගලයකු කැමැත්තේ නම්, යථා පරිදි අත්සන් කරන ලද ලිඛිත සංදේශ 2021 මැයි මස 21 වැනි දින හෝ ඊට පෙර **"ලේකම්, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, කාරක සභා කාර්යාංශය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් එසේ කළ හැකිය. එසේ නැතහොත්, ෆැක්ස් අංක 011-2777300 වෙත ෆැක්ස් මගින් හෝ highposts_c@parliament.lk යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් ද එවිය හැක.

එකී ලිඛිත සංදේශවලට අමතරව වාචික සාක්ෂි ඉදිරිපත් කරන ලෙසට ද කාරක සභාව විසින් නියම කළ හැකිය. මෙම දැන්වීම පාර්ලිමේන්තු වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත. (www.parliament.lk)

**කාරක සභාවේ ලේකම්,**
**පාර්ලිමේන්තුවේ මහ ලේකම්.**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**
**2021 මැයි 07.**

## තැපැල් දෙපාර්තමේන්තුව

### ලංසු සඳහා ආරාධනයයි (IFB)

### ආවරණ සහිත ලිපිකවර හා ඇසුරුම් පෙට්ටි (Padded Envelopes & Packing Box) සකස් කොට, මුද්‍රණය කොට, සැපයීම

1. තැපැල් දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පහත සඳහන් වර්ගීකරණයන්ගෙන් හා ප්‍රමාණයන්ගෙන් වූ ආවරණ සහිත ලිපිකවර හා ඇසුරුම් පෙට්ටි සකස් කොට, මුද්‍රණය කොට, සැපයීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අයිතමය | ලිපිකවර | ප්‍රමාණය (දිග හා පළල) | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|---|
| ආවරණ සහිත ලිපිකවර සකස් කොට, මුද්‍රණය කොට, සැපයීම | CD Pack | (7" x 7") 176mm x 176mm | 10,000 |
| | A5 Pack | (7" x 10") 176mm x 250mm | 10,000 |
| | File Pack | (10" x 15") 250mm x 353mm | 10,000 |
| | Jumbo Pack | (13" x 18") 324mm x 458mm | 10,000 |

| අයිතමය | ඇසුරුම් පෙට්ටි | ප්‍රමාණය (දිග x පළල x උස) | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|---|
| ඇසුරුම් පෙට්ටි සකස් කොට, මුද්‍රණය කොට, සැපයීම | Box - 01 | 8" x 6" x 3" | 10,000 |
| | Box - 02 | 10" x 7" x 4" | 10,000 |
| | Box - 03 | 12" x 9" x 4" | 10,000 |
| | Box - 04 | 13" x 10" x 5" | 10,000 |
| | Box - 05 | 16" x 12" x 6" | 10,000 |

2. ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.
3. **සුදුසුකම් නිර්ණායක**
   අ). අවශ්‍ය වලංගු ව්‍යාපාර ලියාපදිංචිය
   ආ). පසුගිය වසර තුන (03) තුළ පවත්වාගත් වාර්ෂික පිරිවැටුමේ අවම සාමාන්‍ය ශ්‍රී ලංකා රුපියල් මිලියන 8 කට සමාන හෝ ඊට වැඩි විය යුතුය.
   ඇ). පසුගිය වසර 5 කාලය තුළ එක් වසරක් සඳහා රුපියල් මිලියන 20 ක සාමාන්‍ය පිරිවැටුම් සැපයුමක් සම්පූර්ණ කොට තිබිය යුතුය.
4. ආපසු ගෙවනු නොලබන ගාස්තු **ශ්‍රී ලංකා රුපියල්** 3,500.00 තැපැල්පති වෙත ගෙවීමෙන් හා පහත සඳහන් ලිපිනය වෙත, ලංසුකරු විසින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, **2021 ජූනි 01 දින 14.00** පැය දක්වා, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදීගත හැක.
5. මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක් 2021 මැයි 17 වන දින 10.00 පැයට කොළඹ 10, ඩී.ආර්. විජේවර්ධන මාවතේ, අංක 310, තැපැල් දෙපාර්තමේන්තුවේ, මූලස්ථානයේ, තැපැල්පතිගේ සාකච්ඡා කාමරයේදී පැවැත්වීමට නියමිතය.
6. ලංසු, 2021 ජූනි 02 වන දින 14.00 පැයට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ පහත සඳහන් ලිපිනයේදී ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.
7. ලංසු, අදාළ භාර ගැනීම අවසන් කරනු ලබන දින සිට ලිත් දින 77 ක් දක්වා වලංගු විය යුතුය.
8. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවක් විසින් නිකුත් කළ හෝ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය අනුමත කළ රක්ෂණ ආයතනයකින් නිකුත් කළ ශ්‍රී ලංකා රුපියල් 100,000/- වටිනා 2021 සැප්තැම්බර් 17 වන දින දක්වා වලංගු හා **"තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල්පති"** නමට ගත් කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.
9. ලැබී ඇති ලංසු එකක් හෝ සියල්ලම හෝ ඉන් කොටසක් හෝ කිසිදු හේතු දැක්වීමකින් තොරව පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල්පති සතුවේ.
10. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර රාජකාරි දිනවල, 09.00 පැය හා 15.00 පැය අතර කාලය තුළ, දුරකථන අංක 0115746194 හෝ 011-4927249 මගින් ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැකි අතර, පහත සඳහන් ලිපිනයේදී ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

ගණකාධිකාරී (ප්‍රසම්පාදන),
තැපැල් මූලස්ථානය, බිම් මහල,
අංක 310, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

● **සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**තැපැල් දෙපාර්තමේන්තුව,**
**අංක : 310, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.**
2021-05-07

## අභිලාෂය ප්‍රකාශ කිරීම

### අධිකරණ අමාත්‍යාංශය

### සැළසුම් කිරීම, ප්‍රසම්පාදනය, කොන්ත්‍රාත් කළමනාකරණය සහ ඉදිකිරීම හා පශ්චාත් ඉදිකිරීම් සුපරීක්ෂණය

අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත විස්තර කර ඇති සේවා ලබාදීම සඳහා තම අභිලාෂය ප්‍රකාශ කිරීමට යෝග්‍යතාපූර්ණ උපදේශකවරුන්හට ඇරයුම් කරනු ලැබේ.

පහත සඳහන් අධිකරණ ගොඩනැගිලි සැළසුම් කිරීම, ප්‍රසම්පාදනය, කොන්ත්‍රාත් කළමනාකරණය සහ ඉදිකිරීම හා පශ්චාත් ඉදිකිරීම් සුපරීක්ෂණය උපදේශක සේවාවට ඇතුළත් වේ.

| අංකය | අධිකරණය | කොන්ත්‍රාත් අංකය |
|---|---|---|
| 01 | අත්තනගල්ල අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/43/2021 |
| 02 | මිනුවන්ගොඩ අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/44/2021 |
| 03 | හැටන් දිස්ත්‍රික්/ මහේස්ත්‍රාත් අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/45/2021 |
| 04 | හොරණ අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/46/2021 |
| 05 | කෑගල්ල අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/47/2021 |
| 06 | කඩුවෙල අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/48/2021 |
| 07 | මතුගම අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/49/2021 |
| 08 | මාවනැල්ල දිස්ත්‍රික්/ මහේස්ත්‍රාත් අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/50/2021 |
| 09 | මොරවක අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/51/2021 |
| 10 | ගල්කිස්ස අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/52/2021 |
| 11 | නුවරඑළිය අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/53/2021 |
| 12 | පැල්මඩුල්ල අධිකරණය සඳහා බහුමහල් ගොඩනැගිල්ල | MOJ/AC/26/54/2021 |

අභිලාෂී උපදේශකවරුන් හට **www.moj.gov.lk** වෙබ් අඩවිය වෙතින් ලබාගත හැකි "අධිකරණ අමාත්‍යාංශයේ උපදේශක සේවා (Consultancy Service MOJ) යන ශීර්ෂයෙන් යුතු ආකෘති පත්‍රයට අනුකූලව සේවාව ඉටුකිරීම සඳහා තමන් සතුව සුදුසුකම් ඇති බවට තොරතුරු ලබාදිය යුතුය.

(විස්තර පත්‍රිකා, සමාන සේවා පැවරුම් පිළිබඳ විස්තර, සමාන තත්ත්වයන් පිළිබඳ පළපුරුද්ද, කාර්ය මණ්ඩලය සතුව ප්‍රමාණවත් නිපුණතා තිබීම ආදිය) අභිලාෂී උපදේශකවරුන්හට එම වෙබ් අඩවිය වෙතින්ම යොමු කිරීමේ අනුදේශ (Terms of Reference) ලබාගත හැකි අතර, අධිකරණ අමාත්‍යාංශයේ සැපයුම් අංශයේ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකිය. දුක. 0112438178 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අභිලාෂය ප්‍රකාශ කිරීම් මුද්‍රා තබන ලද කවරවල බහා පහත ලිපිනයෙහි අධිකරණ අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලිපිනය ලියා **2021 මැයි 31** වන දින පෙ.ව. 11.00 ට හෝ ඉන් පෙර ගෙනැවිත් භාරදිය යුතුය.

**සභාපති,**
**අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව,**
**අධිකරණ අමාත්‍යාංශය,**
**උපරිමාධිකරණ සංකීර්ණය,**
**කොළඹ 12.**

# ගාල්ල මහා නගර සභාව

## භාවිතයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම

## ටෙන්ඩර් දැන්වීමයි

ගාල්ල මහා නගර සභාව සතු භාවිතයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් මා විසින් කැඳවනු ලැබේ.

02. 2021-05-07 වන දින සිට 2021-06-07 වන දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ මෙම වාහන ගාල්ල මහා නගර සභා ගබඩා පරිශ්‍රයේදී පරීක්ෂා කළ හැකිය. එක් එක් වාහනය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

03. 2021-05-07 වන දින සිට 2021-06-07 වන දින ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් කොන්දේසි සහිත ටෙන්ඩර් ආකෘති පත්‍ර ගාල්ල මහා නගර සභාවේ නාගරික ගණකාධිකාරී වෙතින් පහත උපලේඛනයේ දැක්වෙන ටෙන්ඩර් ආකෘති පත්‍ර ගාස්තු සහ ටෙන්ඩර් ඇප තැන්පත් මුදල් ගෙවීමෙන් පසු ලබා ගත හැක. 2021-06-08 වන දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර් භාරගනු ලබන අතර, එදිනම පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩරක්රුවන්ට සහ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට මෙම අවස්ථාවට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

04. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය. මුල් පිටපත එක් කවරයකත්, අනු පිටපත තවත් කවරයකත් බහා සීල් තබා මුල් පිටපත හා අනු පිටපත යුතුවෙන් සඳහන් කර එම කවර දෙකම එක් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවරේ උඩ පැත්තේ තමා ඉල්ලන ටෙන්ඩරයේ නම සඳහන් කර (උදා : "අංක. RA - 5925 දරන වාහනය මිලදී ගැනීම") ටෙන්ඩර් භාරගන්නා අවසාන දින 2021-06-08 පෙ.ව 10.00 ට පෙර ලැබෙන සේ ගාල්ල නාගරික කොමසාරිස් වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ ගාල්ල නාගරික කොමාසරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම කළ යුතුය. සෑම ටෙන්ඩරයක් සඳහාම ටෙන්ඩර් කොන්දේසි ද අත්සන් කර ඉදිරිපත් කළ යුතුය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ මිල ගණන් පිළිගත් බවට දැනුම් දී දින 03 ක් ඇතුළත, සම්පූර්ණ මුදලම ගෙවා වාහනය නිදහස් කර ගත යුතුය. එම කාලය තුළ මුදල් ගෙවා වාහනය ලබා නොගතහොත් ඔහු විසින් තැන්පත් කරනු ලැබූ ටෙන්ඩර් ඇප තැන්පත් මුදල සභාව සතු කරගනු ලැබේ.

06. ඉදිරිපත් වූ ටෙන්ඩර් පිළිබඳව මතභේදයක් ඇති වූ විට හෝ මෙහි කොන්දේසි වලින් බාහිරව ටෙන්ඩරයට බලපාන කරුණක් සම්බන්ධයෙන් ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන්නේය. නියමිත වේලාවට පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**උපලේඛනය**

| අනු අංකය | විස්තරය | ටෙන්ඩර් ආකෘති පත්‍ර ගාස්තු (රු. ශත) | ටෙන්ඩර් ඇප තැන්පත් මුදල (රු. ශත) | අවම ලංසුව (රු. ශත) |
|---|---|---|---|---|
| 01 | RA - 5925 ට්‍රැක්ටරය | 1,000.00 | 5,000.00 | 30,000.00 |
| 02 | 227 - 5606 ගලි රථය | 1,000.00 | 50,000.00 | 700,000.00 |
| 03 | LA - 4669 ගලි රථය | 1,000.00 | 100,000.00 | 1,000,000.00 |

07. හේතු දැක්වීමකින් තොරව ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ගාල්ල මහා නගර සභාව සතුය.

**රනිල් වික්‍රමසේකර,**
**නාගරික කොමසාරිස් (වැ.බ.),**
**ගාල්ල මහා නගර සභාව.**

**2021-05-04 වන දින,**
**ගාල්ල මහා නගර සභා කාර්යාලයේදී ය.**

# ලංකා විදුලිබල මණ්ඩලය

## මන්නාරම සුලං බලාගාර ව්‍යාපෘතියේ අබලි ද්‍රව්‍ය විකිණීම සඳහා

## ලංසු කැඳවීමයි

| | | |
|---|---|---|
| **දිනය** | - | 2021 මැයි මස 07 වැනිදා |
| **ලංසු අංකය හා ලංසුව** | - | CEB/PD-MWPP/2021 Selling of Scrap<br>මන්නාරම සුලං බලාගාර ව්‍යාපෘතිය |
| **ලංසු වර්ගය** | - | ජාතික තරගකාරී ලංසුකරණය |
| **ලංසු ඇපකරයේ වටිනාකම** | - | රු.150,000.00 |
| **ලංසු භාර ගන්නා අවසාන දිනය** | - | 2021 මැයි මස 21 වැනි දින පෙ.ව.10.00ට |

1. ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන්, සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව (ව්‍යාපෘති) මගින් ලංකා විදුලිබල මණ්ඩලයට අයත් මන්නාරම සුලං බලාගාර ව්‍යාපෘතියේ අබලි ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. (ලංසු පොත සහ විස්තර ලංකා විදුලිබල මණ්ඩලයේ වෙබ් අඩවියෙන් ලබාගත හැක. www.ceb.lk)
2. විකිණීමට ඇති අබලි ද්‍රව්‍ය පහත ලිපිනයේ සඳහන් වැඩබිමේදී පරීක්ෂා කර බැලිය හැක.

   **VESTAS අංගණය (නඩුකුඩා ග්‍රිඩ් උපපොළ අසල)**
   **නඩුකුඩා පාර, පේසාලේ,**
   **මන්නාරම**
3. අබලි ද්‍රව්‍යවල දත්ත සහ විස්තර ලංසු පොතෙහි ඇතුළත් කර ඇත. සාර්ථක ලංසුකරුට ප්‍රදානය කිරීමේ ලිපිය ලබාදුන් පසු, එම ලිපියේ සඳහන් දින සිට වැඩකරන දින 05ක් ඇතුළත් මුළු අබලි ද්‍රව්‍ය ප්‍රමාණය සඳහා ගෙවීම කළ යුතුය. සාමාන්‍යාධිකාරී (ලංකා විදුලිබල මණ්ඩලය) වෙත රේඛනය කරන ලද බැංකු අණකරයක් මගින් ගෙවීම් කළ හැක. ගෙවීම් සාර්ථකව සිදුකිරීමෙන් පසුව ලංසුකරුට මෙම සියලු අබලි ද්‍රව්‍ය වැඩකරන දින 07ක් ඇතුළත වැඩබිමෙන් ඉවත් කර ගත හැක.
4. තොරතුරු ලබාගැනීම සහ ලංසු තැබීමේ ලේඛනය පරීක්ෂා කිරීම සඳහා පහත ලිපිනය හා සම්බන්ධ කර ගත යුතුය.

   **ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
   **මන්නාරම සුලං බලාගාර ව්‍යාපෘතිය,**
   **ලංකා විදුලිබල මණ්ඩලය,**
   **අංක 754, නව පාර්ලිමේන්තු පාර,**
   **පැලවත්ත, බත්තරමුල්ල, 10120**
   **ශ්‍රී ලංකාව. දු.ක. +94 11 288 9640, ෆැක්ස් +94 11 286 9631**
5. ලංසු ලේඛන නිකුත් කරනු ලබන්නේ ලංසුකරුට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පමණි.
6. ලංසු භාරදිය යුතු වන්නේ පහත ලිපිනයේ පිහිටි ටෙන්ඩර් බහාලුම වෙතය.

   **ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
   **මන්නාරම සුලං බලාගාර ව්‍යාපෘතිය,**
   **ලංකා විදුලිබල මණ්ඩලය,**
   **අංක 754, නව පාර්ලිමේන්තු පාර,**
   **පැලවත්ත, බත්තරමුල්ල.**

   - ලංසු භාරගන්නා අවසන් දිනය වන 2021 මැයි මස 21 දින 10.00 වන පැයට හෝ ඊට පෙර ලංසු පොතෙහි ඇති ලංසු විස්තර පත්‍රිකාව සහ අදාළ වටිනාකමින් යුත් ලංසු ඇපකරය සමඟ භාරදිය යුතුය.
   - ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් පැමිණි වහාම ඉහත සඳහන් ස්ථානයේදීම ලංසු විවෘත කරනු ලැබේ.

   ප්‍රමාද වී භාර දෙනු ලබන ලංසු කිසිඳු හේතුවකින් තොරවම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. ලංසු අවසන් වන දිනට දින 02කට පෙර ඕනෑම වැඩකරන දිනක පැය 09.00 ත් 15.00ත් අතර රු. 2,000/-ක මුදලක් ගෙවීමෙන් පසු ඉහත ලිපිනයේ සඳහන් ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඕනෑම ලංසුකරුවෙකුට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු පොත මිලදී ගත හැක. සාමාන්‍යාධිකාරී (ලංකා විදුලිබල මණ්ඩලය) වෙත රේඛනය කරන ලද බැංකු අණකරයක් හෝ අත්පිට මුදල් මගින් ගෙවීම් කළ හැක.
8. සකස් කිරීම්, පූර්ව ලංසු රැස්වීම්වලට සහභාගිවීම්, ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ ලංසු භාරදීම සම්බන්ධයෙන් ලංසුකරුවන් විසින් දරනු ලබන කිසිඳු පිරිවැයක් හෝ වියදමක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වගකියනු නොලැබේ.

**සාමාන්‍යාධිකාරී,**
**ලංකා විදුලිබල මණ්ඩලය.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

"විදුලි බලයෙන් සැපිරිමත් දිවියක්"

# අධ්‍යාපන අමාත්‍යාංශය

## උසස් අධ්‍යාපන අංශය

## අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනයයි

## විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට ලැප්ටොප් පරිගණක ලබාදීම

විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට, ලැප්ටොප් පරිගණක සැපයීම සඳහා ස්වකීය අභිලාෂය ප්‍රකාශ කරන මෙන්, යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා සපයන්නන් හට ("වෙළඳුන්") අධ්‍යාපන අමාත්‍යාංශය දැන් ආරාධනය කරයි. මෙය විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා පොලී රහිත ණය පහසුකම් සැපයීමේ කටයුතු සඳහා වන මුල පියවරකි. මෙම ණය ප්‍රදානය මහජන බැංකුව සහ ලංකා බැංකුව විසින්, ස්වකීය තෝරාගත් ශාඛා මගින්, සපයනු ලැබේ. අමාත්‍යාංශය විසින් මෙම අභිලාෂය ප්‍රකාශ කිරීම් තුළින්, ශාක්‍යතාවන් සහිත වෙළඳුන් තෝරා ගනු ලබන අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට තමන් මනාපයක් දක්වන ඕනෑම වෙළෙන්දෙකුගෙන් ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීමට හැකිවන පරිදි තෝරාගත් වෙළෙඳුන්ගේ ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කරනු ලබනු ඇත. අභිලාෂී වෙළඳුන් විසින් මෙම සැපයුම සිදුකිරීම සඳහා තමන් සතුව අවශ්‍ය සුදුසුකම් හා අදාළ පළපුරුද්ද ඇති බව ප්‍රදර්ශනය කෙරෙන තොරතුරු සම්පාදනය කළ යුතුය.

කෙටි ලැයිස්තුගත කිරීම, මෙම වෙළඳුන් විසින් සපයනු ලබන පහත සඳහන් තොරතුරු මත පදනම්ව සිදු කරනු ලැබේ.

- ✓ සමාගමේ හරයාත්මක ව්‍යාපාර ක්ෂේත්‍රය
- ✓ සමාගමේ ව්‍යාපාර කටයුතුවල තියැලි වසර ගණන
- ✓ ශ්‍රී ලංකාව තුළ අලෙවිය සඳහා බලයලත් ලැප්ටොප් සන්නාම සහ අදාළ සන්නාමයේ විකිණීමේ ලත් පළපුරුදු වසර ගණන
- ✓ එක් එක් සන්නාමය සඳහා බලයලත් වැඩහල් පහසුකම් පිළිබඳ විස්තර තොරතුරු
- ✓ දීපව්‍යාප්ත සේවා සහාය හා ශාඛා ජාලය පිළිබඳ විස්තර
- ✓ පසුගිය වසර තුන තුළ (2018, 2019, 2020) අලෙවි කරන ලද ලැප්ටොප් සංඛ්‍යාව
- ✓ සමාගමේ මූලික/ ප්‍රධාන සේවා කාර්ය මණ්ඩලයේ උචිත දක්ෂතා හා කුසලතා
- ✓ සමාගමේ ස්වභාවය (කුඩා/ විශේෂිත/ විශාල)
- ✓ මූල්‍ය සහ පරිපාලන ශක්තිය හා වෙනත් අදාළ තොරතුරු

නොමිලේ බාගත කර ගත හැකි, අභිලාෂයේ ප්‍රකාශකිරීම් (EOI) තොරතුරු ආකෘතිපත්‍ර, අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් එනම්, www.mohe.gov.lk මගින් දැන් ලබාගත හැකිවන අතර, කොළඹ 07, වෝඩ් පෙදෙසේ, අංක 18 හි, පිහිටි අමාත්‍යාංශයේ, යටිතල පහසුකම් සංවර්ධන අංශයෙන්ද ලබාගත හැකිය. වැඩිදුර තොරතුරු පහත සඳහන් ලිපිනයේ කාර්යාලයන් වෙතින්, රාජකාරී දිනවලදී පැය 0900 සිට පැය 1700 දක්වා ලබා ගත හැකිය.

**අධ්‍යක්ෂක (යටිතල පහසුකම් සංවර්ධන),**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**18, වෝඩ් පෙදෙස, කොළඹ 07.**
**දුරකථන : +94-11-5115204**
**ෆැක්ස් : +94-11-2685139**
**ඊමේල් :** d-proc@mohe.gov.lk

**අධ්‍යක්ෂක (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ),**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**18, වෝඩ් පෙදෙස, කොළඹ 07.**
**දුරකථන : +94-11-2687510**
**ෆැක්ස් : +94-11-2677122**
**ඊමේල් :** d-ict@mohe.gov.lk

අභිලාෂය ප්‍රකාශ කිරීම් සඳහා ආරාධනයේ ඉල්ලා ඇති සියලුම තොරතුරු, 2021 ජූනි මස 01 වන දින පැය 1400 ට හෝ ඊට පෙර ලැබෙනසේ, ලිඛිත ආකාරයෙන්, පුද්ගලිකව හෝ ලේඛනගත තැපෑලෙන් ඉහත ලිපිනයට භාර දිය යුතුය.

**ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,**
**18, වෝඩ් පෙදෙස, කොළඹ 7, ශ්‍රී ලංකාව.**
**2021 මැයි මස 07 වන දින.**

# කොළඹ මහා නගර සභාව

## ප්‍රසම්පාදන දැන්වීමයි

කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් පහත සඳහන් අයිතම ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| | යොමු අංකය | විස්තරය |
|---|---|---|
| 01 | CPD/15/1814/2019 | ලැප්ටොප් පරිගණක 10 ක් ප්‍රසම්පාදනය |

අදාළ ලංසු ලේඛන (මුල් පිටපත හා අනුපිටපත ලෙස) ක්‍රමවේද දෙකක් මගින් ලබාගත හැක.

01. CMC වෙබ් අඩවිය වන www.colombo.mc.gov.lk වෙතින් බාගත කළ හැක.
   i. ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු රුපියල් 5,400/- පහත සඳහන් පරිදි ගෙවිය හැක.
      අ) **නගර ශාලාවේ මහජන බැංකු ශාඛාවේ පවත්නා ගිණුම් අංක** : 167-1-001-6-3169425 **වෙත** ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් ගෙවිය හැක.
      ආ) කොළඹ නගර සීමාවේ පිහිටි පහත සඳහන් නාගරික පරිශ්‍රවල ගෙවීම් කවුළු වෙත සතියේ දිනවල පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ ගෙවිය හැක.
         - ✓ **දිස්ත්‍රික් කාර්යාලය 04, අංක 147, හයිලෙවල් පාර, කිරුළපන, කොළඹ 06.**
         - ✓ **ජලාපවහන හා ජලසම්පාදන අංශය, මාළිගාකන්ද, කොළඹ 10.**
   ii. අදාළ ලදුපත / ගෙවුම් පත, ලංසුලේඛන සමඟ අනිවාර්යයෙන් අමුණා තිබිය යුතුය.
02. නගර ශාලා පරිශ්‍රයෙන් ලබාගත හැක.
   i. නගර ශාලා පරිශ්‍රයේ සරප් කවුළු වෙත **ආපසු නොගෙවන ගාස්තු රුපියල් 5,400/- බැගින් ගෙවීමෙන් හා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන්, 2021 මැයි 25 දින දක්වා රාජකාරී දිනවල පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ කොළඹ 07, නගර ශාලාවේ, කොළඹ මහා නගර සභාවේ මධ්‍යම මිලදී ගැනීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී (ප්‍රසම්පාදන)** වෙතින් අදාළ ලංසු ලේඛන ලබාගත හැක.

2021 මැයි 25 වන දින **පස්වරු 3.00 න්** පසුව අදාළ ලංසු ලේඛන වෙබ් අඩවියෙන් ලබා ගැනීම / නිකුත් කිරීම සිදු නොකරනු ලැබේ.

යථා පරිදි සම්පූර්ණ කළ ලංසු ලේඛන මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් දෙකක් වශයෙන් **2021 මැයි 28 වන දින පෙරවරු 10.00 ට පෙර, කොළඹ 07, නගර ශාලාවේ, නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ තබා ඇති** ටෙන්ඩර් පෙට්ටියේ (ලංසු බහාලනයේ) බහාලිය යුතුය.

**ලංසු භාරගැනීම, 2021 මැයි 28 වන දින පෙරවරු 10.00 ට අවසන් කරනු ලබන අතර,** ඒ හා සමගම විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.

යම් පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වෙතොත්, දුරකථන අංක 0112686389, 0112673173 සහ 0112686369 මගින් ප්‍රධාන ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැක.

**රෝෂණී දිසානායක - නීතිඥ**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව.**

### ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති මාලාවේ 6(1) වගන්තියට අදාළව බල ප්‍රදේශයේ පුරවැසියන් වෙත කෙරෙන නිවේදනයයි

2022 වර්ෂය සඳහා අලව්ව ප්‍රාදේශීය සභාවේ සකස් කිරීමට යෝජිත අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට සහ සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට අදහස් කරනු ලබන යෝජනා ඇතොත් 2021.06.30 වන දිනට පෙර මා වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**2021.05.03 දින අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.**

**සභාපති,**
**ප්‍රාදේශීය සභාව,**
**අලව්ව.**

**දු.ක. 037-2278747 / 037-2278175**
**ෆැක්ස් : 037-2278175**
**විද්‍යුත් තැපැල් : alawwa_ps@yahoo.com**

# කොළඹ දිසා අධිකරණයේදීය

## නොතීසියයි

එක්සත් රාජධානියේ SL3 9AD බර්ක්ෂයර්, (Berkshire) ෂලව් (Slough), 127 ද මයිර්ක් ඩැට්චෙට් (the myrke datchet) නැමති ස්ථානයේ පදිංචිව සිට නැසීගිය ලොකුවත්තගේ සැම්ප්සන් පෙරේරා රාජේන්ද්‍ර නැමති අයගේ අන්තිම කැමති පත්‍රයක් රහිත බූදලයේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය පිළිබඳ කාරණාවය.

**නැසීගිය අය**

විදේශීය ප්‍රොබෙට් බලපත්‍ර නැවත මුද්‍රා තැබීම පිණිස 1977 අංක 20 රාජ්‍ය සභා පනතින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXXVIII B වන පරිච්ඡේදයේ 1977 අංක 20 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධිත) 554 (U) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් පිළිබඳ කාරණාවයි.

| | | |
|---|---|---|
| නඩු අංකය | : | 67/21 **DTS** |
| ස්වභාවය | : | **තෙස්තමේන්තු** |
| වටිනාකම | : | රු. 20,000,000/- |
| කාර්ය පටිපාටිය | : | **ලඝු** |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාද ජනරජයේ කොළඹ 07, මලලසේකර පෙදෙසේ, අංක 27 දරන ස්ථානයේ පදිංචිය දරන සරංජිත් අලහකෝන් යන ඇටෝර්නි බලකරු මගින් පෙනී සිටින එක්සත් රාජධානියේ SL3 9AD බර්ක්ෂයර්, ෂලව්, 127 ද මයිර්ක් ඩැට්චෙට් යන ලිපිනයේ (පහත නම් සඳහන් දෙදෙනාගේම පදිංචිය) පදිංචිය දරන ලොකුවත්තගේ පිය ධම්මිකා රොස්ලින් රාජේන්ද්‍ර සහ ස්නේහ් ලට්ටා රාජේන්ද්‍ර.

**පෙත්සම්කරුවන්**

එක්සත් රාජධානයේ SL3 9AD බර්ක්ෂයර්, ෂලව්, 127 ද මයිර්ක් ඩැච්චෙට් හි පදිංචිව සිට නැසීගිය ලොකුවත්තගේ සම්ප්සන් පෙරේරා රාජේන්ද්‍ර යන අයගේ අන්තිම කැමති පත්‍රයක් රහිත බූදලය සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ SL3 9AD බර්ක්ෂයර්, ෂලව්, 127 ද මයිර්ක් හි පදිංචි ස්නේහ් ලට්ටා රාජේන්ද්‍ර යන අය වෙත එක්සත් රාජධානියේ ඉන්ද හයිකෝට් ඔෆ් ජස්ටිස් අධිකරණය විසින් ප්‍රදානය කරන ලද අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය 1977 අංක 20 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධිත) රාජ්‍ය සභා පනතින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXXVIIIB වන පරිච්ඡේදය අංක 20 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධිත) 554 (U) වගන්තිය යටතේ නැවත මුද්‍රා තැබීම සඳහා වූ අයදුම්පතක් මෙය පළ වූ දින සිට දින විසි අටක් (28) ගත වීමෙන් පසු කොළඹ දිසා අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 24 වන දින දීය.**

**පෙත්සම්කරුවන්ගේ නීතිඥ**

# MINISTRY OF JUSTICE

## Invitation for Pre-Qualification of Information Systems

***Design, Supply, Implementation and Maintenance of a Court Automation Solution for the Judicial System of Sri Lanka - MOJ/AC/26/21/2021***

## Extension of the Deadline

It is hereby announced that the deadline for the submission of responses to the above invitation for Pre-qualification of Information Systems has been extended till ***25th May 2021***. Accordingly, the Responses could be delivered on or before ***1500 hrs, 25th May 2021***.

Please note that an addendum to the originally published Pre-Qualification Document will also be published in the Ministry of Justice Website - **www.moj.gov.lk** in due course.

Further, all potential bidders are requested to register by filling the online registration form published in the Ministry of Justice Website - **www.moj.gov.lk**

**Chairman**
**Cabinet Appointed Procurement Committee**
**Court Automation Project - Ministry of Justice**

**For classified advertisements and for replies**
received in response to advertisements published under Lake House box numbers
Please Contact → MANAGER FRONT OFFICE → Hotline: 1949
LAKE HOUSE

## SOUTH EASTERN UNIVERSITY OF SRI LANKA

**Accelerating Higher Education Expansion and Development Operation (AHEAD)**

### INVITATION FOR BIDS (IFB)

**Supply, Installation and Maintenance of All in one Computers and Servers at the Dept. of ICT, Faculty of Technology, SEUSL, Oluvil**

**(SEU/AHEAD/RA1/FT/GOODS/2021/15)**

1. The **Chairman, Project Procurement Committee** of the South Eastern University of Sri Lanka invites sealed bids from eligible and qualified bidders for procurement of the following items.

| Item No. | Description | Quantity | Bid Security Amount |
|---|---|---|---|
| 01 | All in one Computer | 75 | **Rs. 345,000/-** (Three hundred and Forty Five thousand) |
| 02 | Server Type 1 | 02 | |
| 03 | Server Type 2 | 01 | |

2. Bidding will be conducted through National Competitive Bidding (NCB) method.
3. Interested eligible bidders may obtain further information from Deputy Director / Procurement, OTS, AHEAD Operation, South Eastern University of Sri Lanka, University Park, Oluvil # 32360 (Telephone : 067 22 55177 / 067 22 55189) from 9.00 a.m. to 2.30 pm on week days.
4. A Bid Security obtained from a commercial bank approved by the Central Bank to the value as stated above to be valid until **03rd October 2021** should be submitted along with the bid.
5. A complete set of bidding documents in English Language may be purchased by interested bidders on the submission of a written application and upon payment of non-refundable fee of **LKR 5,000/=** from 09.00 am to 03.00 pm up to **02.06.2021.** The mode of payment shall be either by cash payable at Shroff of the University or bank draft in favour of "Bursar, South Eastern University of Sri Lanka".

   The bidding documents can also be requested by email till 02.06.2021 – 03.00 pm by emailing the request letter to dradmin@seu.ac.lk with the scanned copy of the receipt of payment of the non-refundable fee to the University collection account number **228 1001 9000 1704** at People's Bank, Addalaichenai from any branch of People's Bank.
6. Sealed Bids should be marked **"Supply, Installation and Maintenance of All in one Computers and Servers at the Dept. of ICT, Faculty of Technology, SEUSL, Oluvil (SEU/AHEAD/RA1/FT/GOODS/2021/15)** and placed in the tender box kept in the OTS office, AHEAD Operation, South Eastern University of Sri Lanka or sent under registered cover to be received before **02.00 p.m. on 04.06.2021** at the following address. Bids will be opened in the presence of the bidders' representatives who choose to attend in person at 02.15 p.m. **on the same day** at OTS office, AHEAD Operation, South Eastern University of Sri Lanka, Oluvil. Late bids will be rejected.

**Chairman**
**Project Procurement Committee**
**South Eastern University of Sri Lanka**
**Oluvil**

07.05.2021

## මොරටුව විශ්වවිද්‍යාලයේ උද්‍යාන කළමනාකරණය සඳහා පුහුණු හා නුපුහුණු කම්කරුවන් සැපයීම

**කොන්ත්‍රාත් අංකය :** UM/CWS/GMD/LABOUR/2021/05

## ලංසු සඳහා ආරාධනයයි

1. මොරටුව විශ්වවිද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ උද්‍යාන කළමනාකරණය සඳහා පුහුණු හා නුපුහුණු කම්කරුවන් සැපයීම සඳහා යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.
2. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
3. කිසිදු වගකීමකින් තොරව ලංසුවක කොටසක් හෝ සම්පූර්ණ ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සේවායෝජක සතුය.
4. විකල්ප ලංසු භාරගනු නොලැබේ.
5. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර ලංසු ඉදිරිපත් කරන අවස්ථාව වන විට කම්කරුවන් සැපයීම පිළිබඳව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් සහිත ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් විය යුතුය.
6. ලංසුකරු විසින් සමාගම් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය. තවද, කලින් පළපුරුද්ද පිළිබඳව සේවායෝජකයන්ගෙන් ලබාගත් සහතික, අඛණ්ඩ මාස 3 ක් සඳහා වන බැංකු ප්‍රකාශන, අඛණ්ඩ පූර්වාසන්න මුදල් වර්ෂ 03 ක් සඳහා වන විගණනය කළ ගිණුම් සහිත වාර්ෂික වාර්තා යනාදිය ඉදිරිපත් කළ යුතුය.
7. අපේක්ෂිත සේවා කාලය ආරම්භ කළ දිනයේ සිට දින 365 කි.
8. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු 2021-05-07 වෙනි දින සිට 2021-05-20 වෙනි දින දක්වා සාමාන්‍ය රාජකාරී වේලාවන් තුළදී දුරකථන අංක 011-2651594 ඔස්සේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ප්‍රාග්ධන කර්මාන්ත හා සේවාවන්) වෙතින් ලබාගත හැකිය.
9. මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ප්‍රාග්ධන කර්මාන්ත හා සේවාවන්) කාර්යාලයේදී පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂාකර බැලිය හැකිය.
10. ආපසු ගෙවනු නොලබන ලංකා රු. 1000/- ක් මුදලින් විශ්වවිද්‍යාල සරප් වෙත ගෙවීමෙන් අනතුරුව 2021-05-07 වෙනි දින සිට 2021-05-20 වෙනි දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනයන්හි 0900 පැය හා 1500 පැය අතර මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ප්‍රාග්ධන කර්මාන්ත හා සේවාවන්) වෙත ව්‍යාපාර ලිපි ශීර්ෂයක ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය.
11. ලංසු, 2021-05-28 වෙනි දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි පිටපත් දෙකකින් යුතුව **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව"** යන ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබ විවෘත නොකොට ආපසු හරවා එවනු ලැබේ.
12. සියලුම ලංසු සමග, ලංසු ලිපිලේඛනයේ ලබා දී ඇති ආකෘතියේ ලංකා රු. 71,000.00 ක වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරය, ලංසු භාරගැනීමේ අවසාන දිනයේ සිට දින 119 ක් වලංගු විය යුතුය.
13. පූර්ව ලංසු රැස්වීමක් 2021-05-20 වෙනි දින පෙ.ව. 10.30 ට මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රාග්ධන කර්මාන්ත හා සේවාවන් අංශයේදී පැවැත්වේ. මෙම පූර්ව ලංසු රැස්වීමට සහභාගී වීමට පෙර ලංසු ලිපිලේඛන මිලදී ගත යුතු බව කරුණාවෙන් සලකන්න.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**මොරටුව විශ්වවිද්‍යාලය,**
**කටුබැද්ද,**
**මොරටුව.**

BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina Daily News Thinakaran
AVAILABLE AT
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
LAKE HOUSE

# අධිකරණ අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## අධිකරණ ගොඩනැගිලිවල ක්‍රියාත්මක කිරීමට ඇති අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු

අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පහත සඳහන් අධිකරණ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| No. | Court Zone | Project Name | Package No. | Estimated Total Cost (Excluding VAT & Contingencies (Rs. Mn) | ICTAD No. | Non Refund Fee-(RS) |
|---|---|---|---|---|---|---|
| 1 | Galle | Renovation of the rear part of the Building in which the high court and the District Court in Galle | MOJ/ACT/NCB/26/43/GAL/P-001 | 7.26 | C7 and C6 | 2,000 |
| 2 | Galle | Proposed new Civil Appealate High Court at Balapitiya | MOJ/ACT/NCB/26/44/GAL/P-002 | 32.3 | C5 and C4 | 2,000 |
| 3 | Kurunegala | Repairs to Courts Complex-Kuliyapitiya | MOJ/ACT/NCB/26/45/KUR/P-003 | 18.8 | C6 and C5 | 2,000 |
| 4 | Kurunegala | Repairs to Courts Buildings and Judge's Bungalow Magistrate's Court -Pilessa | MOJ/ACT/NCB/26/46/KUR/P-004 | 6.2 | C7 and C6 | 2,000 |
| 5 | Kurunegala | Repairs to Courts Buildings District Magistrate's Court-Wariyapola | MOJ/ACT/NCB/26/47/KUR/P-005 | 3.1 | C8 and C7 | 2,000 |
| 6 | Kurunegala | Repairs to Courts Buildings Magistrate's Court -Narammala | MOJ/ACT/NCB/26/48/KUR/P-006 | 3.0 | C8 and C7 | 2,000 |
| 7 | Tangalle | Estimate for Painting Building, Boundary wall,tile & rendering work, gnard room, new toilet, record room, repairing chamber toilet, new exhaust fan, new public toilet & septic tank at High Court Hambantota | MOJ/ACT/NCB/26/49/TAN/P-002 | 7.6 | C7 and C6 | 2,000 |
| 8 | Ampara | Repairing works at high courts complex – Ampara | MOJ/ACT/NCB/26/01/AM/P-001 | 8.5 | C7 and C6 | 2,000 |
| 9 | Rathnapura | Repairs to Courts Building at Kalawana Magistrate Court | MOJ/ACT/NCB/26/30/RAT/P-001 | 6.39 | C7 and C6 | 2,000 |
| 10 | Anuradhapura | Repairing of Old Courts Building foe Court Complex - Anuradhapura | MOJ/ACT/NCB/26/02/ANU/P-001 | 32.18 | C4 and C5 | 5000 |
| 11 | Polonnaruwa | Renovation of Court Building and Chummery House for District / Magistrates Courts - Hinguraggoda | MOJ/ACT/NCB/26/26/POL/P-001 | 11.5 | C5 and C6 | 5000 |
| 12 | Puttalam | Repairs of Roof Work, Painting Work, Tile Work of Open Court and Toilet at Court Complex in Puttalam | MOJ/ACT/NCB/26/29/PUT/P-003 | 11.3 | C5 and C6 | 5000 |
| 13 | Rathnapura | Repairs to Courts Building at Balangoda Magistrate Court | MOJ/ACT/NCB/26/32/RAT/P-003 | 13.0 | C5 and C6 | 5000 |

01. ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා වන අවශ්‍යතාවයන් සහ ක්‍රියාත්මක කිරීමේ පිරිවිතර පිළිබඳව පැහැදිලි කරන ලද විස්තර ලංසු ලිපිලේඛන සමඟ ලබා දී ඇත.

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතුය. ඉහත වගුගත කර ඇති ශ්‍රේණිය සඳහා CIDA/ICTAD ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කොළඹ 12, උපරිමාධිකරණ සංකීර්ණයේ අධිකරණ අමාත්‍යාංශයෙහි 03 වන මහලෙහි ප්‍රසම්පාදන අංශයේ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් ලබා ගත හැකි අතර, ඉහත කී ප්‍රසම්පාදන අංශයේ දී 07/05/2021 වෙනි දින සිට 28/05/2021 දක්වා (ප්‍රසිද්ධ නිවාඩු දින හැර) සතියේ දිනවලදී කාර්යාල වේලාව තුළදී, (පෙ.ව. 9.00–ප.ව.4.00) ලංසු ලිපි ලේඛන පරීක්ෂාකර බැලිය හැකිය. දුරකථනය/ ෆැක්ස් අංකය. **011-2438178**

05. එක් ලංසු ලිපිලේඛන කට්ටලයක් සඳහා ආපසු ගෙවනු නොලබන රු.2,000/- ක ගාස්තුවක් කොළඹ 12, උපරිමාධිකරණ සංකීර්ණයේ අධිකරණ අමාත්‍යාංශයේ තුන්වන මහලේ ප්‍රසම්පාදන අංශය වෙත ගෙවීමෙන් අනතුරුව ලිඛිත ඉල්ලීමක් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් කාර්යාල වේලාව තුළදී (පෙ.ව.9.00–ප.ව.3.00) 28/05/2021 වෙනි දින ප.ව.2.00 දක්වා මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

06. ලංසු පිටපත් දෙකකින් යුතුව ගෙනැවිත් භාර දිය යුතු අතර,

   I. 31/05/2021 වෙනි දින පෙ.ව 11.00 හෝ ඊට පෙර අමාත්‍යාංශය වෙත ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලියාපදිංචි තැපැල් මගින් ඉදිරිපත් කිරීමට හෝ

   II. 31/05/2021 වැනි දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි කාර්යාල වේලාව තුළදී කොළඹ 12 උපරිමාධිකරණ සංකීර්ණයේ අධිකරණ අමාත්‍යාංශයේ 03වන මහලේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය.

ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෙනත් ආකාරයකින් හෝ විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කෙරෙන ලංසු භාරගනු නොලැබේ.

07. සියලුම ලංසු සමග ලංසු ලිපි ලේඛනය සමග අමුණා ඇති ආකෘතිය ප්‍රකාර වූ බැංකු ඇපකරයක ආකාරයේ ශ්‍රී ලංකා රුපියල්වලින් වටිනාකම යුතු ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. එක් එක් කාර්යයන් සඳහා ලංසු ලේඛනයන්හි සඳහන් පරිදි ඇපකර දිනය වලංගු විය යුතුය. ලංසු ඇපකරයේ වටිනාකම එක් එක් ලංසු ලේඛනවල මිල ගණන් කැඳවීමේ ආරාධනා පත්‍රයෙහි (IFB) සඳහන් වටිනාකමින් යුක්ත විය යුතුය. වලංගු ලංසු ඇපකරයක් අමුණා නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු ඉදිරිපත් කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු ලංසු ලිපිලේඛනයේ සඳහන් කොට ඇත.

08. ලංසු එක් එක් කාර්යයන් සඳහා ලංසු ලේඛනයන්හි සඳහන් පරිදි ඉදිරිපත්කර ඇති දින දක්වා වලංගු විය යුතුය.

09. ලංසු භාර ගැනීම සඳහා වන අවසාන වේලාව ඉක්ම වූ වහාම 05 වන ඡේදයේ සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් සහ/ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසුව විවෘත කරනු ලැබේ.

10. ලංසු පිළියෙල කිරීම ගෙනැවිත් භාරදීම සම්බන්ධයෙන් ලංසුකරුවන් හට දරන්නට සිදුවන යම් පිරිවැයක් හෝ යම් වියදමක් සඳහා අධිකරණ අමාත්‍යාංශය වගකීම නොදරයි.

11. පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 13/05/2021 දින පෙ. ව. 11.00 ට අධිකරණ අමාත්‍යාංශයේ 02 වන මහලේ සාකච්ඡා කාමරයේදී පැවැත්වේ.

12. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධ අවසන් තීරණය ප්‍රසම්පාදන මණ්ඩලය සතු වෙයි.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය,**
**කොළඹ 12.**

# ආරක්ෂක සේවා ලංසු කැඳවීම

අධ්‍යාපන අමාත්‍යාංශය

## නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය,

### විල්පිට, අකුරැස්ස

අකුරැස්ස විල්පිට පිහිටි නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පරිශ්‍රයට 2021 / 2022 වර්ෂය සඳහා 2021 ජූලි මස 01 වැනි දින සිට 2022 ජූනි 30 දින දක්වා දිවා / රාත්‍රී ආරක්ෂක මුර සේවාවන් සැලසීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් 2021-05-25 දින ප.ව. 2.00 දක්වා භාරගනු ලැබේ. මෙම ලංසු 2021-05-28 දින ප.ව. 2.30 ට විවෘත කරනු ලැබේ.

01. රජයේ ආයතනවලට දැනුදු ආරක්ෂාව සලසන ආරක්ෂා කටයුතු සැලසීම් සඳහා රජයේ ලියාපදිංචි, රජයේ ආයතනවලට ආරක්ෂාව සැලසීම පිළිබඳ වසර 05 ක් හෝ ඊට වැඩි පළපුරුද්දක් ඇති ආයතන මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.
02. මෙම ආයතනයේ ලේඛකාධිකාරී වෙත රු. 600/- ආපසු නොගෙවන ලංසු ගාස්තුවක් ගෙවා ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අදාළ පෝරමය 2021-05-10 සිට 2021-05-25 මධ්‍යහ්න 12.00 දක්වා ලේඛකාධිකාරී වෙතින් ලබාගත හැකිය. මිල ගණන් පෝරම නිකුත් කරනුයේ රජයේ ලියාපදිංචි හා පළපුරුද්ද ලිඛිතව සනාථ කිරීමෙන් පසුවය.
03. සම්පූර්ණ කරන ලද ලංසුපත් ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ මෙම ආයතනයට පැමිණ භාර දිය හැකිය. ලංසු සඳහන් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, එය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ආරක්ෂක සේවා සැපයීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.
04. කාර්යාල වේලාවන් තුළ දී ආරක්ෂාව සැපයිය යුතු සීමා හා ස්ථාන සහ විස්තර ලේඛකාධිකාරී වෙතින් ලබාගත හැකිය.
05. ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන අතර, ලංසුපත් පිළිගැනීම හෝ ලංසු සියල්ල හෝ කිහිපයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ.

**සභාපති / පීඨාධිපති,**
**ප්‍රසම්පාදන මණ්ඩලය,**
**නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**

**2021-05-07**
**අකුරැස්ස, විල්පිට**
**නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දීය.**

---

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

# වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

# ලංකා බැංකුව

**1968 අංක. 34 දරන පනතින් හා**
**1974 අංක. 10 දරන නීතියෙන් සංශෝධනය කරන**
**ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය)**
**22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම.**

1) ණය යොමු අංක 80193909, 80252310, 80371532
2) ජංගම ගිණුම් අංක 79437271

බොරලැස්ගමුව, දෙහිවල පාර, බිම් මහල, අංක 67 හි මොන්ඩලීස් කෝපරේෂන් ලිමිටඩ් හි ණය වගකීම් වෙනුවෙන් අමුණුදොර හල්පොත්ත කුඹුර සහ අමුණුදොර කුරුඳුවත්තෙහි පිහිටි උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018 ඔක්තෝබර් 12 දින 2093 දරන ගැසට් පත්‍රයේ හා 2018 සැප්තැම්බර් 28 වන දින "ඩේලිනිව්ස්" හා "තිනකරන්", "දිනමිණ" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම 2021-06-22 පෙ.ව. 10.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර එම්.එච්.ටී. කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**ඉහත සඳහන් උපලේඛනය**

